සිහින, තාක්ෂණය සමඟ යාකිරීම

තාක්ෂණය අඛණ්ඩව මූල්‍ය ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කරමින් යන බැවින් එම ප්‍රවණතාවය සැලකිල්ලට ගනිමින් අඛණ්ඩව ඵලදායී හා අනාගතය සඳහා සුදුසු බැංකු අත්දැකීම් නිර්මාණය කිරීමට අපි කැපවී සිටින්නෙමු. අති නවීන ඩිජිටල් විසඳුම් එක් කරමින් අපි මූල්‍ය ප්‍රවේශය සඳහා ඇති හිඩැස යාකිරීමෙන් පමණක් නොව පුද්ගලයින්ට හා ව්‍යාපාරිකයින්ට විශ්වාසයෙන් යුතුව ඔවුන්ගේ සිහිනය යථාර්ථයක් බවට පත්කර ගැනීම සඳහා දිරි ගන්වමින් සිටිමු.

ඉහළ තාක්ෂණයෙන් යුත් පාරිභෝගික සහයෝගීතාවයේ සිට සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයකරණය කරන ලද පාරිභෝගික සේවාවන් හා තත්‍ය කාලීන ඩිජිටල් ගනුදෙනු දක්වා අපගේ පරිණාමනය පහසුකම් ඉක්මවායන අතර ජන ජීවිතය සමඟ බැංකුව සමීපවීමේ මග එයින් යළි යළිත් ගෙනහැර දක්වයි. භූගෝලීය හා සමාජයීය බාධක බිඳ දමමින් අපි අනාගතය ගොඩ නගන්නෙමු. එහිදී මූල්‍ය සව්බල ගැන්වීම ස්වයංක්‍රීයව ගනුදෙනුකරුගේ ඇඟිලි තුඩු අගින් සිදුකළ හැකි වන අතර එමගින් පෙර නොතිබූ ලෙස බැංකු කටයුතු නව්‍යතාවයෙන්, ඉක්මනින් හා පහසු ප්‍රවේශයක් සහිතව ඉටු කළ හැකිවෙයි.

ආයතනික පැතිකඩ

ගනුදෙනුකරු: විශිෂ්ඨ පාරිභෝගික සේවාව, නවයකරණය, ගුණාත්මක බව හා අති නවීන තාක්ෂණය මගින් අපගේ සියළුම ගනුදෙනුකරුවන්හට ඔවුන්ගේ නිවාස හා සංවර්ධන මූල්‍ය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ආකර්ෂණීය මූල්‍ය විසඳුම් ලබා දෙමින් සේවය කිරීමට අපි ඇපකැපවී සිටිමු.

ව්‍යාපාර හවුල්කරුවන්: ඉහළ ආරක්ෂාවකින් හා නම්‍යතාවයකින් යුතුව ආයෝජන සඳහා විශිෂ්ඨ ප්‍රතිලාභ ප්‍රදානය කරන්නෙමු.

සේවකයා: කණ්ඩායම් හැඟීමෙන් සේවය කල හැකි යහපත් පරිසරයක් නිර්මාණය කරමින් අපගේ සේවකයින්ගේ කුසලතා උපරිම අයුරින් වර්ධනය කරගැනීම වෙනුවෙන් හා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ද අපි අවස්ථා ලබා දෙන්නෙමු.

කොටස්හිමියන්: පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කරමින් ලාභදායිත්වයේ වර්ධනය මගින් කොටස්කරුවන්ගේ තත්ත්වය ඉහළ නැංවීමට අපි කැපවී සිටින්නෙමු.

තාක්ෂණය: වේගවත්බව, ගුණාත්මක බව හා පහසුව ඇතිකරලීම සඳහා ස්වයංක්‍රියකරණ සහ තාක්ෂණික යෙදවුම් මගින් අපගේ බාහිර ගනුදෙනුකරුවන් සඳහා අගය එකතුකළ සේවාවන් ලබාදීමට අපි බැඳී සිටිමු. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂම බව හා සඵලතාවය වැඩිකරලීම සඳහා අපගේ අභ්‍යන්තර ගනුදෙනුකරුවන්ට වේගවත් හා නිවැරදි තොරතුරු ලබා දෙන්නෙමු.

සමාජය: ජාතික සංවර්ධනයේ කොටස්කරුවෙකු ලෙස අපගේ ප්‍රජාවගේ ජීවන රටාව නගා සිටුවීම සඳහා සේවය කිරීමට අපි පොරොන්දු වෙමු.

දැක්ම

පාරිභෝගික මූල්‍ය කටයුතුවල වෙළෙඳපොල පෙරගමන්කරුවෙකු වීම සමඟින් සංවර්ධන බැංකුකරණයේ ජාතියේ අගනා කොටස්කරුවෙකු වීම.

මෙහෙවර

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ජාතියේ විශිෂ්ඨ නිවාස බැංකුව ලෙස ඉදිරියටත් පවත්වාගෙන යමින් සංවර්ධන බැංකුකරණයේ අගනා කොටස්කරුවෙකු වීම.

ආයතනික වටිනාකම්

අප පෙනී සිටින්නේ

- ගෞරවය පුදකරමින් විශ්වාසනීයව කටයුතු කරමු.
- අප ඉටුකරන සියළුම කාර්යයන්වලදී වෘත්තීයවේදීත්වය හා විශිෂ්ඨත්වය ප්‍රදර්ශනය කරමු.
- අප කරන කාර්යයන් ඉතා කැපවීමෙන් ඉටුකරමින් වගකීම ආරක්ෂා කරමු.
- අපි විවෘතභාවය ප්‍රදර්ශනය කරමින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට උත්සාහ කරමු.
- අපි නවයකරණ අදහස් සහ සක්‍රීය විසඳුම් බලාපොරොත්තු වෙමු.
- ඉගෙනුම සඳහා බලවත් කැමැත්ත සහ බැංකුව සමඟ වර්ධනයවීම සඳහා මහත් ලැදියාව අපි සතු වෙමු.

මූල්‍ය විශේෂතා

	2024 රු. මිලියන	2023 රු. මිලියන	වෙනස %
පොලී ආදායම	7,591	9,324	-18.59%
පොලී වියදම	(5,392)	(8,733)	-38.25%
ශුද්ධ පොලී ආදායම	2,198	591	271.98%
බදු වලට පෙර ලාභය	158	(1,165)	-113.56%
බදු කරණය	(126)	162	-177.78%
බදු වලට පසු ලාභය	32	(1,003)	-103.19%
රාජ්‍ය සුරැකුම් ආයෝජන	6,030	10,256	-41.20%
ණය සහ අත්තිකාරම් ශුද්ධ	41,730	38,603	8.10%
මුළු වත්කම්	55,668	59,067	-5.75%
ගනුදෙනුකාර තැම්පතු	48,161	52,138	-7.63%
ණය ගැනීම්	141	179	-21.34%
පාර්ශවකරුවන්ගේ අරමුදල	5,420	5,454	-0.62%
අනුපාත විශ්ලේෂණ			
ලාභදායිතා මට්ටම	%	%	%
ශුද්ධ පොලී ආන්තිකය	3.83%	1.02%	276.19%
ස්කන්ධය මත ඉපැයීම් (ROE)	0.59%	-16.82%	-103.50%
වත්කම් මත ඉපැයීම් (ROA)	0.28%	-2.01%	-113.72%
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය			
ස්කන්ධය / මුළු වත්කම්	9.74	9.23	5.45%
ස්කන්ධය / ණය හා අත්තිකාරම්	12.99	14.13	-8.07%
	බාසල් (III)	බාසල් (III)	
පළමු පෙළ	19.28%	18.81%	2.52%
පළමු සහ දෙවන පෙළ	19.28%	18.89%	2.06%
ද්‍රවශීලතාව			
ද්‍රවශීල වත්කම් අනුපාතය	104.79	175.14	-40.17%
ණය සහ අත්තිකාරම් / තැම්පතු	86.65%	74.04%	17.03%
ණය ගැනීම් / ණය සහ අත්තිකාරම්	0.34%	0.46%	-27.24%
ශ්‍රේණිගත කිරීම්			
වත්කම් ගුණාත්මකභාවය			
අක්‍රීය ණය / ණය සහ අත්තිකාරම්	29.13%	23.07%	26.27%
සේවක අර්ථසාධක අරමුදල හැර / අක්‍රීය ණය	17.07%	13.54%	26.07%
මුළු වත්කම්වලට ණය සහ අත්තිකාරම්	74.96%	69.42%	7.98%

2024 : මූල්‍ය විශ්ලේෂණය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ආර්ථික පුනර්ජීවනය සඳහා කැපී පෙන්වන පියවර ගත් අතර ප්‍රතිපත්ති පොලී අනුපාත කපා දැමීම, රජයේ සුරැකුම්පත් ප්‍රතිලාභ, බරිත සාමාන්‍ය මූලික ණය දීමේ අනුපාත (AWPLR) සහ ප්‍රධාන උද්ධමනයේ ක්‍රමික අඩුවීම මගින් පිලිබිඹුවන දැඩි වෙළෙඳපළ තත්ත්වයන් පහසුකරවීම සඳහා ප්‍රතිචාර ලෙස ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ උපාය මාර්ගික කේන්ද්‍රගත කිරීම සහ ප්‍රකෘති තත්ත්වයට පත්වීම විදහා දක්වමින් 2024 වර්ෂයේ දී ආකර්ෂණීය කාර්ය සාධනයක් පෙන්වා තිබිනි. කාර්යසාධනය මත පදනම් වූ සංස්කෘතියක් ඇතිකරමින් හා අති නවීන තාක්ෂණය වැළඳ ගැනීම අරමුදල් පිරිවැය ක්‍රමයෙන් අඩුකිරීම මගින් පුද්ගලික අංශයේ ණය ඉල්ලුමේ වර්ධනයක් වෙත බැංකුව සාර්ථක ලෙස ලගාවී තිබිණි. වසර තුල මෙම උත්සාහයන් බැංකුව ඉක්මනින් ප්‍රකෘති තත්ත්වයට පත්වීමට සහ ඉහළ ගිය කාර්ය සාධනයට සැලකියයුතු දායකත්වයක් ලබා දී තිබිණි.

2023 වසරේදී සිදුවී තිබූ අලාභය 2024 වසරේදී රු. මිලියන 32 ක ලාභයක් බවට පරිවර්තනය වී තිබූ අතර එවැනි ක්ෂණික වැඩිවීමක් අනෙකුත් මෙහෙයුම් වියදම් ඉහළ යෑම, සාමූහික ගිවිසුම අනුව 21% ක වැටුප් වර්ධකයක් සේවකයින් වෙත ලබාදීම සහ නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම සඳහා වැය කළ අමතර පිරිවැය වැනි ප්‍රධාන කරුණු තිබියදීත් සිදුවී තිබිණි. ඉදිරි වර්ෂවලදී බැංකුවේ පූර්ණ කාර්ය සාධනය සඳහා මෙවැනි ආයෝජන මගින් පිටිවහලක් ලැබෙනු ඇතැයි බැංකුවේ දැඩි විශ්වාසයි. වසරේ මුල් භාගයේ දී ඇතිවී තිබූ අස්ථාවර දේශපාලන තත්ත්වය නව ජනාධිපතිතුමා සහ ශක්තිමත් පාර්ලිමේන්තුව තේරීපත්වීමෙන් අනතුරුව ඉතා ඉක්මනින් ස්ථාවර තත්ත්වයකට පත්විය. බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කිරීම, පුද්ගලික අංශයේ ණය ඉල්ලුමේ වැඩිවීම, ස්ථාවර විනිමය අනුපාතය, දළ දේශීය නිෂ්පාදිතයේ වාර්තාගත අපේක්ෂා නොකල වර්ධනය සහ සියලුම සාර්ව ආර්ථික කරුණුවල වර්ධනය විදහා දක්වමින් ශක්තිමත් රජයක් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඉදිරියටත් කටයුතු කිරීම යන කරුණු ආර්ථිකය ඉක්මනින් ප්‍රකෘති තත්ත්වයට පත්වීමට හේතු වී තිබිණි.

පුද්ගලික අංශයේ වාර්තාකර ඇති 8.2% ක වර්ධනයට සාපේක්ෂව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 8% ක් ලෙස ලබාගත් එහි ණය කලඹේ වර්ධනය, දැනට සිටින ගනුදෙනුකරුවන් සමග ඇති සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට සහ නවතම නිෂ්පාදන මගින් නව ගණුදෙනුකරුවන් ආකර්ෂණයකර ගැනීමට බැංකුවේ ඇති හැකියාව පිලිබිඹු කරයි. ශ්‍රී ලංකාව තුළ සිටින ව්‍යාපාරික ගණුදෙනුකරුවන් හා පුද්ගල අවශ්‍යතා සපුරා ලීමට ඉලක්කගත උපාය මාර්ග සහ ණය ලබාදීමේ ක්‍රියාවලිය ව්‍යාප්ත කිරීම මෙම වර්ධනයට හේතු වී තිබිණි. 2024 වර්ෂයේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය කාර්යසාධනයේ කැපී පෙනෙන විශේෂත්වයක් වූයේ 2023 වර්ෂයේ තිබූ රුපියල් බිලියන 8.7 සිට 2024 වර්ෂයේ රුපියල් බිලියන 5.4 දක්වා පොලී වියදම 38% කින් අඩු කිරීමට හැකිවී තිබීම වෙයි. බැංකුවේ අරමුදල් සැපයීම යළි සාකච්ඡා කළ හා ප්‍රතිමූල්‍ය ගතකල ණය සඳහා පොලී අනුපාතයන් අඩුකිරීම බැංකුවේ ලාභදායිත්වය ඉහළ නැංවීමට උපකාරිවූ අතර එමගින් සියලුම උපායමාර්ගයන්ගේ මූලික අංගය ලෙස අරමුදල් පිරිවැය පාලනය කිරීමේ වැදගත්කම පෙන්වා දී තිබිණි. ශුද්ධ පොලී ආන්තිකය 2023 වසරේ වාර්තා වූ 1.02% සිට 2024 වර්ෂයේ දී 3.83% දක්වා ඉහළ යෑම ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයක් වූ අතර වර්ෂයේ අවසාන භාගයේ දී මෙම 2.06% ක වැඩිවීම ණය මුදල් මිලකරනය අවම කිරීම, වැඩි දියුණුකල වත්කම් බැරකම් කලමනාකරණය සහ වඩා යහපත් පොලී අනුපාත පැවතීම මගින් පිලිබිඹු විය. උද්ධමන පීඩනය අඩුවීම හා විනිමය අනුපාතයේ තියුණු අධිප්‍රමාණයවීම ඇතුළු සාර්ව ආර්ථික කරුණුවල වර්ධනය සහ ව්‍යාප්තියට බාධා ඇතිකල වෙළෙඳපළ පෙරගමන් කරුවන්ගේ තරගකාරිත්වය වැනි විවිධ අභියෝග හමුවේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සැලකියයුතු ලෙස ප්‍රකෘති තත්ත්වයට හා වර්ධනයට 2024 වර්ෂයේදී පත්වී තිබිණි. වැඩිවූ ණය වර්ධනයට අනුබලයක් ලෙස ද්‍රවශීලීතාවය පාලනය කරමින් තැම්පතුවල සමස්ත පිරිවැය අඩුකිරීමේ ඵලදායි උපාය මාර්ග අනුගමනය කර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අතිරේක වශයෙන් අමතර ද්‍රවශීලතාවය හා බැංකු ක්ෂේත්‍රය හරහා ණය කොන්දේසි ලිහිල් කර තිබිණි. පසුගිය වසරේ ලැබූ අලාභය හා සැසඳීමේදී බැංකුව සැලකිය යුතු මූල්‍ය කාර්ය සාධනයක් ලබාගෙන තිබීම පමණක් නොව නිෂ්පාදන හරහා ණය කළඹ විවිධාංගීකරණය කර තිබූ අතර බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය අපේක්ෂා කල කාලයට ප්‍රථමයෙන් වර්ධනය වී තිබිණි. අනාගත සංවර්ධනය සඳහා ඇති පැහැදිලි උපායමාර්ග හා ආරම්භකර ඇති ශක්තිමත් අඩිතාලම ඉදිරි වර්ෂයේ දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ධනාත්මක ගමන් මාර්ගයකට අවතීර්ණ වීම සඳහා හොඳින් සූදානම් කර ඇත. එමගින් එහි පාර්ශවකරුවන්ගේ අභිවෘද්ධිය සලසමින් ශ්‍රී ලංකාව පුළුල් ආර්ථික සංවර්ධනයක් කරා රැගෙන යනු ඇත.

බැංකුව ඩිජිටල් බැංකුකරණය වැනි නැගී එන වෙළඳපළවල් වෙත අවතීර්ණවීම සහ නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීමට සැලසුම් කරන අතර එමගින් තාක්ෂණික දැනුම සහිත ගනුදෙනුකරුවන් වෙත වඩා යහපත් සේවාවක් සැපයීමට සැලසුම් කරයි. දැනට සිදුවෙමින් පවතින ශ්‍රී ලාංකේය ආර්ථිකයේ ප්‍රකෘතිමත් වීම මගින් වර්ධනය සඳහා අවස්ථාවන් සලසයි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි තිරසාර වගකීම් සහිත ණය සැපයීමේ ක්‍රමවේදය හරහා ඒ සඳහා ආයෝජනය සිදු කිරීමට අපේක්ෂා කරයි. ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පවත්වා ගැනීමට හා ලාභදායිත්වය ඉහළ නැංවීමට බැංකුවේ උපායමාර්ගයන්ගේ අංගයක් ලෙස සඵල පොලී අනුපාත කළමනාකරණය, පිරිවැය පාලනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයට අඛණ්ඩ ප්‍රමුකස්ථානය දීමත් සිදුකරයි.

ආදායම් ප්‍රකාශය විශ්ලේෂණය

ආදායම් ප්‍රකාශයේ සාරාංශය

දර්ශකය	2024 රු. මිලියන	2023 රු. මිලියන	වෙනස %
පොලී ආදායම	7,591	9,324	-19%
සමස්ත මෙහෙයුම් ආදායම	2,780	867	221%
බදු පෙර ලාභය/(අලාභය)	158	(1,165)	114%
බදු පසු ලාභය	32	(1,003)	103%

පොලී ආදායම

සමස්ථ අඩුවීමක් පෙන්වමින් මුලු පොලී ආදායම රුපියල් මිලියන 9,324 සිට රුපියල් මිලියන 7,591 ක් දක්වා අඩුවී තිබිණි. කෙසේ වෙතත් 2023 වසර හා සැසඳීමේදී ණය සහ අත්තිකාරම් වලින් ලැබී තිබුණු පොලී ආදායම රුපියල් මිලියන 473 කින් 8% ක් ලෙස සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් තිබිණි. සමස්ථ ආදායම ධනාත්මක ලෙස වැඩිවීම සඳහා 8% ක් ලෙස වර්ධනය වී තිබූ ණය කළඹ බලපා තිබිණි. අනෙක් අතට ආයෝජන කටයුතුවලින් ලැබෙන පොලී ආදායම රුපියල් බිලියන 2.2 කින් එනම් 59%

කින් සැලකියයුතු ලෙස පහළ ගොස් තිබිණි. මෙයට මූලික වශයෙන් වෙළෙඳපළ පොලී අනුපාතයන්ගේ අඩුවීම සමග බද්දවූ 40% ආයෝජන කලඹ අඩු කිරීම හේතු වී තිබිණි. මෙම තියුණු පහත වැටීම ආයෝජනවලින් ලබන ආදායම මත වෙළෙඳපළ තත්ත්වයන්ගේ හිතකර බවේ අඩුවීමත් කළඹ ඉතා කුඩා වීමත් යන කරුණු දෙකෙහිම සෘණාත්මක බලපෑම ඉස්මතුකර පෙන්වයි.

ශුද්ධ පොලී ආදායම පසුගිය වසර හා සැසඳීමේ ශුද්ධ පොලී ආදායමේ 272% ක කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබෙන අතර මූලිකව මෙම තත්ත්වය පොලී පිරිවැයෙහි සැලකිය යුතු අඩුවීම නිසා සිදුවී ඇත. පොලී වියදමද 2023 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 8.7 සිට 5.4 ක් දක්වා 38% කින් අඩුවී තිබිණි. අරමුදල් පිරිවැය අඩු කිරීමට බැංකුවට ඉඩ ලැබෙන පරිදි වර්ෂය තුළ තැම්පතු පදනම පාලනය කිරීම හා කාර්යක්ෂම කලමනාකරණය පොලී වියදමේ අඩුවීමට හේතු වී තිබිණි. අභියෝගාත්මක ආර්ථික පරිසරයක් තුළ වඩා යහපත් පිරිවැය කළමනාකරණයක් සහ වැඩි දියුණු වූ මෙහෙයුම් කාර්යක්ෂමතාවය පිළිබිඹු කරමින් උපාය මාර්ගික ලෙස එය පාලනය කරමින් බැංකුවට එහි ශුද්ධ පොලී ආදායම සැලකිය යුතු ලෙස වැඩිකර ගැනීමට හැකිවී තිබිණි.

පොලී නොවන ආදායම

පොලී නොවන ආදායමට ගාස්තු හා කොමිස් ආදායම, මූල්‍ය ආයෝජනයන්ගෙන් ලැබූ ලාභය/පාඩුව සහ වෙනත් මෙහෙයුම් ආදායම් ඇතුළත් වේ. මූලික වශයෙන් වර්ෂය තුළ සිදුකළ ගාස්තු සංශෝධන හේතුවෙන් ගාස්තු හා කොමිස් ආදායම 79% ක් දක්වා වර්ධනය වී තිබූ අතර මෙම ප්‍රධාන කරුණු හේතුවෙන් බැංකුවේ පොලී නොවන ආදායමේ සැලකිය යුතු වැඩිමක් දක්නට තිබිණි. මීට අමතරව මූල්‍ය වත්කම්වල සාධාරණ අගය, වෙනත් ආදායම් 140% කින් වැඩි කිරීමට දායකත්වය ලබා දී තිබූ අතර මෙම ප්‍රවණතාවය ඒකක භාර අරමුදල් වල හිතකර මිල උච්චාවචනය හා විවිධ ආදායම් සහ ලාභාංශ ආදායමේ 42% ක වැඩිවීම තවදුරටත් බැංකුවේ පොලී නොවන ආදායම ඉහළ දැමීමට සමත් වී තිබිණි.

සමස්ත මෙහෙයුම් ආදායම

ප්‍රධාන කරුණු කීපයක් හේතුවෙන් සමස්ථ මෙහෙයුම් ආදායම 221% ක් ලෙස සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් තිබිණි. ලාභදායිත්වය වැඩිවීම, තැම්පතු සඳහා වූ ඵලදායි පිරිවැය පාලනය හේතුවෙන් පොලී වියදමේ 38% ක සැලකියයුතු අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබිණි. මීට අමතරව සමස්ථ ආදායම සඳහා ණය හා ආයෝජන වලින් ලැබූ ලාභාංශ, ලාභාංශ ආදායම සහ ගාස්තු හා කොමිස් ආදායම මගින් වෙනත් ආදායම් 114% කින් වැඩිවීමට තවදුරටත් හේතුවී තිබිනි. ණය කළඹේ රු. බිලියන 3.6 ක වැඩිවීම මගින් ණය ආදායමේ 8% ක වර්ධනයක් ධනාත්මක කාර්යසාධනයට දායකත්වය ලබා දී ඇත.

ලාභදායිත්වය

පසුගිය වසර හා සැසඳීමේදී 114% ක බදු පෙර ලාභයේ වැඩිවීමත් බදු පසු ලාභයේ 103% ක ඉහළ යෑමත් සනිටුහන් කරමින් 2024 වර්ෂයේ දී බැංකුව ලාභදායිත්වයේ කැපී පෙනෙන වැඩිවීමක් වාර්තාකර තිබිණි. අභියෝගාත්මක ආර්ථික පරිසරයක් තුළ යහපත් පිරිවැය පාලනයක් හා මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ වර්ධනයක් විදහා දක්වමින් උපායමාර්ගිකව එහි ණය බැඳීම් කළමනාකරණය කිරීම මගින් ශුද්ධ පොලී ආදායම වැඩිවීම හේතුවෙන් බැංකුවේ ලාභදායිත්වය සැලකිය යුතු ලෙස වැඩි වී තිබිණි. අනෙකුත් ආදායම් වර්ධනය බදු පසු ලාභය වැඩිවීමට දායකත්වයක් සපයා තිබූ අතර සුපුරුදු පොලී ආදායමෙන් බැහැරව ශක්තිමත් ලෙස ආදායම් ජනනය වීමක් දක්නට තිබිණි. මෙමගින් බැංකුවේ විවිධාංගීකරණය කළ මෙන්ම ශක්තිමත් ආදායම් ප්‍රවාහයක් විදහා දක්වා ඇත. කාර්යක්ෂම ලෙස අයකර ගැනීම් පාලනය හානිකරණ ගාස්තු 4% ක අඩුවීම සමස්ථ ලාභදායිත්වය කෙරෙහි වැඩිදුරටත් බලපා තිබිණි. ඒ හරහා බැංකුවේ අවදානම් කළමනාකරණ පරිචයන් හා ශක්තිමත් මෙහෙයුම් කාර්යක්ෂමතාවය පිළිබිඹු කරයි.



ජාතිය වෙනුවෙන් දායකත්වය

ජාතියේ පැරණිතම බැංකුව ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව රටේ සංවර්ධනය වෙනුවෙන් කැපවීමෙන් දායකත්වය ලබා දීමට කටයුතු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියෝග කරන ලද අවශ්‍යය ද්‍රවශීලතා හා ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාත පවත්වා ගැනීමට අමතරව බැංකුව විසින් බදු වගකීම් සපුරාලමින් ජාතික රක්ෂණභාර අරමුදල් සඳහා දායකත්වය සලසමින් රටේ සංවර්ධනය වෙනුවෙන් විවිධ අයුරින් ක්‍රියාශීලී සහයෝගය ලබාදෙයි.

2024 වර්ෂය තුළදී පමණක් බැංකුව විසින් වැට් සහ සමාජ ආරක්ෂණ බදු ඇතුළු බදු සඳහා මුළු මුදල රුපියල් මිලියන 166.24 ක් ගෙවමින් රජය වෙනුවෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. මෙකී මූල්‍ය දායකත්වයන් ඔස්සේ ජාතික ආර්ථික වර්ධනය සහ ස්ථායිතාව වෙනුවෙන් කටයුතු කරනු ලබන ප්‍රමුඛයෙකු ලෙස බැංකුව සිය පාර්ශවකරුවන් සහ පුළුල් ප්‍රජාව වෙනුවෙන් සිදු කරනු ලබන සේවය පෙන්නුම් කරනු ලබයි.

විස්තරය	2024 රු. මිලියන
එකතුකළ අගය මත බදු (වැට්)	146.14
සමාජ ආරක්ෂණ බදු (SSCL)	20.1

මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කිරීම

වත්කම්

2024 වර්ෂයේ දී බැංකුව එහි සමස්ත වත්කම්වල රුපියල් මිලියන 55,668 ක සැලකිය යුතු පහත වැටීමක් වාර්තා කර තිබිණි. මෙම පහත වැටීම මූලිකවම රුපියල් බිලියන 6.5 ක (42%) ආයෝජන කළඹේ සැලකිය යුතු අඩුවීම මගින් සිදුවී තිබිණි. සමස්ත ලාභදායිත්වයට දායකත්වය ලබාදීම හා පොලී පිරිවැය පහත දැමීමට ඉහළ පිරිවැයක් සහිත අරමුදල් නිරවුල් කිරීම සඳහා මෙම අඩුවීම බැංකුව උපායමාර්ගික ලෙස ප්‍රයෝජනයට ගෙන තිබිණි. බැංකුවේ මෙම ඉලක්කගත ප්‍රවේශය මගින් බැංකුවේ පිරිවැය රාමුව වැඩි දියුණු කිරීමට උපකාරීවීම පමණක් නොව ශේෂ පත්‍රයේ ශක්තිය හා ඔරොත්තු දීමේ හැකියාව සඳහා දායක වී තිබිණි. වත්කම් වෙන්කිරීම උපරිම කිරීම ඉලක්ක කරමින් බැංකුව අනාගත වර්ධනය සහ ස්ථායිතාවය සඳහා සූදානම් කර ඇත.

ණය සහ අත්තිකාරම්

සමස්ථ වත්කම් 6% ක් ලෙස අඩු වී තිබුණත් පසුගිය වසර හා සැසඳීමේ දී බැංකුවේ මුළු ණය කළඹ රුපියල් බිලියන 3.6 ක්

ලෙස 8% ක වර්ධනයක් පෙන්වා තිබිණි. ණය ඉල්ලුමේ විතැන්වීම හා උපායමාර්ගික ණය දීමේ තීරණ ඇතුලු විවිධ කරුණු මෙම වැඩවීම සඳහා හේතු වී තිබිණි. සමස්ථ වර්ධනය සඳහා සිල්ලර ණය සැපයීම විශේෂයෙන්ම සේවක අර්ථසාධක අරමුදල් (EPF) ණයවල සැලකිය යුතු ඉහළ යෑම මේ සඳහා දායකත්වය ලබා දී තිබිණි. විවිධ කර්මාන්ත අංශ හරහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හොඳින් විවිධාංගීකරණයකල ණය හා ලැබිය යුතු මුදල් කළඹක්ද පවත්වාගෙන ගොස් තිබූ අතර එමගින් බැංකුවේ විචක්ෂණ අවදානම් කලමනාකරණ පරිචය හා ණය සඳහා ඇති උපායමාර්ගික ප්‍රවේශය විදහා දක්වයි. අදාළ කාලය තුළ මෙම විවිධාංගීකරණය කිරීම අවදානම් අවම කිරීමට උපකාරී වූ අතර නව ණය ආයෝජනයන්හි ප්‍රාග්ධනිත කිරීම බැංකුවේ සමස්ථ වර්ධනයට දායකත්වය ලබා දී තිබිණි.

නිෂ්පාදන අනුව	2024 රු. මිලියන	2023 රු. මිලියන
උකස්	10,881.11	10,179.55
අර්ථ සාධක	13,938.72	8,857.46
කාර්ය මණ්ඩල ණය	149.61	1,208.08
පුද්ගල ණය	17,669.14	19,295.36
වෙනත්	2,404.17	1,864.19
එකතුව	45,042.75	41,404.64

වගකීම්

ඉකුත් වසර හා සැසදීමේදී බැංකුවේ මුළු වත්කම් අගය පහළ යෑමට සමානවම බැරකම් කළඹද 6% ක් දක්වා අඩුවී තිබිනි. සමස්ථ බැරකම් රු. මිලියන 50,248 ක් ලෙස 2023 වර්ෂයේ සිට 6.28% ක කැපී පෙනෙන අඩුවීමක් පෙන්වා ඇත. ලාභදායිත්වය උපරිම මට්ටමකට ගෙන ඒමේ අරමුණින් බැංකුවේ අරමුදල් සඳහා මූලිකව සිදුකල සංශෝධන මෙම අඩුවීමට හේතු වී තිබිණි. බැරකම් ප්‍රතිව්‍යුහගත කිරීම මගින් බැංකුවට ඉහළ පිරිවැයක් සහිත ණය ගැනීම් අඩු කිරීමට හැකි වී තිබූ අතර එමගින් අඩු පොලී වියදමකට මග පෑදී තිබිනි. මෙම උපායමාර්ගික අවතීර්ණ වීම බැංකුවේ ශුද්ධ පොලී ආදායම වැඩි කිරීමට උපකාරවීම පමණක් නොව එහි පොලී ආන්තිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් එල්ල කිරීමට සමත්වී තිබිණි. බැරකම් අඩුවීම ඵලදායී පිරිවැය කලමනාකරණය සහ වඩාත් කාර්යක්ෂම අරමුදල්කරණය මගින් ලාභදායිත්වය ඉහළ නැංවීමටගත් ආරම්භක පියවර නිසා සිදුවී තිබිණි.

වත්කම් පදනම

පසුගිය වසර හා සැසදීමේදී ඉතුරුම් තැම්පතු හා ස්ථිර තැම්පතු මගින් සමන්විත සමස්ථ තැම්පතු ප්‍රමාණය රු. මිලියන 48,161ක් ලෙස ගණනය කර තිබූ අතර එය7.63% ක සැලකිය යුතු අඩුවීමක් සඳහා දායකවී තිබිණි. බැංකුවේ වත්කම් පදනමේ පහල යෑම ලාභදායිත්වය වැඩිකර ගැනීම සඳහා සිදුකල උපායමාර්ගික තීරණ හේතුවෙන් සිදුවී තිබිනි. තැම්පතු පදනම අඩු කිරීම මගින් බැංකුව එහි පොලී ගෙවිය යුතු බැරකම් ඵලදායී ලෙස පහල දමා තිබිණි. ඉහළ පිරිවැයක් සහිත තැම්පතු යහපත් ලෙස කළමනාකරණය කිරීම මගින් පොලී වියදම් පහල යෑම බැංකුවට එහි පොලී ආදායම වර්ධනය කර ගැනීමටත් පොලී ආන්තිකය ඉහල නංවා ගැනීමටත් හැකිවී ඇත. වඩා ඵලදායී පිරිවැය රාමුවක් නිර්මාණය කර ගැනීමට මග පාදා ගැනීමට හේතුවන ඉහල පිරිවැයක් සහිත තැම්පතු කෙරෙහි විශ්වාසය අඩුවීම සහ අරමුදල් මූලාශ්‍ර උපරිම කිරීමට තැම්පතු පදනම අඩු කිරීම සඳහා ගත් තීරණය පුළුල් උපායමාර්ගයන්හි කොටසක් විය. අවසානයේ දී තැම්පතුවල මෙම අඩු කිරීම වඩා හිතකර මූල්‍ය තත්ත්වයකට මග පාදා තිබූ අතර ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගනිමින් බැංකුවේ ලාභදායිත්වය වැඩි කිරීමට හේතු වී තිබිණි.



ද්‍රවශීලතා ආවරණ

1988 අංක 30 දරණ බැංකු පනතේ 86 වගන්තියේ නියමකර ඇති රෙගුලාසි වලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපත්‍රලාභී විශේෂිත රාජ්‍ය බැංකුවක් ලෙස (LSB) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් 100% ක අවම ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතයක් පවත්වාගෙන යෑම අනිවාර්ය වේ. මීට අමතරව දින දර්ශනයේ දින 30 ක ආතති තත්ත්වයක් තුළ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා විශාල බරක් නොමැති උසස් තත්ත්වයේ ද්‍රව වත්කම් සහතික කරමින් බාසල් III සම්මතයට අනුකූලව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) පුරා ද්‍රවශීලතා ඔරොත්තු දීමේ හැකියාව උත්සාහවන්තව පවත්වාගෙන යන ලදී. 2023 වර්ෂය අවසාන වන විට 100% ක ස්ථාපිත අවම අවශ්‍යතා ඉක්මවා යමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ද්‍රවශීලතා ආවරණ අනුපාතය 104% ක් ලෙස වාර්තා වී තිබිණි.

මීට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති පරිදි 2024 දෙසැම්බර් 31 දිනට අවම අවශ්‍යතාවය වන 100% ක අවශ්‍යතාවය ඉක්මවා යමින් ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 108% ක් ලෙස දක්වමින් බැංකුව විසින් ස්ථාවර අරමුදල් සඳහා ශක්තිමත් අවතීර්ණවීමක් පවත්වාගෙන යන ලදී. මෙම කරුණු මගින් ජාතියේ මූල්‍ය පසුබිම සඳහා සහයෝගය දැක්වීම උදෙසා නියාමන අනුකූලතාවය සහ ප්‍රායෝගික ද්‍රවශීලතා කළමනාකරණය ,මෙහෙයුම්වල ස්ථාවරත්වය සහ ඔරොත්තු දීම ශක්තිමත් කිරීම වෙනුවෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නොවෙනස්වන කැපවීම පෙන්නුම් කරයි.

නව තාක්ෂණය
සමග අවංකත්වය,
නව්‍යකරණය
සහ තිරසාර වර්ධනය

සභාපතිතුමාගේ පණිවුඩය

"අවංකත්වය නවෝත්පාදනය සහ
තිරසාර වර්ධනය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අනාගතය
කරා යන ගමනේ නිරන්තර සහකරුවන් වනු ඇත. එය
දීප්තිමත්, අර්ථවත් සහ තිරසාර වනු ඇතැයි අපගේ විශ්වාසයයි."

2024 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. පසුගිය වසරට වඩා දේශපාලන හා ආර්ථික වශයෙන් තිබූ අස්ථාවරත්වයේ අඩුවීමක් විද්‍යාමාන වුවද යථා තත්ත්වයට පත්වීමේ අභියෝග යන් ප්‍රබල ලෙස පැවැති අතර බැංකුව කැපී පෙනෙන ධෛර්යක් හා උපාය මාර්ගික විචක්ෂණභාවයක් තිරසාර වර්ධනය පවත්වා ගැනීම සහ පාර්ශව කරුවන් සඳහා අගය එකතු කිරීම වෙනුවෙන් පෙන්වා තිබිණි. සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි සමාජ ස්ථරයන් අතරේ සිටින සේවා දායකයින්හට ගැටළුකාරී තත්ත්වයන් අත්විඳීමට ඉඩ නොතැබීමට විශේෂයෙන්ම ක්‍රියාකර තිබිනි.

සකසුරුවම් සහගත, සුපරීක්ෂාකාරී අධිෂ්ඨානයෙන් යුතු මූල්‍ය පරිසරයක්

මෑත කාලයේ දී රට මුහුණදුන් දරුණු ආර්ථික පසුබෑම හමුවේ ඉකුත් වසරේ සිදුකළ යථා තත්ත්වයට පත්වීමේ උත්සාහයන් 2024 වර්ෂයේ දී ප්‍රකටව දක්නට තිබිණි. ආර්ථික ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීමේ වැඩ පිළිවෙළ පැහැදිලි ලෙසම අසීරු අවධියක තිබූ අතර ඉතා මන්දගාමී වුවත් ප්‍රත්‍යක්ෂ ලෙස වසරේ දෙවන භාගයේ දී එහි ප්‍රතිඵල නෙලා ගැනීම ආරම්භ වී තිබිණි.

විශාල වශයෙන් කර්මාන්ත අංශයේ පුළුල්වීම හේතුවෙන් 2024 තුන්වන කාර්තුවේදී ආර්ථිකය 5.5% ක ප්‍රසාරණයක් වාර්තාකර තිබූ අතර සේවා සහ කෘෂිකාර්මික අංශයන්ගේ ඉපයීම් මධ්‍යස්ථ වුවද වර්ධන ශම්‍යතාවය ඉදිරියටත් පැවතිනි. මේ අතර විදුලිය හා ජල ගාස්තු පහළ යෑම මෙන්ම ඉන්ධන මිලෙහි අඩුවීම හේතුවෙන් උද්ධමනය ඉලක්කවලට වඩා පහළ මට්ටමක පැවතිය ද බලශක්ති මිල ගණන් අඩුවීම අවධමන තත්ත්වයකට මඟ පාදා තිබිණි.

තුන්වන කාර්තුවේදී වාර ඉල්ලුම් හේතුවෙන් සංසරණයේ පවතින ව්‍යවහාර මුදලේ වැඩිවීමත් සමග තවත් එක් යථා තත්ත්වයකට පත්වීමේ ලක්ෂණයක් ලෙස වෙළඳපල ද්‍රවශීලතාවය අතිරික්ත මට්ටමක පැවතිනි. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමට ප්‍රතිචාර වශයෙන් කෙටි කාලීන වෙළඳපළ පොලී අනුපාත පහළ දමා තිබූ අතර මෙමගින් යම් සහනයක් සහ ව්‍යාපාරික කටයුතු හා ජන ජීවිතයේ නිශ්චිතභාවය ඉහළ නැංවීමට හේතු වී තිබිණි.

මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාතය ලිහිල් කිරීම සමග බද්ධ වූ රජයේ සුරැකුම්පත් මත පොලී අනුපාත ක්‍රමයෙන් පහත වැටීම සාමාන්‍ය බරිත මූලික ණය දීමේ අනුපාතය (AWPL) අඛණ්ඩව පහළට ගමන් කිරීම පුද්ගලික අංශයේ ණය වර්ධනය පෝෂණය කිරීමට හේතුවී තිබිණි.

පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා සුපරීක්ෂාකාරී වීම

ආර්ථික අර්බුදයේ උග්‍රතම අවස්ථාව පහවගොස් ඇති පසුබිමක ඉදිරි මග කරදර හා බාධාවන්ගෙන් පිරී ඇති බව හා එමගින් අපරීක්ෂාකාරීත්වය හා අවිචාරවත් බව පැන නැගිය හැකි බැවින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඇතිවිය හැකි අවදානම් පිළිබඳව දැඩි සුපරීක්ෂාකාරීත්වයක් යොමුකර පාරිභෝගිකයාගේ සිට කොටස්කරුවන් හා සේවකයින් දක්වා සිටින සියලුම පාර්ශවකරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට ඇප කැපවී සිටියි.

අර්බුදය නිසා අත්‍යවශ්‍ය වූ ශක්තිමත් කළමනාකරණ රාමුව සහ ඵලදායි පාලන ව්‍යුහයන් කර්මාන්තයේ පදනම ශක්තිමත් කිරීමට අඛණ්ඩව සමත්වූ අතර දුෂ්කරතාවයන්ට මුහුණ දී උගත් පාඩම් වලින් සවිබල ගැන්වුනු බැංකුව ප්‍රකාතිමත් වෙමින් පවතින නමුත් තිරසාර ප්‍රගතිය සඳහා අවශ්‍ය ආකාරයේ ස්ථාවරත්වයකට වඩා දුරින් සිටින ආර්ථික පරිසරයක වර්ධනය හා ස්ථායිතාවය ඇති කිරීමට කැපවීම නැවත තහවුරුකර ඇත.

2022 වර්ෂයේ පැවති ආර්ථික කැළඹීමත් සමග අවිනිශ්චිතතාවය හා අස්ථාවරත්වය අවම කිරීමට සැලකියයුතු ඔරොත්තු දීමේ හැකියාවක් ප්‍රදර්ශනය කර තිබූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2024 වර්ෂයේදී මධ්‍යස්ථ තත්ත්වයක් විදහා දක්වමින් විශේෂයෙන්ම නව මූලික බැංකුකරණ (core banking system) වෙත අවතීර්ණ වෙමින් තීරණාත්මක මෙහෙයුම්වල ප්‍රගතියක් ප්‍රදර්ශනයකර තිබිණි.

සමාලෝචිත වර්ෂය තුළදී ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් තබාගැනීම හා ස්ථිර ද්‍රවශීල ස්වාරක්ෂකයන් පවත්වාගෙන යෑම සඳහා බැංකුව සමත් වී තිබිණි. බැංකුවේ ද්‍රවශීල ආවරණ අනුපාතය ප්‍රධාන ද්‍රවශීල හා ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතය ඇතුළුව 104% ක් ලෙස හා ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 108% ක් ලෙසද තිබූ අතර අධියර 1 අනුපාතය හා සමස්ථ ප්‍රාග්ධන අනුපාතය පිළිවෙලින් 19.28% හා 19.28% ක් ලෙස පැවතිණි. මෙම සංඛ්‍යා මගින් බැංකුවේ විචක්ෂණ කළමනාකරණ පරිචයන් ප්‍රකට කරන අතර එමගින් ප්‍රමාණවත් ද්‍රවශීල හා ප්‍රාග්ධන සංචිත සතුටුදායක මූල්‍ය පරිසරයක් ඇති කිරීම සඳහා වන වෙනස්වීම් සඳහා ආරක්ෂාවක් සලසනු ඇත.

ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වෙමින් පවතින මෙම වකවානුව තුළ කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායන් (SMEs) ශුද, කුඩා හා මධ්‍ය පරමාණ ව්‍යවසායන් (MSMEs) ඇතුළු පුළුල් පරායාසයක පැතිරී ඇති අපගේ විවිධ ගණුදෙනුකරුවන් මුහුණ දුන් අභියෝග සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතාවයන්ට බැංකුව ප්‍රමුඛත්වය ලබා දී තිබිණි.

ආර්ථික අවිනිශ්චිතතාවයන් අඩුවෙමින් පැවතියද, බැංකුවට තරගකාරීත්වයට, අක්‍රීය ණය හා පිරිවැය කළමනාකරණ ගැටළු සඳහා මුහුණ දීමට සිදුවූ අතර ඒවා සුපරීක්ෂාකාරීව හා විචක්ෂණ උපායමාර්ගික ප්‍රවේශයන් මගින් නිරාකරණය කර තිබිණි. මෙම කාල සීමාව තුළ ගණුදෙනුකරුවන්ට සහාය දැක්වීමේ හැකියාව මෙන්ම අනාගත වර්ධනය සහ සමෘද්ධිය සඳහා පදනම ශක්තිමත් කර තිබිණි. විචක්ෂණ ද්‍රවශීල කළමනාකරණය, කාර්යක්ෂම අක්‍රිය ණය හා හානිකරණ කළමනාකරණ, පිරිවැය ප්‍රශස්ථකරණය හා ණය සහ අත්තිකාරම් වලින් ඉපයීම් වැඩි කිරීම මෙන්ම ආයෝජන කටයුතු වැනි ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් වෙත ව්‍යාපාරික උපාය මාර්ග අඛණ්ඩව ඉලක්ක ගත කර තිබිණි.

මේ අතර බැංකුව විචක්ෂණ අවදානම් කළමනාකරණ පරිචයන්ට අනුගත වෙමින් වෙළඳපළ තත්ත්වයන් පිළිබඳ දැඩි අවධානයෙන් පසුවිය. බැංකුව අඛණ්ඩව හා තිරසාර දියුණුවක් සඳහා ප්‍රයත්න දරණ අතරතුරදී පවා සකසා ඇති ප්‍රතිපත්ති රාමුව මගින් මූල්‍යමය ඔරොත්තුදීමේ හැකියාව සහ පාරිභෝගික මැදිහත්භාවය සඳහා ඉහළ අගයක් ලබා දී තිබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස පැනනගින අවස්ථාවන්ගෙන් කඩිනම් ප්‍රයෝජන ගැනීමට බැංකුව සූදානම් කර ඇත.

ඵලදායි තත්ත්ව කලමනාකරණය

නියමිත කාල සීමාවක් ඇතුළත අඛණ්ඩව පාරම්පරික බැංකු ක්‍රමයේ සිට නූතන තාක්ෂණ සහිත බැංකු ක්‍රමයකට (core banking system) සංක්‍රමණය වීම බැංකුව ලබාගත් ජයග්‍රහණයකි. මෙම නූතන ක්‍රමවේදය තිබූ ප්‍රධාන බාධක ඉවත්කරමින් බැංකුව පූර්ණ ලෙස ඩිජිටල් තාක්ෂණය සමග මුසුකර ඇත.

මෙම නවතම ක්‍රමවේදය මගින් අභ්‍යන්තර ක්‍රියාවලිය විධිමත් කිරීමටත්, ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ බැංකුවේ හැකියාව ඉහළ නැංවීමටත් හැකි වී ඇත. මීට අමතරව

ඩිජිටල් බැංකු ගනුදෙනු සඳහා ඇති වැඩිවන ඉල්ලුම සැලකිල්ලට ගනිමින් බැංකුව එහි ඩිජිටල් බැංකු කටයුතු අඛණ්ඩව වැඩිදියුණු කරයි. ජංගම දුරකථන යෙදවුම්, අන්තර්ජාල ගණුදෙනු හා අන්තර්ජාලය හා නූතන තාක්ෂණික උපකරණ ප්‍රයෝජනයට ගනිමින් සිදුකරන ගෙවීම් ඇතුලු විවිධ ඩිජිටල් මාධ්‍යයන් දියුණු කිරීමට බැංකුව සැලසුම් සකස් කරයි. දැනට සිදු කරමින් පවතින මෙහෙයුම් කටයුතු සඳහා සහයෝගය දැක්වීමක් ලෙස බැංකුව 2024 වර්ෂයේදී නියාමන අනුකූලතාවය අනුව ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීම මගින් බැංකුව මූල්‍යමය ඔරොත්තුදීමේ හැකියාව පවත්වාගෙන යෑමට කටයුතු කර ඇත.

ප්‍රධාන කාර්ය සාධක දර්ශක (key performance indicators) ක්‍රමවේදයක් පූර්ණ වශයෙන් ආරම්භ කිරීම බැංකුවේ මානව සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රශස්ථකරණය කිරීම වෙනුවෙන් ලබාගත් තවත් එක් ජයග්‍රහණයකි.

2024 වර්ෂයේදී මූල්‍ය කාර්ය සාධනයේ සම්මිශ්‍රණයක් පැවතිය ද සැලකියයුතු ධනාත්මක ප්‍රගතියක් දක්නට තිබිණි. උදාහරණයක් ලෙස වර්ෂය අවසානය වන විට 14.43% සිට 8.9% දක්වා පහල දැමීමට බැංකුව සමත් වී තිබූ අරමුදල් පිරිවැයෙහි අඛණ්ඩ අඩුවීමක් කරා ගමන් කිරීමට බැංකුව සමත් වී තිබිණි. තවදුරටත් බැංකුව වර්ෂය සඳහා ශුද්ධ ණය ප්‍රමාණයේ 8% ක වර්ධනයක් වාර්තා කර තිබූ අතර එය කර්මාන්තයේ වර්ධන අනුපාතයවන 4.56% ඉක්මවා තිබිණි.

තිරසාර වර්ධනයක් තහවුරු කරමින් බැංකුව මුහුණදෙන සියලුම අභියෝග විසඳීමට හැකි සෑම පියවරක්ම ගන්නා බව මම ඔබ වෙත දැන්වීමට කැමැත්තෙමි. විශේෂයෙන්ම තැම්පතු හා ණය කාණ්ඩයන්ට ඇතුළත් අපගේ සේවාදායකයින් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව අප සැලකිලිමත් වියයුතු අතර සහයෝගාත්මක හා විචක්ෂණ ප්‍රවේශයක් හරහා අභියෝගාත්මක කාලවකවානු තුළදී මෙම කාණ්ඩයන්ට සහාය දැක්වීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ග ආරම්භකර ඇත.

පාලනය සහ අවදානම් කලමනාකරණය තහවුරු කිරීම

වගවීම හා විනිවිදභාවය තහවුරු කරමින් අපගේ පාර්ශවකරුවන් අතර අවංකභාවය හා විශ්වාසනීයත්වය ගොඩනැගීම් වෙනුවෙන් ආයතනික පාලනයේ ඉහළ ප්‍රමිතීන් පවත්වාගෙන යෑමට අපි කැපවී සිටිමු. මේ පිළිබඳව බැංකුව ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ඇතුලු සියලුම අවශ්‍ය ආයතනික පාලන ප්‍රමිති පිළිබඳ පූර්ණ අවබෝධයකින් පසුවිය. මේ පිළිබඳව වැඩිදුරටත් කටයුතු කිරීමේදී බැංකුව ගෝලීය හොඳම පරිචයන් සමග සමගාමී වීම සඳහා වර්ෂය තුළදී එහි පාලන රාමුවේ සම්පූර්ණ සමාලෝචනයක් සිදු කර තිබිණි.

කම්ටු ඵලදායි ලෙස භාවිතා කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය අතර ශක්තිමත් කතිකාවක් ගොඩනැගීමට අපි කටයුතු කළ අතර ශක්තිමත් පාලනයක් හා පාලන මනෝභාවයන් හා ක්‍රියාදාමයක් ඇති කිරීමට ශක්තිමත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය අපගේ පාර්ශ්ව කරුවන්ගේ දිගු කාලීන අවශ්‍යතාවලට ප්‍රමුඛතාවය දෙමින් ගෝලීය හොඳම පරිචයන් අඛණ්ඩව සංස්ථාගත කිරීමට අපේක්ෂා කරයි.

ගෝලීය හා දේශීය ආර්ථික පරිසරයේ අනපේක්ෂිත ප්‍රගතිය හමුවේ එහි අවදානම් කළමනාකරණ පරිචයන් හා ක්‍රියාවලී සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවය බැංකුව හඳුනාගෙන ඇත. මෙමගින් බැංකුවට සිදුවිය හැකි අහිතකර බලපෑම්වලින් ආරක්ෂාවී ඇති බව තහවුරු කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය හා අවස්ථා නිරීක්ෂණය කිරීම මෙයට ඇතුළත් වේ.

අවසාන වශයෙන් මූල්‍ය ආයතන හා නියාමකයින් යන දෙකොට්ඨාශයටම වැඩි වශයෙන් අදාළ වන ක්ෂේත්‍රය ලෙස පත්වී ඇති තොරතුරු තාක්ෂණ හා සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් බැංකුව පුළුල් උත්සාහයක් දරා ඇත. තොරතුරු ආරක්ෂණය, දත්ත රහස්‍යභාවය සහ පාලනය සැලකිලිමත් විය යුතු, වැදගත් ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන නිසි ප්‍රමුඛත්වය ලබා දී ඇත.

තිරසාරත්වය සඳහා කැපවීම

යහපත් පාලනයක් සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණයක් සඳහා වූ ස්ථිර කැපවීම අපගේ පාර්ශවකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දෙන අතරම මූල්‍ය ක්ෂේත්‍රයේ සංකීර්ණතා හරහා ගමන් කිරීමට රාජ්‍ය උකස් ආයෝජන බැංකුව ස්ථානගත කර ඇත.

තිරසාරබව දැන් බැංකුවේ මූලික වටිනාකම තුළ අන්තර්ගත කර ඇති බැවින් එය වඩාත් අන්තර්කරණය වූ හා ඔරොත්තු දෙන අනාගතයක් ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක වෙයි. පාරිසරික, සාමාජීය හා පාලන සාධකයන්ගේ අන්තර් සම්බන්ධතාවය හඳුනා ගැනීම බැංකුවේ සෑම අංශයකම අත්‍යවශ්‍ය අංගයක් බව තහවුරු කරමින් බැංකුවේ මෙහෙයුම්වල තිරසාරභාවය නිසියාකාරව සකස්කර ඇත.

සහභාගි බැංකුකරණය හා ප්‍රජාවගේ ඔරොත්තුදීමේ හැකියාව අපගේ පාරිසරික, සාමාජයීය හා පාලන (ESG) සාධක සහ සංවර්ධන ඉලක්කයන්හි මූලික පදනම ලෙස පවතී. තවදුරටත් මේ සඳහා අපගේ සොයා බැලීම් වැඩි කිරීමට අපගේ සියලුම උත්සාහයන් මගින් විශාල ලෙස ප්‍රතිඵල ඇතිවන සහ වැඩිදියුණුකල තිරසාරභාවයක් සඳහා පහසුකම් සලසන ව්‍යුහයන් ශක්තිමත් කිරීමටත්, නිර්මාණය කිරීමටත්, අපි උනන්දුවෙන් කටයුතුකර ඇත්තෙමු.

මෙම උත්සාහයන් අවබෝධකර ගතයුතු වන්නේ විශේෂයෙන්ම බලශක්ති හා ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් අනුවර්තනයවීමේ හැකියාවේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කිරීමට ඉවහල් වූ අර්බුදය හා දේශපාලන අස්ථාවරත්වය පිටු දැකීමට දරණ උත්සාහයන්ට අනුවය. සැලකියයුතු වඩාත් ස්ථාවර ආර්ථිකයක් සමග දැන් දිවයිනේ සංවර්ධන අභිලාෂයන් සඳහා සහයවීම වෙනුවෙන් තිරසාර මූල්‍ය සම්පත් එක්රැස් කිරීමේ දී බැංකුවට වඩා වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමට ඇත.

දිගුකාලීන ඔරොත්තුදීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමට විශේෂඥතාවය හා සම්පත් උපයෝගීකර ගනිමින් තිරසාර ප්‍රකාතිභාවයක් සඳහා පහසුකම් සැලසීමට බැංකුව අඛණ්ඩව ගණුදෙනුකරුවන් හා පාර්ශවකරුවන් සමඟ සම්බන්ධවෙයි. බැංකුවේ පාරිසරික හා සමාජීය අරමුණු සමග සමපාතවන වර්ධනයක් ඇති කිරීමට අවධානය යොමුකළ උපායමාර්ග අනුග මනය කරමින් තිරසාර මූල්‍ය කටයුතු සඳහා අපගේ ස්ථිර කැපවීම අපි අඛණ්ඩව සිදුකරමින් යන්නෙමු.

තාක්ෂණික සහාය ලබාගැනීමට හා අපගේ විසඳුම් හා වටිනාකම් යෝජනා වැඩි දියුණු කිරීමට සංවර්ධන නියෝජිත ආයතන හා හවුල්කරුවන්ගේ සහයෝගය නොකඩවා ලබාගන්නෙමු. තිරසාර මූල්‍ය සම්පත්වල බලය උපයෝගීකර ගැනීම, තිරසාර සංවර්ධන වැඩ පිළිවෙළට වඩා ශක්තිමත් හා අර්ථවත් දායකත්වයක් ලබාදීමට හැකිවනු ඇති බවත්, ඒ අනුව සැමට සමෘද්ධිමත් අනාගතයක් නිර්මාණය කිරීමට සැලකියයුතු දායකත්වයක් ලබාදෙන බවත් අපගේ විශ්වාසයයි.

ඉදිරි මග

බැංකුව කිසි දිනක අභියෝගවලින් පලාගොස් නොමැත. වඩා යහපත්, වඩා කාර්යක්ෂම හා ව්‍යාපාර කරගෙන යෑමේ තිරසාර ක්‍රම සඳහා ඇති අවස්ථා ලෙස අපි අභියෝග සලකනු ලබන්නෙමු. අපි නිසැක ලෙසම අප විසින් ආරම්භකරනු ලැබ ඇති ගමන පිළිබඳව නැවත ආවර්ජනය කරන්නෙමු. අවශ්‍ය තැන්වල නිවැරදි කිරීම් සිදුකරමින් විචක්ෂණශීලි වෙමින් සැමවිටම අරමුණු පිළිබඳව හැඟීමකින් හා උපරිම අධිෂ්ඨානයකින් ඉදිරියට යන්නෙමු. අපගේ පාර්ශවකරුවන් සඳහා නිර්මිත වටිනාකම් නිර්මාණය කරමින් විකාශනයවන අවශ්‍යතා මගින් පෙන්වා ඇති ගතික පරිසරයක් තුළ ඉදිරියට යාමට අපගේ නව්‍යකරණයන් යොදාගන්නා විට අපගේ උපාය මාර්ග දැඩි ලෙස නැවත විමර්ශණය කිරීමට අපි කිසිදු උත්සාහයක් නොගන්නෙමු.

විශේෂයෙන්ම කුඩා හා මධ්‍යපරිමාණ ව්‍යාපාර, ශුද්‍ර කුඩා හා මධ්‍යපරිමාණ ව්‍යාපාර සහ ආයතනික ගනුදෙනුකරුවන්ට පමණක්ම සේවය කිරීම පමණක් නොව, අපගේ බලපෑම වැඩි කිරීම සඳහා අපගේ ප්‍රවේශය වැඩි කිරීමට මැදිහත්වීම සහ කාර්යක්ෂම පිරිවැය කළමනාකරණය පුළුල් කිරීම සඳහා අපි අපගේ ව්‍යවස්ථාපිත නියෝග වලට දැඩි ලෙස අනුගත වෙමින් කටයුතු කරන්නෙමු. අපගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් වටිනාකම් එකතු කිරීම සඳහා අපි දායකවන බව ප්‍රත්‍යක්ෂ කිරීමට කැමැත්තෙමු.

අපගේ ප්‍රවේශයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා ආසන්න වෙළඳපළවල අවස්ථා ගවේෂණය කරන අතරම අපගේ ආයතනික හවුල්කාරිත්වයන් ස්ථානගතකර ගැනීමේ උත්සාහය පුළුල් කරන බැවින් අපි ඉදිරි වසර දෙස සුබවාදීව බලා සිටිමු. සැබැවින්ම ඩිජිටල් ප්‍රවේශය අපගේ පරිවර්තනීය උපායමාර්ගයේ පෙර ගමන්කරු වෙයි. උපාය මාර්ගික ආයෝජන සහ නව්‍යකරණය මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් වැඩි කිරීමට ඩිජිටල් විසඳුම් උපයෝගීකර ගැනීමට අපට හැකිවනු ඇතැයි අපි විශ්වාස කරමු. ප්‍රමාණයට වඩා ගුණාත්මකභාවය සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරන ස්මාර්ට් වර්ධනය (smart growth) කෙරෙහි අපගේ අවධානය නියත වශයෙන්ම පිරිමැසුම් සහිත උපායමාර්ග අනුගමනය කිරීමට හා අනාගත අභියෝග අපේක්ෂා කිරීම හා අවම කිරීම සම්බන්ධයෙන් අවස්ථා පදනම් කරගත් අවදානම් තක්සේරු කිරීම් සිදුකිරීමට අපට හැකිවනු ඇත.

අවංකත්වය, නව්‍යකරණය හා තිරසාර වර්ධනය බැංකුවේ අනාගතය කරා යන ගමනේ නිරන්තර සහකරුවන් වනු ඇත. එය දීප්තිමත්, අර්ථවත් සහ තිරසාර වනු ඇතැයි අපි විශ්වාස කරමු.

අපගේ ස්තූතිය

නැවුම් අපේක්ෂාවන් ඇති කිරීමට හේතුවක් වන ලෙස අපගේ ගනුදෙනුකරුවන් අප විසින් නිර්මාණයකර ඇති බොහෝ පිරිවැය එලදායි මූල්‍ය විකල්පයන් අවබෝධකරගෙන අගය කර ඇත. මේ සඳහා අපගේ කෘතඥතාවය පළකර සිටින අතර ඔවුන්ගේ පක්ෂපාතිත්වය හා අඛණ්ඩ විශ්වාසය දැඩි ලෙස අගය කරන බව ප්‍රකාශකර සිටිමු.

අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචිත වර්ෂය තුළදී මනා උපදෙස් සහ හොඳ සහයෝගීතාවයක් ලබා දී තිබූ අතර ඔවුන් ලබා දී තිබූ මග පෙන්වීම් පිළිබඳව මම ඔවුන් වෙත මාගේ කෘතඥතාවය ප්‍රකාශකර සිටිමි. අගනා උපදෙස් ලබාදී තිබූ මුදල් අමාත්‍යතුමා වෙත ද මාගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. ඒවාගේම මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා, මුදල් අමාත්‍යාංශ ලේකම්තුමා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා හා මෙම ආයතනවල සියලුම නිලධාරීන්, නීතිපතිතුමා සහ විගණකාධිපතිතුමා ඔවුන් බැංකුව වෙත ලබාදී තිබූ සහයෝගය හා උපදෙස් වෙනුවෙන් මාගේ කෘතඥතාවය පුදකර සිටීමට කැමැත්තෙමි.

අපගේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු කර ගැනීම සඳහා අවස්ථා උදාකර දී තිබූ අතර ඔවුන්ගේ එම කුසලතා වර්ධනය කරගැනීම සඳහා ඔවුන් දිරිමත්කර තිබිණි. එයට ප්‍රතිචාර ලෙස ඔවුන් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත්කර දීම සඳහා වෙහෙස නොබලා කටයුතු කර තිබිණි. බැංකුව සේවකයින්ට කුසලතා වර්ධනය කරගැනීමට හා තමන්ගේම යන හැඟීම ජනිත කරවීම හා වඩා යහපත් සේවා පරිසරයක් ඇති කිරීම තහවුරු කිරීම සඳහා කටයුතු කරන අතර විශිෂ්ඨත්වය කරා යන ගමනේදී අවශ්‍ය කුසලතා ආකර්ෂණය කරගැනීමට, පෝෂණය කිරීමට හා රඳවා ගැනීමට සැමවිටම උත්සාහ කරයි. බැංකුව යනු එක් පැත්තකින් එහි සේවක පිරිස වන අතර අප කවුරුන්ද යන්න හඳුන්වාදුන් හා ඉදිරියට යන ගමනේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන පුද්ගලයින් පිළිබඳව මම ආඩම්බර වෙමි. කළමනාකරණ කණ්ඩායමට සහ සත්‍ය ලෙස සෑම සේවකයෙකුටම ඔවුන්ගේ ශක්තිය මෙම පරිච්ඡේදවල ඔබ කියවන සංඛ්‍යා බවට පරිවර්තනය කිරීම වෙනුවෙන් මාගේ ඉමහත් කෘතඥතාවය පුදකිරීමට කැමැත්තෙමි.

විශ්වාසී



මහිල් පී. කුරගම

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය

"රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාර්යසාධනය, අනාගතයේදී තිරසාර වර්ධනයක් සහ වටිනාකම් නිර්මාණය කිරීමත් සඳහා බැංකුව ස්ථානගත කරමින් විචක්ෂණශීලී අවදානම් කලමනාකරණය, නව්‍යකරණය සහ පාරිභෝගික කේන්ද්‍රීයභාවය සඳහා එහි කැපවීම විදහා දක්වයි."

පෙර වසරවල සියලුම අංශවලට අහිතකර ලෙස බලපෑ පෙර නොවූවිරූ ආර්ථික අර්බුදයෙන් පසුව 2024 වර්ෂයේ දී යථා තත්ත්වයට පත්වීමේ මං සලකුණු පහළ වී තිබිණි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ද මෙම ප්‍රවණතාවයෙන් මිදීමට නොහැකිව තිබූ අතර 2022 වසරේ පැවති ආර්ථික පසුබෑමේ ප්‍රතිඵල දැඩි අභියෝග මතු කරමින් ඉදිරියටත් පැවතිණි. සැබවින්ම 2023 වසර බැංකුවට දැඩි අහිතකර වසරක් වී තිබූ අතර කෙසේ හෝ එම වසර බැංකුවට දැඩි බලපෑම් එල්ලකල වසරක් වුවද අනාගතය පිළිබඳ සුබවාදීවීමට අවශ්‍ය පසුබිම 2024 සමාලෝචිත වර්ෂයේ දී ලබා ගෙන තිබූ කාර්ය සාධනය හේතු වී තිබිණි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රධාන වශයෙන් පාරිභෝගික තැම්පතු මත පදනම් වූ බැංකුවක් වන අතර එයින් 95% ක් කාල තැම්පතු වෙයි. මීට අමතරව ඒ ටී එම් පහසුකම් නැති සීමිත ශාඛා ජාලයක් මෙන්ම දැනට ඩිජිටල් කරණය කෙරෙමින් පවතින හෙයින් අඩු පිරිවැය අරමුදල් ලබා ගැනීමේ සීමිත හැකියාවක් ද පැවතිණි. වර්ෂය තුළ තැම්පතු සඳහා වන සාමාන්‍ය පොලී අනුපාත 20.5% ක් දක්වා ඉහළ ගිය අතර පොලී ආදායම සාපේක්ෂව 11% ක ප්‍රමාණයකින් මඳ වශයෙන් පහත වැටුණි. මෙයට අතිරේක වශයෙන් බැංකුව අඩු ආදායම් ලාභී ණය ගැනුම්කරුවන් ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර මෙම සියලුම කරුණු රුපියල් බිලියන එකක පමණ අලාභයක් ලැබීමට හේතු වී තිබිණි. කෙසේ වෙතත් සාර්ව ආර්ථික ස්ථායිතාවයට, උද්ධමන පාලනයට හා ආර්ථික කටයුතුවලට ස්තුති වන්නට හිතකර මූල්‍ය ප්‍රතිපත්ති තත්ත්වයක් මෙන්ම බාහිර අංශයේ පුනර්ජීවනය හේතුවෙන් සියලු කටයුතු තරමක් වර්ධනයට හේතුවූ අතර ගමන් කළ යුතු දීර්ඝ දුෂ්කර මාවතක් තිබියදීත් අයහපත් දේ අප පසුපස පවතින බව වටහා ගැනීමට හේතු සාධක තිබිණි. රුපියල් මිලියන 32 ක ලාභයක් ලැබීම සාමාන්‍ය පරිසරයක් යටතේ ඉහලින් අගයකළ නොහැකි නමුත් බැංකුවට සිය කටයුතු කරගෙන යෑමට තිබූ සන්දර්භය සලකා බැලීමේ දී එය 2025 වසරේ දී වඩා යහපත් කාර්ය සාධනයක් සඳහා නැවුම් හැඟීමක් මෙන්ම අපේක්ෂාවක් ද ජනිත කරවයි.

2022 වර්ෂයේදී පැවති අපේක්ෂා බිඳ වැටීමේ තත්ත්වයෙන් රට ඉදිරියට ගමන් කිරීම බැංකුවටත් අදාළ ක්ෂේත්‍රයටත් එක ලෙස බලපා තිබූ අතර 2023 වසරේ තිබූ බලාපොරොත්තු සහගත තත්ත්වය 2024 වර්ෂය වන විට දැඩි විශ්වාසයක් ගොඩනැඟීමට සමත් වී තිබිණි. ආර්ථික අවිනිශ්චිතතාවයන් හමුවේ ධනාත්මක ප්‍රතිඵල ලබා ගනිමින් බැංකු ක්ෂේත්‍රයේ උපායමාර්ගික කඩිනම් බව සහ කැපී පෙනෙන ඔරොත්තුදීමේ හැකියාව 2024 වසරේදී සනිටුහන් වී තිබිණි. ගනුදෙනුකරුවන්ගේ සංකීර්ණ මූල්‍ය අවශ්‍යතා සඳහා ගැලපෙන පරිදි සුදුසු මූල්‍ය විසඳුම් ලබා දීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ඇති අධිෂ්ඨානය ශක්තිමත් කරමින් ඉදිරියට ගමන් කර තිබිණි.

2024 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ බැංකුවේ මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය මගින් වඩාත් ස්ථායි ආර්ථික පරිසරයක් සහ එහි ගතිකත්වය ප්‍රකාතිමත් වූ බැංකු ක්ෂේත්‍රයක් තුළ පාර්ශවකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමේදී ලබාගත් සුබවාදී වාතාවරණයක් තුළය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව තුළ පාර්ශ්වකරුවන් අතර ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අධිෂ්ඨානශීලී නව්‍ය ප්‍රවේශයන් මගින් විශාල ලෙස ලබා ගත් ලාභදායිත්වය, යහපත් ද්‍රවශීල තත්ත්වය හා ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිළිබඳ ධනාත්මක කාර්යසාධනයක් සමගින් වසර තුළදී විශ්වාසනීයත්වය ප්‍රකටකර තිබිණි. මෙය 2023 වසර හා සැසඳීමේදී ශුද්ධ පොලී ආන්තිකයේ 1-3% ක වර්ධනයක්, 38% කින් අරමුදල් පිරිවැය අඩුවීමත් මගින් නිරූපණය වී තිබිණි. සමෘද්ධි ප්‍රතිලාභීන්, කාන්තාවන් හා ළමුන් ඉලක්කගත කර ඉහළ පිරිවැයක් සහිත තැම්පතු ප්‍රවර්ධනය නොකරමින් ආයතනික නොවන තැම්පතු වෙත මාරුවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉතුරුම් කළඹ රු. බිලියන 1.3 ක් දක්වා වැඩිවී තිබිණි. යුද්ධ හමුදාව, යුද හමුදා සුභසාධන අංශය හා ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ආයතන ඉලක්ක කරගත් ඉහළ පිරිවැයක් සහිත ආයතනික තැම්පතු රු. බිලියන 10 දක්වා අඩු කිරීමට අපට හැකිවී තිබූ අතර එමගින් සැලකිය යුතු ලෙස ඒවා මත රඳා පැවතීම අඩුකර ගැනීමට ද හැකි වී තිබිණි.

මෙහෙයුම් පරිසරය

ඉකුත් වසරවලට වඩා 2024 වර්ෂයේදී දේශපාලනික වශයෙන් ස්ථාවර තත්ත්වයක් දක්නට තිබිණි. ප්‍රධාන මැතිවරණ දෙකක් පවත්වා ආණ්ඩු වෙනසක් සිදුවුවද මෙහෙයුම් පරිසරය කිසිදු බාධාවකින් තොරව නොවෙනස්ව පැවතිණි. ශ්‍රී ලාංකීය පාරිභෝගිකයින් දියුණුව කරා ගමන් නොකළත් උද්ධමනයේ අඩුවීම හා වසර අවසානයේ ඍණාත්මක තත්ත්වයට පත්වීම වැනි පහළ බැසීම් තත්ත්වයන් යටතේ එම තත්ත්වයන්ට අනුකූලව ජීවන රටාව සකස් කර ගැනීමට හැකියාවක් ඇති බව පෙනී ගොස් තිබිණි. වර්ෂය තුළදී පොලී අනුපාත පහළ බැස තිබිණි. ගෙවුම් ශේෂය පාලනය වීම, සංචිත සුළු ප්‍රමාණයකින් වැඩිවීම, සහ රට ශ්‍රේණිගත කිරීමේ වර්ධනයක් සමඟ මේ සියල්ලන්ගෙන්ම වඩා යහපත් සාර්ව ආර්ථික පරිසරයක් විද්‍යාමාන විය. සත්‍ය ලෙසම මෙයින් අදහස් වූයේ අන්තර්ජාතික බැංකු සමඟ ගණුදෙනු සිදු කිරීමේදී බැංකු අංශය ශක්තිමත් පදනමක සිටින බවයි. සමස්තයක් ලෙස වැඩි ආයෝජනයන්, පරිභෝජනයේ පුනර්ජීවනයක්, පාරිභෝගික වියදම් වැඩිවීමත් සිදුවී තිබිණි. නව බැංකු පනත සම්මතවීම සහ මහ බැංකු පනත සංශෝධනය කිරීමත් සමඟ ව්‍යවස්ථාදායක ප්‍රතිපාදනයන් වලද වෙනස්කම් සිදුවූ අතර එය කර්මාන්තයට සුබදායක ලෙස බලපා තිබිනි.

2024 වර්ෂයේ තුන්වන කාර්තුවේදී ආර්ථිකය ශක්තිමත් ලෙස 5.5% ක ප්‍රසාරණයක් වාර්තා කර තිබූ අතර වර්ධන වේගය දිගටම පැවතිණි. කර්මාන්ත නිෂ්පාදන, ව්‍යාපාර කටයුතු PMI නිෂ්පාදන සහ PMI ඉදිකිරීම් දර්ශක වැනි ඉහළ පෙළේ දර්ශකයන් දේශීය ආර්ථික කටයුතුවල ධනාත්මක නිරූපණයක් සිදුකර තිබිණි. මහ බැංකුවට අනුව බලශක්ති මිල ගණන් පහත වැටීමට අවධමනය අඛණ්ඩව දායකවී තිබිණි. ප්‍රධාන උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා අඩු අගයක පැවැති අතර, මූලික වශයෙන් විදුලිය හා ජල ගාස්තුවල පහළට ගැලපීම මෙන්ම ඉන්ධන මිල අඩුවීම හේතුවෙන් නුදුරු කාලයේදී ඍණාත්මකව පවතින බව ප්‍රක්ෂේපණය කර තිබිණි. මේ අතර මූලික උද්ධමනය ඉදිරි මාස කීපය තුළ තවදුරටත් මන්දගාමීවීමක් පෙන්වන අතර ඉන්පසු එය ස්ථායි තත්ත්වයට පත්වනු ඇත. උද්ධමනය 2025 වසරේ මැද භාගය වන විට ධනාත්මක බවට පත්වෙනු ඇති බවත් සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් අනුබලයක් ලැබෙන්නේ නම් මධ්‍ය කාලීනව 5% ක ඉලක්කගත මට්ටම කරා ක්‍රමයෙන් ළඟාවනු ඇති බවත් මහ බැංකුව පුරෝකථනය කරයි.

වෙළඳපල ද්‍රවශීලතාවය අතිරික්ත මට්ටම්වල පැවති අතර වාර ඉල්ලුම හේතුවෙන් මුදල් සංසරණය වැඩි විය. රජයේ මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය පහසුකරවීමට ප්‍රතිචාර වශයෙන් කෙටිකාලීන වෙළඳපළ පොලී අනුපාත පහල බැසීම ආරම්භවී තිබිණි. මේ අතර ඉදිරි කාලයේ දී අනෙකුත් වෙළඳපල පොලී අනුපාතයන් ද පහළට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කර තිබිණි. මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම නිසා නැවත වරක් බලපත්‍රලාභී වාණිජ බැංකුවල (LCBs) මූලික, ණය දීමේ අනුපාත පහළට ගමන් කිරීමේ ලක්ෂණ මතුවී තිබිණි. මේ අතර පුද්ගලික අංශයට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කර තිබූ ණය 2024 මාර්තු මාසයේ සිට සැලකියයුතු ලෙස පුළුල්විය.

කුඩා හා මධ්‍යපරිමාන ව්‍යවසායන්ගේ ණය අනුපාත අගෝස්තු හා සැප්තැම්බර් මාසවල අඛණ්ඩ ඉහළ යෑමකින් පසු 2024 ඔක්තෝබර් මාසයේදී පහළ ගිය බව සටහන් වී ඇත. රජයේ සුරැකුම්පත් ප්‍රතිලාභවල ද කැපී පෙනෙන අඩුවීමක් දක්නට තිබිණි. අපනයන ඉපයීම්වලට සාපේක්ෂව ආනයන වියදම් ප්‍රසාරණය වීම වෙළඳ ශේෂ හිඟය පුළුල් කළ අතර සංචාරක ඉපයීම් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණවල වර්ධනය බාහිර ජංගම ගිණුමට ධනාත්මක ලෙස දායක වී තිබිණි.

බහු පාර්ශවීය අරමුදල් සංක්‍රමණය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මිලදී ගැනීම් හේතුවෙන් මුළු නිල සංචිත යහපත් තත්ත්වයේ පැවතීමට මෙම කරුණු ඉවහල් වී තිබිණි.

එබැවින් 2024 වර්ෂයේ දී දේශපාලන අස්ථාවරත්වය, සැපයුම් අඩාලවීම, උද්ධමන පීඩනය සහ ඉහල පොලී අනුපාත වැනි ගැටළු මගින් සාර්ව ආර්ථික පරිසරය නිර්වචනය කිරීම සිදු නොකල අතර එමගින් බැංකු කර්මාන්තතය හරහා අනුවර්තනය වූ උපාය මාර්ග හා විචක්ෂණ තීරණ ගැනීමේ ක්‍රියාවලිය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වැනි ආයතනවලට ඇතුළුව මෙහෙයුම් කටයුතු සඳහා ධනාත්මක බලපෑමක් ඇතිකර තිබූ බවයි.

බැංකු අංශයේ කාර්ය සාධනය

බැංකු අංශයට වැඩි වූ ණය අවදානම, ද්‍රවශිල තත්ත්වයන් සීමා කිරීම්, නියාමන අවිනිශ්චිතතාවයන් හා පොලී අනුපාත අස්ථාවරත්වයට මුහුණ දීමට සිදුවූ අතර එහිදී ඉකුත් වසරේ පැවති කැළඹිලි සහගත ස්වභාවයෙන් 2024 වසරට බලපෑම් එල්ලවී නොතිබූ බව වාර්තා කිරීමට කැමැත්තෙමි.

2024 වර්ෂයේ නොවැම්බර් අවසානය වනවිට සමස්ථ වත්කම් රුපියල් ට්‍රිලියන 21.7 ක් ලෙස වාර්තා වී තිබිණි. ණය සහ ලැබිය යුතු දෑ රුපියල් ට්‍රිලියන 11.4 ක් සමඟ ශ්‍රී ලංකා රුපියල් ණය සහ විදේශ විනිමය ණය පිළිවෙලින් 80% ක් හා 20% ක් ලෙස ගණනය කර තිබිණි. තැම්පතු රුපියල් ට්‍රිලියන 17.8 ක් ලෙස හා ශ්‍රී ලංකා රුපියල් හා විදේශ විනිමය කොටස් පිළිවෙලින් 81% ක් හා 19% ක් ලෙස ගණනය කර තිබිණි. ශ්‍රී ලංකා රුපියල් ආයෝජන (93%) සහ විදේශ විනිමය ආයෝජන (7%) ක් ලෙස රුපියල් ට්‍රිලියන 8.4 ක් වූ අතර ණය ගැනීම් රුපියල් ට්‍රිලියන 1.3 ක් ලෙස දක්වා තිබිණි. ශ්‍රී ලංකා රුපියල් ණය ගැනීම් 83% ක් හා විදේශ විනිමය ණය 17% ක් ලෙස ගණනය කර තිබිණි.

රුපියල් බිලියන 238 කින් වත්කම් වර්ධනය වී තිබූ අතර රුපියල් ණය රුපියල් බිලියන 127ක් දක්වා ඉහළ ගොස් තිබිණි. මේ අතර තැම්පතු රුපියල් බිලියන 225 කින් ඉහළ ගොස් තිබිණි. ණය ගැනීම් රුපියල් බිලියන 14 ක අඩුවීමක් දක්නට තිබූ අතර ලාභදායිත්වය රුපියල් බිලියන 42 ක් ලෙස දැක්විණි.

වසරින් වසර 8% ක් ලෙස වර්ධනයක් පෙන්වමින් 2024 නොවැම්බර් අවසානයවන විට බැංකු අංශයේ වත්කම් සමස්ථ වශයෙන් රුපියල් ට්‍රිලියන 21.7ක් ලෙස වැඩිවී තිබිණි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ ණය සහ ලැබියයුතු දෑ නොවැම්බර් අවසානය වනවිට රුපියල් ට්‍රිලියන 11.4 කින් ඉහළ ගොස් 4.9% ක වර්ධනයක් පෙන්වා තිබූ හෙයිනි.

මෙම කාලය තුළදී 18.7% ක වසරින් වසර වැඩිවීමේ වර්ධනයක් පෙන්වමින් 2024 නොවැම්බර් මාසය අවසානය වන විට රුපියල් ට්‍රිලියන 8.4 ක් ලෙස බැංකු අංශයේ ආයෝජන වැඩිවී තිබිණි. 2024 නොවැම්බර් මාසය අවසානය වන විට රුපියල් ට්‍රිලියන 17.8 ක් සහ වසරින් වසර 8.3% ක වර්ධනයක් වාර්තා කරමින් තැම්පතු ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය බවට පත් වී තිබිණි. මෙම කාලය තුළදීම බැංකු අංශයේ ණය ගැනීම් බිලියන 13.9 ක් ලෙස පහළ බැස තිබූ අතර සමස්ථ වර්ධනය 0.4% ක් ලෙස දැක්විණි. මෙම කාලසීමාව ඇතුළත ද්‍රවශීල ආවරණ අනුපාත අවම අවශ්‍යතාවයන්ට වඩා ඉහලින් පවත්වාගෙන යෑමට හැකිවී තිබීම විශේෂයෙන්ම සඳහන් කිරීම වැදගත් වෙයි. 24.0% ක වර්ධනයක් පෙන්වමින් ඉකුත් වසරේ අදාළ කාලය හා සැසඳීමේ දී බැංකු අංශයේ ලාභදායිත්වය රු. බිලියන 42 කින් වැඩි වී තිබිණි.

බැංකු අංශයේ ලාභදායිත්වය සහ කාර්යක්ෂමතාවය කාර්යක්ෂමතාවයේ සහ ලාභදායිත්වයේ අනුපාත මගින් පෙන්වන පරිදි අදාළ කාලය තුළදී ස්ථාවර මට්ටමක පැවතිණි.

බැංකු විසින් ක්‍රියාවට නංවන ලද ණයකරුගේ තත්ත්වය නිරීක්ෂණය කිරීම ඇතුළු ණය තක්සේරු කිරීමේ දැඩි නීති හා රෙගුලාසි සහ ආර්ථික අවිනිශ්චිතතා ලිහිල්වීම හේතුවෙන් ණය අවදානම පෙර වසරට වඩා අඩු වැදගත්කමක් ගත් බව පැවසිය හැකිවේ. වෙනස්වන ගතිකත්වයට වේගයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය විචක්ෂණශීලී උපාය මාර්ගික පියවර ගැනීමද ඇතුළත්ව බැංකු වඩා යහපත් ද්‍රවශීලතා ස්ථාවරයක් පවත්වාගෙන ගොස් තිබිණි. බැංකු සාමාන්‍යයෙන් තාක්ෂණය හා පුද්ගල පුහුණුව සම්බන්ධයෙන් අවශ්‍ය වූ අලුත්වන රෙගුලාසි හා පෙළ ගැසීමට සමත් විය.

මෙම කාලය තුළදී අදාළ ක්ෂේත්‍රය විසින් විචක්ෂණශීලී අක්‍රීය ණය කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමටත් ලාභදායිත්වය හා අවදානම් කලමනාකරණය සැලකිල්ලට ගනිමින් තරගකාරී පොලී අනුපාත හඳුන්වා දීමටත් කටයුතු කර තිබිණි. පාරිභෝගික අත්දැකීම් වැඩි කිරීමට දායකවන ඩිජිටල් බැංකු සේවාවන් වෙත යොමුවන පාරිභෝගික කැමැත්ත ඉටුකිරීම සඳහා පරිවර්තනය, තාක්ෂණික යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම සහ සේවක කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වන මාර්ගයෙහි මෙම අංශය ගමන් කර තිබිණි.

කෙටියෙන් සඳහන් කළ විට බැංකු අවදානම් කළමනාකරණය සහ උපායමාර්ගික අනුවර්තන සඳහා ක්‍රියාශීලීව කටයුතු කරන අතර තාක්ෂණය හා නව්‍යකරණය සඳහා සැලකිය යුතු ලෙස ආයෝජන සිදු කරමින් කර්මාන්තය මුහුණ දෙන තීරණාත්මක අභියෝගයන්ට මුහුණ දීමට අවශ්‍ය පියවර ගත යුතු වෙයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාර්යසාධනය

ක්‍රියාශීලී බැංකු ක්ෂේත්‍රයේ අඛණ්ඩ වර්ධනය හා සාර්ථකත්වය සඳහා බැංකුව ස්ථානගත කිරීම වෙනුවෙන් නැගී එන අවස්ථාවන් සඳහා ආයෝජන සිදු කිරීමට සහ උපායමාර්ගිකව දුර දක්නා නුවණින් හා අවදානම් අවම කිරීමට ක්‍රියාකාරී පියවර ගනිමින් වර්ෂය ගෙවී යන විට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පසුගිය වසරේමෙන් කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාවක් හා අනුවර්තනය වීමේ හැකියාවක් ප්‍රදර්ශනය කර ඇත. ඉකුත් වසරවල බැංකුව මුහුණදුන් අභියෝග සැලකිල්ලට ගැනීමේ දී ලබාගත් ජයග්‍රහණ කෙසේ හෝ වැදගත් වූ අතර සමස්ථ කාර්යසාධනය යහපත් තත්ත්වයක පැවැතිණි. බැංකුව එම කාලපරිච්ඡේදය තුළදී අවිනිශ්චිතතාවය හා අස්ථාවරත්වය සාර්ථක ලෙස අවමකර තිබූ අතර විශේෂයෙන්ම නව තාක්ෂණය හා මුසුවූ බැංකු ක්‍රමය වෙත සංක්‍රමණය වීමේදී තීරණාත්මක මෙහෙයුම් ක්ෂේත්‍රවල කැපී පෙනෙන ප්‍රගතියක් ලබාගෙන තිබිණි.

සමාලෝචිත කාලය තුළදී මහ බැංකුවේ සියලුම නියාමන අවශ්‍යතාවයන්ට අනුගතවීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට හැකිවී තිබිණි. අප යථාතත්ත්වයට පත්වෙමින් සිටි අවස්ථාවක පසුවුවත් බැංකුවේ ද්‍රවශීල ආවරණ අනුපාතය (LCR) සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFER) යහපත් තත්ත්වයක පවත්වා ගැනීමට සමත්වී ඇත. සමස්ථ බැංකු ක්ෂේත්‍රයේම ණය වර්ධනය 8% ක් ලෙස පැවති අතර එය අපගේ වර්ධනය හා

සැසඳීමේදී අප අත්පත් කරගත් වර්ධනය බිලියන 3 ක් ලෙස දැක්විණි. ණය වර්ධනයත් සමග අතිරේක ගාස්තු ආදායම් ඉපයීම ආසන්න වශයෙන් රු. මිලියන 200ක් ලෙස ගණනය කර තිබූ අතර මෙමගින් බැංකුවට සිය ලාභදායිත්ව මට්ටම වැඩිකර ගැනීමට උපකාරී වී තිබිණි.

2024 වර්ෂය තුළ අපි නවතම අති නවීන බැංකු ක්‍රමයක් ද (The Temenos (T.24) Co-banking Solution)) ආරම්භකළ අතර එය සියලුම බැංකු මෙහෙයුම්වලට වේදිකාවක් විය. 2025 දී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හඳුන්වාදීමත් සමග අන්තර්ජාල බැංකුකරණය හා මුදල් මාරු කිරීම් සක්‍රිය කිරීමත් සමග ගනුදෙනුකරුවන්ට තවත් සේවාවන් සැපයීමට බැංකුවට හැකිවනු ඇතැයි අපේක්ෂා කරයි. එපමණක් නොව මෙම වර්ධනයන් සමග සමස්ථ බැංකු පද්ධතිය වඩාත් සුරක්ෂිතවනු ඇති අතර මනා ලෙස පාලනය කිරීමටද හැකියාවක් ලැබෙනු ඇත.

අප මුහුණ දෙන අභියෝග සහ අපට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග සැලකිල්ලට ගනිමින් අපි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතට සංශෝධන සිදු කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටිමු. මෙම ක්‍රියාවලියෙන් 60% ක පමණ ප්‍රමාණයක් දැනටමත් සම්පූර්ණ කර ඇති අතර එය පැහැදිලි ලෙසම සංකීර්ණ හා කල්ගතවන කටයුත්තක් වෙයි. මෙම ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමෙන් අපට තව තවත් නිෂ්පාදන හඳුන්වාදීමට ප්‍රත්‍යක්ෂ ලෙස හැකි වනු ඇත.

වෙළඳපලේ පවතින සියලුම අභියෝගයන්ට මුහුණ දීමට තවමත් අපට සිදුවී ඇති බව සඳහන් කළ යුතු වෙයි. කෙසේ වෙතත් ඉකුත් වර්ෂය තුළදී අපි රක්ෂණ සමාගම් වැනි සමහර පෞද්ගලික හා රජයේ ආයතන සමග සම්බන්ධවීම සිදුකර තිබිණි. ණය ගනුදෙනුකරුවන් සඳහා පහසුකම් සැලසීමට රක්ෂණ සමාගම් 12 ක් සමග අපි අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත්තෙමු. ජල බිල්පත් හා විදුලි බිල්පත් අපගේ බැංකුව හරහා ගෙවීමට පාරිභෝගිකයින්ට අවකාශ සලසා දෙන ලෙස ඉල්ලා ජාතික ජලසම්පාදන හා ජලඅපවහන මණ්ඩලය හා ලංකා විදුලිබල මණ්ඩලය සමග සාකච්ඡා පවත්වා ඇත. මේ අතර Webex-Pay සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර එමගින් අපගේ ගිණුම් වෙත තැම්පතු ලබා ගැනීමට ඔවුන්ගේ එම ක්‍රමවේදය භාවිතා කළ හැකි වෙයි.

ප්‍රධාන කාර්යාල ශාඛාව ඇතුළු ශාඛා 25 කින් සමන්විත ජාලයේ ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා බැංකුව ක්‍රියාවලියක නිරත වෙයි. ආයතනික සමාජ වගකීමේ ව්‍යාපාතියක් ලෙස පාරිභෝගිකයින්ට සහ අනාගතයේ දී පාරිභෝගිකයින් විය හැකි අයට පුහුණු/දැනුවත් කිරීමේ සැසිවාර මේ සඳහා පවත්වා ඇත. ඒ අනුව එවැනි සැසිවාර පහක් අනුරාධපුරය, බණ්ඩාරවෙල, රත්නපුර, යාපනය හා ගාල්ලේ දී පවත්වා ඇත.

19.28% ක ශක්තිමත් ප්‍රාග්ධන අනුපාතයකින් (CAR) බැංකුවේ මූල්‍ය තත්ත්වය ශක්තිමත්ව පැවතිණි. එය නියාමන අවශ්‍යතාවයන්ට වඩා බෙහෙවින් වැඩි අගයක පැවති අතර වෙළඳපල අස්ථාවරත්වයකදී පවා බැංකුවේ මූල්‍ය ස්ථායිතාවය තහවුරු කරමින් විය හැකි පාඩුවලට එරෙහිව ශක්තිමත් ආරක්ෂාවක් සලසයි.

කෙටිකාලීන වගකීම් ඉටු කිරීමට සහ අනපේක්ෂිත ද්‍රවශීල ගැටළුවලින් ආරක්ෂාවීමට නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාවයන් ඉක්මවා යමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රමාණවත් ද්‍රවශීලතා ආවරණයක් පවත්වා ගනී. බැංකුවේ ආයෝජන කළඹ පුළුල් කිරීමෙන් හා ඉලක්කගත වර්ධනය පිළිබඳ උත්සාහයන් කෙරෙහි අවධානය යොමු කිරීමෙන් වෙළඳපළ වෙත පිවිසීම හා ආදායම් ප්‍රවාහය ශක්තිමත් කරන උපායමාර්ගික විකල්ප කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා බැංකුව එහි කැපවීම තහවුරු කරයි. ආර්ථික බාධාවන්ගෙන් ලාභදායිත්වයට සිදුකරන බලපෑම අවම කිරීම සහ ක්ෂේත්‍රය තුළ බැංකුවේ තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා ආදායම් මාර්ග විවිධාංගිකරණය කිරීම අඛණ්ඩව සිදු කරමින් සිටියි.

වෙළඳපළ ප්‍රවිෂ්ඨත්වය පවත්වාගෙන යෑමට මෙන්ම ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගනිමින් රඳවා තබාගැනීමට අවශ්‍ය පියවර ගත් අතර, ඉදිරිපත් කරන නිෂ්පාදනවල විවිධාංගීකරණය වන අනුපූරකයක් හා දැඩි මිලකරණ තන්ත්‍රයක් ලෙස පැමිණි වැඩිවූ තරගකාරිත්වය ගැනද බැංකුව පෙර වසරේදී මෙන්ම හොඳින් දැනුවත් වී තිබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදල් පිරිවැය 13.98% සිට 9% දක්වා අඩුවිය. බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය පෙර වසරට සාපේක්ෂව 1% සිට 3.83% ක් දක්වා වැඩිවිය. පොලී නොවන ආදායම් අංශය සම්බන්ධයෙන් ගත්විට එය පෙර වසරට වඩා 111% ක වර්ධනයක් පෙන්වා තිබිණි. බැංකුවේ සමස්ථ ආදායම 221% කින් ඉහළ ගිය අතර ඉහළ පිරිවැය තැම්පතු අඩුවීම හේතුවෙන් තැම්පතු පදනම පසුගිය වසරට සාපේක්ෂව 7.7% කින් පහත වැටුණි.

මේ අතර ද්‍රවශීල ආවරණ අනුපාතයේ සාමාන්‍ය (LCR) 100% වඩා ඉහලින් පවත්වාගෙන ගොස් තිබුණි. තාක්ෂණය භාවිතා කිරීම සහ ඩිජිටල් පරිවර්තනය සඳහා වන ආයෝජන මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර ක්‍රියාවලි විධිමත් කිරීම යන බැංකුවේ උපායමාර්ගික දැක්මෙහි තීරණාත්මක අංගයක් ලෙස දිගටම පැවතුණි. මෙයට ඩිජිටල්කරණය වැඩිදියුණු කිරීම, සයිබර් ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ දැනුවත් තීරණ ගැනීම සඳහා දත්ත විශ්ලේෂණය උපයෝගීකර ගැනීම ඇතුළත් විය.

බැංකුව තම උපාය මාර්ගික වැඩපිළිවෙලේ අනිවාර්ය අංගයක් ලෙස මානව සම්පත් සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් වෙනස් වන වෙළඳපළ තත්ත්වයන් වලට මුහුණ දීමට හා ගනුදෙනුකරුවන්ට විශිෂ්ට සේවාවක් ලබාදීමට අවශ්‍ය කුසලතා හා හැකියාවන් ගෙන් සේවකයින් සන්නද්ධ කිරීම සඳහා පුහුණු වැඩසටහන් ස්වරූපයෙන් විවිධ වෘතිය සංවර්ධන වැඩ සටහන් වලට සේවකයින් සහභාගි කරවා ගැනීම සිදුකරයි. ඔවුන්ගේ අභිප්‍රේරණය සහ ඵලදායිතාවය තවදුරටත් රඳවා ගැනීම සඳහා බැංකුව කාර්යසාධන දිරි ගැන්වීම් සහ කුසලතා රඳවා ගැනීමේ උපාය මාර්ග ද භාවිතා කර ඇත. අතිරේක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම වෙනුවට බැංකුව දැනට සිටින කාර්ය මණ්ඩලය හෝ අවම බඳවා ගැනීමක් සමග සංක්‍රාන්ති සැලසුම් ක්‍රියාත්මක කළේය. වෙනත් අයුරින් ප්‍රකාශ කළහොත් සමාලෝචිත වසර තුළ මානව සම්පත් අවම අයුරින් භාවිතාකර තිබිණි.

පෙර වසරවල මෙන්ම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රධාන කරුණු තුනක් වටා කේන්ද්‍රගත වූ උපාය මාර්ගවන විචක්ෂණශීලි ද්‍රවශීලතා කළමනාකරණය, අක්‍රිය ණය කලමනාකරණය සහ කර්මාන්ත අංශයේ සාමාන්‍යයට වඩා අඩු අගයක හානිකරණය පවත්වා ගැනීම වැනි මාර්ගවලින් බැහැර නොවිය.

පිරිවැය කළමනාකරණ උපායමාර්ග හා අවසානයේ ණය හා අත්තිකාරම් මත ප්‍රතිලාභ වැඩි කර ගැනීම සඳහා ආයෝජන ආදායම් වැඩිකර ගනිමින් බැංකුව අවම අවශ්‍යතාවය වූ 100% ක් ඉක්මවා ද්‍රවශීල ආවරණ අනුපාතය 160% ක මට්ටමක පවත්වාගෙන ගොස් තිබිනි. 2024 වර්ෂය අවසානයේ දී බැංකුවේ අක්‍රිය ණය අනුපාතය කර්මාන්තයේ සාමාන්‍ය වූ 13% හා සැසඳීමේදී 17% ක් ලෙස වාර්තා වී තිබිණි. පොදු කාර්ය පිරිවැය අවම කිරීමට කළමනාකරන උපාය මාර්ග තිබියදීත් පසුගිය වසරේ සංඛ්‍යා හා සැසඳීමේදී 26% ක බැංකුවේ මෙහෙයුම් වියදමේ වැඩිවීමක්

දක්නට තිබිණි. මෙය සිදුවී ඇත්තේ අති නවීන තාක්ෂණය භාවිතා කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම නිසා සිදු වූ අතිරේක වියදම් වැඩිවීමෙනි. බැංකුවේ මෙම උත්සාහයෙන් ද ණය සහ අත්තිකාරම් වලින්ද ලද පොලී ආදායම 8% ක් ලෙස වැඩිවීමට හේතු වී තිබිණි.

මෙම විවිධ උත්සාහයන් හේතුවෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට විවිධ අංශ හරහා විවිධාංගීකරණය වූ යහපත් ණය කලඹක් පවත්වා ගනිමින් ස්ථාවර ණය වර්ධනයක් පවත්වා ගෙන යෑමට හැකි වී තිබිණි. බැංකුව ශක්තිමත් වත්කම් ගුණාත්මක භාවයක් පවත්වාගත් අතර විචක්ෂණශීලී කලමනාකරණ පිළිවෙත් මගින් අක්‍රිය ණය, කළමනාකරණය කළ හැකි මට්ටමකට ගෙන ඒමට දායක වී තිබිණි.

මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවර පොලී ආදායම, විචක්ෂණශීලි පිරිවැය කළමනාකරණය සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම මගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සිය ලාභදායිත්ව ඉලක්ක සපුරා ගෙන තිබිණි. පාරිභෝගික සේවය සහ සම්බන්ධය පිළිබඳව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පාරිභෝගික තෘප්තියට මුල්තැන දෙමින්, ඩිජිටල් බැංකු සේවා සැපයීම වැඩි දියුණු කරමින් පාරිභෝගිකයන්ට පහසු හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ක්‍රියාවලීන් විධිමත් කරමින් සිටියි.

සමස්ථයක් වශයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි කාර්යසාධනය, විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය, නව්‍යකරණය සහ පාරිභෝගික කේන්ද්‍රීයභාවය සඳහා වූ කැපවීම වර්ෂයතුල දී විදහා දක්වමින් අනාගතයේ දී තිරසාර වර්ධනයක් හා වටිනාකම් නිර්මාණය කිරීමක් සඳහා බැංකුව සූදානමින් සිටියි.

වැදගත් සන්ධිස්ථාන

ඩිජිටල් පරිවර්තනය සඳහා කැපවීම, නව්‍යකරණය හා පාරිභෝගික කේන්ද්‍රීයභාවය පිළිබඳ දක්ෂතාවය සහ ආයතනික සමාජ වගකීම සඳහා ඇති දැඩි කැපවීම මෙම වසරතුළ බැංකුවේ මෙහෙයුම් කටයුතුවල කැපී පෙනෙන ලක්ෂණ විය. මූලික බැංකුකරණ පද්ධතියක් (core banking system)ආරම්භ කිරීම සම්බන්ධයෙන් වැදගත් පියවර ගෙන තිබිණි. ඩිජිටල්කරණය වෙමින් පවතින බැංකු ක්ෂේත්‍රය තුළ ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ බැංකුවේ හැකියාව වැඩි දියුණු කරන අතරම, අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කරන බැවින්, ඩිජිටල් පරිවර්තනය සඳහා යන ගමනේ මෙය සුවිශේෂී ජයග්‍රහණයකි.

උපාය මාර්ගික ලෙස දිවයින පුරා විසිරී ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ශාඛා ජාලය ප්‍රජා සහභාගිත්වය වර්ධනය කිරීමේදී පදිංචිකරුවන් සමග අර්ථවත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටුකර ඇත. මෙම ශාඛා ඒවායේ අදාළ බල ප්‍රදේශය තුළ සමාජීය හා බැංකු ව්‍යාපාරය සම්බන්ධ වෙළෙඳ කටතුවලට සහභාගිවී ඇති අතර බැංකුවෙන් සේවාවන් ලබා ගන්නා ප්‍රජාවගේම අංගයක් බවට පත්වීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කැපවී සිටින බව තවදුරටත් ප්‍රකටකර ඇත. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ශාඛාවන් ද අර්බුදකාරී කාලවලදී ප්‍රජාවගේ දුක් ගැහැට හා සිතුම් පැතුම් මනාව අවබෝධ කරගනිමින් සහයෝගය ලබාදෙමින් තම පාර්ශව කරුවන්ගේ යහ පැවැත්ම තහවුරු කිරීම සඳහා ඇති කැපවීම වෙනුවෙන් ප්‍රතිචාර දක්වා තිබිණි.

ඉදිරි අනාගතය

තිරසාර සංවර්ධනය, මූල්‍යමය ඔරොත්තුදීමේ හැකියාව සහ පාරිභෝගික කේන්ද්‍රීය නව්‍යකරණය දෙස අවධානය යොමු කරමින් කෙටිකාලීන හා දිගුකාලීන යන ඉලක්ක දෙකම සඳහා සුදුසු තෝරාගත් උපායමාර්ගික මාර්ගය ඔස්සේ බැංකුව ඉදිරියට පියමන් කරනු ඇත. මේ සම්බන්ධයෙන් අප විසින් ආරම්භකර ඇති පරිවර්තනයන් සැලකිල්ලට ගනිමින් වෙනස්වන පාරිභෝගික මනාපයන් සහ වෙළඳපල ඉල්ලීම් ඉටුකර දීම සඳහා ඩිජිටල්කරණය සඳහා අඛණ්ඩව ආයෝජනය කරමින් බැංකු සිය ඩිජිටල් ක්‍රියාදාමය ශක්තිමත් කරනු ඇත.

මෙය ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ATM ජාලයක් ක්‍රියාත්මක කිරීම ඇතුළුව ජංගම දුරකථන යෙදවුම්, මාර්ගගත ක්‍රමවේදයන් සහ ඩිජිටල් ගෙවීම් ක්‍රම තවදුරටත් සංවර්ධනය කිරීමට හේතුවනු ඇත. මෙම ක්‍රියාමාර්ග එලඹෙන වර්ෂයේ දී නිසැක වශයෙන්ම පාරිභෝගික අත්දැකීම් විධිමත් කිරීමට හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට හේතු වනු ඇත. පුනර්ජනනීය බලශක්තිය හා කෘෂිකර්මය, කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායන් (SMEs) වැනි ප්‍රධාන අංශ ඉලක්ක කරගනිමින් බැංකුව එහි ණය කළඹ පුළුල් කිරීමටත් කටයුතු කරනු ඇත.

කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කිරීම සහ සම්පත් ප්‍රශස්ථකරණය හරහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පිරිවැය ප්‍රශස්ථකරණය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සඳහා පසුබට නොවනු ඇත. එබැවින් සමස්ථ පිරිවැය ඵලදායිත්වය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් අභ්‍යන්තර ක්‍රියාවලි විධිමත් කිරීම පොදු කාර්ය පිරිවැය අඩු කිරීම සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ කැපවීමක් සිදුකරනු ඇත.

දිගුකාලීන උපායමාර්ග අනුව තිරසාර මූල්‍ය කටයුතු සඳහා ආයෝජනය කිරීම, හරිත ණය දීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම හා පාරිසරික සංරක්ෂණය සහ සමාජ සුභසාධනය සඳහා දායක වන ව්‍යාපාති වෙනුවෙන් සහය ලබාදීම මගින් මූල්‍ය කාර්යසාධනය, සමාජීය සහ පාරිසරික වගකීම් සමග සමතුලිත කිරීම මගින් තිරසාර වර්ධනයක් අත්කර ගැනීම බැංකුව ඉලක්ක කරනු ඇත. දේශීය හා අන්තර්ජාතික වශයෙන් වෙළඳපළ පුළුල් කිරීම සහ විවිධාංගීකරණය දිගටම සිදුවනු ඇත. බැංකුව නව වෙළෙඳපළවල් හඳුනා ගැනීම, උපායමාර්ගික හවුල්කාරිත්වයන් ස්ථාපිත කිරීම සහ පවතින ජාල උපයෝගී කරගනිමින් තම ගනුදෙනුකාර පදනම සහ භූගෝලීය ප්‍රදේශය පුළුල් කරනු ඇත.

කර්මාන්තයේ පවතින ප්‍රවණතාවලට වඩා ඉදිරියෙන් සිටීමට සහ තරගකාරිත්වය වැඩි දියුණු කිරීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නව්‍යකරණය හා තාක්ෂණය යොදාගැනීමට ප්‍රමුඛත්වය දෙනු ඇත. මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, අවදානම් කලමනාකරණය වැඩිදියුණු කිරීම සහ පාරිභෝගික සහභාගිත්වය වැඩි දියුණු කිරීම සඳහා දත්ත විශ්ලේෂණය වැනි නැගී එන තාක්ෂණයන්හි ආයෝජනය කිරීම මෙයට ඇතුලත් වේ.

නිෂ්පාදන සම්බන්ධයෙන් ගත්කල රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් ප්‍රධාන වශයෙන් නිවාස ණය ලබාදීම සිදුකරයි. කෙසේ නමුත් 2024 වසර තුලදී බැංකුව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට සහයවීමේ උපායමාර්ගයක් ක්‍රියාකාරී ලෙස අනුග මනය කළ අතර සූර්ය බලශක්තිය මිලදී ගැනීම, ධීවර කර්මාන්තය, පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රතිමූල්‍ය ණය වැනි නව නිෂ්පාදන හඳුන්වා දී තිබිණි. මෙහි අරමුණවී තිබුණේ නිවාස අංශය මත තිබූ යැපීම අඩුකරලීමයි. විවිධාංගිකරණ උත්සාහයන් සත්‍ය ලෙසම සාර්ථකවූ අතර මෙම මාර්ගයේම ගමන් කිරීම සඳහා අපි සැලසුම් සකස්කර ඇත්තෙමු.

බැංකුවේ ණය කළඹ පුළුල්වීම හේතුවෙන් ඉලක්කගත ණයදීමේ කටයුතු සහ ක්ෂේත්‍ර විශේෂිත අවධානය ණය පරිමාවන්හි වර්ධනය වැඩි කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද සමස්ථ මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා මෙහෙයුම් සහ කාර්යක්ෂමතා ඉහල නැංවීම සඳහා සහ පිරිවැය ප්‍රශස්ථකරණ පියවර ක්‍රියාත්මක කිරීම මගින් බැංකුව එහි පිරිවැයට - ආදායම්

අනුපාතය අඩු කිරීමට අපේක්ෂා කරයි. පරිශීලක හිතකාමී ඩිජිටල් ක්‍රමවේද ලබාදීම සහ වැඩි දියුණුකල ඩිජිටල් බැංකු සේවා ක්‍රියාත්මක කිරීම නිසැක ලෙසම පාරිභෝගික සහභාගිත්වය සහ තෘප්තිමත්භාවය ඉහළ නංවනු ඇත.

දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයක් තහවුරු කිරීම සහ ආයෝජන මත ප්‍රතිලාභ උපරිම කිරීමට පිරිවැය කළමනාකරණ උපාය මාර්ග යන් ආරම්භ කිරීමට සහ ස්ථාවර ආදායම් වර්ධනයකට ළඟාවීම මගින් බැංකුව එහි ලාභදායිත්වය තිරසාර ලෙස වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදුකරනු ඇත.

ලුහුඬින් සලකන විට නව මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ අනාගත දැක්ම සහ උපාය මාර්ගික දිසානතිය, තිරසාර වර්ධනය, නවෝත්පාදනය, පාරිභෝගික කේන්ද්‍රීයභාවය සහ මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව ප්‍රමුඛතා බවට පත්කරනු ඇති අතර, එමගින් දිගුකාලීන සාර්ථකත්වය සහ පාර්ශවකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වේදිකාව සකසනු ඇත. මේ සියල්ල මගින් බැංකුව එහි මූලික වටිනාකම් සමග සමපාතවන සහ සමාජයේ අභිවෘද්ධිය සඳහා දායකවන බලපෑම් සහගත ප්‍රජා සහ පාරිසරික ව්‍යාපෘති සඳහා අඛණ්ඩව සහයෝගය ලබාදෙන අතර එමගින් වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස ශ්‍රී ලංකාවේ බැංකු කර්මාන්තයේ සහ ඉන් ඔබ්බට ධනාත්මක වෙනසක් සඳහා උත්පේරකයක් ලෙස එහි කීර්ති නාමය ශක්තිමත් කරනු ඇත.

ඇගයීම

හිටපු සභාපතිතුමා වන ජෝෂප් සුසෙයිදාසන් මහතාට, අපගේ නව සභාපතිතුමා වන මහීල් කුරගම මහතාට, අධ්‍යක්ෂ මණ්ඩලයට සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සමස්ථ කණ්ඩායමට 2024 වර්ෂය පුරා ලබා දුන් නොමඳ සහයෝගයට මම මාගේ කෘතඥතාවය ප්‍රකාශ කර සිටිමි. ඉදිරියට පියමන් කරමින් සිටින බැංකු ක්ෂේත්‍රය තුල තරගකාරිත්වය පවත්වාගෙන යෑමට සහ වටිනාකම් ලබාදීමට බැංකුවේ ඇති කැපවීම අපගේ ප්‍රගමනයට දායකවූ අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට සහ හවුල්කරුවන්ට තහවුරු කරමින් මම ඔවුන් වෙතද මාගේ කෘතඥතාවය පළ කර සිටිමි. සෑම අතින්ම විනය පවත්වාගැනීම සහතික කිරීම සඳහා අපගේ නියාමන ආයතන ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකර තිබිණි. දුෂ්කර වසරක් පුරා ඔවුන්ගේ මග පෙන්වීම් සඳහා මම ණයගැති වන අතර ඉදිරියටත් අඛණ්ඩ සහයෝගය අපේක්ෂා කරමි.

අවසන් වශයෙන්, මූල්‍යමය ඔරොත්තුදීමේ හැකියාව, නවෝත්පාදනය සහ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයට ප්‍රමුඛත්වය දීමට ඇති බැංකුවේ පූර්ණ කැපවීම ප්‍රකාශ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එමගින් එය අපගේ කොටස්කරුවන් සඳහා විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස අප සේවය සලසන ජන කණ්ඩායම් තුළ ධනාත්මක වෙනසක් සඳහා උත්ප්‍රේරණයක් ලෙස පවතින බව සහතික කරමි.

විශ්වාසී



තුෂාර අසුරමාන්න සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි

අධ්‍යක්ෂ මණ්ඩලය

අරුණ පී.
රණසිංහ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

අතුල සී. ගමගේ
මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

රෝහණ එල්.
වික්‍රමසිංහ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

මහීල් පී. කුරගම
මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

එම්. සී. ඩී. එල් සිල්වා
විධායක නොවන නිලබලයෙන් පත්වන අධ්‍යක්ෂ

ටිරෝන් ඒ.ජේ.එල්.
ගෝමිස් මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

මහීල් පී. කුරගම මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2024 ඔක්තෝබර් මස 04 දින මහීල් පී කුරගම මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සභාපතිවරයා ලෙස පත්කර තිබිනි. බැංකු අංශයේ ආදර්ශමත් සේවාවක් සමග මූල්‍ය හා බැංකුකරණ කටයුතු පිළිබඳ වසර 32 ක පුළුල් පළපුරුද්දක් ලබා ඇති කුරගම මහතා කීර්තිමත් මූල්‍ය ප්‍රවීණයෙකි. සභාපතිවරයා ලෙස ඔහුගේ පත්වීමත් සමඟ නායකත්වය, උපායමාර්ගික සැලසුම් සහ මූල්‍ය කළමනාකරණය වැනි කරුණු පිළිබඳ පුළුල් දැනුම සිය තනතුරෙහි වැඩ කටයුතු කරගෙන යෑම සඳහා උපකාරීවෙයි.

කුරගම මහතා ඔහුගේ සේවා කාලය තුළ ශාඛා මෙහෙයුම්, පරිපාලනය සහ අභ්‍යන්තර විගණන යන අංශවල විවිධ තනතුරු උසුලා ඔහුගේ බහුශ්‍රැතභාවය හා විශේෂඥතාවය පෙන්වා ඇත. ප්‍රථමයෙන්ම ඔහු සම්පත් බැංකුවේ සේවය කළ අතර එහිදී ආයතනික කළමනාකරන කණ්ඩායමේ හා බැංකුවේ තාක්ෂණ උපදේශන කණ්ඩායමේ සාමාජිකත්වය දරා ඇත. උපාය මාර්ගික තීරණ ගැනීම, නවෝත්පාදන සඳහා අදහස් සහ මෙහෙයුම් විශිෂ්ඨතාවය තහවුරු කිරීම, පිළිබඳව ඔහුගේ දායකත්වය ඉතා වැදගත් විය. ඔහුගේ සේවා කාලය තුළ විශිෂ්ඨ නායකත්ව ලක්ෂණ හා කළමනාකරණ කුසලතා පෙන්වා තිබූ අතර එමගින් ඔහු සේවය කල ආයතනයේ නවීකරණය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට හේතු වී තිබිණි. බැංකු ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වය හා ගැඹුරු අත්දැකීම් සඳහා ඔහු සතුවූ කැපවීම හා ආයතනික ඉලක්ක වෙත ළඟාවීමට සහ වර්ධනය ඇති කිරීමට කැපවූ ඉහළ පෙලේ වෘතිකයෙක් ලෙස ප්‍රසිද්ධියක් ලබාගෙන තිබිණි.

ඇමෙරිකා එක්සත්ජනපදයේ හාවර්ඩ් ව්‍යාපාරික පාසලේ ආදි ශිෂ්‍යයකු වීමත් හා ඉහල පෙලේ ජාත්‍යාන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමත් ඔහුගේ වෘත්තිය සංවර්ධනයට ඇතුලත් වන අතර ඔහු සිංගප්පූරුවේ කීර්තිමත් ජාතික විශ්ව විද්‍යාලය ඇතුලු ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි සංවර්ධන වැඩසටහන් රැසකට සහභාගි වී ඇත.

මීට අමතරව කුරගම මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයකු වන අතර එමගින් වෘතිය සංවර්ධනය හා කර්මාන්ත ප්‍රමිති වැනි අංශ කෙරෙහි ඔහුගේ සහභාගිත්වය තවදුරටත් ප්‍රකටව පෙන්වයි.

අරුණ පී. රණසිංහ මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

අරුණ පී රණසිංහ මහතා 2025 ජනවාරි 22 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස පත්කර ඇත. වසර 20 ට අධික කාලයක් ඉක්මවා ඇති ඔහුගේ වෘතිය ජීවිතය මෙහෙයුම් අවදානම්, බැංකු මෙහෙයුම්, විගණනය හා මූල්‍ය සේවා පිළිබඳ ඔහුගේ ගැඹුරු ප්‍රවීනත්වය පිළිබිඹු කරමින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අගනා වත්කමක් බවට පත්වී ඇත.

අමෙරිකා එක්සත් ජනපදයේ ඇමරිකන් සිටි සරසවියෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන උපාධියක් රණසිංහ මහතා ලබාගෙන ඇත. මීට අමතරව ඔහු පහත සඳහන් සුදුසුකම් ලබා ඇත. ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාවක්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයෙන් භාණ්ඩාගාර හා විදේශ විණිමය මෙහෙයුම් පිළිබඳ සහතික පත්‍රයක් ද ලබාගෙන ඇත. එක්සත් රාජධානියේ අවදානම් කලමනාකරණය පිළිබඳ විශේෂතාවයක් උසුලන සුරැකුම්පත් හා ආයෝජන පිළිබඳ වරලත් ආයතනයෙන් මූල්‍ය ආයතනයන්හි මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ සහතිකයක්ද ඔහුගේ වෘතිය සුදුසුකම් අතර වෙයි.

රණසිංහ මහතා ඔහු දැනට දරණ තනතුරට පෙර ප්‍රසිද්ධ මූල්‍ය ආයතන ගණනාවකම ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු උසුලා ඇත. ඒ අතරට සවුදි අරාබියේ රියාද් නුවර සවුදි බ්‍රිටිෂ් බැංකුවේ ජේෂ්ඨ කලමනාකරු මෙහෙයුම් අවදානම් (අධීක්ෂණ), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජාත්‍යන්තර), සේලාන් බැංකුව, සවුදි අරාබියේ රියාද් නුවර සවුදි හොලන්ඩි (Hollandi) බැංකුවේ වෙළෙඳ නිෂ්පාදන සංවර්ධන ප්‍රධානී, මහජන බැංකුවේ වෙළෙඳ සේවා හා ආයතනික ශාඛාවේ ප්‍රධානී ලෙස සේවය කර ඇත. මීට අමතරව සවුදි අරාබියේ රියාද් නුවර ප්‍රොටිවිටි (Protiviti) කළමනාකරණ උපදේශන සේවයේ සවුදි බ්‍රිටිශ් බැංකුවේ විගණන කණ්ඩායමේ ආරාධිත විගණකවරයකු ලෙස සේවය කරන අතරතුර විශේෂ පැවරුම් හා උපදේශනය පිළිබඳ කටයුතු බාරවද ක්‍රියාකර තිබිනි. සවුදි ප්‍රැන්සි බැංකුවේ (Fransi Bank) මෙහෙයුම් කලමනාකරණය සඳහා උපදේශනය හා තාක්ෂණ දැනුම ද ලබා දී ඇත.

රණසිංහ මහතා දැනට වෘතිය හා ජාත්‍යන්තර අධ්‍යයන කටයුතු පිළිබඳ විද්‍යායතනයේ (The Academy for Professional and International Studies (Pvt) Ltd) අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරන අතර 2019 පෙබරවාරි 08 දින ඒ සඳහා පත්වීම ලබා තිබිනි. පරිපාලනය, දේශන පැවැත්වීම හා අධ්‍යාපන නායකත්වය ඔහුගේ කාර්යභාරයට ඇතුලත් වෙයි.

අරුණ පී රණසිංහ මහතා ශ්‍රී ලංකාවේ හා සවුදි අරාබියේ ප්‍රධාන නායකත්ව තනතුරු උසුලා මූල්‍ය, අවදානම් කලමනාකරණ සහ බැංකු මෙහෙයුම් කටයුතු පිළිබඳ විශාල පලපුරුද්දක් සහිත දක්ෂ වෘතීය වේදියෙකි. ඔහුගේ පුළුල් විශේෂඥතාවය අවදානම් කලමනාකරණය, මෙහෙයුම් අධීක්ෂණය සහ උපායමාර්ගික බැංකුකරණ කටයුතු වන අතර එහි ප්‍රථිපලයක් ලෙස ඔහු සතුව මෙහෙයුම් අවදානම් සහ මූල්‍ය පද්ධති පිළිබඳ ගැඹුරු අත්දැකීමක් ඔහු දැනට උසුලන තනතුර වන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ තනතුරේ කාර්යභාරයට එකතු කරයි.

අතුල සී. ගමගේ මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2025 ජනවාරි 22 දින සිට බලපැවැත්වෙන පරිදි අතුල සී ගමගේ මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර ඇත.

බැංකු මෙහෙයුම් කටයුතු ණය කලමනාකරණය සහ සිල්ලර ණය යන ක්ෂේත්‍ර වල බැංකු අංශයේ වසර 25 ට අධික අගනා පලපුරුද්දක් ඔහු ලබා ඇත. කැළණිය සරසවියෙන් භෞතික විද්‍යාව සඳහා විද්‍යාවේදී උපාධියත් ව්‍යාපාර පරිපාලනය සහ කලමනාකරණය සඳහා ව්‍යාපාර පරිපාලනවේදී උපාධියත් එම විශ්ව විද්‍යාලයෙන්ම ලබාගෙන ඇත. මීට අමතරව ඔහු ශ්‍රී ලංකා ණය කලමනාකරණ ආයතනයෙන් ණය කලමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කටයුතු පිළිබඳව විභාගයේ මධ්‍ය පරීක්ෂණය සමත්වී ඇත.

ගමගේ මහතාගේ බැංකු කටයුතු ආශ්‍රිත පුළුල් වෘතිය ජීවිතය ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ජේෂ්ඨ තනතුරු ගණනාවක් පුරා පැතිර තිබූ අතර එහිදී ඔහු විවිධ ණය කලමනාකරණ කටයුතු හා

බැංකු කාර්යයන් හරහා බැංකුවේ වර්ධනයට හා සාර්ථකත්වයට දායකත්වයක් ලබා දී තිබිනි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය, සහකාර සාමාන්‍යාධිකාරී ණය සහ අයකර ගැනීම් අංශ, සහකාර සාමාන්‍යාධිකාරී - ශාඛා ණය සහ සහකාර සාමාන්‍යාධිකාරී - ශාඛා කලමනාකරණ අංශය ඔහු පෙර ඉසිලූ තනතුරු අතර වෙයි.

සිල්ලර බැංකුකරණයේ, ණය කලමනාකරණයේ සහ උපායමාර්ගික අධීක්ෂණයන්ගේ ශක්තිමත් අඩිතාලමක් සහිත ගමගේ මහතාගේ ගැඹුරු විශේෂඥතාවය අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇත. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඔහුගේ නායකත්ව පලපුරුද්ද විශේෂයෙන්ම ණය කටයුතු අධීක්ෂණය මගින් ඔහු රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වටිනා වත්කමක් ලෙස ස්ථානගත වී ඇත.

ටිරෝන් ඒ.ජේ.එල්. ගෝමිස් මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2025 ජනවාරි 22 දින ටිරෝන් ගෝමිස් මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර තිබිණි.

බැංකු ක්ෂේත්‍රයේ වසර 32 ට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇති ගෝමිස් මහතා බැංකු මෙහෙයුම් ශාඛා කළමනාකරණය සහ කළමනාකරණය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබාගෙන ඇත. මෙහෙයුම් සහ කළමනාකාරිත්වය යන දෙඅංශයේම ඔහුගේ පුළුල් වෘතිය ජීවිතය බැංකුවේ උපායමාර්ගික තීරණ සඳහා ඵලදායි ලෙස දායක වීමට අවශ්‍ය විශේෂඥ දැනුමෙන් ඔහුව සන්නද්ධකර ඇත.

එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය සහ වාණිජ්‍ය පිළිබඳ වාණිජවේදී උපාධිය ද ගොමිස් මහතා ලබාගෙන ඇත. තවද ඔහු ණය කළමනාකරණ ආයතනයෙන් ණය කලමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද කළමනාකරණය පිළිබඳ සෙලින්කෝ ආයතනයෙන් කළමනාකරණ ඩිප්ලෝමාවක් ද ලබාගෙන ඇත.

ගෝමිස් මහතා ඔහුගේ වෘතිය ජීවිතය පුරා ජ්‍යේෂ්ඨ තනතුරු කීපයක්ම දරා ඇති අතර 2023 ජනවාරි මාසයේ සිට මැක්ස් පී.බී.සී හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ (Max PBC Holdings (Pvt) Ltd) සාමාන්‍යාධිකාරීවරයා ලෙස ඔහුගේ මෑත කාලීන භූමිකාව දරයි. බැංකුකරුවෙකු ලෙස ගෝමිස් මහතා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සේවයකර වසර 32 ට අධික පලපුරුද්දක් ලබා ඇති අතර එහිදී ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්, සහකාර සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ ප්‍රාදේශීය කලමනාකරු - මෙහෙයුම් යන තනතුරුවල සේවය කර ඇත.

ගෝමිස් මහතාගේ ශාඛා කළමනාකරණය, මෙහෙයුම් සහ සාමාන්‍ය කලමනාකරණය පිළිබඳ පුළුල් පලපුරුද්ද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අගනා වත්කමක් වනු ඇත. ඔහුගේ නායකත්වය සහ කලමනාකරණ විශේෂඥතාව විශේෂයෙන්ම විශාල බැංකු ජාලයන්හි ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම බැංකුවේ අඛණ්ඩ සාර්ථකත්වය සහ උපාය මාර්ගික වර්ධනය සඳහා ඉවහල්වනු ඇත.

රෝහණ එල්. වික්‍රමසිංහ මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2025 ජනවාරි මස 31 දින දොන් රෝහණ ලාල් වික්‍රමසිංහ මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර ඇත. මූල්‍ය විගණනය, බදුකරණය සහ ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ වසර 32 ට අධික පුළුල් පලපුරුද්දක් සමග ඔහු බැංකුව සමග එක්වී ඇත. බැංකු අධීක්ෂණය සහ උපායමාර්ගික ප්‍රතිපත්ති සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මූල්‍ය නියාමනය, අභ්‍යන්තර විගණනය සහ කළමනාකරණය තුළ ඔහුගේ කීර්තිමත් වෘතිය ජීවිතයේ ප්‍රධාන භූමිකාවන් විහිදී යයි.

වික්‍රමසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇත. ශ්‍රී ලංකා වරලත් ගලකාධිකාරී ආයතනයේ මූලික හා ආවසරික පරීක්ෂණ ඔහු සම්පූර්ණකර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ සහතිකලත් මූල්‍ය සේවා විගණකවරයකු ද වෙයි. තවද ඇමෙරිකා එක්සත් ජනපදයේ තොරතුරු පද්ධති විගණන හා පාලන සංගමයේ සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරයකු ද වෙයි.

මූල්‍ය පාලනය හා නියාමන කටයුතු සඳහා දායක වෙමින් ශ්‍රී ලංකාවේ හා ඕමානයේ ප්‍රසිද්ධ ආයතන ගණනාවකම වික්‍රමසිංහ මහතා වැදගත් තනතුරු උසුලා තිබිණි. ඔහු ඕමානයේ මහ බැංකුවේ බැංකු විශේෂඥ තනතුරක් හොබවා ඇති අතර එහිදී බලපත්‍රලාභී මූල්‍ය ආයතන පරීක්ෂාව, කාර්යමණ්ඩල පුහුණු කිරීම සහ ඕමානයේ බැංකු හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා සහය දැක්වීමේ වගකීම ද දරා තිබිණි.

වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර බැංකු පරීක්ෂක, බැංකු පරීක්ෂක සහ ප්‍රතිපත්ති අංශයේ ප්‍රධානී ලෙස තනතුරු ද හොබවා ඇත. වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයකල දීර්ග කාලය තුල බලපත්‍රලාභී මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමන ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ ප්‍රධාන භූමිකාවක් ද උසුලා තිබිනි.

බැංකු නියාමනය, අභ්‍යන්තර විගණනය, බදුකරණය සහ ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ඔහුගේ පුළුල් විශේෂඥතාව හේතුවෙන් වික්‍රමසිංහ මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට අගනා සම්පතක් වෙයි. මූල්‍ය සේවා විගණනය අභ්‍යන්තර විගණනය සහ තොරතුරු තාක්ෂණික පද්ධති විගණනය පිළිබඳ ඔහුගේ පෘථුල දැනුම සමග සම්බන්ධ වූ කැපී පෙනෙන නායකත්ව පලපුරුද්ද බැංකුවේ උපාය මාර්ගික තීරණ හා පාලනයට දායක වීමට ඔහුව ස්ථානගත කර ඇත.

එම්.සී. ඩී. එල් සිල්වා

විධායක නොවන නිලබලයෙන් පත්වන අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගෙන ඇත. ඔහු වසර 30 කට වඩා පලපුරුද්දක් ඇති පලපුරුදු ගණකාධිකාරීවරයෙකි.

ඔහුගේ සුදුසුකම් අතර ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය, රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ අධි සාමාජිකත්වය, සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකු සහ වරලත් රාජ්‍ය මූල්‍ය කලමනාකරන ගණකාධිකාරීවරයෙකු සහ වරලත්

රාජ්‍ය මූල්‍ය ගනකාධිකාරි ආයතනයේ සාමාජිකත්වය ද දරයි. රාජ්‍ය මූල්‍ය කලමනාකරණය, භාණ්ඩාගාර ණය කලමනාකරණය විගණනය සහ රාජ්‍ය ප්‍රසම්පාදන අංශයන්හි විශේෂඥතාවයක් උසුලයි.

ජෝශප් එම්. සුසෙයිදාසන් මහතා

පත්වීම් කාලය:

2023 මාර්තු 17 සිට 2024 ඔක්තෝබර් 04 දක්වා

ජෝසප් එම් සුසෙයිදාසන් මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සභාපතිවරයා ලෙස 2023 මැයි 17 දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කර ඇත. වෘතියෙන් කළමනාකාර ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ අධි සාමාජිකයෙකි. ඔහු මූල්‍ය පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් විවිධ ජ්‍යේෂ්ඨ විධායක සහ විධායක නොවන වෘතීන්හි පුළුල් පලපුරුද්දක් ඇති දක්ෂ වෘතිකයෙකි. විශේෂයෙන්ම පාලනය හා උපායමාර්ගික අධීක්ෂණ ක්ෂේත්‍රවල ඔහුගේ සම්බන්ධතාවය තිබූ ආයතන හැඩගැස්වීමට ඔහුගේ දායකත්වය ඉවහල් වී තිබිණි. ඔහුගේ පුළුල් දැනුමේ පසුබිම දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපල ද්විත්වයේම පැතිරී පවත්නා අතර එය ඔහු ව්‍යාපාරික ලෝකයේ දැවැන්තයෙක් ලෙස ස්ථානගත කරයි. ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ - හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පීඑල්සී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - සීමාසහිත ට්‍රෙන්ඩ් සෙටර්ස් (පුද්ගලික) සමාගම, සාමාන්‍යාධිකාරි - ටයිමෙක්ස් ඇන්ඩ් පර්ගසම් සමූහ ව්‍යාපාරය, සාමාන්‍යාධිකාරි / උපදේශක - සීමාසහිත ස්ටාර් ඇපරල් සමාගම ටැන්සානියාව, සාමාන්‍යාධිකාරි - සීමාසහිත එල්.එම්. කලෙක්ෂන් (පුද්ගලික) සමාගම සහ මූල්‍ය හා පරිපාලන කළමනාකරු - පෙගසස් රීෆ් හෝටලය ඇතුළු විවිධ තනතුරු ගණනාවක්ම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සභාපතිවරයා ලෙස පත්වීමට පෙර දරා ඇත.

මහාචාර්ය ඩී. අමින්ද එම්. පෙරේරා මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:

2023 මාර්තු 21 දින සිට 2025 ජනවාරි 22 දක්වා

ඉහළ අධ්‍යාපන පසුබිමක් ඇති ඔහු KEISEI ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් හා වයඹ විශ්ව විද්‍යාලයෙන් අලෙවිකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ද ලබා ඇත. මීට අමතරව ඔහු ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධි විවෘත විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී සාමාන්‍ය උපාධිය ලබාගෙන එම ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් ලබා ඇති අතර වයඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද ලබාගෙන ඔහුගේ විශේෂඥතාවය ප්‍රගුණකරගෙන තිබිණි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය කලමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියෙන් ඔහු ඔහුගේ ප්‍රාථමික දැනුම රැස්කරගෙන තිබූ අතර ඔහුගේ අධ්‍යාපනික සුදුසුකම් වලට අමතරව ඔහුට ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ සම්මානිත සාමාජිකත්වය උසුලමින් ශාස්ත්‍රාලීය හා වෘතීය අංශයෙන් විවිධ හා පුළුල් කුසලතාවලියක් පෙන්වයි.

බුද්ධික ආර්. මඩිහහේවා මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:

2023 මැයි 02 දින සිට 2025 ජනවාරි 22 දක්වා

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හා ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ලබා ගනිමින් ඔස්ට්‍රේලියාවේ ඇඩිලේයිඩ්හි ඕස්ට්‍රේලියන් ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස් ආයතනයෙන් ඔහුගේ වැඩිදුර අධ්‍යාපන කටයුතු ආරම්භකර තිබිණි. වෘතිය සංවර්ධනය සඳහා ඔහුගේ ගවේශණය වරලත් වෘතිය කලමනාකරුවන්ගේ අධි සාමාජිකයකුවීමටත් ශ්‍රී ලංකා අලෙවිකරන ආයතනයේ සහතික ලත් සාමාජිකයකුවීමටත් ඔහු මෙහෙයවා ඇත.

තවදුරටත් ඔහුගේ තත්ත්වය ඔසවා තබමින් ව්‍යාපාර විධායකයින්ගේ සංගමයේ සහ වරලත් කලමනාකරන ආයතනය යන ආයතන දෙකෙහිම අධි සාමාජිකයකු වන ඔහු කලමනාකරණ අංශයේ හා වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකත්වයට අමතරව අවුරුදු 30ට අධික ජ්‍යේෂ්ඨ කලමනාකාරිත්ව පලපුරුද්දක් සමඟ ඔහුගේ වෘතිය ජීවිතය නායකත්වය, විශිෂ්ඨත්වය සහ ව්‍යාපාරික ක්ෂේත්‍රය සඳහා වූ නොසැලෙන කැපවීමේ ගමන් මගක් ප්‍රකට කරයි.

සැම්සන් කේ. ඒ. ගලප්පත්ති මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:

පලමු පත්වීම - 2020 ජනවාරි 02 සිට 2023 ජනවාරි 01 දක්වා
දෙවන පත්වීම - 2023 මාරතු 07 සිට 2025 ජනවාරි 31 දක්වා

කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇති ඔහු වසර 29 ට අධික කාලයක පලපුරුද්දක් සහිත නීතිඥවරයෙකි. ඔහු දිස්ත්‍රික් උසාවි, වාණිජ මහාධිකරණ, සිවිල් අභියාචනා මහාධිකරණ සහ කම්කරු විනිශ්චය සභා හරහා සිය සේවා කටයුතු සිදු කරමින් වාණිජ නීතිය, සමාගම් නීතිය, ඉඩම් නීතිය සහ කම්කරු නීතිය ඇතුළු පුළුල් පරාසයක නීති ක්ෂේත්‍රයන්හි විශේෂඥයකු වී ඇත.

මීට අමතරව ඔහු අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ රිට් අයදුම්පත් පරිපාලන නීතිය සහ මූලික අයිතිවාසිකම් නඩු කටයුතු පිළිබඳ ප්‍රවීණයෙකි. ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිතයකු වන අතර කොළඹ නීති සංගමයේ සහ වෘතියවේදීන්ගේ සංගමයේ ද සාමාජිකයෙකු වේ. මෙමගින් ඔහුගේ වෘතීය සඳහා ඇති පුළුල් විශේෂඥතාවය හා කැපවීම ප්‍රකටකර පෙන්වයි.

ආචාර්ය ආර්. ඒ. ටී. කපිල රණසිංහ මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම් කාලය:

2024 ජනවාරි 09 සිට 2025 ජනවාරි 22 දක්වා

2013 වර්ෂයේදී එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන් ලබාගත් උපායමාර්ගික සැලසුම් පිළිබඳ ආචාර්ය උපාධියත්, 2007 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ගණිතය පිළිබඳ ලබාගත් ව්‍යාපාර පරිපාලනවේදී උපාධියත් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලෙන් 2000 වසරේදී ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියත් පුළුල් අධ්‍යාපනික පසුබිමක් සහිත ආචාර්ය කපිල රණසිංහ මහතා සතුවේ. මීට අමතරව 2014 වර්ෂයේ දී ඇමරිකා එක්සත්

ජනපදයේ හාවඩ් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කටයුතු පිළිබඳ උපායමාර්ග හා නවෝත්පාදනය සම්බන්ධ වෘතිය සුදුසුකම් කපිල රණසිංහ මහතා ලබාගෙන ඇත.

ආචාර්ය රණසිංහ මහතා දැන් එක්සත් රාජධානියේ C2L ආයතනයේ අධ්‍යක්ෂක ලෙස සේවය කරන අතර සීමාසහිත පයනියර් ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජී (පුද්ගලික) සමාගමේ (Pioneer Institute of Business and Technology (Pvt) Ltd) සභාපති සහ සමූහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස ද සේවය කරයි.

ආචාර්ය රණසිංහ මහතා මීට පෙර විවිධ උපදේශන හා නායකත්ව තනතුරු දරා තිබිණි. කුසලතා සංවර්ධන අමාත්‍යාංශයේ කුසලතා සංවර්ධන අරමුදලේ සභාපති ලෙස සේවය කිරීම, සෞඛ්‍ය දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ආරම්භක සාමාජිකයකු / වැඩ බලන සභාපති ලෙස සේවය කිරීම එයට ඇතුළත්වේ. රණසිංහ මහතා පුද්ගලික සෞඛ්‍ය අංශ නියාමන කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හා ශ්‍රී ලංකා තත්ත්ව සහතික ආයතනයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අමාත්‍ය උපදේශක ලෙස ආචාර්ය රණසිංහ මහතා කටයුතු කර තිබූ අතර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය සහ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වෙනත් අමාත්‍යාංශවල විවිධ තනතුරු දරා ඇත.

රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශයේම පරිපාලනය උපායමාර්ග සහ නායකත්වය පිළිබඳ පෘථුල පලපුරුද්දක් සහිත ආචාර්ය රණසිංහ මහතා ශ්‍රී ලංකාවේ හා අන්තර්ජාතිකව විවිධ ව්‍යාපාර හා නියාමන කාර්යයන් සඳහා අඛණ්ඩව දායකත්වය සපයයි.

ආයතනික කළමනාකරණය

අයි. ටී. අසුරමාන්න මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.
MBA, BSc. Eng., ACMA - UK, CGMA - UK, BMS, AM (IESL), MIEE- UK

කේ. එල්. එන්. ඒ. පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
MBA (Fin), FCA, B.Com.(Sp),SAT, HNDA, Dip. in Risk Management

එල්. ඩබ්ලිව්. සමරවික්‍රම මහතා
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය)
BSc (Sp) Estate Management & Valuation, AIV, ACBF - (IBSL

කේ. කේ. කපිල කිරිවැල්ල මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (අයකර ගැනීම්)
B.Com (Sp) Hons (USJ),PG.EX.Dip. in Bank Mgt (IBSL)

ඩබ්. කේ. කේ. තන්ත්‍රිගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)
MBA-PM, MDT,Bsc MIS, CLSSGB, CISE

එච්. ඒ. පී. එම්. සමන්තිලකා මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (නීති)
LLM,AAL

පී. ආර්. ඒ. ලසන්ත යු. කුමාර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් හා සැපයුම්)
MBA, BSc. HRM, ACIPM

ඒ. එම්. ඩී. එස්. අලහකෝන් මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
ACCS, Dip. ICSA (UK),LLB

පී. කුරුවිට මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ACA, ACMA, CGMA, AAT, DIP IT, IIA Member

ජ්‍යේෂ්ඨ කළමනාකරණය

එස්. වික්‍රමසිංහ මහතා
ප්‍රධාන කලමනාකරු (ණය)
B.Sc (EMV) (Sp) Hons., AIV

ආර්. එම්. යු. ඩී. බණ්ඩාර මහතා
ප්‍රධාන කලමනාකරු (මානව සම්පත් හා සැපයුම්)
MHRM,BSc BA (Sp),NDHRM., AMCIPM

අයි. එදිරිසූරිය මහතා
ප්‍රධාන කලමනාකරු (තක්සේරු)
MEM, B.Sc (EMV) (Sp) Hons. MRICS, AIV

ටී. තිලකරත්න මහත්මිය
ප්‍රධාන කලමනාකරු (නීති)
LLB,AAL

ඊ. ඒ. ඩී. ඩබ්ලිව් සේපාලිකා මහත්මිය
ප්‍රධාන කලමනාකරු (මූල්‍ය)
Bsc.ACC, ACA

ආර්. කේ. ඒ. එන්. රත්නායක මහත්මිය
ප්‍රධාන කලමනාකරු (අවදානම් කළමනාකරණ)
ACMA(UK), CGMA (UK), Dip.in Busisness Management, Dip in Integrated Risk Management (IBSL)

ජේ. එමිල්රාජන් මහතා
ශාඛා මෙහෙයුම් ප්‍රධානී (ශාඛා මෙහෙයුම්)
(Branch Operations)
BBA (Hons) in Finance, MBA in Finance

ඩී. ජී. කේ. විජේසිංහ මහතා
ජ්‍යේෂ්ඨ කළමණාකරු
(SME & Business Banking)
MBA (ARU),B.Sc BA (UOSJ),CMA (SL),Dip. Banking & Finance (IBSL)

ජේ. ටී. ආර්. රණවීර මෙනෙවිය
අනුකූලතා නිලධාරිනි (වැඩ බලන)
MBA (UK),ACMA/CGMA,AIB (Sri Lanka), Dip. In Compliance

ආයතනික පාලනය

ආයතනික පාලනය තුළින් විධායක කලමනාකරණයේ කාර්යසාධනය, ක්‍රමෝපායික තීරණ කොටස් කරුවන් වෙත ඔවුන්ගේ වගවීම සම්බන්ධයෙන් අධීක්ෂණය සහ පාලනය පිළිබඳ වැදගත් මූලධර්ම ඉස්මතු කර දක්වයි.

ආයතනික කාර්යසාධනය සහ අනාගත සංවර්ධනය සඳහා පදනමක් ලබා දෙන යහපත් ආයතනික පාලනයේ වැදගත්කම පිළිබඳ සාධකයට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි උපරිම සැලකිල්ල දක්වයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තීරණ ගැනීමේ ඉහළම බලධාරීන්වන අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුවේ මෙහෙයුම් හා මූල්‍යමය යහපත්බව සඳහා සමස්ත වගකීම පැවරී ඇති අතර, තැම්පත්කරුවන්, ණයහිමියන්, සේවකයින් සහ අනිකුත් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කිරීම සඳහා වගකිව යුතු වෙයි. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුකරණය, මූල්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය සහ අලෙවිකරණය යන අංශයන්ගේ ප්‍රායෝගික පළපුරුද්දක් ලබා ඇති වෘතිකයින් පිරිසකගේ සක්‍රීය එකතුවකි. ක්‍රමෝපායික, කාර්යසාධන සහ සම්පත් පිළිබඳව ගැටළු සම්බන්ධයෙන් ස්වාධීන, අපක්ෂපාතී සහ සෘජු තීරණ ගැනීමට අවශ්‍යවන දක්ෂතා සහ පළපුරුද්ද ඔවුන් සතුව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ක්‍රමෝපායික අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය ලබා දීම, ව්‍යාපාර පිළිබඳ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ කොටස් හිමියන්ට ඔවුන්ගේ කළමනාකාරිත්වය පිළිබඳ වාර්තා කිරීම සම්බන්ධ කටයුතු පිළිබඳ එහි පාලන වගකීම් අඛණ්ඩව ශක්තිමත් කරයි.

බැංකුවේ පාලන මූලධර්ම හා ව්‍යුහය ඵලදායී තීරණ ගැනීම ශක්තිමත් කරන අතර, ඉන් වඩා ඉහළ විනිවිදභාවය දිරිගන්වමින් ව්‍යාපාරයේ සෑම දිශාවක් තුළම වගවීම සිදුකරයි. බැංකුව විචක්ෂණශීලිව සහ දිවයිනේ හා පාලන අධිකාරීන්හි නීති හා රෙගුලාසි සහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති පිළිබඳ රාමුව තුළ පාලනය කෙරෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

බැංකුවේ තත්ත්වය සහ අනාගත කටයුතු සභාපතිතුමාගේ සමාලෝචනය/පණිවිඩය සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.ගේ සමාලෝචනය තුළ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

කෙසේවෙතත්, සදාචාර ආකාරයකින් බැංකුවේ ව්‍යාපාරය වර්ධනය කිරීම අත්‍යවශ්‍යයෙන් කළයුතු බැවින්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වගවීම, අවංකකම, සාධාරණත්වය, ආචාරවිධි සහ සදාචාර, නෛතික/නියාමන අනුකූලතාව, විනිවිදභාවය හා අනාවරණය සහ විශිෂ්ඨ කාර්යක්ෂමතා වැනි පදනම් තත්ත්වයන් සහ උපලක්ෂණ සහිත මූලික පදනම මත කටයුතු කිරීම ඉතා වැදගත් ය.

වගවීම

වගවීමේ ක්‍රමවේදයක් ඇති කිරීම ආයතනයක සාර්ථකත්වයට හේතුවන එක් ප්‍රධාන සාධකයක් වන හෙයින් බැංකුව ඉහත කරුණ පිළිබඳව මනා වැටහීමක් සහිතව එහි ක්‍රියාකාරකම් සඳහා වගකීම් බාර ගැනීමේ සංස්කෘතියක් සංවර්ධනයකර ඇත.

වගවීම පිළිබඳ සංකල්පය යහපාලනයේ එක් අඩිතාලමක් වන බව අවබෝධ කරගනිමින්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුවේ නිර්දේශ මත බැංකුවේ වාර්ෂික සහ අතුරු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අනුමත කරන අතර, මූල්‍ය ප්‍රකාශන මත තොරතුරු විනිවිදබාවයෙන් සහ නිසි ආකාරයෙන් බැංකුවේ පාර්ශ්වකරුවන්ට සහ පොදු මහජනතාවට වාර්තා කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන අතර, බැංකුව පුවත්පත්වල කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරයි. මේ මගින් බැංකුව එහි වගවීම මුදාහැරීමේදී එහි ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිවල විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය වැඩි කරයි.

බැංකුවේ ව්‍යාපාරයට අදාළ කරුණු සම්බන්ධයෙන් සියලුම නියාමන බලධාරීන් විසින් පනවනු ලබන අවශ්‍යතාවන්ට බැංකුව අනුකූල වී ඇත.

සාධාරණත්වය

ජාතියේ නිවාස බැංකුව බවට පත්වෙමින්, බැංකුව එහි උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ට නිවැරදි සහ සාධාරණ ආකාරයකින් සලකනු ලබයි. බැංකුව යහපත් තීරණ ගන්නා අතර, එම තීරණ ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස්හිමියන්, සැපයුම්කරුවන් සහ අවසාන වශයෙන් ප්‍රජාව වැනි යම් අයෙකුට පීඩාවත් නොමැතිව ව්‍යාපාර අවශ්‍යතාවන්ට සේවය කරන තීරණ වේ.

බැංකුව සියලුම ගනුදෙනුකරුවන් සඳහා වටිනා දෑ සිදුකරයි. ණය පහසුකම් ලබාදීමේදී, බැංකුව මාසිකව ගෙවීමේ හැකියාව වන එහි ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කරයි. බැංකුව අවසාන උපාය ලෙස පමණක් පැහැරහැරි ගනුදෙනුකරුවන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා අතර, අනපේක්ෂිත දුෂ්කරතාවන්ට ඔවුන් මුහුණපාන අවස්ථාවක සෑමවිටම ගනුදෙනුකරු සමඟ සිටීම මගින් ඉතා තරඟකාරී බැංකුකරණ කර්මාන්තයක් ලෙස ජාතියේ නිවාස බැංකුව වෙමින් බැංකුවේ දැක්ම සහ මෙහෙවර නගා සිටුවයි.

විනිවිදභාවය සහ අනාවරණය

ප්‍රාග්ධනය වෙන්කිරීම, ආයතනික ගනුදෙනු සහ මූල්‍ය කාර්යසාධන නියාමනය සම්බන්ධයෙන් කොටස්හිමියන්ට, පාර්ශ්වකරුවන්ට සහ අනාගත ආයෝජකයින්ට දැනුවත් තීරණ ගැනීම සඳහා ඔවුන්ට පදනම් ලබාදෙන බැවින්, විනිවිදභාවය සහ අනාවරණය ශක්තිමත් ආයතනික පාලන රාමුවක අත්‍යවශ්‍ය අංග වෙති. මූල්‍ය අර්බුදයට හේතුවන ප්‍රධාන දෝෂය මූලිකව ඇති වන්නේ මූල්‍ය අනාවරණයේ අඩුපාඩුව සහ ප්‍රමාණවත් නොවන පාලන භාවිතයන් මගින් බවට පොදුවේ එකඟ වී ඇත.

විනිවිදභාවය යනු ආයතනික පාලනයේ ප්‍රධාන පියවරවලින් එකක් වන අතර කළමනාකාරිත්වය අනිසි හෝ නීති විරෝධී හැසිරීම්වල නොයෙදෙන බව සහතික කරයි. මන්ද ඔවුන්ගේ හැසිරීම් පරීක්ෂාවට ලක්කල හැකි බැවිනි.

විනිවිදභාවය අත්කර ගැනීම පිණිස, බැංකුව නිවැරදි ගිණුම්කරණ ක්‍රම යොදාගැනීම, සමාගමේ තොරතුරු සම්පූර්ණයෙන් හා කඩිනමින් අනාවරණය කිරීම සහ අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාලන කොටස්හිමියන් යනාදියගේ බැඳියා පිළිගැටුම් අනාවරණය කිරීම කළයුතු බව බැංකුව තරයේ විශ්වාස කරයි. ඒ අනුව, බැංකුව එහි වාර්ෂික වාර්තාව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව, මූලික කාර්යසාධන දර්ශක, ව්‍යාපාර සංකේන්ද්‍රණ, ආයතනික පාලන ප්‍රකාශන සහ

මූල්‍ය ප්‍රකාශන අනාවරණය තුළින් එහි කටයුතුවල විනිවිදභාවය අනාවරණය කරන බව බැංකුව සහතික කරයි.

එමෙන්ම, බාසල් 111 රෙගුලාසි සහ පැහැදිලිව සහ පහසුවෙන් අවබෝධකරගත හැකි ශ්‍රී.ලං.මූ.වා. (SLFRS) ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරන කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය වාර්තා බැංකුව ප්‍රසිද්ධියට පත් කරයි. බැංකුවේ කටයුතුවල පොදු බැඳියාව සුරක්ෂිත කරන බව මේ මගින් සහතික කරයි. අවශ්‍ය රහස්‍යතාව කඩනොකර බැංකුවේ අවදානම් නිරාවරණ සහ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් සම්බන්ධ ප්‍රධාන කරුණු පිළිබඳ එහි අනාවරණ බැංකුව විසින් කළ යුතුය යන්න පිළිගැනීම මගින්, විධිමත් වාර්තා අතර ඇතිවන සියලුම වැදගත් සංවර්ධනයන් අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව නීතිය මගින් අවශ්‍යකරන පරිදි අදාළ බලධාරීන්ට සහ පාර්ශ්වකරුවන්ට අනාවරණය කරනු ලැබේ.

2024 වසර කාලසීමාවේදී, බැංකුව තුළ වාර්තා වූ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කිසිවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ එහි සංශෝධනවල දක්වා ඇති පරිදි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් ආර්ථික හ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබ ඇති අතර, විවිධ ක්ෂේත්‍රවල දැනුම සහිත සුදුසු සහ යෝග්‍ය ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් නව දෙනෙකුගෙන් සමන්විත වේ. එකී සාමාජිකයින් නවදෙනාගෙන් අධ්‍යක්ෂවරු තිදෙනෙක් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යංශයේ අමාත්‍යවරයාගේ, නිවාස විෂයභාර අමාත්‍යංශයේ අමාත්‍යවරයාගේ සහ පශුසම්පත් විෂයභාර අමාත්‍යංශයේ අමාත්‍යවරයාගේ නියෝජිතයින් විය යුතුය. එයට හේතුව මූල්‍ය සහ අනෙකුත් සහය ලබාදීම මගින් කෘෂිකර්මය, කර්මාන්ත සහ නිවාස සංවර්ධනය තුළ පොදු ජනතාවට සහයවීම බැංකුවේ අරමුණ වීමයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ දායකවීමේ මඟපෙන්වීම්වල ප්‍රමාණවත් බල තුලනයක් සහ අඛණ්ඩතාවයක් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සංයුතිය මගින් සහතික කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළ මට්ටමේ උපාය මාර්ගික තීරණ ගැනීම අධීක්ෂණය කරමින් බැංකුවේ සමස්ථ වගකීම් සහ වගවීම භාරගන්නා අතර සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි වෙත ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ බලය පවරා ඇති අතර ඔහු මූලිකත්වය ගන්නා සහ ඔහු විසින් නායකත්වය සහ උපදෙස් ලබාදෙන ආයතනික කළමනාකරණ කණ්ඩායම තුළින් විධායක බලය ක්‍රියාවට නංවයි. බැංකුවට ඵලදායී නායකත්ව ව්‍යුහයක් ඇති අතර ඉන් අධ්‍යක්ෂ මණ්ඩලයට කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීමට ඉඩලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය, ඔවුන්ගේ තීරණ, පළපුරුද්ද සහ ප්‍රවීනත්වය මත විශ්වාසය තබමින්, බැංකුවේ උපාය මාර්ගික ප්‍රමුඛතාවන්ට සමගාමීව සම්පත්වල ඵලදායී භාවිතය, ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සහ සක්‍රීය අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් සහතික කිරීම සඳහා ආයතනික කාර්ය මණ්ඩලය වෙත මනා අධ්‍යක්ෂ මණ්ඩලයක් ලෙස සහ මගපෙන්වීමේ මූලාශ්‍රයක් ලෙස සේවය කරයි.

සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ ශක්තිමත් බැඳීම සහ දුරදර්ශී මගපෙන්වීම අනුව, බැංකුවේ පාලනය ඉදිරියටත් සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මාසයකට වරක් අවම වශයෙන් මුණ ගැසෙන අතර, 2024 වසර තුළ, රැස්වීම් 14 ක් පවත්වා ඇත.

සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරීට ආරාධනය කෙරේ. පැමිණීම අවශ්‍යනම් පමණක් උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය, සමාජ හා පාරිසරික කාර්යසාධනය, මෙහෙයුම් පරිසරයෙන් ඇතිකළ වෙනස්වීම් සහ අභියෝග, නිර්දේශිත ප්‍රතිපත්ති රාමු සහ විධායක පාලන ව්‍යුහ පිළිබඳ ප්‍රගතිය ඇතුළු කරුණු සම්බන්ධයෙන් විස්තර කිරීම සඳහා වෙනත් යම් විධායක නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කැඳවනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපාර අවස්ථාවන් සහ බැංකුව නිරාවරණය වන ප්‍රධාන අවදානම් සැලකිල්ලට ගනිමින් ආයතනික සැලැස්ම, කාර්ය සැලැස්ම සකස් කිරීම බැංකුවේ මෙහෙවර, දැක්ම, ව්‍යාපාර පරමාර්ථ සහ උපාය මාර්ගික කලින්කල සමාලෝචන කර, තක්සේරු කර අනුමත කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමට පෙර සුදුසු බවට සලකා බලන බැවින් ක්‍රමෝපායික සැලැස්මට එවැනි සංශෝධන යෝජනා කරයි. කළමනාකාරිත්වය අනුමතකළ පරිදි ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

	අධ්‍යක්ෂවරයාගේ නම	පත්වීමේ දිනය	අධ්‍යක්ෂවරයාගේ වර්ගීකරණය
1	එම්. පී කුරගම මහතා	04.10.2024	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
2	ජේ. එම්. සුසෙයිදාසන් මහතා - සභාපති (2024.10.04 දින ඉල්ලා අස්විය.	17.05.2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
3	එච්. සී. ඩී. එල්. සිල්වා මහතා	11.01.2020	විධායක නොවන අධ්‍යක්ෂ
4	ඒ. පී. රණසිංහ මහතා	22.01.2025	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
5	ඒ. සී. ගමගේ මහතා	22.01.2025	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
6	එම්. ටී. ඒ. ජේ. එෆ්. ගොමිස් මහතා	22.01.2025	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
7	ඩී. ආර්. එල් රණසිංහ මහතා	31.01.2025	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
8	එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා	07.03.2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
9	පී. ආර්. මඩිහහේවා මහතා	02.05.2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
10	මහාචාර්ය ඩී. ඒ. එම් පෙරේරා මහතා	21.03.2023	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
11	ආචාර්ය ආර්. ඒ. ටී. කේ. රණසිංහ මහතා	09.01.2024	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

සාමාන්‍යාධිකාරී/ (ප්‍ර.වි.නි.) ගේ කාර්යභාරයන්

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) යනු බැංකුවේ ඉහළම ශ්‍රේණියට අනුයුක්ත පුද්ගලයාය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී පත්කරනු ලබයි. බැංකුවේ කළමනාකාරිත්ව සහ මෙහෙයුම් කටයුතු සාමාන්‍යාධිකාරී වෙත පවරා ඇති අතර ඔහු ආයතනික කළමනාකරණ කණ්ඩායම මෙන්ම බැංකුවේ කළමනාකරණ කමිටු මෙහෙයවයි.

බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාර කටයුතුවල එදිනෙදා කළමනාකරණය භාරව කටයුතු කරන ඉහළ විධායක නිලධාරියකු ලෙස සාමාන්‍යාධිකාරී කටයුතු කරයි. ඉහළ මට්ටමේ කළමනාකාරිත්ව තීරණ ගැනීම සඳහා බැංකුවේ සියලුම සාර්ථකත්වයන් වෙනුවෙන් ඔහු වගකීමට බැඳී සිටී. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ කාර්යසාධනය සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාකරන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමට බැඳි සිටී. බැංකුවේ සමස්ථ සාර්ථකත්වයට අමතරව, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සංවර්ධනය මෙහෙයවීම සහ කොටස්හිමි වටිනාකම වැඩි කිරීම අපේක්ෂා කරමින් දිගුකාලීන උපාය මාර්ග ක්‍රියාවට නැංවීම සඳහා ද වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනත් ආකාරයක උපදෙස් ලබාදී ඇත්නම් මිස සාමාන්‍යාධිකාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමකටම පැමිණ සහභාගිවන නමුත් එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඔහුට නොමැත.

මෙය ඉතා වගකීම්සහගත තනතුරක් වන බැවින් සහ බැංකු ක්ෂේත්‍රයේ විවිධ අංශ සහ මට්ටම්වල වසර ගණනාවක පළපුරුද්ද අවශ්‍ය වන බැවින්, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීට බැංකුව තුළ සෑම මට්ටමකම සිදුවන මෙහෙයුම් පිළිබඳව ගැඹුරු දැනුමක් ඇත. බැංකුවේ මෙහෙයුම්වල ප්‍රධානී වීම තුළ, බැංකුවේ කළමනාකරණයේ සියලුම අංශ පාලනය සඳහා ඔහු වෙත පැවරී ඇති රාජකාරි ඔහු දැඩිව පිළිපැදිය යුතුය.

2024 වසරතුල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ දැක්වේ. ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධාන අනුව සභාපතිගේ හා ප්‍ර.වි.නි. ගේ බලතල හා වගකීම් එකිනෙකට වෙනස්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුකමිටු හතරක් (4) පිහිටුවා ඇති අතර ඒවා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සාමාන්‍යයෙන් එකිනෙකාගෙන් ස්වාධීනව කටයුතු කරන අතර, සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීමේදී ඒවා වෙත ප්‍රමාණවත් බලය, සම්පත් සහ පැවරුණු වගකීම් ලබා දේ.

මෙම අනුකමිටු පහත පරිදි වේ.

1. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)
2. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC)
3. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)
4. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC).

මෙම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂයපථයන් අනුකමිටු වාර්තා තුළ විස්තර කර ඇති අතර, මෙම වාර්ෂික වාර්තාව තුළ සඳහන් කර ඇත. මෙම කමිටු විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් මෙහෙයවන අතර, අදාළ ක්ෂේත්‍රය තුළ ප්‍රවීනත්වය සහ ප්‍රවීනතාව ඔවුන් සතුය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, විගණන ක්‍රියාවලිය, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව සම්බන්ධ අධීක්ෂණය සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අනාගත බලපෑම අවබෝධ කර ගැනීම සඳහා වැදගත් ගිණුම්කරණ හා වාර්තාකරණ ගැටළු සහ මෑතකාලීන වෘත්තීමය හා නියාමන ප්‍රකාශනයන් සමාලෝචනය එයින් අපේක්ෂා කරයි.

වාර්තා සම්පූර්ණ සහ නිවැරදිද යන්න තක්සේරු කිරීම සඳහා කළමනාකරණය විසින් අභ්‍යන්තර අතුරු මූල්‍ය තොරතුරු සංවර්ධනය කරන ආකාරය පිළිබඳ අවබෝධයක් අවශ්‍යය.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) අධ්‍යක්ෂවරු, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඉලක්ක සහ අරමුණු සකස් කරන අතර, කලින්කල සකස්කළ ඉලක්ක හා අරමුණු අනුව ඒවායේ කාර්යසාධනය ඇගයීමට ලක්කර, පාරිශ්‍රමිකය, ප්‍රතිලාභ සහ අනෙකුත් කාර්යසාධනය පදනම් දිරිදීමනා ගෙවීම් සමාලෝචනය සඳහා පදනම තීරණය කරයි. බැංකුව වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන ක්‍රමෝපායන් සංවර්ධනය සහ සමාලෝචනය සහ සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටළු පිළිබඳ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හා මෙහෙයුම් කමිටු සමඟ උපදේශක භූමිකාවක් පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත පැවරී ඇති බලතල අතර මූලික වගකීම් වෙති.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරාගැනීම/පත්කිරීමේ ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. තනතුරට සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සලකාබැලිය යුතු යෝග්‍යතාව සඳහා අවශ්‍යකරන සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික සුදුසුකම් වැනි නිර්ණායක තීරණය කිරීම සඳහා වගකීමට බැඳි සිටී. ඒ අනුව, මෙම කමිටුව බැංකුවේ ආයතනික පාලනයේ කොටසක් ලෙස කටයුතු කරයි. ප්‍රධාන කළමණාකරන නිලධාරීන් හා අධ්‍යක්ෂවරු නැවත සේවයේ යෙදවීම සඳහා අනුප්‍රාප්තික කටයුතු හා අවශ්‍යවන අතිරේක/නව නිපුණතා කමිටුව විසින් කලින් කලට සලකා බලා අනුමත කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් බැංකුවට ඇති ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් තක්සේරු කරයි. මෙම කමිටුව විශේෂ අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ එවැනි අවදානම් කමිටුව විසින් නියමකළ පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ කළමනාකරණය කර ගැනීම සඳහා ණය කමිටුව සහ වත්කම්, වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කරනු ලබයි. යම් අවදානම් බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම් වී කමිටුව විසින් තීරණය කරන මට්ටම්වලින් එපිට පවතින අවස්ථාවලදී එවැනි විශේෂ අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග මෙම කමිටුව විසින් ගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණතාව සහ විශ්වාසනීයත්වය පිළිබඳ සමාලෝචනය කර තීරණ ගැනීමට සහ මූල්‍ය තොරතුරු සහ ඒවායේ විශ්වාසනීයත්වය, ක්ෂේත්‍රයේ ප්‍රධාන අවදානම් අංග සහ බැංකුවේ සුදුසු අවදානම් සාධක සහ ආයතනික පාලනය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. ආයතනික පාලන ව්‍යවහාර පරිදි මෙහෙයුම් මට්ටම දක්වා බලය බෙදීම නොමැතිව එහි අධීක්ෂණය යටතේ මෙහෙයුම්වල තීරණාත්මක ක්ෂේත්‍ර අධ්‍යක්ෂ මණ්ඩලය රඳවාගෙන ඇත.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ යහපත් අවදානම් කළමනාකරණය විසින් වඩා අඩු සාපේක්ෂ අවදානම් සහ පාර්ශ්වයන් අතර වඩා අඩු බැඳියා පිළිගැටුම් තුළ බැංකුව ක්‍රියාත්මක වන බව සඳහන් කරයි. යහපත් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ මෙවැනි වාසි බැංකුවේ කාර්යසාධනය වර්ධනය කිරීමට හේතු වී ඇත.

කළමනාකරණ කමිටු

බාසල් මාර්ගෝපදේශවලට අනුගත වෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලය එදිනෙදා කළමනාකරණයට සහභාගි නොවිය යුතු වුවත් කළමනාකරණය විනිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබාගත යුතුය. බැංකුවේ කටයුතු කළමනාකරණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමන්විත යම් විශේෂිත කමිටුවලට ව්‍යාපාර මෙහෙයුම් පවරා ඇත. මෙවැනි කමිටු අධ්‍යක්ෂ මණ්ඩලයට එහි පාලන කාර්යයන්හිදී සහයවීම සඳහා ස්ථාපිත කරනු ලැබ ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ආරක්ෂිත සහ යහපත් ආකාරයෙන් බැංකුවේ එදිනෙදා කටයුතු කරගෙන යනු ලබන බවට මගපෙන්වීම සහ පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ඇති කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම කමිටු විසින් වාර්තා ඉදිරිපත් කළ යුතුය. මෙම සංදර්භය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට අමතරව පහත සඳහන් කළමනාකරණ කමිටු පත්කර ඇත.

1. විධායක ණය කමිටුව (ECC)
2. වත්කම්/වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)
3. අලෙවිකරණ කමිටුව (MC)
4. නිෂ්පාදන සංවර්ධන කමිටුව (PDC)
5. අයකිරීම් කමිටුව (RC)
6. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC)

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශය සහ පාලනය යටතේ, ජ්‍යේෂ්ඨ කළමනාකරණය විසින් ව්‍යාපාර ක්‍රමෝපාය, අවදානම් රුචිය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිපත්තිවලට අනුරූප වන ආකාරයකින් බැංකුවේ කටයුතු සිදුකර පාලනය කළ යුතු අතර, ඒ අනුව ඉහත සඳහන් කළමනාකරණ කමිටුවල සාමාජිකයින්ට ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ව්‍යාපාරය සහ සේවකයින් කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය පළපුරුද්ද, දක්ෂතා සහ විශ්වාසනීයත්වය තිබිය යුතු අතර, ඔවුන්ගේ දක්ෂතා පවත්වාගැනීමට සහ වැඩි කර ගැනීමට මෙන්ම ඔවුන් වගකීමට බැඳී සිටින ක්ෂේත්‍රවලට අදාළ සංවර්ධනයන් පිළිබඳ යාවත්කාලීනකර තබාගැනීම සඳහා විධිමත් පුහුණුව වෙත ප්‍රවේශය ඔවුන්ට ලබා දේ. ශාඛා කළමනාකරුවන් ජ්‍යේෂ්ඨ කළමනාකරණය සමඟ මාසයකට එක්වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගි වෙති.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAN/F/SMIB/CG/2024/43

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 අප්‍රේල් 01

සභාපති,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සපුරාලීම සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සිද්ධි වාචක සෙවීම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව - 2024 දෙසැම්බර් 31

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙලකර ඉදිරිපත්කර ඇති පාලන වාර්තාව සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඇමුණුමට සම්බන්ධකර ඇති ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැංවීම මා විසින් සිදුකරනු ලැබ ඇත. එකඟ වූ ක්‍රියාමාර්ග සඳහා අදාලවන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 4400 (SLSPS 4400) හි දක්වා ඇති මූලධර්මවලට අනුකූලව මෙම කටයුතු සිදුකර ඇත. ආයතනික පාලන විධිවිධානයන්ට අනුකූලවීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඔබට සහයවීම පිණිස පමණක් මෙම ක්‍රියාපටිපාටි ඉටුකර ඇත.

මාගේ සොයා ගැනීම් මෙම වාර්තාවේ ඇමුණුමෙහි මා විසින් දක්වා ඇත.

ඉහත ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන බැඳීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව සිදුකළ විගණනයක් හෝ සමාලෝචනයක් අර්ථවත් නොවන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීම සම්බන්ධයෙන් යම් සහතික කිරීමක් මම ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හෝ සමාලෝචන කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිතිඅනුව පාලන වාර්තාවේ විගණනයක් හෝ සමාලෝචනයක් හෝ අතිරේක ක්‍රියාමාර්ග ඉටුකර තිබිනි නම් ඔබට වාර්තාකළ යුතුව තිබූ අනෙකුත් කරුණු මාගේ අවධානයට ලක්විය යුතුව තිබිනි.

මාගේ වාර්තාව මෙම වාර්තාවේ පළමුවන පරිච්ඡේදයේ විස්තරකර ඇති කාර්යයන් සඳහා සහ ඔබගේ දැනගැනීම පිණිස පමණක් වන අතර, වෙනත් අරමුණු සඳහා හෝ වෙනත් කිසිම පාර්ශවයක් සඳහා ලබාදීම පිණිස නොවේ.

මෙම වාර්තාව ඉහත දක්වා ඇති අයිතමයන් සම්බන්ධයෙන් පමණක් වන අතර, සමස්ථයක් ලෙස ගත්විට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කිසියම් මූල්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් විස්තර දැක්වීමක් නොවේ.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 73 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ආයතනික පාලනය

බැංකුවේ අනුකූලතා නිලධාරීන් සඳහා ප්‍රශ්නාවලියක්

පරිච්ඡේද අංකය	විස්තරය	අනුකූලවිය	යොමුව
3.1	අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීම්		
3.1.i	අධ්‍යක්‍ෂ මණ්ඩලය බැංකුවේ ආරක්ෂාව සහ විශිෂ්ඨත්වය ශක්තිමත් කර ඇති බව සහතික කිරීමට ගත යුතු ක්‍රියාපටිපාටි		
3.1.i.අ	බැංකුවේ උපාය මාර්ගික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය පරීක්ෂා කිරීම.	අනුකූලවිය	2024-2028 වර්ෂය සඳහා වන ආයතනික සැලැස්ම පිළිවෙලින් 2023.11.21 හා 2023.12.07 යන දිනයන්හි පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 23/06/BD (APP)/16 සහ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 23/SP04/11/1 මගින් අනුමත කර ඇත.
	බැංකුව විසින් බැංකුවේ උපාය මාර්ග පරමාර්ථ සහ ආයතනික වටිනාකම් බැංකුව තුළ සන්නිවේදනය කර තිබේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූලවිය	2024 වසර තුළ ජ්‍යේෂ්ඨ කළමනාකරණ රැස්වීම් සහ ශාඛා කළමනාකරුවන්ගේ රැස්වීම්වලදී එක් එක් අංශයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් සන්නිවේදනය කර ඇත.
3.1.i.ආ	බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සමස්ත ව්‍යාපාරික උපායමාර්ග (ආයතනික දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ) ආයතනික සැලැස්මේ ඇතුලත් වේ. මෙය පිළිවෙලින් 2023.11.21 සහ 2023.12.07 දිනයන්හි පැවති රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 23/06/BD (APP)/16 සහ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 23/SP04/11/1 මගින් අනුමත කර ඇත.
	සමස්ත අවදානම් ප්‍රතිපත්තිය. අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි හා යාන්ත්‍රණ ඇතුළත් සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග සහ එය ලේඛණගත කිරීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි හා යාන්ත්‍රණ ඇතුළත් සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග බැංකුව විසින් ලේඛණගත කර ඇත.
	සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග තුළ අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක අඩංගු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	2024-2028 සඳහා වන ආයතනික සැලැස්ම ඉලක්ක සමගින් ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්‍රියාත්මක කර ඇත.
3.1.i.ඇ	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගත් අවදානම් කලමනාකරණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන්හි විචක්ෂණශීලි බව මෙන්ම ඒවා නිසි පරිදි ක්‍රියාවට නංවා ඇත් දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති සමුද්දේශ්‍ය විෂයට අනුව ලබා දී ඇති බලතල පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව ක්‍රියා කරයි. බැංකුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව. අවදානම් තක්සේරු රාමුව සහ අවදානම් රුචිය සමාලෝචනය අනුමත කිරීම හා හඳුනාගත් ප්‍රධාන අවදානම් මාර්ග තක්සේරු කිරීමට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කලින් කලට රැස්වෙයි. අවදානම් අවම කිරීම සඳහා උපායමාර්ගික තීරණය ගැනීමට ප්‍රධාන අවදානම් සීමා හා තහවුරු පරීක්ෂණ ප්‍රතිඵල සහ BIRMC හි අවදානම් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් යොමු කරනු ලබයි. ප්‍රධාන අවදානම් දර්ශක හා අවදානම් රුචිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි.

3.1.i.ඈ	තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස්කරුවන් හා ණය ගැනුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමග සන්නිවේදන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකර ක්‍රියාත්මක කරන්නේ දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	බැංකුව සහ ගනුදෙනුකරුවන් අතර ඵලදායි සන්නිවේදන ක්‍රියාවලියක් සඳහා ගනුදෙනුකාර ප්‍රඥප්තිය ප්‍රයෝජනයට ගනු ලබයි. එමෙන්ම, බැංකුවේ අයිතිය 100% රජය සතුවන අතර සියලුම අධ්‍යක්ෂවරු මුදල් අමාත්‍යංශය විසින් පත්කරනු ලබයි. එම නිසා රජය, කොටස්කරුවන්, තැන්පත්කරුවන්, ණය හිමියන්, හා ණය ගැනුම්කරුවන් සහ බැංකුව අතර ඵලදායි සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලබයි. කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පුවත්පත්වල ප්‍රසිද්ධ කරනු ලබයි. සංශෝධනය කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තිය 2024.10.30 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී. (වාර්තා අංක 24.10.140.03 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 24/10/BD(APP/04).
3.1.i.ඉ	බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා කලමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත් බව හා විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අභ්‍යන්තර පාලන සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර තිබිණි. අධ්‍යක්ෂ මණ්ඩල විගණනක කමිටුව, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ හා කලමනාකරණ තොරතුරු පද්ධතියෙන් ප්‍රමාණාත්මකභාවය හා විශ්වාසනීයත්වය සමාලෝචනය කරන අධ්‍යක්ෂක මණ්ඩලයට සහයෝගය ලබා දෙයි. අභ්‍යන්තර විගණන අංශය අඛණ්ඩව මෙය අධීක්ෂණය කරයි.
3.1.i.ඊ	2010 අංක 03 බැංකු පනතේ නිර්වචනයකර ඇති පරිදි හා 2015 දෙසැම්බර් 02 වෙනි දින නිකුත් කරන ලද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 02/17/550/002/003 හා පසුව සංශෝධනය කරන ලද 2020 ජනවාරි 01 වෙනි දින සිට බලපැවැත්වෙන 2019 අංක 01 දරණ බැංකු පනතේ නිර්නයකර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් හඳුනාගැනීම හා පත්කිරීම සිදුකර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සාමාන්‍යාධිකාරීවරයාද ඇතුළත්ව විධායක කටයුතු සිදුකරන නිලධාරීන් හා අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් ලෙස නිර්වචනය කරයි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 24) ප්‍රමිතීන් නාම යෝජනා කමිටුව (BNC) විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.
3.1.i.උ	අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට අනුව ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් මගින් බැංකුවේ කටයුතුවල සුදුසු පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය භාවිතාකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	බැංකුව උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මට අනුව බැංකුවේ කාර්යසාධනය සමාලෝචනයට ලක් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වලට පවරා ඇති මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ වෙනත් අදාළ කරුණු පිළිබඳව වාර්තා ලබාගනී. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර ඇති සමුද්දේශ විෂය මගින් පාලනය වේ. ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති කරුණු ජ්‍යෙෂ්ඨ කලමනාකරණ රැස්වීම් වලට ඉදිරිපත් කරයි.
3.1.i.ඌ	ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් හා අධ්‍යක්ෂවරුන්හට ඔවුන්ගේ ප්‍රධාන වගකීම් හා අධිකාරිත්වයේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කර ඇති බව පරීක්ෂා කිරීම	අනුකූලවිය	අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා අධිකාරිත්වය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිච්ඡේද අංක 07 යටතේ නිර්වචනය කර ඇත. එක් එක් අධ්‍යක්ෂවරු අනු කමිටුවක් හෝ කිහිපයක් සඳහා පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරු අනු කමිටු සඳහා වෙන්කර ඇති

			අතර, සෑම කමිටු ප්‍රඥප්තියකම වගකීම් පිලිබඳ නිර්වචනයන් සිදුකර ඇත. ප්‍රධාන කලමනාකරණ නිලධාරියාගේ බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ලැයිස්තුගත කර ඇත. අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රධාන කළමණාකරන නිලධාරීන් සඳහා අධිකාරිත්වයේ හා වගකීමේ ප්‍රමාණය BHRRC හි විස්තර කර ඇත.
3.1.i.එ	(i) අධ්‍යක්ෂවරු හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් තේරීම නම් කිරීම හා පත්කිරීම, (ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ (iii) දුර්වලතාවයන් හඳුනාගැනීම සහ අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකිරීම පිලිබඳ කරුණු ඇතුලත්වන අධ්‍යක්ෂවරුන්ගේ පාලන පරිචයන්හි ඇති සඵලතාවය කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇති බව පරික්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩලය තේරීම නම්කිරීම හා පත්කිරීම 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි. අමාත්‍යවරයාගෙන් ලැබෙන නාම යෝජනා මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයට, පත්කිරීමට නියමිත අධ්‍යක්ෂකවරුන්ගේ යෝග්‍යතාවය ඇගයීමට ලක්කර පත්කිරීම සඳහා නිර්දේශ කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය එහි පාලන පරිචයක් පිලිබඳව වාර්ෂික ඇගයීමක් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු ඔවුන්ගේ ස්වයං ඇගයීම් පත්‍රිකාවල තහවුරු කර තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම විගණනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිත්වය ප්‍රශ්නාවලියක් තුළින් තක්සේරු කෙරේ.
3.1.i.ඒ	ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් පත්කිරීම සඳහා අනුප්‍රාප්තික සැලස්මක් ඇති බව පරික්ෂාකිරීම.	අනුකූලවිය	2024 දෙසැම්බර් 13 වෙනි දින ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් සඳහා වන අනුප්‍රාප්තික ප්‍රතිපත්තිය අනුමත වී ඇත.
3.1.i.ඔ	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහළ කලමනාකරණ නිලධාරීන් සමග ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමේ සන්නිවේදන ක්‍රම ඇති කිරීමේ සහ ආයතනික අරමුණුවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා නියමිත පරිදි රැස්වීම් වාර පැවැත්වීමට නියම කර ඇති බව පරික්ෂා කිරීම.	අනුකූලවිය	සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකටම සාමාන්‍යාධිකාරීවරයාගේ පැමිණීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය සන්නිවේදන මාර්ග ඇතිකිරීමත් ආයතනික අරමුණුකරා ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමත් සිදුකරයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති කරුණු නිතර ඉදිරිපත් කිරීමත් සිදුකරයි. තවදුරටත් සෑම BIRMC සහ BAC රැස්වීම්වලදී ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් ඉදිරිපත් කිරීම් සිදු කරයි. ඔවුන්ගේ විෂය පථය යටතට වැටෙන කරුණු පැන නැගුනු විට ඒවා නිරාකරණය කරගැනීම සඳහා ඔවුන් කැඳවනු ලබයි. තවද, කලමනාකරණය, ආයතනික අරමුණු ලඟා කර ගැනීම සඳහා කටයුතු කරන බව තහවුරු කිරීම වෙනුවෙන් කලමනාකරණ කමිටු රැස්වීම් හා ජ්‍යෙෂ්ඨ කලමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනුම් දී ඇත.

3.1.i.ඕ	නියාමන පරිසරය අවබෝධකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාමාර්ග සමග ක්‍රියාවලි ගෙන තිබේද යන්න සහ බැංකුව නියාමකයින් සමග සම්බන්ධතාවයක් පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අනුකූලතා නිලධාරියා මගින් නියාමකයින් සමග බැංකුව හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. ඇය නිතරම නියාමකයින් සමග සම්බන්ධතාවයක් පවත්වා ගෙන යයි. සියලුම නියාමන අවශ්‍යතාවයන් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන කළමණාකරනයේ නිලධාරීන් ඇය නිතරම ඇගයීමට ලක් කරයි. නියාමන පරිසරයේ සිදුවන සියලුම වෙනස්වීම් අදාල නියාමකයා විසින් සන්නිවේදනය කළ විගසම දැනුම්දෙයි. අනුකූලතා නිලධාරියා හා අවදානම් ප්‍රධානී අනුකූලතා අවශ්‍යතාවයන්ගේ තත්වය කලින් කලට තවදුරටත් වාර්තා කරයි. නියාමන පරිසරයේ වෙනස්කම් හොඳින් අවබෝධ කරගැනීම සඳහා නියාමකයින් විසින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් වලටද අධ්‍යක්ෂවරු සහභාගී වෙති.
3.1.i.ක	බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීමට මෙන්ම ඔවුන් අධික්ෂණ තත්ත්වයේ තබා ගැනීම සඳහා ක්‍රියා පිලිවෙතක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බව පරික්ෂා කිරීම.		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ සඳහන් ප්‍රතිපාදන අනුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව විගණකාධිපතිවරයා පත්කර ඇති අතර එම ප්‍රතිපාදන අනුව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වෙයි.
3.1.ii	සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා (ප්‍ර.වි.නි.) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇති බව පරික්ෂා කිරීම. සභාපතිවරයාගේ සහ (ප්‍ර.වි.නි.)ගේ කාර්යභාරය සහ වගකීම් මෙම නියෝගයන්හී 3 (5) නියෝගයට අනුකූලව ඇත්දැයි පරික්ෂා කිරීම.	අනුකූලවිය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිච්ඡේද අංක 14.1 අනුව, සභාපතිවරයා අදාළ රේඛිය අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබ ඇත. සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිවරයා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත. සභාපතිවරයාගේ හා ප්‍ර.වි.නි.ගේ කාර්යන් සහ වගකීම් ඉහත සඳහන් විධිවිධාන අනුව සිදුවෙයි.
3.1.iii	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා තිබේද යන්න හා මසකට එක් වතාවක් බැගින් වසරකට අවම වශයෙන් දොලොස් වතාවක් රැස්වීම් පවත්වා තිබේදැයි පරික්ෂා කිරීම.	අනුකූලවිය	2024 වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩලය 18 වතාවක් රැස්වී ඇත. ආසන්න වශයෙන් මසකට එක් වතාවක් බැගින් රැස්වීම් වාර 12 ක් පවත්වා ඇති අතර විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 5 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේඛණ හා අධ්‍යක්ෂ මණ්ඩල පැමිණීමේ ලේඛණ පවතී.
3.1.iv	විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයට කරුණු හා යෝජනා ඇතුලත් කිරීමට සියළුම අධ්‍යක්ෂවරුන්ට හැකිවන පරිදි සැකසූ වැඩ පිලිවෙලක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇති බව පරික්ෂා කිරීම සහ මෙහිදී එම කරුණු හා යෝජනා ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සහ බැංකුවේ අවදානම් කළමනාකරණයට අදාළ වීම.	අනුකූලවිය	අධ්‍යයනය කිරීමට හා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි රැස්වීම් පැවැත්වීමේ නිවේදනය හා න්‍යාය පත්‍රය සියළුම අධ්‍යක්ෂවරුන් වෙත රැස්වීම් පැවැත්වීමට අවම වශයෙන් දින 07 ට පෙර ලැබීමට සලස්වයි. ඒ අනුව බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනයට හා අවදානම් කලමනාකරණය කිරීමට සම්බන්ධ කරුණු හා යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරනු ලබයි.
3.1.v	සියලුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම්වලට සහභාගීවීම සඳහා අවස්ථාව ලබා දීම පිණිස අවම වශයෙන් දින 07 ට පෙර දැනුම්දීම සිදුකරන බව පරික්ෂා කර ඇත. සියලු අනිකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහාත් දැනුම් දීම සිදුකර ඇත.	අනුකූලවිය	විද්‍යුත් සන්නිවේදනයක් මගින් රැස්වීම පැවැත්වීමට දින 07 කට පෙර සියලුම අධ්‍යක්ෂවරුන් වෙත දැනුම් දීමක් සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අත්සන් තබා අනුමත කර පිලියෙල කරන ලද න්‍යාය පත්‍රය සභාපතිවරයාගේ ද අනුමැතිය සහිතව රැස්වීම් පැවැත්වීමට දින 07 ට ප්‍රථම සෑම අධ්‍යක්ෂවරයකු වෙතම භාරදීම සිදුකරයි.

3.1.vi	මාස 12 ක් ඇතුළත පැවැත්වූ රැස්වීම් වාර වලින් 2/3 කට සහභාගී නොවූ හා නොකඩවා රැස්වීම් වාර 03 ක් සඳහා සහභාගී නොවූ අධ්‍යක්‍ෂවරුන් පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගෙන ඇති බව පරීක්ෂා කරන ලදී. අධ්‍යක්‍ෂවරයෙකු වෙනුවට නම් කරන ලද විකල්ප අධ්‍යක්‍ෂවරයෙකු රැස්වීම් වලට සහභාගි කරවීම රැස්වීම් වලට සහභාගී වූවාසේ පිළිගනු ඇත.	අනුකූලවිය	අවශ්‍ය පරිදි අධ්‍යක්‍ෂවරු රැස්වීම් වලට සහභාගී වී ඇති නිසා එවැනි පියවර ගැනීමක් අවශ්‍ය නොවිය.
3.1.vii	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සමාගම් ලේකම් කෙනෙකු පත්කර ඇති බව පරීක්ෂා කරන ලද අතර, එම අයගේ මූලික වගකීම වන්නේ අධ්‍යක්‍ෂ මණ්ඩල හා කොටස් කරුවන්ගේ රැස්වීම්වල ලේකම්ගේ කාර්යභාරය ඉටු කිරීමත් අඥාපනතේ හා අනෙකුත් නීතිරීතින්හි දක්වා ඇති කටයුතු ඉටු කිරීමත්ය.	අනුකූලවිය	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයකු පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්‍යාලයක් පිහිටුවා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස සුදුසුකම්ලත් අයකු පත්කර ඇත.
3.1.viii	සියලුම අධ්‍යක්‍ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීමට ඇති ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමට හැකිවෙයි.
3.1.ix	අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තබා ගැනීම සමාගම් ලේකම් විසින් සිදු කරන අතර, සියලුම අධ්‍යක්‍ෂවරුන්ට එවැනි වාර්තා පිරික්සීමට ක්‍රියාවලියක් තිබේද යන්න පරීක්ෂා කරන ලදී.	අනුකූලවිය	සියළුම අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිලිවෙලින් ගොනු කර අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්ගේ භාරයේ තබාගනී. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් පිලිබඳ ඕනෑම තොරතුරක් ඕනෑම අවස්ථාවක ලබාගැනීමට ඕනෑම අධ්‍යක්‍ෂවරයකුට අවස්ථාව ඇත.
3.1.x	අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල පහත සඳහන් කරුණු අඩංගු වී තිබේද යන්න පරීක්ෂා කිරීම: අධ්‍යක්‍ෂ මණ්ඩල සාකච්ඡා වලදී අධ්‍යක්‍ෂ මණ්ඩලය භාවිතා කල දත්ත හා තොරතුරු සාරාංශයක් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කල කරුණු හෙලිදරව් කර ගැනීමේ සාකච්ඡා සහ මතබේදයට තුඩු දුන් කරුණු, අධ්‍යක්‍ෂ මණ්ඩලය දැඩි සැලකිල්ලකින් හා විචක්ෂණශීලීව ඔවුන්ගේ රාජකාරි ඉටු කරමින් සිටියේද යන වග නිරූපණය කරයි. අධ්‍යක්‍ෂ මණ්ඩල ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්ති හා අදාළ නීති හා රෙගුලාසි පිලිපැදීම පිළිබඳ අනුකූලතාවය දක්වන කරුණු බැංකුව මුහුණදෙන අවදානම් අවබෝධ කර ගැනීම හා යොදාගත් අවදානම් කලමනාකරණ ක්‍රියාමාර්ගවල දළ විශ්ලේෂණයක් සහ තීරණ හා අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා	අනුකූලවිය	ඉහත සඳහන් සියලු කරුණුවලට අදාළව ප්‍රමාණවත් විස්තර අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල අඩංගුවී ඇත. පොදුවේ, අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාවන් හි පහත සඳහන් දෑ අඩංගු වේ. පෙර රැස්වීම්වල ස්ථිර කරන ලද වාර්තා පෙර රැස්වීම්වල වාර්තාවලින් මතු වූ කරුණු පෙර රැස්වීම් වාර්තාවලින් කල් තැබූ කරුණු අයකර ගැනීම් පිලිබඳ කරුණු මූල්‍ය කරුණු අලෙවිකරණ සහ ප්‍රකාශනය කරන ලද කරුණු පරිපාලන සහ පුද්ගල කරුණු ණය කරුණු අවදානම් කරුණු නෛතික කරුණු අනුකූලතා කරුණු සහ වෙනත් කරුණු
3.1.xi	සාධාරණ ඉල්ලීමකින් පසුව සුදුසු අවස්ථාවන්හි දී ස්වාධීන වෘත්තිය උපදෙස් බැංකුවේ වියදමින් ලබා ගැනීම සඳහා අධ්‍යක්‍ෂවරුන්ට හැකිවීම පිණිස අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් එකගවූ ක්‍රියා පිලිවෙත් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	තීරණ ගැනීමේ දී හා රාජකාරි කටයුතු කරගෙන යාමේ දී අවශ්‍ය වූ විටක ස්වාධීන වෘත්තීය උපදෙස් බැංකුවේ වියදමින් අධ්‍යක්‍ෂවරුන්ට ලබාගැනීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. බැංකුව මේ සඳහා රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරයි.

3.1.xii	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ බැඳියා පිලිගැටුම් නොමැතිවීම හෝ පැවතීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග පැවතීම, ඒ පිළිබඳ වාර්තා කිරීම හා ඒවා නිරවුල් කිරීම සහ එවැනි තත්ත්වයන් වලක්වාලීමට සුදුසු ක්‍රියාමාර්ග පැවතීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය	1975 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 28 වෙනි පරිච්ඡේදය අනුව කිසිම අධ්‍යක්ෂවරයෙකුට බැංකුව විසින් ණය මුදල් අනුමත කරීමක් සිදු කර නොමැත. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35) 2016.08.26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02
	අධ්‍යක්ෂවරයකු ඔහු/ඇය හෝ ඔහුගේ /ඇයගේ ඥාති සම්බන්ධතාවයක් ඇති අයෙකු හෝ අධ්‍යක්ෂවරයාගේ සැලකිය යුතු උනන්දුවක් ඇති කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටීම පරීක්ෂා කිරීම.		සමාලෝචිත වර්ෂය තුල එවැනි අවස්ථාවක් පැනනැගී නොමැත.
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ වන කරුණක් සඳහා ගණපූරණය සම්බන්ධයෙන් ඔහු/ඇය ගණන් ගෙන ඇති බව පරීක්ෂා කිරීම.		එවැනි කරුණක් 2024 වසර තුළ පැන නැගී නොමැති බැවින් මෙම කොටස අදාල නොවේ.
3.1.xiii.	නියෝග හඳුනාගැනීම සහ බැංකුවේ පාලනය සම්පූර්ණයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල අධිකාරිත්වයේ පවතින බව තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එයටම ආවේනික වූ විධිමත් සැලස්මක් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	කරුණු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර, බැංකුවේ විධිවිධානයන් හා පාලනය එහි බලය යටතේ දැඩිව පවතින බව හඳුනාගැනීම තිරණය කිරීම සඳහා වෙන්වූ කරුණු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය පවත්වා ගනී. 16.10.122.02 වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/10/40
3.1.xiv	බැංකුවට සිය වගකීම් ඉටුකල නොහැකි හෝ නොහැකිවීමේ තත්ත්වයට පත්විය හැකි බව හෝ බුන්වත් තත්ත්වයට පත්වීමට ආසන්න බව හෝ තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ ගෙවීම් අත්හිටුවීමට ආසන්න බව අධ්‍යක්ෂ මණ්ඩලයට හැගි යන්නේ නම් බැංකුවේ තත්ත්වය පිළිබඳව යම්කිසි තීරණයක් හෝ පියවරක් ගැනීමට ප්‍රථම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වහාම දැනුම් දීම සිදුකල යුතු බව පරීක්ෂා කිරීම.		එවැනි අවස්ථාවක් පැන නැගී නැත.
3.1.xv	මුදල් මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි බැංකුවේ ප්‍රාග්ධන මට්ටම පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූල නොවිය	2024.12.31 දිනට සමස්ථ ප්‍රාග්ධන අනුපාතය 19.28% ක් හා පොදු ස්කන්ධය අධියර 1 ප්‍රාග්ධන අනුපාතය 19.28% ක් ලෙස පැවති අතර අදාල කාලය සඳහා වාර්තාගත ප්‍රාග්ධනය රු.මිලියන 4,787 ක් සහ වාර්තාගත ප්‍රාග්ධන හිගය රු.මිලියන 2,713 ක් ලෙස පැවතිණි.
3.1.xvi	මෙම විධිවිධානයන්ගේ 03 වන විධිවිදානයට අනුකූල බව ප්‍රකාශ වන වාර්ෂික ආයතනික පාලන වාර්තාව බැංකුවේ වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රසිද්ධ කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	මෙම විධිවිදානයන්ගේ 03 වන විධිවිදානයට අනුකූල බව දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාව වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළකරනු ලබයි.
3.1.xvii	සෑම අධ්‍යක්ෂවරයකු විසින්ම වාර්ෂිකව ස්වයං තක්සේරුවක් සිදුකල යුතු බවට වැඩ පිලිවෙලක් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මකකර ඇති අතර එවැනි තක්සේරු පිළිබඳව වාර්තා පවත්වාගෙන යෑම සිදු කිරීම කලයුතු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං තක්සේරු/ඇගයීම් ක්‍රියාවලිය 2024 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇත.
3.2	අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය		

<table>
<tr><td>3.2.i</td><td>අධ්‍යක්‍ෂ මණ්ඩලයේ 07 දෙනෙකුට නොඅඩු සහ 13 දෙනෙකුට නොවැඩි අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාවක් අඩංගු විය යුතු බව පරීක්ෂා කිරීම.</td><td>අනුකූල නොවිය</td><td>අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු (05) දෙනෙක් හා (01) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත වේ.
<table>
<tr><th></th><th>අධ්‍යක්ෂවරයාගේ නම</th><th>පත්වීම් ලද දිනය</th></tr>
<tr><td>1</td><td>ජේ.එම්.සුසෙයිදාසන් මහතා (2024.10.07 දින සිට බල පැවැත්වෙන පරිදි විශ්‍රාම ගොස් ඇත)</td><td>2023.05.17</td></tr>
<tr><td>2</td><td>එම්. පී කුරගම මහතා</td><td>2024.11.04</td></tr>
<tr><td>3</td><td>එස්.කේ.ඒ.ගලප්පත්ති මහතා</td><td>2023.03.07</td></tr>
<tr><td>4</td><td>මහාචාර්ය ඩී.ඒ.එම් පෙරේරා මහතා</td><td>2023.03.21</td></tr>
<tr><td>5</td><td>පී.ආර්. මඩිහහේවා මහතා</td><td>2023.05.02</td></tr>
<tr><td>6</td><td>එච්.සී.ඩී.එල්. සිල්වා මහතා</td><td>2023.01.01</td></tr>
<tr><td>7</td><td>ආචාර්ය ආර්.ඒ.ටී.කේ. රණසිංහ මහතා</td><td>2024.06.07</td></tr>
</table></td></tr>
<tr><td>3.2.ii.අ</td><td>ප්‍රධාන විධායක නිලධාරියාගේ තනතුර හොබවන අධ්‍යක්‍ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්‍ෂවරයකුගේ මුළු සේවා කාලය අවුරුදු 9 නොඉක්මවන බව පරීක්ෂා කිරීම.</td><td>අනුකූලවිය</td><td>අධ්‍යක්‍ෂවරයකු ලෙස කිසිම අධ්‍යක්‍ෂවරයෙකු වසර 09 ට වැඩි සේවා කාලයක් ගතකර නොමැත.</td></tr>
<tr><td>3.2.ii.ආ</td><td>කිසියම් අධ්‍යක්‍ෂවරයකු අවුරුදු 9 ට වඩා කාලයක් සේවයේ යෙදෙනවිට සංක්‍රාන්තික ප්‍රතිපාදන අනුගමනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම.</td><td></td><td>අධ්‍යක්‍ෂවරයකු ලෙස කිසිම අධ්‍යක්‍ෂවරයෙකු වසර 09 ට වැඩි සේවා කාලයක් ගතකර නොමැත.</td></tr>
<tr><td>3.2.iii.</td><td>ප්‍රධාන විධායක නිලධාරියා ද ඇතුළුව විධායක අධ්‍යක්‍ෂවරුන්ගේ සංඛ්‍යාව අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වැඩි නොවන බව පරීක්ෂා කිරීම.</td><td></td><td>1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධානවලට අනුව රේඛිය අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන අධ්‍යක්‍ෂවරුන්ගෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය සමන්විත වන අතර ඔවුන් සියල්ලන්ම විධායක නොවන අධ්‍යක්‍ෂවරු වේ.</td></tr>
<tr><td>3.2.iv</td><td>අධ්‍යක්‍ෂ මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්‍ෂ මණ්ඩල සංඛ්‍යාවෙන් තුනෙන් එකකට සමාන ගණනින් වැඩි අගයට ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාවක් සිටිය යුතු බව පරීක්ෂා කිරීම. විධායක නොවන අධ්‍යක්‍ෂවරු ස්වාධීන ලෙස සැලකිය හැකි නම් ඔහු හෝ ඇය.</td><td>අනුකූලවිය</td><td>1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව සියලුම අධ්‍යක්ෂකවරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබයි. අධ්‍යක්ෂවරු 05 දෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වන අතර එක අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ.</td></tr>
<tr><td>3.2.iv.අ</td><td>බැංකුවේ ඍජු හා වක්‍ර කොටස් හිමිකාරිත්වයෙන් 1% ට වැඩි ප්‍රමාණයක් දැරීම.</td><td></td><td>බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවන බැවින් එවැනි අවස්ථාවක් උදා වී නොමැත.</td></tr>
<tr><td>3.2.iv.ආ</td><td>අධ්‍යක්‍ෂවරයෙකු ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක් ඇතුලත ඔහු/ඇය මෙහි විධිවිධාන අංක 3(7) යටතේ විස්තර වන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවා යන ප්‍රමාණයක බැංකුව සමග කිසියම් ව්‍යාපාරික ගනුදෙනුවක් සිදුකර ඇති විට</td><td></td><td>2024 මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 31 අනුව එවැනි ගණුදෙනුවක් සිදු වී නොමැත.
එවැනි ගණුදෙනුවක් හෙලිදරව් වී හෝ හඳුනාගෙන ද නොමැත.</td></tr>
<tr><td>3.2.iv.ඇ</td><td>අධ්‍යක්‍ෂවරයෙකු ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක්තුළදී බැංකුව විසින් එහි සේවයේ යොදවා ඇති විට</td><td></td><td>බැංකුව මගින් සේවයේ යොදවා ඇති එවැනි කිසිම විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු නොමැත.</td></tr>
</table>

3.2.iv.ඈ	බැංකුවේ හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ප්‍රධාන විධායක නිලධාරී, ඉහල කලමනාකරණයේ නිලධාරියෙකු සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු සමග සමීප සම්බන්ධතාවයක්පවත්වා තිබීම (සමීප සම්බන්ධතාවය යනු කාලත්‍රයාගේ හෝ මූල්‍යමය ලෙස යැපෙන දරුවෙක් මේ සඳහා අදහස් කෙරේ)		ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රකාශනය හා බැංකු පනතේ (42) වගන්තියට අනුව අධ්‍යක්ෂවරු සිදුකර ඇති ස්වයං ප්‍රකාශය අනුව සමීප සම්බන්ධතාවයක් පවත්වා ඇති එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරු නොමැත.
3.2.iv.ඉ	බැංකුවේ විශේෂිත පාර්ශ්වකරුවෙකු නියෝජනය කරන විට		බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවේ.
3.2.iv.ඊ	සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක අධ්‍යක්ෂවරයකු සේවකයකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වන විට		බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවේ. අධ්‍යක්ෂවරයෙකු සෘජුව සම්බන්ධ වූ ගනුදෙනු නොතිබිනි.
3.2.iv.ඊ.I	මෙම නියෝගවල 3(7) නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ප්‍රමාණයක් ඉක්මවා යන යම්කිසි ගනුදෙනුවක් බැංකුව සමග පැවතීම හෝ		2024 වර්ෂය තුලදී කිසිම අධ්‍යක්ෂවරයෙකු බැංකුව සමග සෘජුවම හෝ වක්‍රව කිසියම් ගනුදෙනුවක් පිලිබඳව උනන්දුවක් දක්වා නොමැත.
3.2.iv.ඊ.II	මේ සම්බන්ධයෙන් බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සේවයේ යොදවා හෝ අධ්‍යක්ෂවරුන් හෝ සැලකිය යුතු කොටස්කරුවන් හෝ		මේ සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් ඇති වි නොමැත.
3.2.iv.ඊ.III	මෙම නියෝගවල 3(7) නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ප්‍රමාණයක් ඉක්මවා යන ගනුදෙනුවක් බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් බැංකුව සමග ඇති බව		මේ සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් ඇති වි නොමැත.
3.2.v	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත්කල විට, එසේ පත්කල අය ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කිරීම.		වසර තුලදී විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කර නොතිබිනි.
3.2.vi	බැංකුවට ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අදාල ක්‍රියා පිලිවෙත් ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.
3.2.vii	බැංකුවේ නියම කරන ලද ගණපුරණය සඳහා අධ්‍යක්ෂවරුන් 50% වැඩි සංඛ්‍යාවක් අවශ්‍යවන අතර මෙම ගණපුරණයෙන් 50% ට වැඩි ප්‍රමාණයක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් විය යුතු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.
3.2.viii.	සභාපතිවරයාගේ, විධායක අධ්‍යක්ෂවරුන්ගේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළත්ව අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් සහ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ බැංකුව විසින් එළි දක්වා ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂවරුන්ගේ හා සභාපතිවරයාගේ නම් ද ඇතුළත්ව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය බැංකුව විසින් එලිදරව්කර ඇත. ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු ලෙස වර්ග කරමින් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රවර්ගය බැංකුව විසින් වාර්ෂික වාර්ථාවේ එළි දක්වා ඇත.
3.2.ix	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත්කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටිය පරීක්ෂා කිරීම.	අනුකූලවිය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අධ්‍යක්ෂවරු පත්කිරීම අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි.
3.2.x	තාවකාලික පුරප්පාඩු පිරවීම සඳහා පත්කල සියළුම අධ්‍යක්ෂවරු ඔවුන්ගේ පත්වීමෙන් පසු එලඹෙන පලමු මහා සභා රැස්වීමේ දී කොටස්කරුවන්ගේ ඡන්දයෙන්ද තේරී පත්වීමට යටත්වන බව පරීක්ෂා කිරීම.		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.

3.2.xi	අධ්‍යක්ෂවරයකු ඉල්ලා අස්වුවහොත් හෝ සේවයෙන් ඉවත් කරනු ලැබුවහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අධ්‍යක්ෂවරු ඉවත්කිරීම සිදුකරනු ලබන්නේ අදාල රේඛීය අමාත්‍යංශයේ අමාත්‍යවරයා විසිනි.
3.2.xi.අ	අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම් හෝ ඉවත්කිරීමට හේතුව නිවේදනය කළයුතු අතර එම ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීමට හේතුව එම අදාළ අධ්‍යක්ෂවරයා බැංකුව සමග තිබූ කිසියම් මතභේදයක් සම්බන්ධ තොරතුරුවලට පමණක් සීමා නොවීම සහ		
3.2.xi.ආ	කොටස්කරුවන්ගේ අවධානයට ලක් කිරීමට අවශ්‍ය කරන යම් තොරතුරු තිබේද නැතිද යන වග තහවුරු කර නිවේදනයක් නිකුත් කළ යුතු වේ.		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අධ්‍යක්ෂවරු ඉවත්කිරීම සිදුකරනු ලබන්නේ අදාල රේඛීය අමාත්‍යංශයේ අමාත්‍යවරයා විසිනි.
3.2.xii	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබ හෝ තේරී පත්වී ඇති බව හෝ නම්කර ඇති බවක් හෝ දැනගැනීම පිණිස වැඩ පිළිවෙලක් තිබේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූලවිය	බැංකු පනතේ 42 වගන්තිය සමග කියවියයුතු 76 ඒ වගන්තිය පරිදි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ සුදුසුකම ඇගයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පිළිගෙන ඇත.
3.3	අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ සුදුසුකම තක්සේරු කිරීමේ නිර්ණායක		
3.3.ඝ	අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරන අයෙකුගේ වයස අවුරුදු 70 ට නොඉක්මවිය යුතු බව පරීක්ෂා කිරීම	අනුකූලවිය	ප්‍රකාශන තුළින් සියලුම අධ්‍යක්ෂවරුන් අවුරුදු 70 ට වඩා අඩු අය බව පරීක්ෂාකර තහවුරුකර ඇත.
3.3.i.අ	සංක්‍රාන්තිමය විධිවිධානවලට අනුකූලවීම පරීක්ෂා කිරීම.		වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂවරු නොමැති බැවින් මෙම කොටස අදාල නොවේ.
3.3.ii	බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ඇතුළුව සමාගම්/ආයතන 20 ට අධික ප්‍රමාණයක යම් අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂ ධුර හොබවන්නේද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සමාගම්/ආයතන 20 ට අධික සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අධ්‍යක්ෂවරයෙකු නොමැත.
3.3.iii	ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරිවරයෙකු පළමු බැංකුවේ ඔහුගේ / ඇයගේ නිලය අවසන්කළ දිනයේ සිට මාස 06 ක කාලයක් ඉකුත්වීමට ප්‍රථම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන වෙනත් බලපත්‍රලාභි බැංකුවක අධ්‍යක්ෂකවරයකු හෝ ප්‍රධාන විධායක නිලධාරි වරයෙකු ලෙස පත් නොකළ යුතු බව පරීක්ෂා කිරීම.		එවැනි පත්වීමක් සිදු කර නොමැත.
3.4	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරන ලද කලමනාකරන කාර්යයන්		
3.4.i	බලය පැවරීමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 20 සහ 21 වගන්ති අනුව ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරිවරයාට බලය පවරා දීම සිදුකර ඇත. මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇති අනු කමිටු සඳහා ද බලය පවරා දීම සිදුකර ඇත.
3.4.ii	එවැනි ක්‍රියාවන් සඳහා බලය ලබාදී ඇති අවස්ථාවන්වලදී පවා 3 (1) (ඝ) හි සඳහන් කරුණු පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමක් ගෙන ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරගෙන යෑමේ හැකියාව අඩු නොවන ප්‍රමාණයට අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වලට, ප්‍රධාන විධායක නිලධාරිවරයාට හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය නිලධාරීන්හට යම් යම් කරුණු පිලිබඳ බලය ලබා දීම සීමා කර ඇත.

3.4.iii	බලය පැවරීමේ ක්‍රියාවලිය බැංකුවේ අවශ්‍යතාවන්ට උචිත පරිදි පවතී දැයි තහවුරු කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එය කලින් කලට සමාලෝචනය කිරීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය	බලය පැවරීමේ ක්‍රියාවලිය බැංකුවේ අවශ්‍යතාවන්ට උචිත පරිදි පවතී දැයි තහවුරුකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එය කලින් කලට සමාලෝචනය කරනු ලබයි.
3.5	සභාපතිවරයා හා ප්‍රධාන විධායක නිලධාරී		
3.5.i	සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කාර්යභාරය එකිනෙකට වෙනස්වන අතර, එම කටයුත්ත එකම පුද්ගලයෙකු විසින් සිදු නොකරන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කාර්යභාරය එකිනෙකට වෙනස්වන අතර, එම කටයුත්ත එකම පුද්ගලයෙකු විසින් සිදු නොකරයි.
3.5.ii	සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර, 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය යටතේ අදාළ රේඛීය අමාත්‍යංශය විසින් ඔහු පත්කරනු ලබයි.
	සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු නොවන අවස්ථාවක, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු ලෙස ලේඛනගතකළ විෂය ක්ෂේත්‍රයට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරයකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම පරීක්ෂා කිරීම.		සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි.
	ජේෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම බැංකුවේ වාර්ෂික වාර්තාවේ එළිදරව් කලයුතු බව පරීක්ෂා කිරීම.		ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය ප්‍රතිපාදන නොසපයයි.
3.5.iii	වාර්ෂික වාර්තාවේ කොටසක් වන ආයතනික පාලන වාර්තාවේ යම්කිසි සම්බන්ධතාවයක් (මූල්‍ය, ව්‍යාපාරික, ඥාති හෝ වෙනත් සැලකිය යුතු සම්බන්ධතාවය/තාවයන් සභාපතිවරයා, ප්‍ර.වි.නි. හා අධ්‍යක්ෂ මණ්ඩලය අතර තිබේද යන්න පිළිබඳවත් එම සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳවත් හඳුනාගැනීමක් කිරීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	බැංකු පනතේ 42 වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් විසින් සිදුකර ඇති ස්වයං ප්‍රකාශයේ මේ පිළිබඳව අනාවරණය කිරීමක් සිදුකර ඇත.
3.5.iv	අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් ඇති බවත් එහිදී සභාපතිවරයා: (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීමත් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස සේවය කිරීමත් වගකීම් නිසි ලෙස ඉටු කිරීමත් තහවුරු කිරීම සහ (ඇ) සියලුම ප්‍රධාන හා යෝග්‍ය කරුණු කාලානුරූපව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කර ඇති බව තහවුරු කිරීම.	අනුකූලවිය	ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇත.
3.5.v	සභාපතිවරයා විසින් අනුමත කර ඇති විධිමත් න්‍යාය පත්‍රය සමාගම් ලේකම්වරයා විසින් බෙදා හැර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සභාපතිවරයාගේ අනුමැතිය සහිතව න්‍යාය පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සෑම අධ්‍යක්ෂවරයකු වෙතම ලැබීමට සලස්වා ඇත.
3.5.vi	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී පැන නගින මත භේදයන්ට ලක්වූ කරුණු පිළිබඳව කාලීනව ඉදිරිපත් කිරීම තුලින් අධ්‍යක්ෂවරුන් යථා පරිදි දැනුවත් කිරීම සිදුකර ඇති බව සභාපතිවරයා තහවුරු කරන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල දී පැන නගින ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරු හොඳින් දැනුවත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සූදානම්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂවරු වෙත පූර්වයෙන් බෙදාහැර ඇත.

3.5.vii	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ ක්‍රියාකාරී දායකත්වය ලබාදීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ධෛර්යමත් කිරීමේ ස්වයං ඇගයීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර සභාපතිවරයා බැංකුවේ ප්‍රගමනය සඳහා කටයුතු කිරීමට පෙරමුණ ගෙන ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	2024 වසරේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය ඇගයීම සඳහා ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය සිදුකර ඇත.
3.5.viii	විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගේ දායකත්වය තක්සේරු කලහැකි ස්වයං අගැයීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	2024 වසරේ දී ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇති අතර, එමගින් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය තක්සේරු කරයි. ඇගයීමේ පත්‍රිකා නිරීක්ෂණය කරන ලදී.
3.5.ix	ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ හෝ විධායක තත්ත්වයේ කුමන හෝ රාජකාරියක සෘජු අධීක්ෂණය හා සම්බන්ධ කටයුතුවල සභාපතිවරයාගේ මැදිහත්වීමක් වන බව පරීක්ෂා කිරීම.		සභාපතිවරයා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ හෝ වෙනත් විධායක රාජකාරී කටයුතු සඳහා සෘජු අධීක්ෂණ කටයුතු වල නියැලීමක් සිදු නොකරයි.
3.5.x	කොටස්කරුවන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යෑම සඳහා සහ කොටස්කරුවන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා ගැනීම සඳහා ක්‍රියාවලියක් ඇති බව පරීක්ෂා කිරීම.		බැංකුවේ හිමිකාරිත්වය 100% රජය සතු වන අතර, සියලුම අධ්‍යක්ෂවරු පත්කිරීම අදාළ රේඛීය අමාත්‍යංශය විසින් සිදුකරනු ලබයි. භාණ්ඩාගාරයේ නියෝජිත අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්ථිර සාමාජිකයෙකි.
3.5.xi	බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතුවල එදිනෙදා කලමනාකරණය බාරව ඇති ඉහළ විධායක නිලධාරියකු ලෙස ප්‍ර.වි.නි. ක්‍රියාකරන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සංවිධාන සැලැස්ම පරිදි, ප්‍ර.වි.නි./ සාමාන්‍යාධිකාරි ඉහළ විධායක නිලධාරියෙකු ලෙස බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු කලමනාකරණය සඳහා සහභාගි වෙයි.
3.6	අධ්‍යක්ෂ මණ්ඩලය පත්කල කමිටු		
3.6.i	මෙම නියෝගවල 3(6)(ii), 3(6) (iii), 3(6)(iv) සහ 3(6)(v) නියෝගවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් (04) පිහිටුවා ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	බැංකුව පහත සඳහන් අනුකමිටු පිහිටුවා ඇත. • අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) • අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) • අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC) • අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව (BIRMC)
	සෑම අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාවක්ම සෘජු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සෑම වාර්තාවක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ඇත.
	සෑම කමිටුවකම කටයුතු, කාර්යභාරය හා කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත්කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සංයුතිය, රාජකාරී, කර්‍යභාරය සහ කාර්‍යසාධනය ඇතුලත් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල විස්තර බැංකු වාර්ෂික වාර්තාවේ එලි දක්වා ඇත.
3.6.ii	විගණන කමිටුව:		

3.6.ii.අ	කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු වීම හා අවශ්‍ය සුදුසුකම් හා එම ක්ෂේත්‍රයේ පලපුරුද්ද ලබා ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු වන අතර අවශ්‍ය සුදුසුකම් හා එම පලපුරුද්ද ඔහු සතුය. සභාපතිවරයා පහත සඳහන් සුදුසුකම් දරයි. KEISEI අන්තර් ජාතික විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කලමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් සහ වයඹ විශ්ව විද්‍යාලයෙන් අලෙවිකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබාගෙන ඇත. ඉන්දිරා ගාන්ධි, ජාතික විවෘත විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් හා වයඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ලබාගෙන ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය කලමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබාගෙන ඇත. ගණකාධිකරණ ශිල්පීන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.
3.6.ii.ආ	කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් වේදැයි පරීක්ෂා කිරීම	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව එක් විකල්ප අධ්‍යක්ෂවරයෙකුද ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විතවේ. සාමාජිකයින් තිදෙනා අතරින් දෙදෙනෙක් ස්වාධීන විධියක නොවන අධ්‍යක්ෂවරු වන අතර එක් අයෙකු විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වෙයි.
3.6.ii.ඇ	කමිටු පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇත් දැයි පරීක්ෂා කිරීම.		
3.6.ii.ඇ.I	අදාළ ආඥා පනත අනුව විගණන කාර්යයන් සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම.		ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බාහිර විගණකවරයා විගණකාධිපති වෙයි 1975 අංක 13 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 65 වගන්තිය, විගණන පනත සහ මූල්‍ය පනත අනුව මෙම පත්වීම සිදුකරයි.
3.6.ii.ඇ.II	විගණකවරුන් සඳහා කලින් කලට මහ බැංකුව විසින් නිකුත් කර ඇති උපදෙස් ක්‍රියාත්මක කිරීම.		
3.6.ii.ඇ.III	අදාල ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීම සහ		මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs/ LKASs) අනුව සහ නියාමකයින් විසින් නියම කර ඇති ආකෘති අනුව පිළියෙල කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන 2025.02.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත කරනු ලැබූ අතර 2025.02.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ දී ස්ථිර කරන ලදී. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ එළිදරව් කර ඇත. කාර්තුමය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත්වල පළකර ඇත.
3.6.ii.ඇ.IV	සේවා කාලය, විගණක ගාස්තුව හා විගණකවරයා ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම විගණන සහකරුගේ සේවා කාලය වසර 05 නොඉක්මවීම අනුව සේවයෙන් ඉවත්කිරීම හා පෙර සේවා කාලය සම්පූර්ණ වූ දිනයේ සිට වසර තුනක් ගතවීමට පෙර අදාළ විගණක සහකරු නැවත සේවයේ පිහිටුවා නොතිබීම පරීක්ෂා කිරීම.		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 65 වගන්තිය, මුදල් පනත/විගණන පනත සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වෙයි.
3.6.ii.ඈ.	තම ස්වාධීනත්වය පිළිබඳව බාහිර විගණකවරුන්ගේ කරුණු ඉදිරිපත් කිරීම කමිටුව ලබාගෙන තිබීම හා විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය අනුව, විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ බාහිර විගණකවේ.

3.6.ii.ඉ.	අදාළ රෙගුලාසිවලට අනුව විගණන නොවන සේවා සැපයීමට බාහිර විගණකවරයකුගේ සේවය ලබා ගැනීමේ ප්‍රතිපත්තියක් කමිටුව අනුගමනය කර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම.		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය අනුව□ විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ බාහිර විගණකවේ.
3.6.ii.ඊ	විගණනය ආරම්භ කිරීමට ප්‍රථම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව විගණනයේ විෂයපථය හා ස්වභාවය කුමක් දැයි බාහිර විගණකවරුන් සමග කමිටුව සාකච්ඡා කර තීරණය කර තිබේ දැයි පරීක්ෂා කිරීම.		විගණන කමිටුව බාහිර විගණක සමග විගණනයේ විෂය පථය හා ස්වභාවය සාකච්ඡා කර ඇත. විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව පවත්වන ලද බව විගණන වාර්තාව සඳහන් කරයි.
3.6.ii.උ	එළිදැක්වීම් සඳහා පිළියෙළ කර ඇති බැංකුවේ කාර්තුමය වාර්තා, ගිණුම්, වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයන්හි විශ්වාසනීයත්වය අධීක්ෂණය කිරීම සඳහා මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමට කමිටුව ක්‍රියාවලියක් සහ පහත සඳහන් දෑ ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගෙන් ලබාගැනීමටද ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම; ප්‍රධාන තීන්දු ගතයුතු ක්ෂේත්‍ර ගිණුම් ප්‍රතිපත්ති හා ව්‍යවහාරවල වෙනස්වීම්; අඛණ්ඩතාව පිළිබඳ උපකල්පනය; සහ අදාල ගිණුම්කරණ ප්‍රමිති හා වෙනත් නෛතික අවශ්‍යතා සමග අනුකූලතාවය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේදී පැනනගින ප්‍රධාන ගැලපීම්	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් විගණන කමිටු රැස්වීම් තුළින් මූල්‍ය තොරතුරු සමාලෝචනය කර ඇත. රැස්වීම් දිනය : 2024.02.22 රැස්වීම් දිනය : 2024.04.25 රැස්වීම් දිනය : 2024.04.29 රැස්වීම් දිනය : 2024.07.24 රැස්වීම් දිනය : 2024.10.29 රැස්වීම් දිනය : 2024.12.11
3.6.ii.ඌ	විගණනයට සම්බන්ධ විධායක කලමනාකාරිත්වය සහභාගි නොවන යම්කිසි කරුණකට අදාළව බාහිර විගණකවරුන් කමිටුව හමුවීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය	විධායක කලමනාකරණය නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකවරයා හමුවී තිබිණි. වර්ෂය තුල එවැනි කරුණක් පැන නොනැගිණි.
3.6.ii.එ	බාහිර විගණකගේ කලමනාකරණ ලිපිය හා ඒ සඳහා කලමනාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව සමාලෝචනය කර ඇති බව පරීක්ෂා කිරීම.		2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන පරිච්ඡේදය යටතේ නිකුත්කර ඇති 2023 වර්ෂය සඳහා වන විස්තරාත්මක කලමනාකරණ විගණන වාර්තාව කලමනාකරණය විසින් සමාලෝචනය කර ඇත.
3.6.ii.ඒ	බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළව කමිටුව පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලබන බව පරීක්ෂා කිරීම.		
3.6.ii.ඒ.I	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සම්පත් කාර්යයන් සහ විෂය පථයේ ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කරන අතර දෙපාර්තමේන්තුවට එහි වැඩ කටයුතු සිදුකරගෙන යෑම සඳහා අවශ්‍ය බලතල ඇති බවට සෑහීමකට පත් වෙයි.	අනුකූලවිය	2024 අභ්‍යන්තර විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු පත්‍රිකා අංක BAC 23/04/03 මගින් 2023.12.08 වෙනි දින පැවති රැස්වීමේදී අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මගින් අභ්‍යන්තර විගණන අංශයට ඔවුන්ගේ වැඩකටයුතු කරගෙන යෑමට අවශ්‍ය බලතල අභ්‍යන්තර විගණන අංශය වෙත ලබා දී ඇත.
3.6.ii.ඒ.II	අභ්‍යන්තර විගණන වැඩ සටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සඳහා අවශ්‍යතාවය පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත සුදුසු පියවර ගැනීම සහතික කිරීම	අනුකූලවිය	විගණන කමිටුව විසින් කාර්තුමය ලෙස අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කර ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත.

3.6.ii.ඒ.III	අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කිසියම් ඇගයීමක් හෝ තක්සේරුවක් පිළිබඳ සමාලෝචනය කිරීම.	අනුකූලවිය	කාර්යසාධන කරුණු වලදී විගණන කමිටු සභාපතිවරයා ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය ඇගයීම සිදුකරයි. අභ්‍යන්තර විගණන අංශයේ ජ්‍යේෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය තක්සේරු කිරීම ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සිදු කරයි.
3.6.ii.ඒ.IV	අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රධානි හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ බාහිර සේවා සපයන්නන්ගේ පත්කිරීම හෝ සේවය අවසන් කිරීම නිර්දේශ කිරීම.	අනුකූලවිය	කමිටුවේ නිර්දේශ මත ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා පත්කර ඇත. 2024 වසර තුළ සේවය අවසන් කිරීම් සිදු වී නොමැත.
3.6.ii.ඒ.V	ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිර සේවා සපයන්නන් ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් කමිටුව ඇගයීමට ලක් කරන අතර ඉල්ලා අස්වීම සඳහා හේතු ඉදිරිපත් කිරීමට ඉල්ලා අස්වන ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිර සේවා සපයන්නන් වෙත අවස්ථාව ලබා දෙන බව පරීක්ෂා කිරීම;	අනුකූලවිය	2024 වර්ෂය තුලදී එවැනි අවශ්‍යතාවයක් පැන නැගී නැත.
3.6.ii.ඒ.VI	අභ්‍යන්තර විගණන කාර්ය එහි විගණන ක්‍රියාකාරකම් වලින් ස්වාධීනව සිදුකරන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණක කාර්‍යයන් ස්වාධීන විගණනයක් සිදුකරන බව තහවුරු කරයි. අභ්‍යන්තර විගණන කාර්‍යය එය විගණනය කරන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන වෙයි.
3.6.ii.ඔ	අභ්‍යන්තර පරීක්ෂණවලින් සොයාගත් කරුණු හා ඒ සඳහා කලමනාකරණය දැක්වූ ප්‍රතිචාර කමිටුව විසින් සැලකිල්ලට ගෙන ඇත්දැයි තහවුරු කරගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සමාලෝචිත කාලසීමාව තුල සමාලෝචනය කරන ලද ප්‍රධාන සොයාගැනීම් සහ කලමනාකරණ ප්‍රතිචාර කමිටු වාර්තාවල සටහන් කර ඇත.
3.6.ii.ඕ	කමිටුව විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව බාහිර විගණකරුවන් සමග අවම වශයෙන් කමිටු රැස්වීම දෙකක් පවත්වා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	2024 වර්ෂයේදී සියලුම විගණන කමිටු රැස්වීම් වලට විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකු සහභාගීවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයින්ට කිසිම විධායක අධ්‍යක්ෂවරයෙකු ඇතුලත් නොවේ.
3.6.ii.ක	පහත තත්ත්වයන් තහවුරු කිරීම සඳහා කමිටුවේ සමුද්දේශ්‍ය පරීක්ෂා කරන ලදී විෂය ක්ෂේත්‍රය තුළ ඇති ඕනෑම කරුණක් විභාග කිරීමේ ස්වාධීන පැහැදිලි බලය එසේ කිරීම සඳහා අවශ්‍ය සම්පත් හා තොරතුරු වෙත පූර්ණ ප්‍රවේශයත් සහ බාහිර වෘත්තිමය උපදෙස් ලබා ගැනීමේ බලතල හා අදාළ අත්දැකීම් ඇති බාහිර පුද්ගලයන්හට අවශ්‍ය විටක ආරාධනා කිරීම	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සමුද්දේශ්‍ය විෂයේ අවශ්‍ය කොන්දේසි අඩංගුවේ. කාර්‍යයන් ඉටුකිරීමට අවශ්‍ය සම්පත් වෘතීය උපදෙස් ලබාගැනීමට ඇති බලය තොරතුරු ලබාගැනීමට ඇති බලය ඕනෑම කරුණක් විමර්ශනය කිරීම සඳහා විගණන කමිටු ප්‍රඥප්තිය අනුව කමිටුවට බලය පවරා ඇත.
3.6.ii.ග	කමිටුව අවම වශයෙන් සිව් වතාවක්වත් රැස්වී ඇති බව හා වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය	2024 වසර තුල කමිටුව හය වතාවක් රැස්වී ඇති අතර, ඒ සම්බන්ධ වාර්තා පවත්වාගෙන යයි.

3.6.ii.ච	වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත කරුණු අනාවරණය කර ඇත්දැයි පරීක්ෂා කිරීම. විගණක කමිටුවේ කටයුතු පිළිබඳ විස්තර; වසර තුළ පැවැත්වූ විගණක කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ එවැනි රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පිළිබඳ විස්තර	අනුකූලවිය	විස්තරාත්මක, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවක් වාර්ෂික වාර්තාවේ පිටු දැක්වේ.
3.6.ii.ඡ	කමිටුවේ ලේකම් සමාගම් ලේකම් හෝ එසේ නැතහොත් අභ්‍යන්තර විගණක කාර්යයේ ප්‍රධානියා දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	කමිටුවේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වේ.
3.6.ii.ද	"තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය" (whistle blower) මගින් පහත ක්‍රියාදාමය සිදුකරන්නේ දැයි පරීක්ෂා කිරීමත් මූල්‍ය වාර්තාකරණය අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කටයුතු වල වැරදි (i) ට අදාලව එවැනි කරුණු පිළිබඳව සාධාරණ හා ස්වාධීන පරීක්ෂණයක් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීමට කමිටුව වග බලා ගත යුතුය අදාල පසු විපරම් පියවර	අනුකූලවිය	"තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය, (whistle blower) අභ්‍යන්තර විගණන මැනුවලය සමග අභ්‍යන්තර විගණන අංශය සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සමාලෝචනය කර ඇති අතර 2024.10.29 වන දින පැවති විගණන කමිටු රැස්වීමේදී විගණන කමිටුව විසින් අනුමතකර තිබිනි.
3.6.iii	පහත දැක්වෙන නියමයන් මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට අදාල වන්නේ දැයි පරීක්ෂා කිරීම.		
3.6.iii.අ	වාර්තා හා සමුද්දේශ්‍ය විෂය සමාලෝචනය කර බැංකුවේ අධ්‍යක්ෂවරුන් ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්හට පාරිශ්‍රමික (වැටුප් දීමනා හා වෙනත් මූල්‍ය ගෙවීම්) ප්‍රමාණය තීරණය කිරීම සඳහා කමිටුව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	දැනට පාරිශ්‍රමික පහත පරිදි තීරණය කරයි. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පී.ඊ.ඩී.3/2015 හා රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2020 අධ්‍යක්ෂවරු හා සභාපතිවරයා-සඳහා සහ ප්‍රධාන රාජ්‍ය බැංකු තුනක වැටුප් වර්ධක සලකා බලමින් සාමුහික ගිවිසුමක් මගින් ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමික තීරණය කරන අතර ඉන්පසු ඒවා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශයේ එකගතාවය පරිදි අනුමත කරයි.
3.6.iii.ආ	අධ්‍යක්ෂවරුන් ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් සඳහා ඉලක්ක හා පරමාර්ථ ලිඛිතව සකසා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂවරු" ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාර නිලධාරීන් සඳහා ඉලක්ක හා අරමුණු 2024-2028 සංශෝධිත ආයතනික සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇත. කලින් කලට සපයා ඇති ඉලක්ක හා අරමුණු සඳහා ප්‍රධාන කළමණාකරණයේ නිලධාරීන් හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යසාධන මට්ටම් තවදුරටත් ක්‍රියාවලි ගත කරමින් පවතී.

3.6.iii.ඇ	ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්හට ලබා දී ඇති ඉලක්ක හා අරමුණු පිළිබඳව කාලීනව කාර්යසාධන ඇගැයීම් සිදු කිරීමට කමිටුව අවධානය යොමුකර ඇත්දැයි හා ඔවුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිලාභ හා කාර්යසාධනය පදනම් කරගත් දිරි දීමනා වැනි වෙනත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම පිළිබඳ පරීක්ෂා කිරීම.	අනුකූලවිය	ප්‍රධාන කළමණාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක්කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව විසින් නියමකරන ලද ප්‍රධාන කාර්යසාධක දර්ශක වලට අනුව ඔවුන්ගේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීමෙනි. තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍ර.වි.නි. ගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක්කරයි. අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. සහකාර සාමාන්‍යාධිකාරි-අනුකූලතාගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවදානම් කළමනාකරණ ප්‍රධානීගේ කාර්යසාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමික සාමුහික ගිවිසුම පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරයි.
3.6.iii.ඈ	වාර්තා සමාලෝචනය කරමින් ප්‍රධාන විධායක නිලධාරියාට අදාල කරුණු සාකච්ඡා කරන කමිටු රැස්වීම් වලට ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී නොවන්නේ දැයි සමුද්දේශ්‍ය විෂයෙහි සඳහන් වීම පරීක්ෂා කිරීම	අනුකූලවිය	ප්‍රධාන විධායක නිලධාරිවරයාට සම්බන්ධ කරුණු සාකච්ඡා කරන රැස්වීම් සඳහා ඔහු සහභාගී නොවන බව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු ව්‍යවස්ථාවේ දැක්වේ.
3.6.iv	පහත සඳහන් නීති නාම යෝජනා කමිටුවට අදාළ වන්නේ ද?		
3.6.iv.අ	නව අධ්‍යක්ෂවරු ප්‍ර.වි.නි. හා ප්‍රධාන කලමනාකරණ නිලධාරි තනතුරු සඳහා තේරීම/පත් කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් කමිටුව ක්‍රියාත්මකකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධාන අනුව" අධ්‍යක්‍ෂවරු අමාත්‍යංශය විසින් පත්කරනු ලබයි. ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව තෝරා ගනී. තොරාගත් අපේක්ෂකයා බඳවාගනු ලබන්නේ පිළිවෙලින් නාම යෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය හා අනුමැතිය ඇතිවය.
3.6.iv.ආ	වත්මන් අධ්‍යක්‍ෂවරු නැවත පත්කිරීම සඳහා කමිටුව සලකා බලා නිර්දේශ කර (හෝ නිර්දේශ නොකර) ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	වර්තමාන අධ්‍යක්ෂවරු නැවත පත්කිරීමට (තවදුරටත් කාර්යයේ නියැලීමට) නාම යෝජනා කමිටුව නිර්දේශකර ඇත.
3.6.iv.ඇ	රැකියා විස්තර සමාලෝචනය මගින් ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරි තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා යෝග්‍යතාවය සලකා බැලීමට අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද සහ අනෙකුත් ප්‍රධාන අවශ්‍යතා වැනි නිර්ණායක කමිටුව සකසා ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	ප්‍ර.වි.නි. හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අවශ්‍ය සුදුසුකම් පළපුරුද්ද අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇතුළත් වේ.
3.6.iv.ඈ	ව්‍යාවස්ථාවෙහි හා විධිවිධාන 3 (3) හි නිර්ණායකයන්හි දක්වා ඇති පරිදි තමන් දරන නිලය සඳහා තමන් සුදුසු හා උචිත පුද්ගලයින් බවට අත්සන් කල ප්‍රකාශනයක් අධ්‍යක්‍ෂවරුන්, ප්‍ර.වි.නි. හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගෙන් කමිටුව ලබාගෙන ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්‍ෂවරු සියළු දෙනා හා ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් විසින් සම්පූර්ණ කළ ප්‍රකාශ අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම් විසින් ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවට යොමුකර ඇත.

3.6.iv.ඉ	විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලස්මක් පිළිබඳව කමිටුව අවධානය යොමුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය මගින් අධ්‍යක්ෂවරු පත් කිරීම පාලනය වන අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට කලින් කලට අධ්‍යක්ෂවරු පත්කිරීම/නම් කිරීම අමාත්‍යවරයා විසින් සිදු කරයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික ප්‍රතිපත්තිය 2024 දෙසැම්බර් 13 වන දින අනුමත කර ඇත.
3.6.iv.ඊ	ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකින් සමන්විත කමිටුවේ සභාපතිත්වය ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විසින් දරන බව පරීක්ෂා කිරීම් ප්‍ර.වි.නි. හට ආරාධනයෙන් රැස්වීම් වලට සහභාගී විය හැක.	අනුකූලවිය	කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විතවේ. එක් අයෙකු විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා විකල්ප සාමාජිකයකු වන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ. කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ. ප්‍ර.වි.නි. රැස්වීම් සඳහා ආරාධනයෙන් පැමිණේ.
3.6.v	පහත සඳහන් නීති අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුවට (BIRMC) අදාළ වන්නේ දැයි පරීක්ෂා කිරීම:		
3.6.v.අ	විධායක නොවන අධ්‍යක්ෂවරු අවම වශයෙන් තිදෙනෙක් හා ප්‍ර.වි.නි. සහ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් හා උපාය මාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් අධීක්ෂණය කරන ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්ගෙන් කමිටුව සමන්විත වන අතර, කමිටුවට පවරා ඇති බලතල හා වගකීම් රාමුව තුළ කටයුතු කරයි.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනකරණ කමිටුව එක් විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකු හා ස්වාධීන විධායක නොවන විකල්ප සාමාජිකයකු වන එක් අධ්‍යක්ෂවරයෙකු ඇතුළු සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි, අවදානම් කලමනාකරණ ප්‍රධානී අනුකූලතා නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුවේ ලේකම් ඇතුලත්වේ.
3.6.v.ආ	බැංකුව මුහුණ දෙන ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් හා ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් මාසික පදනමක් මත සුදුසු අවදානම් දර්ශක හා කලමනාකරණ තොරතුරු මගින් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් කමිටුවට තිබේ දැයි පරීක්ෂා කිරීම පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන්, බැංකු පදනම මත හා සමූහ පදනම මත අවදානම් කලමනාකරණය සිදු කරයි.	අනුකූලවිය	අවදානම් කලමනාකරණ අංශය (RMD) මගින් ණය අවදානම, වෙළෙඳපොල අවදානම හා මෙහෙයුම් අවදානම, උපාය මාර්ගික අවදානම සහ ද්‍රවශීලතා අවදානම ප්‍රමාණවත් අයුරින් තක්සේරුකර, කාර්තුමය පදනමින් වාර්තා මෙම කමිටුවට යොමු කරයි. අමතරව අවදානම් හිමිකරුවන්ට තම අවදානම් හඳුනා ගැනීම සඳහා අවදානම් කලමනාකරණ අංශ පරීශිලකයින් වෙත යොමු කර ඇත.
3.6.v.ඇ	කමිටුව විසින් විශේෂයෙන් සඳහන් කර ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාතුල මෙම අවදානම් කලමනාකරණය කිරීමට හා විශේෂිත අවදානම් සඳහා අවධානය යොමුකිරීමට ණය කමිටුව සහ වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මක බව හා ඵලදායී බව කමිටුව සමාලෝචනය කරයි.	අනුකූලවිය	ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් වන ණය, ද්‍රවශීවලතා, මෙහෙයුම්, උපායමාර්ගික සහ අනුකූලතා සම්බන්ධ කරුණු අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සාකච්ඡා කර ඇත. ප්‍රධාන අවදානම් දර්ශක (KRI) මගින් අදාල අවදානම් සීමා සහ වගකිව යුතු කණ්ඩායම්/ නිලධාරීන්/ කමිටු නිරූපනය වේ. යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සමග අවදානම් දරන්නන් විසින්ම කාර්තුමය ප්‍රධාන අවදානම් දර්ශක වාර්තා කිරීමක් අවශ්‍යවේ.
3.6.v.ඈ	විශේෂයෙන් සඳහන් කර ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඉක්මවන අවදානම් දර්ශක සියල්ල කමිටුව සමාලෝචනය කර සැලකිල්ලට ලක්කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	විශේෂයෙන් සඳහන් කර ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඉක්මවන අවදානම් දර්ශක සියල්ල කමිටුව සමාලෝචනය කර සැලකිල්ලට ලක්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද අවදානම් මට්ටම් සාරාංශ පත්‍රිකාවෙන් විචක්ෂණ මට්ටමින් ඉදිරියට ගිය අවදානම් දර්ශක පිළිබඳ කමිටුව විශේෂ අවධානය යොමුකිරීමත් නිසි උපදෙස් ලබාදීමත් සිදු කර ඇත.

3.6.v.ඉ	අවම වශයෙන් කාර්තුවකට කමිටුව කොපමණ වාරයක් රැස්වී ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව 2024 වසර තුළ පස් වතාවක් හමුවී ඇත.
3.6.v.ඊ	සුවිශේෂි අවදානම් හඳුනාගැනීමට අපොහොසත්වීම සඳහා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත්ව සැකසු විනය ක්‍රියාමාර්ග ක්‍රමවේදයක් කමිටුව විසින් සමාලෝචනය කර ක්‍රියාත්මක කලේ දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	සියළුම විනය ක්‍රියාමාර්ග රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විනය කලමනාකරණ නීතිරීති මගින් පාලනය කරන අතර, එවැනි පියවර ගැනීමට අවශ්‍ය වූ විටදී කමිටුවට ඒ පිළිබඳ දන්වනු ලබයි. කමිටුව කාර්තුමය පදනමක් මත හමුවන බැවින්, එවැනි සිදුවීම් මූලිකවම සාමාන්‍යාධිකාරී (විනය බලධාරියා) වෙත වර්තා කරන අතර විනය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලබයි.
3.6.v.උ	කමිටුව එක් එක් රැස්වීමකින් සතියක කාලයක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩල අදහස් එකඟත්වය හා/හෝ/විශේෂ උපදෙස් පතා අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන්නේ දැයි පරීක්ෂාකිරීම	අනුකූලවිය	සෑම රැස්වීමකින් පසුව කමිටුව අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ දැන ගැනීම පිණිස හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමුකර තිබිනි.
3.6.v.ඌ	බැංකුව නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන හා සියලු ව්‍යාපාරික මෙහෙයුම් ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්ති සමග බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර තිබේද යන්න සහ කමිටුව වෙත කාලීනව වාර්තා කිරීම සඳහා අනුකූලතා කාර්යය කරගෙන යාමට ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් අතරින් තෝරාගත් සුදුසු අනුකූලතා නිලධාරියෙක් සිටි ද යන්න පරීක්ෂා කිරීම.	අනුකූලවිය	අනුකූලතා කාර්යයන් සඳහා අනුකූලතා නිලධාරියකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත. සහකාර සාමාන්‍යාධිකාරී-අනුකූලතා විශ්‍රාමයෑමත් සමග එම තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවා ගන්නා තෙක් එම රාජකාරිය ආවරණය කිරීම සඳහා බැංකුව අනුකූලතා කළමනාකරුවෙකු පත්කර ඇත. අනුකූලතා නිලධාරියා අනුකූලතා කාර්යයන් නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි.
3.7	සම්බන්ධිත පාර්ශවකාර ගනුදෙනු		
3.7.i	යම්කිසි අයෙකු හා විශේෂයෙන්ම මෙම නියෝග යේ අරමුණ සඳහා "සම්බන්ධිත පාර්ශ්ව" ලෙස සලකා බැලිය හැකි පහත දැක්වෙන පුද්ගල වර්ග සමඟ බැංකුවේ කිසියම් හෝ ගනුදෙනුවක් සිදුකිරීමේදී ඇතිවිය හැකි බැඳියා පිළිගැටුම් වැලැක්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට පිළිගත් හා ලිඛිත ක්‍රියාවලියක් ඇත්දැයි පරීක්ෂා කිරීම; අ බැංකුවේ යම්කිසි පරිපාලිත සමාගම්; ආ බැංකුවේ යම්කිසි ආශ්‍රිත සමාගම් ඇ බැංකුවේ කිසියම් අධ්‍යක්ෂවරයෙකු ඈ බැංකුවේ යම්කිසි ප්‍රධාන කලමනාකරණ නිලධාරීන්; ඉ බැංකුවේ අධ්‍යක්ෂවරුන් ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් කවරෙකුගේ හෝ සමීපතම ඥාතියෙකු; ඊ බැංකුවේ සැලකියයුතු හිමිකමක් ඇති කොටස්කරුවෙක් උ බැංකුවේ කිසියම් අධ්‍යක්ෂවරයෙකු හෝ බැංකු අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් සමීප ඥාතියෙකු හෝ එහි සැලකියයුතු කොටස්කරුවන්හට සැලකියයුතු උනන්දුවක් ඇති සුවිශේෂි අවස්ථාවක	අනුකූලවිය	බැඳියා පිළිගැටුම් වැලැක්වීම සඳහා ගනුදෙනු කරගෙන යාමට පෙර සම්බන්ධිත පාර්ශ්ව හඳුනාගැනීම සඳහා ස්ථාපිත ක්‍රියාවලියක් ඇත. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 24/11/BD (APP) 15 2024.12.27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 24.11.153.04

3.7.ii	පහත ආකාරවල ගනුදෙනු මෙම නියෝගයේ ආවරණය කරන සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනුවක් ලෙස හඳුනා ගැනීම හා වාර්තා කිරීමේ ක්‍රම වේදයක් ඇති දැයි පරික්ෂා කිරීම.	අනුකූලවිය	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා අංක 24/11/BD (APP) 15 2024.12.27 දිනැති අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තා අංක 24.11.153.04.
3.7.ii.අ	උපරිම ණය පහසුකම් ප්‍රමාණයක් පිළිබඳ මූල්‍ය මණ්ඩල නියෝග යේ දක්වා ඇති පරිදි ඕනෑම වර්ගයක ණය මුදලක්		1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 28 වගන්තියට අනුව, යම් අධ්‍යක්‍ෂවරයෙක්ට හෝ සේවකයෙක්ට හෝ යම් සමාගමකට හෝ අධ්‍යක්‍ෂවරයෙක්ට හෝ සේවකයෙක්ට සැලකියයුතු හිමිකමක් ඇති යම් ආයතනයකට බැංකුව විසින් කිසිදු ණය මුදලක් පිරි නොනමයි.
3.7.ii.ආ	තැන්පත්, ණයගැනීම් හා ආයෝජන ලෙස බැංකුවේ යම්කිසි වගකීමක් නිර්මාණය කිරීම.		සමාලෝචනයට භාජනයවන කාලය තුල තැම්පතු, ණය ගැනීම් සහ ආයෝජන ආකාරයෙන් එවැනි වගකීම් නිර්මාණයවී නොමැත.
3.7.ii.ඇ	බැංකුවට ලබාදෙන හෝ බැංකුවෙන් ලබා ගන්නා මූල්‍ය හෝ මූල්‍ය නොවන ආකාරයේ කිසියම් සේවා සැපයීම.		සමාලෝචනයට භාජනයවන කාලය තුලදී මූල්‍ය හෝ මූල්‍ය නොවන එවැනි සේවාවන් සපයා නොමැත.
3.7.ii.ඈ	බැංකුව හා අදාළ කිසියම් හෝ පාර්ශවයන් අතර තොරතුරු හුවමාරු හා දැනුම්දීමේ ක්‍රම ඇතිකිරීම හෝ පවත්වාගෙන යෑම මගින් එවැනි අදාළ පාර්ශ්වයන්ට වාසිවිය හැකි තීරණාත්මක තොරතුරු එසේ නැතහොත් හිමිකාරත්වයන් බෙදී යාම		සමාලෝචනයට භාජනයවන කාලය තුල එවැනි ජේඛීය වාර්තාකරන නිර්මාණයවී නොතිබිනි.
3.7.iii	ඉහත 3(7)(1) නියෝගයේ දක්වා ඇති පරිදි සම්බන්ධිත පාර්ශව සමග බැංකුව ගනුදෙනුවල නිරත නොවන බව සහතික කිරීමත් සහ එවැනි පාර්ශව සඳහා එකම ව්‍යාපාරයේ නිරත බැංකුවේ අනිකුත් ගනුදෙනුකරුවන්ට වඩා වැඩි සැලකිල්ලක් ලබාදෙන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ක්‍රියාවලියක් තිබේද	අනුකූලවිය	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. (අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා අංක 24/11/BD (APP) 15 2024.12.27 දිනැති අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තා අංක 24.11.153.04.

3.7.iii.අ	මෙම උප නියෝගයන්ගේ කාර්ය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනු ලබන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ මට්ටම ඉක්මවායන මුළු ශුද්ධ ණය පහසුකම් සම්බන්ධිත පාර්ශව සඳහා අනුමත කිරීම. "ණය පහසුකම, යන්නෙන් උපරිම ණය පහසුකම් මත 2007 අංක 7 දරණ බැංකු පනතේ නියෝගවල සඳහන් ණය පහසුකම අදහස් වේ. මුළු ශුදධ ණය පහසුකම් ගනනය කරනු ලබන්නේ මුළු ණය පහසුකම් ප්‍රමාණයෙන් එවැනි සම්බන්ධිත පාර්ශව විසින් බැංකුවේ හුවමාරු ප්‍රාග්ධනයේ හා ණය උපකරණවල වසර 5ක් හෝ ඊට වැඩි කල්පිරීමේ කාලයක් සහිත මුදල් ඇපසුරැකුම් හා ආයෝජන අඩු කිරීමෙනි. ආ. අසම්බන්ධිත සෑම පාර්ශවයක් සමග සම ගනුදෙනුවක් සඳහා බැංකුවේ ඉහළ ණය අනුපාතිකයට වඩා අවම පොලී අනුපාතයක් අයකිරීම හෝ බැංකුවේ තැන්පතු අනුපාතයට වඩා වැඩියෙන් ගෙවීම; ඇ. සම්බන්ධිත නැති පාර්ශ්ව සමඟ ගණුදෙනු කිරීමේ සාමාන්‍ය ක්‍රමයට ලබාදෙන කොන්දේසි පරයායන සහනශිලි කොන්දේසි, වෙළඳ අඩුපාඩු පියවීම හා/හෝ ගාස්තු/කොමිස් කපා හැරීම වැනි විශේෂිත සැලකීම් දැක්වීම. ඈ. ඇගැයුම් ක්‍රමවේදයකින් තොරව සම්බන්ධිත පාර්ශ්වයකින් සේවා සැපයීම සහ සේවා ලබා ගැනීම. ඉ. කාර්යසාධනය සදහා අවශ්‍යවන සුදුසු රාජකාරි හා කාර්යයන් හැර සම්බන්ධිත පාර්ශව සමග යෝග්‍ය විය හැකි රහසිගත හෝ වැදගත් තොරතුරු හුවමාරුවීම සදහා හේතුවන තොරතුරු ගලායෑමක් සහ වාර්තාකරණ ක්‍රම පවත්වාගෙන යෑම.		අධ්‍යක්‍ෂවරුන් සඳහා පහසුකම් පිරිනමා නැත. ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් විසින් ලබාගන්නා සේවක නිවාස ණය පහසුකම් අනුමත ණය සීමාව ඇතුලත පමණක් වේ.
3.7.iv	බැංකුවේ කිසියම් අධ්‍යක්‍ෂවරයෙකුට හා ප්‍රධාන කලමනාකරණ නිලධාරියෙකුට ණය පහසුකම් ලබාදීමේ ක්‍රමවේදයක් ඇත්දැයි යන්න හා එසේ ණය පහසුකම් දීම බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කලයුතු බව සහ එහිදි අදාළ අධ්‍යක්‍ෂ හැර අධ්‍යක්‍ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්‍ෂවරුන් ඒ සඳහා වූ යෝජනාවට පක්ෂව ඡන්දය දීමටත් එසේ ලබාදෙන ණය පහසුකම් සඳහා මූල්‍ය මණ්ඩලයද වරින්වර තීරණය කරනු ලබන ඇපයකින් ආරක්ෂා වියයුතු බව පරීක්ෂා කිරීම.		එවැනි ණය මුදලක් අනුමතකර නොමැත.
3.7.v.අ	බැංකුව මගින් කිසියම් පුද්ගලයෙකුට හෝ ඔහුගේ සමීප නෑදෑයකුහට හෝ සැලකියයුතු සම්බන්ධයක් ඇති පුද්ගලයෙකුට ණය පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලියක් බැංකුව සතුව පවතී දැයි පරීක්ෂා කිරීම් සැලකිය යුතු සම්බන්ධයක් ඇති පුද්ගලයෙකු (පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂ ධූරයකට පත්වන) කිසියම් කරුණකට අදාළව ණය පහසුකම් ලබාදීමේ ක්‍රමවේදයක් බැංකුව සතුව තිබේ දැයි හා මූල්‍ය මණ්ඩලය විසින් අනුමතකර ඇති අත්‍යාවශ්‍ය ඇප ලබාගැනීමට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කල දිනයේ සිට වසරක් ඇතුලත බැංකුව ගෙන ඇති පියවර පිළිබඳව පරීක්ෂා කිරීම.		එවැනි ණය පහසුකමක් අනුමතකර නොමැත.

3.7.v.ආ	උක්ත 3(7)(ඩ)(ඒ) උපදේශයේ දක්වා ඇති පරිදි අදාල කාලයට ඇප සපයා නොමැති අවස්ථා පරීක්ෂාකර තිබේද උක්ත 3(7)(v)(ta) උපදේශයේ දක්වා ඇති පරිදි අදාල කාලයට ඇප සපයා නොමැතිවිම පරීක්ෂාකිරීම, එවැනි අධ්‍යක්ෂවරයෙකු පත්කර මාස 18ක කාලයක් ගතවීමේ දී හෝ ණය පහසුකම් අනුමත කිරීමේදී ගිවිසගත් කාලය ඇතුලත, කුමක් කලින් සිදුවූවත් පොලියක් තිබේනම් ඒ සමග ණය මුදල් ගිණුමෙන් අයවිය යුතු ප්‍රමාණය අයකර ගැනිමට බැංකුව පියවර ගෙන තිබේද? එවැනි අධ්‍යක්ෂවරයෙකු පත්කර මාස 18ක කාලයක් ගතවීමේ දී හෝ ණය පහසුකම් අනුමත කිරීමේ දී ගිවිසගත් කාලය ඇතුලත කුමක් කලින් සිදුවූවත් පොලියක් තිබේ නම් ඒ සමග ණය මුදල් ගිණුමෙන් අයවිය යුතු ප්‍රමාණය අයකර ගැනිමට බැංකුව පියවර ගෙන ඇත.		එවැනි ණය පහසුකමක් අනුමතකර නොමැත.
3.7.v.ඇ	ඉහත සඳහන් පරිදි නියෝගයට අවනත විමට අපොහොසත්වන කිසියම් හෝ අධ්‍යක්‍ෂවරයෙකු හඳුනාගැනීමට සහ තම අධ්‍යක්‍ෂධුරය අතහැර ගිය අයෙකු ලෙස සැළකීමටත් එවැනි සිදුවීම් බැංකුව මහජනතාවට හෙලි කිරීමේ ක්‍රමවේදයක් ඇත්දැයි පරීක්ෂා කිරීම		සිදුවී නැමැත.
3.7.v.ඈ	ණය පහසුකම් අනුමතකරන සමය වන විට 3(7)(v)(c) වගන්තිය කිසියම් අධ්‍යක්ෂ වරයෙකුට අදාල නොවන්නේ දැයි පිළිබඳ තහවුරු කිරීමට ක්‍රියාවලියක් තිබේ දැයි පරීක්ෂාකිරීම, ණය පහසුකම් අනුමතකරන සමයවන විට බැංකුවේ සේවකයකුට සිටි කිසියම් අධ්‍යක්ෂවරයෙකුට 3(7)(v)(c) වගන්තිය අදාල නොවන්නේ ද පිළිබඳ තහවුරු කිරීමට ක්‍රියාවලියක් තිබේද යන්න පරීක්ෂා කිරීම සහ එම ණය පහසුකම් අනුමතකර ඇත්තේ එවැනි බැංකුවක සියලුම සේවකයින්ට අදාලවන යෝජනා ක්‍රමයක් යටතේ වන අතර එම අධ්‍යක්ෂවරයා එහි සේවකයකු වී සිටීම නිසා හා එවැනි බැංකුවක සේවකයින් සියල්ලටම අදාලවන යෝජනා ක්‍රමයක් යටතේ ණය පහසුකම් අනුමතකර ඇත.		සිදුවී නැමැත.
3.7.vi	එවැනි බැංකුවක සේවකයින්ට අදාලවන හෝ උක්ත 3(7)(v) උපදේශයට අනුව ණය පහසුකම් හෝ සහන සැළසීමට අදාලව මූල්‍ය මණ්ඩලය විසින් අනුමතකර තිබිය හැකි ඇපය මගින් සහන අත්විම එවන් අවස්ථාවකදී හැර කිසියම් සේවකයකුට හෝ එවැනි සේවකයකුගේ සමීප ඥාතියෙකුට හෝ සේවකයාට හෝ ඥාතියාට සම්බන්ධිත වෙනත් කිසියම් අයෙකු සඳහා හෝ ගාස්තු හා/හෝ කොමිස් කපාහැරීම බැංකුව කිසියම් ණය පහසුකමක් මුදලක් හෝ "වඩාත් හිතකර සැළකීමක්" ලබා දීම හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ඇත්දැයි පරීක්ෂා කරන ලදී.		සිදුවී නැමැත.

3.7.vii.	උක්ත 3(7)(ඩ) හා 3(7)(vi) නියෝග යටතේ බැංකුව විසින් කිසියම් ණය පහසුකමක් සඳහා මුල්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇත්දැයි හා එවැනි අනුමැතියක කොටසක් හෝ එමගින් ලැබෙන පොළී මුදලක් මුල්‍ය මණ්ඩලයේ පූර්ණ අනුමැතිය රහිතව බැරකර ඇති බව හා එවැනි අනුමැතිය රහිත කිසියම් බැර කිරීමක් වලංගු බවක් නැති බව පරීක්ෂා කිරීම.		සිදුවී නොමැත.
3.8.	හෙලිදරව් කිරීම්		
3.8.i.අ	අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් නිර්දේශිත ආකෘතියට හා අදාල ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සංක්ෂිප්තව සකසා ප්‍රවෘත්ති පත්‍රවල පළකිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය හෙළිදරව් කර තිබේදැයි පරික්ෂා කිරීම.	අනුකූලවිය	අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් නිර්දේශිත ආකෘතියට හා අදාල ගිණුම්කරණ පිරිවිතර වලට අනුව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කරයි තවද එම ප්‍රකාශන පහත සඳහන් පුවත්පත්වල පළ කරන ලදී. ද අයිලන්ඩ් දිනමිණ තිනකුරල්
3.8.i.ආ	කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සකස්කර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සංක්ෂිප්තව පුවත් පත්වල පළකරන ලදී.	අනුකූලවිය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුව කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ද ඉහත සඳහන් පරිදි ප්‍රසිද්ධ කර ඇති බව නිරීක්ෂණය කරන ලදී.
3.8.ii	අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන අවම හෙලිදරව් කිරීම සිදුකර ඇත්දැයි පරීක්ෂා කිරීම.		
3.8.ii.අ.	විශේෂිත හෙලිදරව් කිරීම් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවට වූ ප්‍රකාශනය	අනුකූලවිය	මෙම විස්තර "මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම්, යටතේ එලි දක්වා ඇත.
3.8.ii.ආ	මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මූල්‍ය වාර්තාකරණ විශ්වාසදායිත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සකස්කර තිබීම සහ බාහිර අවශ්‍යතා සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුකර තිබීම පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව	අනුකූලවිය	මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය පිලිබඳ අධ්‍යක්‍ෂවරුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ අඩංගුවේ.
3.8.ii.ඇ	අධ්‍යක්‍ෂ මණ්ඩලය උක්ත 3(8)(ii)(ආ) සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව බාහිර විගණන වාර්තාව ලබාගෙන ඇත්දැයි පරීක්ෂා කිරීම	අනුකූලවිය	මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය පිලිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත.
3.8.ii.ඈ	යෝග්‍යතාවය හා සුදුසුකම යන මාර්ගෝපදේශයට අවශ්‍යතා සැපිරීම සහ බැංකුව සමග සිදු කරන ගනුදෙනු සහ බැංකුව මගින් ගෙවනු ලබන මුළු ගෙවීම් පාරිශ්‍රමික නම් සහ සුදුසුකම්, වයස පළපුරුද්ද ඇතුළු අධ්‍යක්‍ෂවරුන්ගේ විස්තර	අනුකූලවිය	අධ්‍යක්‍ෂවරුන්ගේ විස්තර වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත. අධ්‍යක්‍ෂවරුන්ගේ පාරිශ්‍රමික වාර්ෂික වාර්තාවේ එළිදරව් කර ඇත.
3.8.ii. ඉ	3(7)(iii) හි පෙන්වා දී ඇති අදාළ පාර්ශ්වවල එක් එක් වර්ගය සඳහා සමස්ථ ශුද්ධ ණය පහසුකම් දීම සිදු කර ඇත. අදාළ පාර්ශ්වවල එක් එක් වර්ගය සඳහා ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කර ඇත.	අනුකූලවිය	සම්බන්ධිත පාර්ශව සඳහා ණය පහසුකම් සපයා නොමැත.

3.8.ii.ඊ	බැංකුව විසින් එහි ප්‍රධාන කලමනාකරණ නිළධාරීන්හට ගෙවනු ලබන පාරිශ්‍රමිකවල මුළු වටිනාකම හා බැංකුව එහි ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් සමග ඇති ගනුදෙනු වල මුළු වටිනාකම ගෙවූ පාරිශ්‍රමික, ලබාදුන් ණය පහසුකම් හා බැංකුවේ කල තැන්පත් හෝ ආයෝජන ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩල ප්‍රභේද දක්වා ඇත.	අනුකූලවිය	ප්‍රධාන කළමණාකරන නිලධාරීන් සමග සිදුවූ ගනුදෙනු වාර්ෂික වර්තාවේ එළිදරව් කර ඇත.
3.8. ii.උ	අධ්‍යක්‍ෂ මණ්ඩලය ආයතනික පාලන නියෝග සමග අනුකූලතාව සම්බන්ධයෙන් බාහිර විගණන වාර්තාව ලබාගෙන ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය	ආයතනික පාලන නියෝග සමග විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අනුකූලතාවය වාර්ෂික වාර්තාවේ අඩංගුවේ.
3.8.ii.ඌ	විචක්ෂණයෙන් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතා නීති රෙගුලාසි හා අභ්‍යන්තර පාලනය සමග අනුකූලවීමේ සහ ප්‍රමාණාත්මක නොගැලපීම් නිවැරදි කිරීමට ගත් පියවර පිළිබඳව විස්තර ඇතුළත් වාර්තාවක්	අනුකූලවිය	වාර්ෂික වාර්තාවෙහි විචක්ෂණශීලිව කටයුතු කිරීමේ අවශ්‍යතාවයන්, නීති රෙගුලාසි, අභ්‍යන්තර පාලනය, සහ කිසියම් ප්‍රමාණාත්මක අනුකූල නොවීමක් නිවැරදි කිරීමට ගත් ක්‍රියා මාර්ග පිළිබඳ විස්තර ඇතුලත් වෙනම වාර්තාවක් නොමැත. කෙසේ නමුත් අදාළ නීති හා රෙගුලාසි සමග අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ අනුකූලතා ප්‍රකාශයක් අඩංගු වෙයි.
3.8. ii.එ	බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දී ඇති මෙම නියෝග හා අනුකූල නොවීම හෝ බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු පිළිබඳව නියාමනය හා අධීක්ෂණය පිළිබඳ ප්‍රකාශයක් එසේ නම් මෙම අඩුපාඩු පිළිබඳව බැංකුව ගත් ක්‍රියාමාර්ගයන් සමඟ මුදල් මණ්ඩලය උපදෙස් දී ඇති පරිදි එය මහජනයාට අනාවරණය කිරීම.	අනුකූලවිය	2024 වසර තුළ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අනුකූල නොවීම සම්බන්ධයෙන් කරුණු දක්වමින් කිසිදු වාර්තාවක් ලබා දී නොමැත.

කඩිනම් සේවාවක් සඳහා පුද්ගලාරෝපිත බැංකු අත්දැකීමක්

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

විගණන කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටු සමුද්දේශ්‍ය විෂය පාලනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කර අනුමත කරනු ලබන විගණන කමිටු ප්‍රඥප්තිය මඟිනි. කමිටුවේ ක්‍රියාකාරිත්වයට අදාළ නව වර්ධනයන් සහතික කිරීම සඳහා 2024 නොවැම්බර් 27 දින විගණන කමිටු ප්‍රඥප්තිය අවසන් වරට සමාලෝචනය කර අනුමත කරන ලදී.

තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය, කළමනාකාරිත්වයේ සහයෝගය සහ එහි රැස්වීම් සඳහා සහභාගීවීමට ඕනෑම විධායක නිලධාරියෙකුට ආරාධනා කිරීමේ නිදහස කමිටුව සතු වේ.

ආයතනික පාලනය සඳහා ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනත් විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද එහි සංශෝධන මඟින් කමිටුවේ සංයුතිය, කාර්යභාරය සහ ක්‍රියාවලිය තවදුරටත් නියාමනය කරනු ලබයි.

මූලික පරමාර්ථ

විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර/ බාහිර විගණන පිළිබඳ වගකීම් දැරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය සපයයි.

කමිටුවේ සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

	සාමාජිකයා	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ දරන තනතුර	පත්වීම් ලද දිනය	පැමිණීම්
1.	මහාචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා	සභාපති (ස්වාධීන අධ්‍යක්ෂ)	26.06.2023	6
2.	එච්. සී. දිලීප් ලාල් සිල්වා මහතා	සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ)	26.06.2023	6
3	එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා	සාමාජික (ස්වාධීන අධ්‍යක්ෂ)	26.06.2023	6

විගණන කමිටුවේ ගණපූරණය, සමාජිකයින් දෙදෙනෙකු හෝ සාමාජිකයින්ගේ බහුතරය යන්නෙන් වැඩි අගය විය යුතුය. 2024 දෙසැම්බර් 31 දිනට සාමාජිකයින් පිළිබඳ විස්තරය පිටු අංක 19 සහ 22 හි දක්වා ඇත.

විගණන කමිටු ප්‍රඥප්තියෙන් ලබා දී ඇති බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා කටයුතු කරයි.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී, බාහිර විගණකවරයෙකු ලෙස රජයේ විගණන නියෝජිත, සහකාර සාමාන්‍යාධිකාරී මූල්‍ය සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක යනු ඇරයුම් ලැබීමෙන් විගණන කමිටුව සඳහා සහභාගී වන නිත්‍ය සාමාජිකයින්ය.

2024 වර්ෂයේ පවත්වන ලද රැස්වීම්

2024 වර්ෂයේදී කමිටුව අවස්ථා හයකදී (06) රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභා රැස්වීම් කටයුතු සභාගත කර අනුමත කරන ලදී. එහිදී ප්‍රධාන ගැටලු, සැලකිය යුතු කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගනු ලැබිණි.

2024 වර්ෂයේදී අවධානය යොමු කළ ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ වාර්තාකරණය

විගණන කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශවල සාධාරණත්වය තක්සේරු කිරීමේදී ගිණුම්කරණ මූලධර්ම, ඇස්තමේන්තුවල සාධාරණභාවය සහ ඒ පිළිබඳ විනිශ්චයන් යොදා ගැනීම පිළිබඳ සාකච්ඡා කොට ඇගයීමට ලක් කරන ලදී.

කමිටුව විසින් 2016 අංක 1 දරන බැංකු පනත් විධිවිධානයේ " අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය පිළිබඳ නියාමන රාමුව" හි විශේෂිත කොට දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව, 2024 වර්ෂය සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධනය ප්‍රමාණවත්ව තක්සේරු කිරීමේ (ICAAP) නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා පවතින අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය ඇගයීමට ලක් කරන ලදී.

නියාමන අනුකූලතාව

අවශ්‍ය සියලු බැංකුකරණ සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවලට බැංකුව අනුකූලවන බව කමිටුව මඟින් සහතික කරන ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් වැඩිදුර අධීක්ෂණ පියවරක් ලෙස සියලුම නියාමන අනුකූලතා අවශ්‍යතා ආවරණය වන පරිදි ස්වාධීන පරීක්ෂණයේ හරිවැරදි බැලීමක් සිදු කරන ලදී.

අභ්‍යන්තර පාලනයන්

සියලුම සැලකිය යුතු අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණවත් බව සහ සඵලතාවය තක්සේරු කිරීම සඳහා අවදානම් පදනම් කරගත් විගණන ක්‍රියාවලියක් බැංකුව විසින් සිදු කරන ලද අතර, අභ්‍යන්තර විගණනයේ විෂය පථයෙහි ආවරණය වර්ධනය කරලීම සහ පුළුල් කරලීම සඳහා කමිටුව විසින් නියමිත ක්‍රියාවලිය සහ නිර්දේශ සමාලෝචනය කරන ලදී.

කමිටුව විසින් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල සඵලතාවය පවත්වා ගැනීම සඳහා හඳුනාගත් අවදානම් සම්බන්ධයෙන් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග පිළිබඳ අවශ්‍ය සහතික කිරීම් ව්‍යාපාර ඒකකවලින් බලාපොරොත්තු වන අතර, එය ලබා ගනු ලබයි.

නිත්‍ය පදනමක් යටතේ සහ යම් අවස්ථාවක් ඇති වුවහොත්, කමිටුව විසින් පාලන ඌනතාවයේ මූලික හේතුව විශ්ලේෂණය කොට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලබයි.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය සහ විෂයමූලිකත්වය සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සහ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළ අත්පොත අධ්‍යයනය කරන ලදී.

විගණන කමිටුව විසින් වාර්ෂික විගණන සැලැස්ම අනුමත කරන ලද අතර, වර්ෂය පුරා එය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සමාලෝචනය කරන ලදී.

වසර තුළදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් බැංකුවේ විවිධ අංශවල සිදු කරන ලද විගණනයක් ඔස්සේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සහ පද්ධති පාලනය කිරීම සඳහා සිදු කළ මුලපිරීම්වල ප්‍රගතිය කමිටුව විසින් අධ්‍යනය කරන ලදී.

විගණන කමිටුව විසින් ශාඛා ණය සහ තැන්පතු කළඹ ඇගයීමට ලක් කරන ලද අතර කාර්යසාධනය වර්ධනය කරලීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තියට අනුව ගනුදෙනුකරුවන් සහ සේවකයින් විසින් සිදු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය මගින් සිදු කරන ලද විමර්ශනය විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර, බැංකුවේ හැසිරීම් සහ කටයුතුවල විනිවිදභාවය වැඩි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන්වලට නව වර්ධනයන් එක් කරමින් යාවත්කාලීන කිරීම සඳහා තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලදී.

බාහිර විගණනය

ව්‍යවස්ථාව අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වේ. වාර්ෂික විගණනයේ අරමුණ සඳහා බාහිර විගණකට අවශ්‍යවන සියලුම තොරතුරු සහ ලියවිලි ලබාදීම කමිටුව විසින් සිදු කරනු ලබයි. කමිටුව විසින් අවසන් විගණන වාර්තාවේ එළිදරව් කර ඇති බාහිර විගණනයේ දී සැලකිල්ලට බඳුන් වූ කරුණු සමාලෝචනය කර ඇති අතර, කළමනාකරණ ලිපියේ සහ කාලාන්තර විගණන විමසුම්වල ඉස්මතු කර ඇති ගැටලු විසඳීම සඳහා කළමනාකාරීත්වය විසින් ගෙන ඇති නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රමාණවත් බව සමාලෝචනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව

මහාචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණක කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව

කමිටුවේ විෂය පථය

ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා තෝරා ගැනීම හෝ පත් කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන විධායක නිලධාරී තනතුරු සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සකස් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව මගින් සිදු කරනු ලබයි. ඊට අමතරව අපේක්ෂකයින් බඳවා ගැනීම සහ පත් කිරීම සඳහා හොඳම ක්‍රියාවලිය සැකසීමට ක්‍රියා කිරීම මගින් කමිටුව විසින් වරින් වර බැංකුව වෙත අමතර හෝ නව විශේෂඥතාවන්ගේ අවශ්‍යතා සලකා බලා නිර්දේශ කළ යුතුය.

කමිටුවේ සංයුතිය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද එක් විකල්ප සාමාජිකයෙකු ද ඇතුළත්ව, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව සමන්විත වේ.

2024 වර්ෂය අවසානයේ දී අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත සඳහන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

- ජේ. එම්. සුසෙයිදාසන් මහතා - සභාපති (2024.10.04 දින ඉල්ලා අස්විය)
- එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා - සාමාජික
- එච්. සී. ඩී. එල්. සිල්වා මහතා - සාමාජික
- මහාචාර්ය ඩී. ඒ. එම්. පෙරේරා මහතා - විකල්ප සාමාජික

කමිටු රැස්වීම්

කමිටුව අවම වශයෙන් වසරකට වරක් රැස්විය යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී රැස්වීම් පිළිබඳ දැනුම්දීම් සිදු කළ හැකිය. ගණපූරණය සාමාජිකයින් දෙදෙනෙකු වන අතර ඔවුන් දෙදෙනාම රැස්වීම හරහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය. කමිටුවේ සභාපතිවරයාගේ නිර්දේශය මත ආරාධිතයෙකු ලෙස රැස්වීම්වලට සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සහභාගී විය යුතුය.

අධ්‍යක්ෂවරුන්ගේ දැනගැනීම පිණිස කමිටු රැස්වීම් කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිරතුරුව වාර්තා කරනු ලබයි. 2024 වර්ෂයේදී කමිටු රැස්වීම් නවයක් (09) පවත්වන ලදී.

රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම

කමිටු සාමාජික	අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා	කමිටුවේ දරන තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන	සහභාගිවූ රැස්වීම් ගණන
1.	ජේ. එම්. සුසෙයිදාසන් මහතා	සභාපති	07	05
2.	එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා	සාමාජික		07
3.	එච්. සී. ඩී. එල්. සිල්වා මහතා	සාමාජික		07
4.	මහාචාර්ය ඩී. ඒ. එම්. පෙරේරා මහතා	විකල්ප සාමාජික		02

ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ (BNC) ලේකම් ලෙස කටයුතු කරනු ලබයි.

එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා
කමිටුවේ තාවකාලික සභාපති
20.01.2025

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

2024 වසර තුළ කමිටුවේ සංයුතිය හා ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් සමන්විත වන අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන විකල්ප සාමාජිකයෙකු ද ඒ අතර වෙයි. කමිටුවේ ගනපූරණය සාමාජිකයින් දෙදෙනෙකි.

2024 වසරේ කමිටු සාමාජිකයින්

- ජේ.එම්. සුසෙයිදාසන් මහතා - සභාපති (2024.10.04 දින ඉල්ලා අස්වී ඇත.)
- එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා - සාමාජික
- බී.ආර්. මඩිහහේවා මහතා - සාමාජික
- එච්.සී.ඩී.එල්. සිල්වා මහතා - සාමාජික

ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

කමිටුවේ විෂයපථය

බැංකුවේ අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරි (ප්‍ර.වි.නි.) සහ ප්‍රධාන කළමණාකරන නිලධාරින්ගේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තීරණය කිරිම සහ මානව සම්පත් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරිම, මානව සම්පත් ප්‍රතිපත්ති, මූලෝපායන්, සැලසුම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරිම සඳහා කමිටුව මග පෙන්වීම් සහ උපදෙස් ලබා දෙයි. කමිටුව අධ්‍යක්ෂවරු, ප්‍ර.වි.නි.ට හා ප්‍රධාන කළමණාකරන නිලධාරින් සඳහා ඉලක්ක හා අරමුණු නියම කරයි. ප්‍ර.වි.නි.ට හා ප්‍රධාන කළමණාකරන නිලධාරින්ට දී තිබෙන ඉලක්ක හා අරමුණුවල කාර්යසාධනය කලින් කලට ඇගයීමට ලක්කරන අතර දිරි දීමනා මත පදනම්වූ කාර්යසාධනය සඳහා වන අනෙකුත් ගෙවීම් හා ප්‍රතිලාභ සහ පාරිශ්‍රමික සංශෝධනය සඳහා පදනමක් තීරණය කරයි.

කමිටු රැස්වීම්

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව අවම වශයෙන් වසරකට එක් වරක් රැස්වෙන අතර අවශ්‍යවූ ඕනෑම අවස්ථාවක රැස්වීම් කැඳවිය හැකි වෙයි. 2024 වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් වාර හතරක් (04) පවත්වා ඇත.

රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වය

අධ්‍යක්ෂවරයාගේ නම	පැවැත්වූ රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
ජේ.එම්. සුසෙයිදාසන් මහතා	04	03
එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා		04
බී.ආර්. මඩිහහේවා මහතා		02
එච්.සී.ඩී.එල්. සිල්වා මහතා		01

එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා
කමිටුවේ තාවකාලික සභාපති
2025.01.20

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය - 2024

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු සිව්දෙනෙක්, බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි., අවදානම් කළමනාකරණ අංශ ප්‍රධානී සහ කමිටුවේ ලේකම්ගෙන් සමන්විතවේ. 2024 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක් පවත්වා ඇත.

පළමුවන, දෙවන, තුන්වන සහ සිව්වන කමිටු රැස්වීම් සඳහා කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

- එච්.සී.ඩී.එල්. සිල්වා මහතා -විධායක නොවන අධ්‍යක්ෂ - කමිටුවේ සභාපති
- එස්.ගලප්පත්ති මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
- බී.ආර් මඩිහහේවා මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
- මහාචාර්ය ඩී.ඒ.එම් පෙරේරා මහතා - විධායක නොවන අධ්‍යක්ෂ (විකල්ප)
- අයි.ටී. අසුරමාන්න මහතා - සාමාන්‍යාධිකාරී ප්‍රධාන විධායක නිලධාරී
- ආර්.කේ.ඒ.එන් රත්නායක මහත්මිය - අවදානම් කළමනාකරණ අංශ ප්‍රධානී
- ඩී. අලහකෝන් මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කළ 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3:6 (v) වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය 2023.12.12 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එය කලින් කලට සමාලෝචනය කරයි. අනුමත කරගත් ප්‍රඥප්තිය තුළින් එහි බලතල, ව්‍යුහය සහ වගකීම් පිළිබඳ අර්ථ දක්වයි.

ප්‍රඥප්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ.

1. බැංකුවේ අවදානම් රුවිය සමාලෝචනය කිරීම.

2. බැංකුවේ ප්‍රධාන අවදානම් ප්‍රතිපත්ති සමාලෝචනය සහ අනුමත කිරීම හා විශේෂිත සීමාවන් සඳහා බැංකුවේ අනුගතවීම පිළිබඳ වාර්තා ලබා ගැනීම.

3. බැංකුව මුහුණ දෙන ණය, වෙළඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් ඇතුළුව විවිධ අවදානම් සහ එක් එක් වර්ගවලට නිරාවරණයවීම, මෙම අවදානම් වර්ග තුළ සැලකියයුතු සංකේන්ද්‍රණ, අවදානම් නිරාවරණය මැනීම සඳහා යොදාගත් ක්‍රම සහ මෙම අවදානම් නිරාවරණයේ පිලිගතහැකි හා සුදුසු මට්ටම් පිළිබඳ කළමනාකරණයේ අදහස් පිළිබඳ වාර්තා ලබාගැනීමත් ඒවා සමාලෝචනය කිරීමත් සමගින් කළමනාකරණයට යම් පිටුවහලක් ලබාදීම.

4. කළමනාකරණය විසින් අවදානම් නිරාවරණ පාලනය කිරීමට භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව සහ අවදානම් මැනීමේ ක්‍රමවේද සහ පීඩන පරීක්ෂා ප්‍රවේශය සමාලෝචනය කිරීම

5. මෙයටම සීමා නොවූවද, බැංකුව වෙත ඇති ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් සහ ක්‍රමෝපායික/ කීර්තිනාම අවදානම් ඇතුළු සියලුම අවදානම් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් සමාලෝචනය කිරීම.

6. බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම් වී, ස්ථාපිතව පවරනලද බලතලවලට අනුකූලව අවදානම් තීරණ ගන්නා බව සහ කමිටුව විසින් නියමකළ අවදානම් ඉවසුම් සීමාව ඉක්මවන, අවදානම් අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීම.

7. අවදානම් කළමනාකරණ කාර්යයේ ප්‍රමාණාත්මතාව සහ තෝරාගත් අවදානම් නිලධාරීන්ගේ සුදුසුකම් සහ පසුබිම ඇගයීමට ලක් කිරීම.

8. අවදානම් කළමනාකරණ කාර්යයේ ස්වාධීනත්වය සහ බලතල සමාලෝචනය කිරීම.

9. බැංකුවේ අවදානම් ප්‍රාග්ධන රාමුව (ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම්) වැදගත් නිමැවුම් හා උපකල්පන ඇතුළුව සමාලෝචනය කිරීම

10. අවදානම් නිරාවරණය කළමනාකරණ සඳහා කළමනාකරණය භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ශේෂ පත්‍රය. ශේෂ පත්‍ර ව්‍යුහය, ප්‍රාග්ධනය, අරමුදල්, පොළී අනුපාත සහ ද්‍රවශීලතා කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම.

11. බැංකුවේ ද්‍රවශීලතාව, තැන්පතු රැස්කිරීම සහ අරමුදල් කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.

12. බැංකුවේ නියාමන ප්‍රාග්ධන මට්ටම සහ ප්‍රාග්ධන ව්‍යුහය සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.

13. බැංකුවේ ප්‍රාග්ධන අරමුණු ඇතුළුව එහි ප්‍රාග්ධනය තක්සේරු කිරීමේ රාමුව සමාලෝචනය කිරීම.

14. අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ කාර්යයට අදාළ කරුණු සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ප්‍රධානී, අනුකූලතා නිලධාරි, අභ්‍යන්තර විගණක, මූල්‍ය ප්‍රධානී, භාණ්ඩාගාරික, කළමනාකරණයේ අනෙකුත් පිරිස, ස්වාධීන විගණකවරුන්, නියාමකයින් සහ සුදුසු පරිදි බාහිර ප්‍රවීනයින්ගෙන් තොරතුරු ලබාගැනීම.

15. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අයකරගැනීමේ කමිටුව, විධායක ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි විශේෂිත අවදානම් හෝ අවදානමේ සමහර අංශ සමඟ කටයුතු කරන සියලුම කළමනාකරණ කමිටුවල විෂය ක්ෂේත්‍රය සමාලෝචනය කිරීම.

16. ඉහත සඳහන් අදාළ කමිටු විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවල ඵලදායිත්වය පරීක්ෂා කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් ආරම්භ කළ ක්‍රියාමාර්ග නියාමනය.

17. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියමකළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පරාමිති තුළ අවදානම් හඳුනාගැනීම, මැනීම, වැලැක්වීම, අවම කිරීම, මාරු කිරීම හෝ පාලනය කිරීම සඳහා එහි විධි විධාන සහ ප්‍රමාණවත් යාන්ත්‍රණය පිළිබඳ මනා අවබෝධයක් ඇති බව සහතික කිරීමට ඉහත කමිටුවල වාර්ෂික වැඩ සැලැස්ම, අදාළ ක්‍රමෝපායන්, ප්‍රතිපත්ති සහ වැඩරාමු සමාලෝචනය කිරීම.

18. විශේෂිත අවදානම් සමඟ සෘජුව හෝ වක්‍රව කටයුතු කරන කළමනාකරණ කමිටු සමඟ අඛණ්ඩ සාකච්ඡා පවත්වා ගැනීම සහ ඒ තුළින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව එහි කාර්යය ඉටු කිරීමේදී හෝ එහි තීරණ ක්‍රියාත්මක කිරීම තුළ යම් අවහිරතා, බාධා, අධෛර්යමත් කිරීම හෝ වැලැක්වීම පිළිබඳ ඒකාබද්ධ කළමනාකරණ කමිටුව (BIRMC) දැනුවත් කෙරේ.

19. අපේක්ෂිත අවදානම් කළමනාකරණ පරමාර්ථවලට සේවය කිරීමේදී අවදානම් දර්ශකවල ප්‍රමාණාත්මතාව තීරණය කිරීම පිළිබඳ දැක්මක් සහිතව යම් දෙන ලද කාලයක් තුළ විශේෂිත අවදානම්වල මට්ටම නියාමනය කිරීමට එවැනි දර්ශක සමාලෝචනය කිරීම.

20. එක් එක් අවදානම් දර්ශක අනුව මාසිකව ගණනය කරන ලද සැබෑ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ යම් අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සීමාවන් ඉක්මවන අවස්ථාවක එම විශේෂිත අවදානම්වල බලපෑම අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වහාම ගතයුතුය.

21. විවිධ වර්ගයේ අවදානම් අනුව කළමනාකරණය විසින් නියමකළ පරාමිති සහ සීමා සමාලෝචනය කර අනුමත කිරීම සහ ඒවා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ අපේක්ෂිත ප්‍රතිපත්ති මට්ටම්වල පවතින්නේද යන්න සහතික කිරීම.

22. විශේෂ අවදානම් හඳුනාගැනීමට / අභ්‍යන්තර පාලන උපදෙස්වලට අනුකූලවීමට අපොහොසත් වීම සඳහා වගකීමට බැඳී සිටින නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම සහ කමිටුව විසින් නිර්දේශ කරන පරිදි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාපටිපාටි ගැනීම.

23. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළ නීති සහ රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුකූලතා කාර්යයේ ඵලදායිත්වය සමාලෝචනය කිරීම.

24. වාර්ෂිකව ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා පිලියම් සැලැස්ම සමාලෝචනය කිරීම.

25. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කිරීම

26. බැංකුවේ ප්‍රධාන වියදම් වැඩසටහනට අනුව සිදුකරන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දීමට අවශ්‍ය ප්‍රාග්ධන දායකත්වයන් සමාලෝචනය කිරීම.

27. වැදගත් පීඩන අවස්ථාවක් සම්බන්ධයෙන් ව්‍යාපාරය පිළිබඳ අර්බුදයක් වියහැකි බලපෑම සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම සහ කළමනාකරණය විසින් සිදුකළයුතු අයකරගැනීමේ විකල්ප සමාලෝචනය කිරීම

28. විගණන කමිටුවේ උපදේශකත්වයෙන්, අවම වශයෙන් වාර්ෂිකව කළමනාකරණය සමඟ සමාලෝචනය කර සාකච්ඡා කිරීම.

29. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා ඇති පරිදි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියට අදාළ වෙනත් කටයුතු ඉටු කිරීම. ප්‍රඥප්තියට අනුව, මෙම කමිටුවේ අනෙකුත් වගකීම් පහත පරිදි වේ.

1. කමිටුව විසින් විගණන කමිටුවට එහි ව්‍යවස්ථාපිත, නියාමන සහ අනෙකුත් වගකීම් සුදුසු පරිදි ඉටු කිරීමට ඉඩ ලබාදීම සඳහා අවශ්‍ය පරිදි තොරතුරු හුවමාරුව සහ සන්නිවේදනය පවත්වාගෙන යෑම.

2. කමිටුව විසින් කමිටුවේ විෂයපථය තුළ ඇති කරුණු සම්බන්ධයෙන් නියාමන පරීක්ෂණ වාර්තා පිටපත් සහ ඒ සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරයද ලබාගනී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටු රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වන අතර, කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ. 1, 2, 3 සහ 4 වන කාර්තු සඳහා

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගීවූ රැස්වීම් ගණන / සහභාගී වියයුතු රැස්වීම් ගණන
එච්.සී.ඩී.එල්. සිල්වා මහතා (කමිටුවේ සභාපති)	4/4
එස්. ගලප්පත්ති මහතා	4/4
බී.ආර් මඩිහහේවා මහතා	4/4
මහාචාර්ය ඩී.ඒ.එම්. පෙරේරා මහතා (කමිටුවේ විකල්ප සාමාජික)	නිදහස්

වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීමේදී ව්‍යාපාර මෙහෙයුම් සිදුකරමින් හා අවදානම් කළමනාකරණය කරමින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සමීපව කටයුතු කර ඇත.

වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වලදී යෝජනා කල හා සාකච්ඡාවට ලක්කල කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ලබා ගැනීම එකඟතා හා විශේෂිත මග පෙන්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ සමගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකල නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සඳහා සහ අවශ්‍යවූවිට විස්තරාත්මකව සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

එච්.සි.ඩි.එල්. සිල්වා මහතා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

ඔබගේ
ක්‍රියාශීලි ජීවිතයේ පහසුව
උදෙසා බැංකු කටයුතු
සඳහා
නව අත්දැකීමක්

අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකාව පසුගිය වසර කීපය තුළදී කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර මුහුණදුන් දුෂ්කර කාලසීමාවන් අභිබවා අපේක්ෂිත කාලයට ප්‍රථම යථා තත්ත්වයට පත්වී තිබිණි. දැඩි මූල්‍ය දුෂ්කරතා වලින් රට යථා තත්ත්වයට පත්වෙමින් ඇති හෙයින් 2024 වසර සුභවාදී වසරක් ලෙස පත්වෙනු ඇත. උද්ධමනය පාලනය කිරීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ මූල්‍ය ඒකාග්‍රතාවය ඇතුළු ආර්ථිකය ස්ථාවර කිරීමට ගත් උත්සාහයන් මගින් ක්‍රමික වර්ධනයක් අපේක්ෂා කරයි. සංචාරක කර්මාන්තය ශක්තිමත් බවට යථා තත්ත්වයට පත්වීම, ආයෝජක විශ්වාසය ඇති කිරීම සඳහා ආරම්භ කර තිබූ ප්‍රතිසංස්කරණ මගින් වර්ෂය සඳහා දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය 4% සිට 5% දක්වා අගයක පැවතිණි. විණිමය අවප්‍රමාණය වීම, වෙනස්වන ආහාර මිලෙහි ඇතිවී තිබූ අඩුවීම සහ බල ශක්ති ප්‍රභවයන්ගේ සැලකිය යුතු අඩු කිරීම වැනි කල්පවත්නා බලපෑම් හේතුවෙන් 2022 වසරේ උපරිම තත්ත්වයකට 70% ක් ලෙස ඉහළ ගොස් තිබූ උද්ධමනය 2024 දෙසැම්බර් මාසයේදී 1.7% ක් ලෙස අවධමන ත්ත්වයකට පත්වී තිබිණි. කෙසේ වෙතත් ණය ප්‍රමාණය ඉහල මට්ටමක පැවතීම විරැකියාව සහ විදේශ සංචිත හිඟය පැවතීම දක්නට තිබිණි. ගෝලීය ආර්ථික පරිසරය සහ සිදුකරමින් පැවැතුනු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාව යථා තත්ත්වයට පත්වීමේ මාර්ගයට ප්‍රවේශවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ඇත.

මෙම ආර්ථික අභියෝගයන් හමුවේ බැංකුව සිය මෙහෙයුම් කටයුතු නිසි ලෙස සිදුකරමින් එහි අවදානම් කළමනාකරණය ඵලදායී ලෙස ඉටුකරමින් මෙහෙයුම් කටයුතු සඳහා විය හැකි බාධාවන් අවමකර ගැනීමට මෙම අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට කටයුතු කරයි.

බැංකුවේ අවදානම් කලමනාකරණ ව්‍යුහය, අවදානම් හඳුනාගැනීම, මැනීම, කළමනාකරණය, අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා ඇති වගකීම් පැහැදිලි ලෙස නිර්වචනය කර ඇත. සම්පූර්ණ ලෙස හා ක්‍රමානුකූලව අවදානම් කළමනාකරණය වෙත ප්‍රවේශවීම පහසුකරවීමට ආයතනය මුහුණ දෙන සියලුම වර්ගයේ අවදානම්වල විශ්වාසනීයත්වය තහවුරු කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල හා විධායක මට්ටමින් ඇති අවදානම් පාලනය සම්බන්ධ කමිටුවල කාර්යභාරය වෙයි. අධ්‍යක්ෂ මණ්ඩල හා විධායක කාර්යයන් ඇතුළත් අවදානම් කලමනාකරණ ව්‍යුහය පහත පරිදි ප්‍රස්ථාරගතකර ඇත.

බැංකුවේ අවදානම් පාලන හා කළමනාකරණ ව්‍යුහය



අවදානම් සංස්කෘතිය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අවදානම් දැනුවත් කිරීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන අතර එහිදී සියලුම සේවකයින් අවදානම් හඳුනාගැනීම, කළමනාකරණය සහ අවදානම් වැඩිවීම පිළිබඳ වගකිවයුතු වෙයි. බැංකුවේ සාරධර්ම පද්ධතිය සමඟ සමගාමීව ක්‍රියා කිරීම ද සියලුම සේවකයින්ගේ අපේක්ෂා කරන අතර එමගින් නිවැරදි ක්‍රමයට නිවැරදි ලෙස ව්‍යාපාර කටයුතු කිරීම අවධාරණය කරයි. අවදානම් සම්බන්ධ පැහැදිලි වගකීම් වෙන්කර දීම මගින් ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ඇතිකිරීම සඳහා ආරක්ෂක පියවර ත්‍රිත්වයෙන් පහසුකම් සලසයි. අවදානම් සංස්කෘතියක් හෝ පෝෂණය කිරීම සඳහා සේවක සහභාගිත්වය මගින් බැංකුවේ වටිනාකම් හා සාරධර්ම පුහුණු කිරීමේ, නිරතුරුවම පවත්වන පුහුණු වැඩසටහන් මගින් දායකත්වයන් සපයයි.

අවදානම් වාර්තාකරණය

පැහැදිලි අවදානම් කලමනාකරණ යාන්ත්‍රණයක් මගින් ප්‍රධාන අවදානම් නිරාවරණ හඳුනාගෙන ඇති බවත් කාලෝචිත මෙන්ම අදාළ ලෙස අදාල පුද්ගලයින් වෙත සහ අවසාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඒ පිළිබඳ දැනුවත්කර ඇති බවත්, තහවුරු කරනු ලබයි. අවදානම් වර්තාකරණය සඳහා සියලුම ප්‍රධාන අවදානම් නිරාවරණ ඇතුළත් වන අතර ආයතනයේ සියලුම අදාල සේවකයින්ට පැහැදිලි ලෙස සන්නිවේදනය කරයි.

අවදානම් රුචිය

බැංකුවේ අවදානම් රුචිය මගින් අවදානම් මට්ටම සහ සිය උපායමාර්ගික සහ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අවදානම්වලට මුහුණ දීමට කොතරම් හැකියාවක් පවතින්නෙ ්ද යන්න නිර්වචනය කරයි. එමෙන්ම මෙකී සීමාවන් ඉක්මවා ගියහොත් හෝ වර්ධනය වුවහොත් එවැනි අවස්ථාවක දී, ගත් ක්‍රියාමාර්ග අවදානම් රුචිය සහ එකී තත්ත්වය වර්ධනය කරනු ලබන සාධක මගින් පෙන්නුම් කරයි.

අවදානම් කලමනාකරණය මගින් බැංකුවේ අවදානම් රුචිය අධීක්ෂණය කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික කළමනාකාරිත්වය සහ අදාළ කමිටු වෙත නිරන්තරයෙන් වාර්තා කරනු ලබයි. අභ්‍යන්තර හා බාහිර පරිසරයේ සැලකියයුතු වෙනස්කම් වලට අනුකූලව මෙම ප්‍රතිපත්තිය පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින්වර මෙම ප්‍රතිපත්ති සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවක දී සුදුසු වෙනස්කම් සිදු කරනු ලබයි.

ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුවේ මූල්‍ය තත්වය සහ කීර්තිය ආරක්ෂා කිරීමටත් බංකොලොත්භාවයෙන් බැංකුව මුදා ගැනීමටත් ඵලදායි ප්‍රාග්ධන කළමනාකරණය ඉතා වැදගත් වෙයි.

	අවම අවශ්‍යතාවය	2023	2022	2021
පොදු ස්ථර 1 ස්ථරය	7%	19.28	23.46	21.91
1 ස්ථරයේ අනුපාතය	8.5%	19.28	23.46	21.91
මුළු ප්‍රාග්ධන අනුපාතය	12.5%	19.28	23.46	23.80

ප්‍රතිපත්ති රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති පරිපූර්ණ ප්‍රතිපත්ති සමුදායක් අවදානම් හඳුනාගැනීමට, මැනීමට හා අවම කිරීමට සහ ආයතනය තුළ පවතින සියලුම මට්ටම් වෙත සුදුසු ලෙස හා ක්‍රමානුකූලව වාර්තා කිරීම තහවුරු කරයි. කර්මාන්තයේ පවතින හොඳම පරිචයන් හා සමගාමීව හා නැගී එන අවදානම් සඳහා මුහුණ දීම තහවුරු කිරීමට ප්‍රතිපත්ති නිතරම සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම සිදුකරයි. වැඩි දියුණු කර ඇති දත්ත ආරක්ෂාව හා විනිවිදභාවය පැහැදිලි ලෙස දක්වමින් දත්ත වර්ගීකරණ ප්‍රතිපත්තියක් සහ එළිදරව් කිරීමේ ප්‍රතිපත්තියක් බැංකුව වර්ෂය තුළදී හඳුන්වා දී තිබිණි.

අවදානම් කලමනාකරණය

ණය අවදානම

ප්‍රති පක්ෂයක් විසින් ණය ගනුදෙනුවකදී ඔහුගේ/ඇයගේ වගකීම් ඉටු කිරීමට ගිවිසගත් කොන්දේසි අනුව අපොහොසත් වීමෙන් සිදුවිය හැකි පාඩුව ණය අවදානම ලෙස නිර්වචනය කළ හැකි වෙයි. ණය අවදානම, පැහැර හැරීමේ අවදානම, ප්‍රතිපක්ෂ සංකේන්ද්‍රණය භූගෝලීය ප්‍රදේශ හෝ කර්මාන්ත අංශයන්ගේ ස්වරූපය ගත හැකි වන අතර එය නියාමනය කරන ලද අනුකූලතා අවදානම සහ විචක්ෂණ සීමාවක් තුල ක්‍රියාත්මක වෙයි. හොඳම පරිචයන්ට අනුගත වීම හා වෙළෙඳපළ තත්ත්වයන්ට අදාළ වීම තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකරනු ලබයි. අවදානම් බරිත වත්කම්වල බහුතරය ආසන්න වශයෙන් ගණනය කිරීම සඳහා ණය අවදානම බැංකුවේ එක් අවදානම් නිරාවරණයක් වෙයි.

බාසල් අවශ්‍යතාවලට අනුකූල වන අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය මගින් බැංකුවේ අවදානම් වලට අදාල සමස්ත ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේ ක්‍රියාවලියට මග පෙන්වයි. රාජ්‍ය බැංකුවක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ප්‍රාග්ධනය රැස්කර ගැනීම සඳහා කොටස් වෙළඳපලට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් සීමිත හැකියාවක් පවතින අතර ප්‍රාග්ධනය වර්ධනය කරලීමට අභ්‍යන්තර ලාභ උත්පාදනය හා රාජ්‍ය අනුග්‍රහය මත බලාපොරොත්තු තැබීමට සිදුවේ. ණය ප්‍රතිපත්ති, ණය සංග්‍රහයන්, බලය පැවරීම, අවදානම් ශ්‍රේණිගත කිරීම, ඇප සුරැකුම්පත් කළමනාකරණය සහ අධීක්ෂණ ක්‍රියාමාර්ග ඇතුළත් ශක්තිමත් රාමුවක් තුළ ණය අවදානම් කලමනාකරණය සිදුකරයි. ආදායම් මූලාශ්‍රවල විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා තහවුරු කිරීමේ ආකෘතියක් තක්සේරු කිරීම හා අවදානම් පරීක්ෂා කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා විශේෂ ඒකකයක් ඇතුළු ගනුදෙනුකරුවන් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් අමතර වශයෙන් අනුගමනය කරයි. ණය ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ණය ලබා ගැනීමට පෙර සමාලෝචනයක් සිදු කිරීමට වගකිවයුතු වෙනම ඒකකයක් ඒ පිළිබඳව වගකිව යුතු වෙයි. සෑම ණය වර්ගයක් සඳහාම එම ණය වර්ගයේ විශේෂිත අවදානම් පැතිකඩ සඳහා අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආකෘති සංවර්ධනය කර ඇත. වියහැකි පාඩු සහ පැහැරහැරීම් පුරෝකථනය කරගැනීමට උපකාරී වන ණය සීමාවන් වැඩි කිරීමේ හෝ ණය ප්‍රධානය කිරීමට පෙර මෙම ශ්‍රේණිගත කිරීම සිදුකරයි. වෙනත් වැදගත් අනුපාතයන් හා ප්‍රධාන අවදානම් දර්ශක සමග ඇති අවදානම් නැඹුරුව අවදානම් ශ්‍රේණිගත කිරීමේ ශ්‍රේණි, නිෂ්පාදන වර්ගීකරණය සහ ආංශික නිරාවරණය තක්සේරු කරමින් කළඹ විශ්ලේෂණය නිරතුරුවම සිදුකරයි. මෙම විශ්ලේෂණයන් අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන හා අවදානම් කලමනාකරණ කමිටුව වෙත කලින් කලට

වාර්තා කරන අතර ඒවායේ පිළියම් හා යථා තත්ත්වයට පත්වීම ඇතුළත් බැංකුවේ අර්ථ දක්වා ඇති අවදානම් රුචිය හා සමගාමී වෙයි. මෙම ක්‍රියාමාර්ග අවදානම් කළමනාකරණයේ හොඳම පරිචයන් හා අවස්ථාවන් එලි දැක්වීම සඳහා සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම නිතර නිතර සිදුකරයි.

විශේෂිත නිෂ්පාදන නිරාවරණය සම්බන්ධයෙන් බැංකුවේ ණය කළඹ පුද්ගල ණය සඳහා වැඩි නැඹුරුවක් දක්වා තිබූ අතර ණය කළඹෙන් සියට 48% ක් උකස් හා මුදල් ආපසු අර්ථසාධක මුදල් ණය මත රැඳී පැවතිණි. විවිධ අංශ හා කර්මාන්ත වෙත විවිධාංගිකරණය කිරීමට බැංකුව ඇප සුරැකුම් කළඹ වැඩි කිරීමට පියවර ගෙන තිබිණි.

නිෂ්පාදන අනුව නිරාවරණයේ ඇති ප්‍රතිපාදන අනුව බැංකුවේ ණය කළඹ පුද්ගල ණය වලින් සමන්විත අතර එම ණය කළඹින් 48% ක් ඇප සුරැකුම් සහිත උකස් ණය හා මුදල් ආපසු අර්ථසාධක අරමුදල් ණය වෙයි. ඇප සුරැකුම් සහිත ණය කළඹ ව්‍යාප්ත කිරීමට හා විවිධ අංශ හා කර්මාන්ත හරහා විවිධාංගීකරණය තවදුරටත් වැඩි කිරීමට බැංකුව පියවර කීපයක් ගෙන තිබිණි.

නිෂ්පාදන අනුව ආයෝජන කළඹේ සංයුතිය



අවදානම් පිළිවෙත් අනුකූල බවත්, යාවත්කාලීන බවත් සහ වෙනස්වන ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලන බවත් සහතික කරමින් වෙනස්වන සාධක සඳහා ප්‍රතිචාර වශයෙන් බැංකුව සිය ණය ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරයි. බැංකුව සිය ණය අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් වර්ෂය තුළදී දුර්වලතා ප්‍රතිපත්ති සහ ණය අත්පොත සමාලෝචනය කරන ලද අතර, අධීක්ෂණ කටයුතු තවදුරටත් විධිමත්ව කරන ලදී. ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට සහ කළඹ, සම්පව පසු විපරම් කිරීමට බැංකුව පියවර ගත් අතර, කාර්ය සාධනයක් නොමැති ණය සීමා කිරීමට කටයුතු කළේය.

ක්‍රියාකාරී නොවූ ණය අනුපාතය සහ හානිකරණය



වෙළඳපළ අවදානම

වෙළඳපළ අවදානම යනු වෙළඳපළ අනුපාත හෝ මිල ගණන්වල වෙනස්වීම හේතුවෙන් බැංකුවේ වත්කම් හා වගකීම්වල වටිනාකම හෝ එයින් ලැබෙන ආදායම අහිතකර අන්දමින් වෙනස්වීමට භාජනවීමේ අවදානමයි. වෙළඳපළ අවදානමේ අර්ථ දක්වා ඇති පරිදි බැංකුවේ මූල්‍ය උපකරණ මගින් පැනනගින පොලී අනුපාත අවදානමට බැංකුව ප්‍රධාන වශයෙන් නිරාවරණය වෙයි.

අප දක්වා ඇති අවදානම් රුචිය ඇතුළත වෙළඳපළ අවදානම් නිරාවරණය තහවුරු කිරීමට කල්පිරීම් අවගැලපුම් අත්තිකාරම් සහ තැම්පතු අධීක්ෂණය කිරීම සහ වෙළෙඳපළ කලමනාකරණ රාමුවක් ආරම්භ කිරීමේ වගකීම වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇත.

ද්‍රවශීලතා අවදානම

බැංකුවේ මූල්‍ය බැඳීම් නිසි කලට වෙලාවට ඉටු කර ගැනීමට නොහැකි වීම නිසා ප්‍රාග්ධනයට සහ / හෝ ඉපයීම් වලට විය හැකි පාඩු ද්‍රවශීලතා අවදානමට ඇතුළත් වෙයි. අනපේක්ෂිත ද්‍රවශීලතා ගැටලු තත්ත්වයන්ට මුහුණ දීමේ දී බැංකුව සතුව පවතින ඔරොත්තු දීමේ හැකියාව එමගින් තහවුරු කරයි. බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ද්‍රවශීල අවදානම් කළමනාකරණය කිරීම සඳහා වත්කම් හා බැරකම් කමිටුව (ALCO) වගකිව යුතු වෙයි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග හඳුනාගැනීමට හා විධායක ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව වත්කම් හා බැරකම් කමිටුව (ALCO) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ද අවදානම් කලමනාකරණ කමිටුව (BIRMC) වෙත වාර්තා කිරීමට ද්‍රවශීලතා අවදානම සහ පොලී අනුපාත අවදානම අවදානම් කලමනාකරණ අංශය (RMD) විසින් අඛණ්ඩව තක්සේරු කරයි.





සාමාන්‍යයෙන් කෙටිකාලීන හා මධ්‍යකාලීන ණය දීම සඳහා බැංකු තැම්පතු කළඹ අදාළවන අතර, දිගුකාලීන ණය දීම සඳහා බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත වන නිවාස මූල්‍ය අදාල වෙයි. මෙයට අමතරව බැංකුව ප්‍රධාන වශයෙන් ස්ථාවර අනුපාත ණය දෙන පරිසරයක් තුළ ක්‍රියාත්මක වන අතර එහි වගකීම්වලින් බහුතරයක් නැවත මිළ කිරීමකට නිරන්තරයෙන් යටත් වේ. සෘණාත්මක අවගැලපුම් කළමනාකරණය කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය හරහා විකල්ප කෙටිකාලීන ණය හඳුන්වාදීම, පොලී අනුපාත සහිත ණය ප්‍රදානය සහ බාල වයස්කාර ඉතුරුම් ගිණුම් ප්‍රවර්ධනය වැනි ක්‍රියා මාර්ග කිහිපයක් බැංකුව ගෙන ඇති අතර එමගින් කල්පිරීම් අවගැලපුම් සමග බද්ධ වූ අවදානම් අවම කිරීමට සහය වීමත් සිදුවෙයි.

තහවුරු පරීක්ෂණ

අවදානම් රුචියට අදාළව බැංකුවේ වර්තමාන හා විය හැකි අවදානම් පැතිකඩෙහි සංවේදීතාවය මැනීම සහ බැංකුවේ ව්‍යාපාර කටයුතු මත වියහැකි අවදානම් බලපෑම නිතර නිතර සිදුකරන තහවුරු පරීක්ෂණ මගින් තක්සේරු කරයි. සාර්ව ආර්ථික හා ව්‍යාපාර ආකෘති තහවුරු පරීක්ෂණ මගින් තක්සේරු කරයි. සාර්ව ආර්ථික හා ව්‍යාපාර ආකෘති තහවුරු පරීක්ෂණ ඇතුළත් තාක්ෂණික ක්‍රම රාශියක එකතුවෙන් බැංකුවේ තහවුරු පරීක්ෂණ රාමුව මගින් ප්‍රයෝජනයට ගනී. ක්‍රියාකාරී කළමනාකරණයක් මගින් බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමට හා බැංකුව තුල අවදානම් පිළිබඳ දැනුවත්වීම් වැඩිකිරීමට තහවුරු පරීක්ෂණ මගින් දායකත්වයක් ලබා දෙයි. වෙළෙඳපළ අවදානම පිළිගත හැකි මට්ටමක පවතින බව තහවුරු කිරීමට බැංකුව අභ්‍යන්තර තහවුරු පරීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරයි. ද්‍රවශීලතා සංචලනය, සුපුරුදු මුදල් ප්‍රධාන පුරෝකථන, ද්‍රවශීලතා අනුපාත සහ කල්පිරීම් පරතර විශ්ලේෂණය හරහා ගණනය කරයි. තහවුරු පරීක්ෂණ ප්‍රතිපත්ති රාමුව සියලුම ද්‍රව්‍යාත්මක අවදානම් ණය, ද්‍රවශීලතා, පොලී අනුපාත සහ සුළු, මධ්‍යම හා ප්‍රධාන හා අර්බුදකාරී විවිධ තහවුරු මට්ටම් යටතේ ඇති කල්පිරීම් පරතර ආවරණය කරයි. ලාභදායිත්වයට ද්‍රශීලතාවයට සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයට මෙයින් ඇතිවන ප්‍රතිඵලවල බලපෑම තක්සේරු කර ඉහල කළමනාකරණයට විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරන කමිටුවට (EIRMC), විධායක ඒකාබද්ධ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුවට (BIRMC) ඵලදායි තීරණ ගැනීම සඳහා අවශ්‍ය පරිදි කාර්තුමය වශයෙන් හෝ නිරන්තරයෙන්, තක්සේරුකර වාර්තා කරයි. ඇතිවී තිබෙන තහවුරු අවස්ථාවන්වල බැංකුව යථාතත්ත්වයට පත්වීමේ හැකියාව සඳහා අධිකාරීන් හා නියාමකයින් වෙත පුළුල් අවබෝධයක් ද තහවුරු පරීක්ෂණ මගින් සපයා දෙයි.

තහවුරු පරීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵලය මනාව නිරීක්ෂණය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි. බැංකුව විසින් ගනු ලබන වෙනත් අවදානම් කලමනාකරණ ප්‍රවේශයන් සඳහා අතිරේකයක් ලෙස මෙය භාවිතා කරයි.

2024.12.31 දිනට සිදුකරන ලද තහවුරු පරීක්ෂණ පහත දැක්වේ.

ණය අවදානම	ක්‍රියාකාරී නොවන ණය කාණ්ඩවල වෙනස්කම්/ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමේ සහ පැහැර හැරීමේ සම්භාවිතාව ආදී ආර්ථික සාධකවල අහිතකර සංචලනයන් හේතුවෙන් දුර්වලතා වැඩි වීම. ඇපකරයේ වටිනාකම පහත වැටීම.
ණය සංකේන්ද්‍රණ අවදානම	ණය දෙන ගෙවීම් පාර්ශවයන් සහ අංශවල HHI අගයන් වැඩි වීම.
පොලී අනුපාත අවදානම	පොලී අනුපාතවල අහිතකර සංචලනයන්.
ද්‍රවශීලතා අවදානම	බැංකුවේ වත්කම් සහ වගකීම් යන දෙකෙහිම අහිතකර ක්‍රියාකාරකම් මගින් ද්‍රවශීලතා ආතති තත්වයන් ඇති කරයි. SLAR, LCR සහ ප්‍රාග්ධනය මත බලපෑම්



ද්‍රවශීල ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බැංකුව අවිනිශ්චිත අරමුදල් සැලැස්මක් පවත්වාගෙන යයි. මහ බැංකුව විසින් නියමකර ඇති මට්ටමට වඩා ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යෑම සහතික කිරීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

පූර්ව ආරක්ෂාවක් ලෙස වසර තුළදී වත්කම් හා වගකීම් නිෂ්පාදන හඳුන්වා දීමට බැංකුව පියවර කීපයක් ගෙන ඇත. කාලය තුළ නොගැලපීම් අවම කර ගැනීමට සහ පාරිභෝගික අවශ්‍යතා සහ වෙළෙඳපල තත්ත්වයන් පවත්වා ගැනීම මෙහි අරමුණ වෙයි.

මීට අමතරව, බැංකුව සඳහා මූලික බැංකුකරණ විසඳුමක් ලබා ගැනීම වෙනුවෙන් ගත් උත්සාහයන් සාර්ථක වූ අතර එමගින් වැඩිදියුණු කරන මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ පාරිභෝගික විශ්වාසය, දත්ත මත පදනම් වූ තීරණ ගැනීම වැනි විවිධ ප්‍රතිලාභ බැංකුව වෙත ලබාදෙයි.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් පාඩු ඇතිවීමේ අවදානමයි. මෙහෙයුම් අවදානම් කලමනාකරණය කිරීම ආයතනය පුරා විනය පවත්වා ගැනීමක් වන අතර බැංකුවේ මෙහෙයුම් අවදානම් කලමනාකරණ රාමුව තුළ අඩංගු මෙවලම් උපයෝගි කරගනිමින් එම කටයුතු ආරම්භකර ඇත. මෙම අවදානම් කලමනාකරණ රාමුව මගින් ද්‍රව්‍යාත්මක මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, මැනීම කළමනාකරණය, අධීක්ෂණය සහ වාර්තාකරණයට සහාය දක්වයි.

පරිපූර්ණ අවදානම් කළමනාකරන රාමුවක් මගින් මෙහෙයුම් අවදානම් ඵලදායි ලෙස හඳුනා ගැනීම සහ කළමනා කරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. "පළමු ආරක්ෂක මට්ටම" ලෙස දැක්වෙන ශාඛා සහ අංශ මගින් මූලාරම්භයේදී අවදානම් හඳුනාගැනීමේ වගකීම දරයි. දෙවන ආරක්ෂක මට්ටම වන අවදානම් කළමනාකාරණ අංශයෙ මෙහෙයුම් අවදානම් රාමුව ක්‍රියාත්මක කිරීම සහ අවදානම් රුචිය තුළ අර්ථ දක්වා ඇති පරාමිතීන්ට එරෙහිව අවදානම් ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු වෙයි. විගණන හා අනුකූලතා ඒකක මගින් මෙහෙයුම් අවදානම් කලමනාකරණ ක්‍රියාවලීන් හි ප්‍රමාණවත් බව සහ සඵලතාවය පිළිබඳ ව සහතික වෙයි.

අවදානම් කළමනාකරන අංශය විසින් (RMD) සියලුම ප්‍රධාන ව්‍යාපාරික ඒකකයන්ට අවදානම් පාලන ස්වයං ඇගයීම් (RCSA) සිදුකරන අතර මෙමගින් පළමු ආරක්ෂක මට්ටමේ දී සිදුවන මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම සිදුකරයි. මෙහෙයුම් අවදානමට නිරාවරණය වීම ඇගයීම සඳහා සිද්ධි වාර්තාකරණය, ප්‍රධාන අවදානම් දර්ශක, අභ්‍යන්තරව අලාභ සිදුවීමේ දත්ත වැනි මෙවලම් ආයතනය ඇතුලත භාවිතා කරයි.

බැංකුවේ අවදානම් රුචියට අනුකූලවන අයුරින් මෙහෙයුම් අවදානම් කලමනාකරණය, පාලනය හා අවම කිරීම බැංකුවේ අරමුණ වෙයි. මෙහෙයුම් වල සංවේදී අංශ සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රවේශයේ ඇති දැඩි ඉහළ යෑමක් සහිත මට්ටම බැංකුව තහවුරු කර ඇත.

මානව සම්පත් කළමනාකරණය

සේවක පිරිස් ආයතනයේ ලාභය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන අතර ඔවුන්ගෙන් ආයතනයට වටිනාකමක් ලැබෙයි. සේවක පිරිස ආයතනයක ශේෂ පත්‍රයේ හෝ ගිණුම් පොත් තුළ වත්කම් යටතේ දැක්විය හැකිවේ. කෙසේ නමුත් ඔවුන් යම් මූල්‍ය වටිනාකමක් ලබා දිය නොහැකි ඉතා වටිනා වත්කමකි.

අපගේ ගනුදෙනුකරුවන් වෙත වටිනාකමක් ලබා දෙන අපගේ දැක්ම දෘෂ්‍ය ප්‍රතිඵල බවට පත් කරනු ලබන්නේ සේවක පිරිස විසිනි. එම නිසා පුහුණු හා සංවර්ධන කටයුතු සහ සේවක සහභාගිත්ව කටයුතු මගින් සේවක පිරිසට යහපත් සේවා ස්ථානයක් නිර්මාණය කරමින් අප සේවක පිරිසගේ දැනුම, දක්ෂතා සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා ආයෝජන සිදු කරමින් අවධානය යොමුකර ඔවුන්ට විශිෂ්ඨත්වය දැක්වීම සඳහා සියල්ල ඇතුලත් පෙලඹවීම් ඇති කරන සේවා පරිසරයක් ලබා දෙන බව අපි තහවුරු කරමු. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අපි ආර්ථික වර්ධනය ඉදිරියට ගෙනයාමට විශිෂ්ට දක්ෂයින් ආකර්ෂණය පෝෂණය කිරීම හා රඳවා ගැනීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරමු.

කාර්ය මණ්ඩල සංඛ්‍යාව

මෙම වසර තුළ මුළු සේවක සංඛ්‍යාව 353 ක් වූ අතර, ඔවුන් තුළනාත්මකව කුඩා ප්‍රමාණයක් වුවත්, ඔවුන් වඩා ඉහළ ප්‍රමාණයකින් බැංකුවේ කාර්යසාධනයට දායක වී ඇත. වසර තුළ, කාර්ය මණ්ඩල සාමාජිකයින් 33 දෙනෙකු බැංකුවෙන් ඉවත් වූ අතර නිලධාරීන් 10 ක් බැංකුවෙන් විශ්‍රාම ගන්නා ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින් 23 දෙනෙකු වෙනත් හේතූන් මත බැංකුවෙන් ඉවත් විය. වසර තුළ බැංකුව සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයින් 30 ක් අපි බඳවා ගත්තෙමු. බැංකුවේ බඳවාගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීම සිදුකර ඇත.

කාර්ය මණ්ඩල වෙනස

කළමනාකරණ මට්ටම	වෙනස		
	විශ්‍රාම ගිය	ඉල්ලා අස්වූ / වෙනත්	බාහිරින් බඳවාගත්
ආයතනික කළමනාකරණය	3	1	2
ජ්‍යේෂ්ඨ කළමනාකරණය	-	-	-
විධායක	1	10	4
විධායක නොවන	6	9	2
කොන්ත්‍රාත් පදනම මත / TBA	-	3	22
එකතුව	10	23	30

කාර්ය මණ්ඩල සංඛ්‍යාව ස්ථර අනුව

කළමනාකරණ මට්ටම	2024.12.31 දිනට සේවක සංඛ්‍යාව
ආයතනික කළමනාකරණය	9
ජ්‍යේෂ්ඨ කළමනාකරණය	6
විධායක	103
විධායක නොවන	195
කොන්ත්‍රාත් පදනම මත / TBA	40
එකතුව	353

ස්ත්‍රී පුරුෂභාවය

සමානව රැකියා අවස්ථා සපයන්නෙකු ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කාන්තා හා පුරුෂ පාර්ශවයන් සඳහා සමාන රැකියා අවස්ථා ලබා දී ඇත. 2024 වසර සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාන්තා හා පිරිමි සේවක ප්‍රතිශතය පිරිමි 48% සහ කාන්තාවන් 52% ක් විය.

සේවක වයස් විස්තරය

ඉතා පළපුරුදු හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයක් තබා ගැනීමට බැංකුවට හැකියාව ලැබී තිබිනි. කාර්ය මණ්ඩලයෙන් 50% ක ප්‍රමාණයක් අවුරුදු 40 ඉක්මවූ අය වෙති.

වයස් වර්ගය	2024.12.31 දිනට සේවකයින් ගණන
50 හෝ ඊට ඉහළ	71
40 - 49	105
30 - 39	120
29 හෝ ඊට පහළ	57
එකතුව	353

කුසලතා කළමනාකරණය

අපගේ සියලුම ගනුදෙනුකරුවන්හට උසස් ගුණාත්මක සේවාවක් ලබා දීමට හැකි වන නිසා කුසලතා සංචිතය කළමනාකරණය සඳහා අපගේ ඉහලම ප්‍රමුඛත්වය හිමි වෙයි. සම්පූර්ණ හැකියාවක් අවබෝධ කරගැනීමට බැංකුවට හැකියාව ඇතිකරමින් අනාගත නායකයින් බවට පත්වීම සඳහා සේවකයින්ගේ හැකියාවන් සංවර්ධනය කිරීමට අපගේ කණ්ඩායම තුළ ආයෝජනය කරමින් විශිෂ්ට සම්පත් අත්පත් කරගෙන බැංකුව තුළ රඳවා ගන්නා බව අපි තහවුරු කරමු.

කුසලතා ආකර්ෂණය හා අත්පත් කරගැනීම

ව්‍යාපාර අවශ්‍යතාවයන් සඳහා මනාව ගැලපෙන අපේක්ෂකයා තෝරාගැනීම සඳහා සැලසුම්කර ඇති බැංකුවේ බඳවාගැනීමේ පටිපාටිය මගින් නව කුසලතා අත්පත් කර ගැනීම සිදුකරයි. අවශ්‍ය දක්ෂතාව, දැනුම, හැකියාවන් සහ අපගේ සංස්කෘතියට ගැලපෙන හා එය පෝෂණය කරන චර්යාවන් සහිත දක්ෂයින්ට ප්‍රමුඛතාව ලබා

දේ. ඇබෑර්තු ඇතිවන සෑම අවස්ථාවකදීම, අභ්‍යන්තර දක්ෂයින්ට සම්ප සලකාබැලීම ලබාදෙන අතර, අභ්‍යන්තර දක්ෂයින් ලබාගත නොහැකිනම් අවශ්‍ය මට්ටම්වලදී විශේෂිත දක්ෂයින් ලබා ගනී.

පුහුණුව හා සංවර්ධනය

සේවකයෙකුගේ දැනුම, හැකියාවන්, දක්ෂතා, ආකල්ප සහ කාර්යසාධනය වැඩි කරන ආකාරයෙන් පුහුණුව හා සංවර්ධනය ප්‍රධාන මෙවලමක් වන අතර, එය අප බැංකුවේ වර්ධනය අත්කර ගනු ලබයි. අපගේ සේවකයින්ට ඔවුන්ගේ දක්ෂතා සහ දැනුම වැඩි කර ගැනීමට ඔවුන්ගේ පුද්ගල සන්නාමය ශක්තිමත් කරමින් පුහුණුව හා සංවර්ධන අවස්ථා පිරිනමනු ලැබේ. තම රාජකාරි ඉටු කිරීමට ඔවුන්ට හැකියාව ඇති කරමින් විවිධ කාර්යයන් හී සෑම මට්ටමකදීම සේවකයින් පුහුණු කර සංවර්ධනය කිරීමට බැංකුව උත්සාහ ගන්නා අතර අනාගත වගකීම් සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දේ.

වෙළඳපොළට බලපා තිබූ අයහපත් අස්ථාවරභාවය හේතුවෙන් 2024 වර්ෂයේ දී පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සහභාගිත්වය අභියෝගාත්මක විය. නියමිතව තිබූ පුහුණු වැඩ සටහන් වලින් වැඩි කොටසක් අවලංගු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩ සටහන් පැවැත්වීමට අපට හැකිවී තිබිනි. අපගේ සේවකයින් අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 3 කට හා බාහිර පුහුණු වැඩසටහන් 26 කට සහභාගිවී ඇති බව දක්නට තිබිනි.

2024 වසර තුළ, ලබාදෙන ලද විවිධ පුහුණු අවස්ථාවන් හී සේවක සහභාගිත්වය පහත වගුවෙන් සාරාංශ කෙරේ.

ප්‍රධාන ක්ෂේත්‍ර	සහභාගීවූවන් ගණන
දැනුම හා දක්ෂතා සංවර්ධන පුහුණුව	137
ආකල්ප සංවර්ධන පුහුණුව අභිප්‍රේරණ පුහුණුව	67
සම්මන්ත්‍රණ, වැඩමුළු, සාමාජිකත්ව ගාස්තු, ප්‍රශ්න තරගාවලි	3

සේවකයින්ගේ සේවය

සේවා වර්ගය (අවුරුදු)	2024.12.31 දිනට සේවකයින් ගණන
0-4	79
5-9	40
10-14	130
15-19	44
20 ඉහළ	60
එකතුව	353

සේවකයින්ගෙන් 78%ක් බැංකුව තුළ වසර 5කට වැඩි කාලයක් සේවය කර ඇති අතර, බැංකුවේ සංවර්ධනයට ඔවුන්ගේ සේවය දායක කරයි. කාර්ය මණ්ඩලය වෙත මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම පමණක් නොව, මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබාදීමෙන් ඔවුන්ගේ රැකියා තෘප්තිය වැඩිකර ඇත.

අප අද සිටින ස්ථානය කරා ගමන්මග එතරම් පහසු නොවීය. නමුත්, බැංකුව එය අත්කරගෙන සිටින සෑම දෙයක්ම එහි සේවකයින්ගේ වෙහෙස නොබලා කැපවීමේ උත්සාහයන් තුළින් අත්කරගෙන ඇත.

අනාගත කරුණු

එළඹෙන වර්ෂයේ දී මානව සම්පත් විශිෂ්ට පරිචයන් වැඩි දියුණු කරමින් අපගේ සේවක පිරිස අඛණ්ඩව ශක්තිමත් කරමු. පුහුණු හා සංවර්ධන අවශ්‍යතාවයන් පිළිබඳ පරිපූර්ණ විශේෂ විශ්ලේෂණයක් දැනටමත් සිදු කරන අතර මෙම විශ්ලේෂණය මගින් සේවකයින්ගේ තාක්ෂණය සහ මෘදු කුශලතා ආවරණය වන පරිදි සියල්ල ඇතුලත් වඩාත් විස්තීර්ණ පුහුණු සැලැස්මක් නිර්මාණය කිරීමට අපි අපේක්ෂා කරමු.

අපේක්ෂිත මට්ටම් කරා ළඟා වීම සඳහා ප්‍රධාන පුද්ගලයින්ට ඔවුන්ගේ කුසලතා හා දැනුම වර්ධනය කරගැනීම වෙනුවෙන් ලබාදී තිබෙන අවධානාත්මක කරුණු මගින් අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට හා ශක්තිමත් කිරීමට ඉදිරි වසරේ දී අපේක්ෂා කරයි. කෙටියෙන් සඳහන් කරන්නේනම්, වඩා යහපත් සේවා ස්ථානයක් සහ වඩා තෘප්තිමත් සේවකයින් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරමු.

නිෂ්පාදන සන්නාමකරණය

හැඳින්වීම

2024 වර්ෂයේදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සිය ප්‍රගමනය පවත්වා ගනිමින් ශ්‍රී ලාංකේය ජනතාවගේ වර්ධනයවන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට සමත්විය. සමාජගත සියලුම ජන කොටස් වෙත නැවුම් මූල්‍ය විසඳුම් සැපයීම සඳහා දැඩිව මුල්බැසගත් බැංකුවක් ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මේ වසරේදී නිෂ්පාදන සන්නාමකරණය පිළිබඳ දැඩි අවධානයක් යොමු කර ඇත. අප ගනුදෙනුකරුවන්ගේ විවිධ අවශ්‍යතාවයන් හා සිතුම් පැතුම් සමඟ සංකලනය වූ නවතම හා ප්‍රතිඅනුරූපකරණය කළ නිෂ්පාදන හඳුන්වා දීමට මෙම ප්‍රවේශය අප හට ඉඩ සලසා ඇත.

2024 වර්ෂය සඳහා බැංකුවේ ප්‍රධාන නිෂ්පාදන සන්නාමකරණය පිළිබඳ වාර්ෂික වාර්තාවේ මෙම කොටසින් පැහැදිලි ලෙස පෙන්වා දෙන අතර එයට '"මැක්ස් සේවර්" "අපූර්වා" සහ සුළු හා මධ්‍ය පරිමාණ "ධීවර දිරිය" ගිණුම් හඳුන්වාදීම සහ "මුතුසිනා" ගිණුම නැවත ආරම්භ කිරීම ඇතුළත් වේ. මෙම කටයුතු පාරිභෝගික කේන්ද්‍රීය විසඳුම් ලබාදීමට වෙළෙඳ නාම ඇති කිරීම සහ අපගේ ගනුදෙනුකරුවන් සමඟ දිගුකාලීන සම්බන්ධයක් ගොඩනගා ගැනීමට අපගේ ඇති කැපවීම පිළිබිඹු කරයි.

මැක්ස් සේවර් - ඉහළ පොලියක් සහිත ඉතුරුම් ගිණුම

නිෂ්පාදන සන්නාමකරණ උපාය මාර්ග

ඉතුරුම් සඳහා ඉහල ප්‍රථිලාභ අපේක්ෂාකරන ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා 2024 වර්ෂයේ දී "මැක්ස් සේවර්" ඉතුරුම් ගිණුම ආරම්භ කර තිබිණි. ඉහළ ප්‍රථිලාභ සමග ඇති ඉතුරුම් විභවතාවය උපරිම කිරීම, ආරක්ෂව හා වර්ධනය තහවුරු කිරීමේ සංකල්පය වටා මැක්ස් සේවර් නිෂ්පාදන සන්නාමකරණය කේන්ද්‍රගත වී ඇත. වැඩිවන පොලී අනුපාතවල ප්‍රථිලාභ සහ අරමුදල් වෙත ප්‍රවේශවීමේ පහසුව කෙරෙහි අවධානය යොමුකරමින් පාරිභෝගික සන්නිවේදන මාර්ග හරහා පාරිභෝගිකයා පැහැදිලි ලෙස දැනුවත්කර මෙම සන්නාමකරණය ශක්තිමත් කර ඇත.

ප්‍රධාන අංග

- ඔබගේ දෛනික ශේෂය මත පදනම්ව සිත්ගන්නා සුළු පොලී අනුපාත
- පොලී ආදායම ලබා ගැනීම සඳහා රු. 5,000.00 ක අවම ශේෂයක් පවත්වාගෙන යා යුතු වෙයි.
- පොලිය දෛනික ශේෂය මත ගණනය කර මාසිකව ගිණුමට බැර කරයි.
- ගිණුම් සඳහා ප්‍රතිලාභියෙකු නම් කිරීමට ඇති හැකියාව.

සන්නාමකරණ පණිවුඩය

"මැක්ස් සේවර්"සමග ඔබගේ ඉතුරුම් විභවතාවය උපරිම කරගන්න. මෙම පණිවිඩය ඩිජිටල් අලෙවිකරණ වැඩ සටහන්, ශාඛා තුළ ප්‍රවර්ධනය සහ මාධ්‍ය දැන්වීම් හරහා ලබා දී තිබිණි.

2024 වසරේ බලපෑම

- සන්නාම පිළිබඳ දැනුවත් කිරීම් ඉලක්කගත දැන්වීම් හා මේ පිළිබඳව උනන්දු කරවන්නන්ගේ සහභාගිත්වය මගින් ඉහල නංවා තිබිණි. මෙම ගිණුම 2024 වර්ෂයේ දී ඉමහත් ජනප්‍රියත්වයක් සහිත ගිණුමක් බවට පත්වී තිබිණි.

අපූර්වා - කාන්තාවන් සඳහා ඉතුරුම් ගිණුමක්

නිෂ්පාදන සන්නාමකරණ උපයා මාර්ග

2024 වර්ෂයේදී හඳුන්වාදුන් අපූර්වා ගිණුම කාන්තාවන් සඳහා කේන්ද්‍රගතකල ඉතුරුම් ගිණුමක් ලෙස දියුණු කර තිබිණි. කාන්තාවන් සවිබල ගැන්වීම, මූල්‍ය ස්වාධීනත්වය ඇති කිරීම සහ මූල්‍ය කළමණාකරණයේදී ඔවුන්ගේ සුවිශේෂී අවශ්‍යතාවයන් හඳුනාගැනීමේ වේදිකාවක් ලෙස සන්නාමකරණ උපාය මාර්ග ඉලක්ක ගත කර තිබිණි. අපූර්වා යන සන්නාමය සුවිශේෂී හෝ අද්විතීය ලෙස සිංහල භාෂාවෙන් අර්ථ දැක්විය හැකි අතර මෙමගින් කාන්තාවන් සඳහා සුවිශේෂී මූල්‍ය විසඳුමක් ලබාදීම වෙනුවෙන් බැංකුවේ ඇති කැපවීම විදහා දක්වයි.

ප්‍රධාන අංග

- වාර්ෂිකව 6% ක විශේෂ පොලී අනුපාතයක්.
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු ණය පහසුකම් සඳහා විශේෂ පොලී අනුපාත.

සන්නාමකරණ පණිවුඩය

කාන්තා ව්‍යාපාරිකාවන්, වෘතිකයින් සහ ගෘහණියන්ට අපූර්වා ගිණුම මගින් මූල්‍ය සුරක්ෂිතතාවයක් සඳහා එළඹීමේ අවස්ථා ප්‍රකට කරමින් අලෙවිකරණ කටයුතු චිත්තවේගීය ආයාචනයක් වන "කාන්තාවන් සවිබල ගැන්වීම එක් වරකට එක් අයෙකුගේ ඉතුරුම්" යන තේමාව යටතේ සිදු කර ඇත.

2024 වසරේ බලපෑම

- බලගැන්වීමේ පණිවුඩ මගින් ලැබුණු ධනාත්මක ප්‍රතිචාර හරහා කාන්තා ගිණුම් හිමිකාරිනියන් 25% ක ප්‍රමාණයකින් වැඩි වී ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) - ධීවර දිරිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) සඳහා නව ණය යෝජනා ක්‍රමයක්

නිෂ්පාදන සන්නාමකරණ උපාය මාර්ග

ශ්‍රී ලංකාව තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) බල ගැන්වීම ඉලක්ක ගත කර 2024 වසරේ දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) ධීවර දිරිය ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබිණි. නිෂ්පාදන සන්නාමකරණය මගින් ව්‍යාපාර කටයුතු සඳහා සහ ව්‍යාපාර වර්ධනය සඳහා සහය දැක්වීම අවධාරණය කරන අතර දේශීය ව්‍යාපාරයන් හි ඇති මූල්‍ය බාධා පිටුදකිමින් එම ව්‍යාපාරයන්හි මෙහෙයුම් ව්‍යාප්ත කිරීම පිණිස මෙම ණය යෝජනා ක්‍රමය ආරක්ෂක පවුරක් ලෙස ක්‍රියා කරයි. "ධීවරදිරිය" "ධෛර්ය" ලෙස අර්ථ දැක්විය හැකි අතර එමගින් ශක්තිය හා ඔරොත්තු දීමේ හැකියාව සංකේතවත් කරයි.

ප්‍රධාන අංග

- ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.
- පසු අස්වනු හානිය අවම කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම.
- අපනයනය සහ දේශීය පරිභෝජනය සඳහා මත්ස්‍ය නිෂ්පාදන වල ප්‍රමිතිය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- ධීවර පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ධීවරයින් සහ ධීවර කාන්තාවන්බලගැන්වීම.

සන්නාමකරණ පණිවුඩය

"ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයින් බලගැන්වීම" මෙම පණිවුඩය ඉලක්කගත වැඩ සටහන් හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ගේ වර්ධනය වීමේ විභවතාවය සහ ණය යෝජනා ක්‍රමය හරහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් දෙනු ලබන සහයෝගය විදහා දක්වමින් සන්නිවේදනය කර ඇත.

2024 වසරේ බලපෑම

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 1,000 ක් මෙම ණය යෝජනා ක්‍රමයෙන් සාර්ථක ලෙස ප්‍රතිඵල ලබා ගෙන ඇත.

මුතුසිනා - නැවත ආරම්භ කරන ලද ළමා ඉතුරුම් ගිණුම

නිෂ්පාදන සන්නාමකරණ උපායා මාර්ග

දෙමව්පියන්හට ඔවුන්ගේ දරුවන්ගේ අනාගත අධ්‍යාපනය, සෞඛ්‍ය කටයුතු සහ වෙනත් අවශ්‍යතාවයන් සඳහා ඉතුරුම් සිදුකිරීමට ආධාරවන ලෙස වැඩිදියුණු කරන ලද අංගයන් සමගින් 2024 වර්ෂයේ දී "මුතුසිනා" ළමා ඉතුරුම් ගිණුම නැවත ආරම්භ කර තිබිණි. මෙම ගිණුම මගින් වාසිදායක ආයෝජන අවස්ථා ලබාදෙමින් දෙමාපියන් වෙත මානසික සහනයක් ලබා දෙන අතර ඔවුන්ගේ දරුවන් ද අනාගතය සඳහා සූදානම් කරයි. මෙම ගිණුම නැවත ආරම්භ කිරීම පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත විය.

ප්‍රධාන අංග

- 5% ආකර්ෂණීය පොලි අනුපාතයක් සමග විශ්මිත තෑගි ක්‍රමයක්
- වයස අවුරුදු 13 දක්වා ගිණුම් ශේෂය මත පදනම් වූ ත්‍යාග ලබාදීම
- පහ වසර ශිෂ්‍යත්ව විභාගය අ.පො.ස. (සා.පෙළ.) සහ අ.පො.ස. (උ.පෙළ.) විභාග වලදී දරුවා දැක්වූ විශේෂ දක්ෂතා සඳහා ත්‍යාග
- දරුවාට වයස අවුරුදු 18 සම්පූර්ණවීමෙන් පසුව මුතුසිනා ගිණුම සාමාන්‍ය ගිණුමක් බවට ස්වයංක්‍රීයවම පත්වෙයි.

සන්නාමකරණ පණිවුඩය

"මුතුසිනා සමග ඔබගේ ඉතුරුම් කෙරෙහි විශ්වාසය තබන්න" වසර ගණනාවක් මුතුසිනා ගිණුමෙන් ප්‍රතිලාභ ලැබූ විශ්වාසනීය ගණුදෙනුකරුවන්ගේ තහවුරු කිරීම් සමගින් මුතුසිනා මගින් පිදෙන ස්ථාවරත්වය හා ආරක්ෂාව අවධාරණය කරමින් වෙළෙඳ දැන්වීම් මාලාවක් මගින් මුතුසිනා නැවත ආරම්භ කිරීම සන්නිවේදනය කර තිබිණි.

2024 වසරේ බලපෑම

- මුතුසිනා සඳහා කැමැත්තක් දක්වන දිගුකාලීන ගනුදෙනුකරුවන්ගේ කැපී පෙනෙන වැඩිවීම සමග ගණුදෙනුකරුවන් රඳවා තබා ගැනීම හා ඔවුන්ගේ පක්ෂපාතිත්වය ඉහළ යෑම.

සමාප්තිය

2024 වර්ෂයේ දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මගින් "මැක් සේවර්" "අපූර්වා" සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) සඳහා "ධීවර දිරිය" වැනි නවතම නිෂ්පාදන එළි දැක්වීම මෙන්ම "මුතුසිනා" ගිණුම නැවත ආරම්භ කිරීමත් සමගම බැංකුව නිෂ්පාදන සන්නාමකරණ ප්‍රයත්නයන් සැලකිය යුතු ලෙස ශක්තිමත් කර තිබිණි. මෙම නිෂ්පාදන සියල්ලම විශේෂිත අනාගත ගනුදෙනුකරුවන් පිරිසක් ඉලක්ක කර සැලසුම් කර තිබූ අතර විශ්වාසය, බලගැන්වීම වර්ධනය සහ ආරක්ෂාව තහවුරු කිරීමට මෙම නවීන සන්නාමකරණ උපාය මාර්ග මගින් හැකි වී තිබිණි.

උපායමාර්ගික සන්නාමකරණ මගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අනාගතයේ ගනුදෙනුකරුවන් විය හැකි විභවතාවයෙන් යුතු පිරිසක් ආකර්ෂණය කර ගැනීමට පමණක් නොව බැංකුවේ මූල්‍ය නිෂ්පාදන හා සේවා වෙත ප්‍රවේශයක් ලබා ගැනීමට කැමැති පිරිසක් ඇතිකර ගැනීමට සහ පාරිභෝගික තෘප්තිමත්භාවය සඳහා ඇති කැපවීම ශක්තිමත්කර ඇත. මෙම උත්සාහයන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ මූල්‍ය ආයතනය බවට පත්වීමේ බැංකුවේ දැක්ම සමග සමපාත වන අතර දිවයින පුරා සිටින සියලුම ජනතාව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයින්ට නවතම පාරිභෝගික කේන්ද්‍රීය විසඳුම් ලබා දෙයි.

අප 2025 වසර වෙත පියනගන විට, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අපගේ ගනුදෙනුකරුවන්ගේ වැඩිවන අවශ්‍යතා සපුරාලමින් රටේ ආර්ථික වර්ධනයට දායකවන තවත් නිෂ්පාදන හා සේවාවන් හඳුන්වා දෙමින් මෙම සන්නාමකරණ වැඩ පිළිවෙල සිදු කරයි.

ආරක්ෂිත, විශ්වාසදායක
සහ
පහසු ප්‍රවේශයක් සහිත
බැංකු කටයුතු වෙත
අවධානය යොමු කිරීම

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතිය මගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධනවලට යටත්ව සහ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව ඇතුළුව බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සමගින් බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව අධ්‍යක්ෂවරු ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ නිවාස කටයුතු, කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධන මූල්‍ය සහ තැන්පතු භාවිතය ප්‍රවර්ධනය කිරීමයි. වර්ෂය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැත. බැංකුව, රටේ නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නැත. සංශෝධිත 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතියේ විධිවිධාන යටතේ, සභාපතිවරයා ඇතුළු විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරු හත් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, සංශෝධිත පරිදි 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුකූලව අමාත්‍යවරයා විසින් ඔවුන් පත් කරනු ලබයි. විධායක අධ්‍යක්ෂවරු කිසිවෙකු බැංකුවේ නොමැත. එසේ පත් කරන ලද අධ්‍යක්ෂවරු තිදෙනෙකු පහත සඳහන් අමාත්‍යාංශවල නියෝජිතයින් වේ; (අ) කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය; (ආ) නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය; (ඇ) පශු සම්පත් සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය. එක් අධ්‍යක්ෂවරයෙකු භාණ්ඩාගාර නියෝජිතයා ලෙස පත්කර ඇත.

ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී ගණපූරණය සඳහා අධ්‍යක්ෂවරු නවදෙනෙකු අතුරින් සාමාජිකයින් තිදෙනෙකු ප්‍රමාණවත් වේ. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මසකට එක් වතාවක් හෝ සභාපතිවරයාට අවශ්‍ය යැයි හැඟීයන විට නිතර නිතර වුවත් පැවැත්විය හැකිය. 2024 වසර තුළදී රැස්වීම් 16 පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම.

	අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී විය යුතු රැස්වීම් ගණන	සහභාගී වූ රැස්වීම් ගණන
1	ජේ. එම් සුසෙයිදාසන් මහතා - සභාපති (2024.10.04 දින ඉල්ලා අස්විය)	14	14
2	එම්. පී කුරගම මහතා - සභාපති (2024.10.04 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කර ඇත.)	04	03
3	එස්. කේ. ඒ. ගලප්පත්ති මහතා	18	18
4	බී. ආර්. මඩිහහේවා මහතා	18	16
5	එච්. සී. ඩී. එල්. සිල්වා මහතා	18	17
6	මහාචාර්ය ඩී. ඒ. එම් පෙරේරා මහතා	18	17
7	ආචාර්ය ආර්. ඒ. ටී. කේ. රණසිංහ මහතා (2024 ජුනි මාසයේදී මහ බැංකු අනුමැතිය ලැබී ඇත)	09	08

කොන්ත්‍රාත් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් විනිවිදභාවය සහ අතේ දුරින් වූ මිලකරණය මත පදනම්ව බැංකුව සහ ඊට අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු සිදු වන බව සහතික කිරීම අරමුණු කරයි.

මෙම ප්‍රතිපත්ති මගින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ප්‍රමාණාත්මකභාවය තීරණය කරනු ලබන පදනම සහ බැංකුව විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමග කටයුතු කරන ආකාරය පෙන්වා දේ. බැංකුව විසින් බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කළ නියෝගවලට සමගාමීවන සම්බන්ධිත අදාළ ගනුදෙනු ප්‍රතිපත්තිය අනුගමනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනුදෙනු කරන ලද හෝ ගනුදෙනු කිරීමට යෝජනා කර ඇති යම්කිසි ව්‍යාපාර ගනුදෙනුවක් පිළිබඳව සෘජුව හෝ වක්‍රව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ ඔහුගේ කාලත්‍රයා හෝ යැපෙන දරුවකු හෝ දරුවන් උනන්දුවක් දක්වා තිබේ නම්, එම ගනුදෙනුව සඳහා දක්වා තිබූ උනන්දුවේ ස්වභාවය පිළිබඳ එවැනි ගනුදෙනු සාකච්ඡා කරන රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එළිදරව් කළ යුතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන් බැඳියාවක් දක්වන කරුණු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශය කිරීමෙන් වැළකී සිටින බව සහතික කරලීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඔවුන්ගේ අධ්‍යක්ෂ ධුර සහ සම්බන්ධතා අනාවරණය කළ යුතුය. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුව සමග යම් ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙකු සෘජුව හෝ වක්‍රව බැඳියාවක් නොමැති බව වාර්තා කරයි.

මෙහෙයුම් සමාලෝචනය සහ අනාගත සංවර්ධන

2024 මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය සහ අනාගත සංවර්ධනය පිළිබඳ සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාවේ පිළිවෙලින් අංක 03 සිට 17 දක්වා පිටුවල දක්වා ඇති සභාපතිගේ වාර්තාව, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. ගේ වාර්තාව සහ මූල්‍ය සමාලෝචනය තුළ අන්තර්ගත වේ. එම වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසකි.

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී :ප්‍ර.වි.නි.*

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) යනු බැංකුව තුළ ඉහළම ශ්‍රේණියේ පුද්ගලයා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුව පත් කරනු ලැබේ. ඔහුගේ මූලික වගකීම් අතරට බැංකුවේ කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතු ඇතුළත් වේ. බැංකුවේ තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රමෝපායික අරමුණු, ආයතනික සාරධර්ම සහ සමස්ත අවදානම් ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවලට අනුකූලව බැංකුවේ ව්‍යාපාරයේ එදිනෙදා කළමනාකරණ කටයුතු ඔහු විසින් සිදු කරයි.

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

දැක්ම, මෙහෙවර සහ වටිනාකම් මඟින් බැංකුව ගමන් කරන දිශාව සහ සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන දෑ පිළිබඳ සියලු දෙනාගේ අවධානය යොමු කරයි. තවද එමඟින් බැංකුවේ මූලික සාරධර්ම සහ සේවකයින්ගේ හැසිරීම අපේක්ෂා කරන ආකාරය පැහැදිලි කරයි. බැංකුව එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා ඉහළ මට්ටමක සදාචාර ප්‍රමිතීන් අනුව සිය ව්‍යාපාරික කටයුතු පවත්වනු ලබයි. බැංකුවේ දැක්ම, මෙහෙවර සහ ආචාර ධර්ම පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 02හි දක්වා ඇත.

ආයතනික පාලනය

ඵලදායී ආයතනික පාලන ව්‍යුහයක් සහ ක්‍රියාවලියක් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. ඵලදායී පාලනය මඟින් තිරසාර වගකීම් සහගත වර්ධනය සඳහා මඟ පෙන්වන බැව් අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. ආයතනික පාලන ප්‍රතිපත්ති මඟින් බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා කාර්යයන් ඵලදායී ලෙස මෙහෙයවීම සහ පාලනය කිරීම සිදු කරනු ලබයි. ආයතනික පාලන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 25 සිට 52 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුවේ කටයුතු පාලනය කිරීම සහතික කිරීම සඳහා බැංකු පනතේ විධානයන්ට අනුකූලව අනු කමිටු හතරක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මඟින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරයි. බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ හෙළිදරව් කිරීම සඳහා සකස් කරන ලද ත්‍රෛමාසික වාර්තා, බැංකුවේ නෛතික සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම, බැංකුවේ බාහිර විගණන කාර්යයන්හි වාර්ෂික වැඩ වැඩසටහන සහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ මූල්‍ය වාර්තාකරණය, තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ පාලනය ආදිය කමිටුවේ විෂය පථය යටතට ගැනේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර, එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. කමිටුවේ සභාපතිවරයා ගණකාධිකරණය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සේවය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, කුසලතා සහ පළපුරුද්ද ඇති සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සඳහා පත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරයි.

සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යධිකාරී (මූල්‍ය), සහකාර සාමාන්‍යධිකාරී (මානව සම්පත් සහ ප්‍රසම්පාදන) සහ ප්‍රධාන කළමනාකාර (ශාඛා මෙහෙයුම්) ආරාධිතයන් ලෙස රැස්වීම්වලට සහභාගී වූ අතර, රජයේ විගණන අධිකාරී නිරීක්ෂකයෙකු ලෙස සියලුම රැස්වීම්වලට සහභාගී විය.

2024 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් හයක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 54 සිට 55 දක්වා පිටුවල ඉදිරිපත් කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව

බැංකුවේ අධ්‍යකෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) බැංකුව වෙනුවෙන් මානව සම්පත් ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ සැලසුම් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමේදී මඟ පෙන්වීම් හා උපදෙස් ලබා දේ, බැංකුවේ සාමාන්‍යධිකාරී/ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පාරිශ්‍රමික ප්‍රතිපත්ති, වැඩසටහන්, වැටුප් ව්‍යුහයන් සහ නියමයන් හා කොන්දේසි සමාලෝචනය කරයි, එමෙන්ම සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටලු සම්බන්ධයෙන් අනෙකුත් අධ්‍යකෂ මණ්ඩල උපකමිටු සමඟ උපයෝගී කාර්යභාරයක් පවත්වා ගෙන යයි, එමෙන්ම මේවා කමිටුව වෙත පැවරී ඇති මූලික වගකීම් වේ.

බැංකුවේ අධ්‍යකෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විතවන අතර, එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යකෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන විට හැර සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී කමිටුවේ සියලුම රැස්වීම් සඳහා සහභාගී වේ.

මෙම කමිටුව අවම වශයෙන් වසරකට වරක් රැස්විය යුතු අතර, 2024 වර්ෂයේදී කමිටුව එක් වරක් රැස්විය. අධ්‍යකෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 57 හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ

කමිටුව (BIRMC) මඟින් සියලු අවදානම් තක්සේරු කරනු ලබයි; එනම් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ඔස්සේ ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ග තක්සේරු කරනු ලබන අතර, බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා සමාලෝචන කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් විශේෂිත අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සමාලෝචනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ ව්‍යාපාරික මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්තිවලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා ස්වාධීන අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත. එමෙන්ම බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරන ලද විචක්ෂණ මට්ටම් ඉක්මවා යන මට්ටම්වලදී විශේෂිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වේ; අයෙකු විකල්ප සාමාජිකයෙකු වන අතර, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ පුළුල් අවදානම් කාණ්ඩ භාරව කටයුතු කරනු ලබන අවදානම් කළමනාකරණ ප්‍රධානියා මේ අතර වේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) ලේකම් ලෙස කටයුතු කරයි.

2024 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු 58 සිට 60 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම/ පත්කිරීමේ ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් යන තනතුරු සඳහා පත්කිරීම් හෝ උසස්කිරීම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සැකසීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩල නමයෝජනා කමිටුව එහි ක්‍රියාකාරකම් සහ තීරණ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර, අයෙකු විකල්ප සාමාජිකයෙකි. කමිටුවේ සභාපතිවරයාගේ මඟපෙන්වීම මත ආරාධිතයන් ලෙස සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, සහකාර සාමාන්‍යධිකාරී (මානව සම්පත් සහ ප්‍රසම්පාදන) රැස්වීම්වලට සහභාගි වෙයි. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ (BNC) ලේකම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව අවම වශයෙන් වසරකට වරක් හමුවීමට අවශ්‍ය වන අතර, අවශ්‍යතා මත පදනම්ව, තවත් රැස්වීම් පැවැත්විය හැකිය. 2024 වර්ෂයේදී කමිටු රැස්වීම් හතක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 56 වන පිටුවේ දක්වා ඇත.

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR)

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR) යනු බැංකුවක පවතින ප්‍රාග්ධනය මැනීමකි. එය බැංකුවේ බර තැබූ අවදානම් ණය නිරාවරණවල ප්‍රතිශතයක් ලෙස දක්වනු ලබයි. බැංකුව සෑම විටම අවම ප්‍රාග්ධන ප්‍රමාණවත් අවශ්‍යතා පවත්වා ගෙන යයි.

බැංකුවේ වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) විසින් ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය නිතිපතා අධීක්ෂණය කරනු ලැබේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාර ගනී. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගනු ලබන නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ 62 සිට 66 දක්වා පිටුවල විස්තර කර ඇත.

අභ්‍යන්තර පාලනය

ගිණුම්කරණය සහ විගණනය මගින් අර්ථ දක්වා ඇති පරිදි, අභ්‍යන්තර පාලනය යනු මෙහෙයුම් ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව, විශ්වාසනීය මූල්‍ය වාර්තාකරණය සහ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුවේ අරමුණු සහතික කිරීමේ ක්‍රියාවලියකි.

එදිනෙදා ව්‍යාපාර කළමනාකරණයේදී ආයතනික කළමනාකාරිත්වයට මගපෙන්වීමක් දක්වන ඵලදායී හා පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් බැංකුව තුළ ක්‍රියාත්මක වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කර ඇත.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 76 සිට 77 දක්වා පිටුවල දක්වා ඇත.

ලාභ සහ විසර්ජන

2024 වර්ෂය සඳහා බැංකුවේ මුළු ආදායම රු. මිලියන 7581 කි. බැංකුවට අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

විස්තර	රු. මිලියන
සංචිත	5,420
ප්‍රාග්ධන වියදම්	375
නිශ්චල දේපළවල වෙළඳ පොළ/ සාධාරණ වටිනාකම	-
දායක ප්‍රාග්ධනය	889
සැලකිය යුතු කොටස් හිමිකම සහ කොටස් තොරතුරු	-
රජයේ ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා දායකත්වය	166
බදු අය කිරීම	166
ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවන සිදුවීම්	අදාළ නොවේ
පසු ශේෂ පත්‍ර සිදුවීම්	අදාළ නොවේ
අඛණ්ඩ පැවැත්ම	අදාළ නොවේ

වාර්තා කරන දිනට පසු සිදුවීම්

වාර්තා කරන දිනට පසු වාර්තා කිරීමට අවශ්‍ය සිදුවීම් නොමැත.

අදාළ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල වීම

බැංකුව සෑම අවස්ථාකදීම 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු නීතියට හා එහි සංශෝධනයන්ට සහ පනවා ඇති, ශ්‍රී ලංකාවේ අනෙකුත් අදාළ සියලුම නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල බවට තහවුරු කර ඇත.

සියලුම පාර්ශවකරුවන්ට සාධාරණ සැලකීම

බැංකුව සෑම පාර්ශ්වකරුවන් කණ්ඩායමකටම එක හා සමානව වැදගත්කමක් ලබා දෙයි. සාධාරණ මිලකරණය; සේවාවන්හි ගුණාත්මකභාවය; මෙන්ම අවංකභාවය සහ සම්පූර්ණත්වය තුළින් බැංකුව සිය සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට කැපවී සිටී.

ගනුදෙනුකරුවන් සහ ණයගැතියන්

බැංකුවේ ප්‍රධාන අරමුණක් වන්නේ දැරිය හැකි මිලකට ජනතාව වෙනුවෙන් නිවාස ණය ලබාදීමයි. මේ සම්බන්ධයෙන් නිරන්තර සමීක්ෂණ සිදු කිරීමට බැංකුව විශේෂ උත්සාහයක් ගෙන ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, රැකියා වියුක්තිය තුරන් කිරීමට රජයට සහය දක්වන කර්මාන්තකරුවන්ට උපකාර කිරීම සඳහා බැංකුව විසින් ණය යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දී ඇත.

තැන්පත්කරුවන් සහ සැපයුම්කරුවන්

තැන්පත්කරුවන් බැංකුවේ ප්‍රධාන අරමුදල් සපයන්නන් වේ. තැන්පතු අනුපාත ප්‍රකාශයට පත් කර ඇති අතර තරගකාරී වේ. ප්‍රාග්ධනය සහ පොලී නියමිත දිනට ගෙවනු ලැබේ. බැංකුව භාණ්ඩ හා සේවා සැපයීම සඳහා මිල ගණන් කැඳවන අතර, කඩිනම් ගෙවීම් සහතික කරයි.

විගණක වාර්තාව

විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ විගණකවරයා වේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයාගේ උපදෙස් අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුවේ ගිණුම් විගණනය සිදු කරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 82 සිට 86 දක්වා පිටුවල දක්වා ඇත.

ස්තුතිය

අධ්‍යක්ෂවරු බැංකුවේ අගනා ගනුදෙනුකරුවන්ගේ සහයෝගය හා බැංකුව කෙරෙහි ඔවුන් තබා ඇති විශ්වාසය පිළිබඳව අවංක ස්තුතිය පුදකර සිටින අතර මෙම අන්‍යෝන්‍ය සහයෝගාත්මක සම්බන්ධතාවය ඉදිරියටත් පවත්වාගෙන යෑමට අපේක්ෂා කරති. බැංකුවේ ප්‍රගමනය සඳහා සේවකයින් ලබාදුන් දායකත්වය පිළිබඳව අධ්‍යක්ෂවරු ඔවුන්ගේ කෘතඥතාවය පිරිනමන අතර ශ්‍රී ලංකාවේ නියාමන හා රාජ්‍ය බලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය පිළිබඳවත් ස්තුතිය පළ කරති.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ඩිලානි අලහකෝන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය

වගකීම

2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 03 වන පරිච්ඡේදයේ (8) (ii) (බී) වගන්තියට අනුකූලව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව තුළ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සහ එහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. බැංකුකරණ ව්‍යාපාර පාලිත පදනමක් යටතේ අවදානම් සහ ප්‍රතිලාභ සමතුලිත වීම අවශ්‍ය බව එවැනි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සලකා බැලීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන ඇත. බැංකුවේ අවදානම් දැරීමේ හැකියාව අනුව සැඳුම් ලත් සීමා සහ දර්ශක මගින් පෙන්නුම් කරනු ලබන නොගැළපීම් ඉස්මතු කරලීමට එවැනි අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් සකස් කොට ඇත. මෙහිදී පාලකවල ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය සැලකිල්ලට ගනිමින් වත්කම් නිසි ලෙස ආරක්ෂා කිරීම, නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ විශ්වසනීයත්වය සැපයීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, මූල්‍ය තොරතුරු සහ වාර්තාවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ට එරෙහිව හෝ ආවේනික සීමාවන් හේතුවෙන් අක්‍රමිකතා සහ වංචා ඉවත් කිරීම සඳහා මෙම පද්ධතිය මගින් පූර්ණ සහතිකයක් ලබා නොදේ.

බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇත. ව්‍යාපාරික පරිසරයේ හෝ නියාමන අවශ්‍යතා සහ වෙනත් මාර්ගෝපදේශ වෙනස් වන විට සහ වෙනස් කරන විට අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම මෙම ක්‍රියාවලිය සඳහා ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශයට අනුකූලව මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා අධීක්ෂණය කරනු ලබයි. එම මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා මූලධර්මවලට අනුකූලව අභ්‍යන්තර පාලන පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිය යහපත් සහ ප්‍රමාණවත් මට්ටමින් පවතින බවත්, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවලට අනුකූල බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

බැංකුව විසින් මුහුණ දෙනු ලබන අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම ඔස්සේ අවදානම් සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය වේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලැස්ම සහ ඵලදායිත්වය යොදා ගැනීම සහ සමාලෝචනය කිරීමේදී භාවිත කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලැස්ම සහ කාර්යසාධනය වරින් වර සමාලෝචනය කිරීමේ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත. එහි ප්‍රධාන ක්‍රියාවලි සඳහා පහත දෑ ඇතුළත් වේ.

- බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත්භාවය සහ පරිපූර්ණත්වය සහතික කරලීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ අනු කමිටු පිහිටුවා ඇත. ආයතනික අරමුණු, උපාය මාර්ග සහ වාර්ෂික අයවැය සාක්ෂාත් කර ගැනීම මෙන්ම බැංකුව විසින් මුහුණ දෙන අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීමට එහි අධිකාරිය ආයතනික කළමනාකාරිත්වය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ බැංකුවේ කළමනාකරුවන් යන මට්ටම් අතර පවරා ඇත.

- ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමන්විත වේ. බැංකුවේ අවදානම් ස්වරූප සමාලෝචනය කිරීම, බැංකුව විසින් මුහුණ දෙන ප්‍රධාන අවදානම හඳුනා ගැනීම සහ බැංකුවේ අවදානම් ස්වරූපය සහ අවදානම් දැරීමේ හැකියාව මත පදනම්ව ප්‍රතිපත්ති සකස් කිරීම කමිටුවේ වගකීම වේ.

- බැංකුවේ අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමඟ එහි මූල්‍ය, පරිපාලන සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ගැළපෙන්නේද යන්න සහතික කිරීම සඳහා අවදානම් මත පදනම් වූ විගණන ප්‍රවේශය අනුව බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය පරීක්ෂණ සිදු කරයි. ක්‍රියාකාරී ඒකක සහ බැංකුවේ නිෂ්පාදන හා සම්බන්ධ අවදානම් මට්ටම අනුව නිරන්තරයෙන් සියලුම ක්‍රියාකාරී ඒකක සහ ශාඛා සඳහා විගණන සිදු කෙරේ. බැංකුවේ අක්‍රමිකතා, සාවද්‍ය ප්‍රකාශන, වංචා, පරිපාලනය සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ විගණන නිරීක්ෂණවලට අදාළව අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ විෂයමූලික සහ ස්වාධීන තක්සේරුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත නිරන්තර වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක වගකීම දරයි

- සාමාන්‍යයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ සමස්ත කාර්යක්ෂමතාව සමාලෝචනය කරන අතර, අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳ නිශ්චිත නිරීක්ෂණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරන්තරයෙන් වාර්තා කරයි. මේ සම්බන්ධයෙන්, කමිටුව විසින් භාවිත කරන යාන්ත්‍රණය සඳහා විගණකාධිපති වාර්තාව, අභ්‍යන්තර විගණන වාර්තා, නියාමන වාර්තා, වාර්ෂික/මාසික මූල්‍ය ප්‍රකාශන සහ ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් වේ.

- 2012 දී බැංකුව විසින් LKAS සහ SLFRS ඇතුළත් නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් සම්මත කරන ලදී. එවැනි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමත් සමඟ, හඳුනාගැනීම, ඇගයීම, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම පිළිබඳ නව

අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීමට බැංකුව විසින් ක්‍රියාවලි අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ප්‍රගතිශීලී ලෙස වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි.

- 2018 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් SLFRS 9 "මූල්‍ය සාධනපත්‍ර" බැංකුව විසින් අනුගමනය කරනු ලබයි. SLFRS 9 හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා, විවිධාකාර ආර්ථික පුරෝකථන භාවිත කරමින් බැංකුව විසින් අපේක්ෂිත ණය අලාභ (ECL& ආකෘතියක් සකස් කරන ලදී. වර්ෂය තුළදී වරලත් ගණකාධිකාරීවරුන්ගේ ජාත්‍යන්තර සමාගමෙන් හානිකරණ ප්‍රතිපත්තියේ ආදර්ශ වලංගුභාවය ලබාගත් අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. SLFRS 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ ඇගයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූල වීමට බැංකුව සුදුසු පියවර ගෙන ඇත.

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වාර්තාකරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි මඟින් සහතික කරන්නේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.

- එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම් සම්බන්ධයෙන් බැංකුවේ මූලික ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණය සහ අධීක්ෂණය සහතික කිරීම සඳහා කළමනාකරණ මට්ටමේ කමිටු අදාළ බලතල අනුව ක්‍රියාත්මකව පවතී.

- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සැලසුම් සහ කාර්යසාධනය පිළිබඳ විධිමත් වාර්ෂික සමාලෝචනයක් සිදු කර ඇත. අභ්‍යන්තර පාලනවල කාර්යසාධනය සමාලෝචනය කිරීමට පහසුකම් සලසන බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ලියකියවිලි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

- තොරතුරු පද්ධති පාලනය ශක්තිමත් කරලීමට වරලත් ගණකාධිකාරීවරුන්ගේ ජාත්‍යන්තර සමාගම විසින් සකස් කරන ලද තොරතුරු පද්ධති ආරක්ෂණ පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී පියවර ගෙන ඇත.

- කර්මාන්තයේ හොඳම භාවිතයන් හඳුනා ගැනීමට සහ පාරිභෝගික සේවාව වැඩිදියුණු කිරීමට ව්‍යාපාර ක්ෂේත්‍රයේ තාක්ෂණික සහ තොරතුරු පද්ධති පරිසරයේ සිදුවන වෙනස්කම් ඉතා වැදගත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. මෙකී කාරණයට විසඳුමක් ලෙස නව මූලික බැංකු පද්ධතියක් සඳහා ආයෝජනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී මුලපිරීමක් ගෙන ඇත. සංවිධානයේ සංවර්ධන අරමුණු සඳහා ඉහළ ප්‍රතිඵලයන් අත් කර ගැනීමට ව්‍යාපාර මෙහෙයුම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සහ පාරිභෝගික අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම මෙහි අරමුණ විය.

- පසුගිය වසරේ සහ වර්ෂය තුළ අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව බාහිර විගණකවරයා සහ මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද අදහස් ද සලකා බැලූ අතර, අවශ්‍ය අවස්ථාවලදී ඒවා විසඳීමට නිසි පියවර ගන්නා ලදී.

සහතික කිරීම

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුවේ මූල්‍ය වාර්තාකරන ක්‍රමය මූල්‍ය වාර්තාකරනයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා පිළියෙල කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුව සිදුකර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව

මහාචාර්ය ඩී. ඒ. එම් පෙරේරා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ස්වාධීන අධ්‍යක්ෂ

එච්. සී. ඩී. එල් සිල්වා මහතා
සාමාජික - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ විධායක නොවන අධ්‍යක්ෂ

එස්. කේ. ඒ ගලප්පත්ති
සාමාජික - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/ ස්වාධීන අධ්‍යක්ෂ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/SMIBIC/2024/40	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2025 පෙබරවාරි 28

සභාපති
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිවරයාගේ ස්වාධීන තහවුරු වාර්තාව

හැඳින්වීම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට ඇතුලත් කළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි (බැංකුව) අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය ("ප්‍රකාශණය") සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය පිළිබඳ තහවුරු කිරීමක් මෙම වාර්තාව මගින් සපයනු ලබයි.

කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝග යේ 3(8)(11)(ආ) වගන්තිය අනුකූලව නිකුත්කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂ මණ්ඩල සඳහා මාර්ගෝපදේශය" ට අනුව මෙම ප්‍රකාශණය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමණාකරණය වගකීමට බැඳී සිටී.

මාගේ වගකීම සහ SLSAE 3050 (ප්‍රතිශෝධිත) සමග අනුකූලතාවය

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලසුම් සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් සත්හේතුක කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත්කර ඇති අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු සඳහා සහතික කිරීමේ වාර්තාව වන, සහතික කිරීමේ කාර්යය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය -SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුකූලව මම මගේ කාර්යය සිදුකළෙමි. සියලුම වැදගත් අංශයන් හිදී කළමනාකරණය අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කර ඇති බවට සීමිත සහතිකයක් ලබාගැනීමේ ක්‍රියාපටිපාටි මම විසින් සැලසුම් කර ඉටුකිරීම මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ.

මෙම කාර්යයේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සඳහා මම වගකීමට බැඳී නොමැති අතර, මෙම කාර්යය සම්බන්ධයෙන් මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදුකර නොමැත.

ක්‍රියාවට නංවන ලද කාර්යයන් පිළිබඳ සාරාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලසුම් සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා මාගේ කාර්යය මම ඉටු කළෙමි.

නියැදියකින් ප්‍රශ්න කිරීම් මගින් ලබාගත් තොරතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලියට සහයවන නියැදි පදනමක් මත, ඉටුකරන කරන ලද ක්‍රියාපටිපාටි මූලික වශයෙන් බැංකුවෙහි කාර්යය මණ්ඩලය සහ ලේඛණවල පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා සීමා විය.

SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව මෙම ප්‍රකාශනය මගින් සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න හෝ බැංකුවෙහි අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටිවල ඵලදායිතාව පිළිබඳ මතයක් සකස් කරන්නේද යන්න සලකා බැලීමක් අවශ්‍ය නොවනු ඇත. SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව වාර්ෂික වාර්තාව තුළ හෙළිදරව් කරන ලද කිසියම් සැලකිය යුතු ගැටළු පිළිබඳ වැදගත් අභ්‍යන්තර පාලන අංගයන් සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කරන ලද ක්‍රියාවලි සැබැවින්ම ගැටළුවලට පිළියම් කරන්නේද යන්න සලකා බැලීමක් මාහට අවශ්‍ය නොවනු ඇත.

තෝරාගත් ක්‍රියාපටිපාටි බැංකුවේ ස්වභාවය, ප්‍රකාශනය පිළියෙල කර ඇති සිදුවීම හෝ ගනුදෙනුව පිළිබඳ මාගේ අවබෝධය සැලකිල්ලට ගත් මගේ විනිශ්චය මත රඳා පවතී.

මගේ නිගමනය සඳහා පදනමක් ලබා ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් සාධක මා ලබාගෙන ඇති බව මම විශ්වාස කරමි.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියාපටිපාටි අනුව, බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සැකසුම් සහ එහි ඵලදායිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාවට නගනු ලබන අගය කිරීමේ ක්‍රියාවලිය, අපගේ අවබෝධයට අනුව සහ වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් ප්‍රකාශයන්හේ අනුකූලතාවයේ පැහැදිලි බවක් හෝ විශ්වාස කටයුතුභාවයෙහි සැකයක් ඇති බවට කිසිදු සාක්ෂියක් හමුවී නොමැත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

කළමනාකරණය විසින් භාරගන්නා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා වගකියමින්, මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මූල්‍ය වාර්තාකරණයට අදාළ නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වී ඇති බව සහතික කිරීම සඳහා අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශනය තුළ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කරන බව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත්කරන මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී.

මූල්‍ය ප්‍රකාශන

1988 අංක 30 දරණ බැංකු පනත, 1971 අංක 38 දරන මූල්‍ය පනත සමග කියවියයුතු 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්හි දක්වා ඇති විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියෝග ප්‍රකාරව අවබෝධකර ගැනීම, අධීක්ෂණය සහ ආයතනය ඉදිරියට මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සාක්ෂරතාවයක් ඇති බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු සහ ව්‍යාපාරය පාලනය සහ පරිපාලනය කිරීම සිදුකරයි.

මෙම වාර්ෂික වාර්තාවේ පිළියෙල කර ඉදිරිපත් කර ඇති 2024 මූල්‍ය වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ පොත්වලට අනුකූලවන අතර, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතාවන්ට අනුකූලවන අතර අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව එක් එක් මූල්‍ය වසර අවසානයේදී බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

මෙම වාර්ෂික වාර්තුව තුළ ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී. මෙම මූල්‍ය ප්‍රකාශනවල පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂවරු පහත දෑ තහවුරු කර සිටිති.

1. පවත්නා මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුව අනුරූප ආකාරයකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන, යොදාගෙන, සහ භාවිතා කර ඇති අතර වැදගත් අපගමනයන් ඇත්නම් අනාවරණය සහ පැහැදිලිකර ඇත;

2. අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රමිති අදාල පරිදි අනුගමනය කර ඇත.

3. විනිශ්චයන් හා ඇස්තමේන්තු සිදුකර ඇති බව සහ ඒවා විචක්ෂණ හා සාධාරණබව.

මූලික කාර්යසාධන දර්ශක ඇතුළුව කාර්තුමය විගණනය කළ මූල්‍ය ප්‍රකාශන එක් එක් කාලසීමාව අවසානයේදී මාස දෙකක් ඇතුළත භාෂා තුනෙන් පුවත්පත්වල බැංකුව ප්‍රකාශයට පත් කර ඇති අතර ඒවා බැංකුවේ වෙබ් අඩවියේද ප්‍රකාශයට පත් කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකළ සමාලෝචනය හා නිර්දේශය අනුගමනය කරමින් අතුරු මූල්‍ය ප්‍රකාශන මුද්‍රාහැරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා අනුමත කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 54 සිට 55 දක්වා පිටුවල ඇත. මූල්‍ය ප්‍රකාශන බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියමිත ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

අඛණ්ඩතා පැවැත්ම

නුදුරු අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකිරීම සඳහා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS හා SLFRS) අනුකූලව සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරණය කිරීමට ප්‍රමාණවත් සම්පත් බැංකුවට ඇති බව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අභ්‍යන්තර පාලනය හා අවදානම් කළමනාකරණය

බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම, වංචා හා වැරදි කළමනාකරණය පිටු දැකීම සහ ශක්තිමත් පාලන වටපිටාවක් පවත්වාගෙන යෑම සඳහා සැලකිය යුතු අවදානයක් යොමු කිරීම හා අභ්‍යන්තර විගණනය හා අවදානම් කළමනාකරණය ඇතුළත් ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් හා එහි ඵලදායිත්වය අධීක්ෂණය කිරීම සඳහා ඵලදායී පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර බැංකුවේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත් වංචා හා වෙනත් අක්‍රමිකතා අනාවරණය කර ගැනීම සඳහාත්, සැලකිය යුතු ක්‍රියාමාර්ග හා දැඩි අවදධානය යොමු කිරීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වෙයි.

අභ්‍යන්තර පාලනයේ අරමුණ වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකර ඇති ඉලක්ක සපුරාගත හැකි ඵලදායි ආයතනයක් බිහිකර ගැනීම වන අතර එබැවින් මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ ව්‍යාපාර කටයුතු සුදුසු හා ඵලදායි ලෙස සිදුකරගෙන යනු ලබන බව සහ නීති හා රෙගුලාසි සඳහා අනුකූලව කටයුතු කරන බව සැලකිය යුතු දුරකට අර්ථවත් වෙයි.

විගණන කමිටුවේ මග පෙන්වීම් යටතේ අභ්‍යන්තර විගණන අංශය අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිත්වය අධීක්ෂණය කරන අතර අවශ්‍ය විටදී අවශ්‍ය සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හරහා සහ සාමාන්‍ය පරිදි පවත්වන රැස්වීම්වලදී සාජුව මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරනු ලබන බව අධ්‍යක්ෂවරු තහවුරු කරති.

බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරන වාර්තාව මෙම වාර්ෂික වර්තාවේ පිටු අංක 76 සිට 77 දක්වා පිටුවල ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට බැංකුව විසින් ගෙවියයුතු බදු සහ බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් හා ඒ වෙනුවෙන් ගෙවියයුතු සියලුම දායකත්වයන් හා බදු සහ බැංකුව විසින් රජයට සහ අනෙකුත් නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවීමට බැඳී සිටින හා ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කර සිටිති.

විගණන වාර්තාව

විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයාවන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අවසන් මතයක් ප්‍රකාශකරයි.

අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන ඇතුලු බැංකුවේ සියලුම වාර්තා විගණකාධිපතිවරයා වෙත ලබා දී ඇති අතර ඔවුන්හට සුදුසුයයි හැඟීයන පරීක්ෂාකිරීම් සිදුකිරීමට අවස්ථාව ලබා දෙමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම දේ පරීක්ෂාකර විගණකාධිපතිවරයා අවසන් මතයක් ප්‍රකාශකර ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකවරයාගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 82 සිට 86 දක්වා පිටුවල දැක්වේ.

වැදගත් ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන් බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ හිටපු අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහ බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහතික කළ යුතුව ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට බැංකුව විසින් සියළුම නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බව හෝ අදාල පරිදි සපයා ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමකට පත්වෙති. මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ වගකීම් ඉටුකර ඇති බව අධ්‍යක්ෂවරුන් දරණ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩිලානි අලහකෝන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

REPORT OF THE AUDITOR GENERAL

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	BANSMIBFS202439	
ඔබේ අංකය / உமது இல. / Your No.		
දිනය / திகதி / Date	2025 පෙබරවාරි 28	

සභාපති,

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව

I. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ද්‍රව්‍යාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනත සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත මාගේ වාර්තාව යථාකාලයේදී සභාගත කරනු ලැබේ.

මේ සමඟ ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන්වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සත්‍ය හා සාධාරණ පිරූපණයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

REPORT OF THE AUDITOR GENERAL

1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මම මාගේ විගණනය පැවැත්වූයෙමි. මෙම ප්‍රමිති යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තරකර ඇත. මම ලබාගත් විගණන සාක්ෂිය මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට මම විශ්වාස කරමි.

1.3. බැංකුවේ 2024 වාර්ෂික වාර්තාවේ අඩංගු වෙනත් තොරතුරු

අනෙකුත් තොරතුරු සඳහා බැංකුවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුලත් තොරතුරු අන්තර්ගත නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල හා මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන අතර එම තොරතුරු මා වෙත ලැබෙනු ඇත්තේ මෙම විගණන වාර්තාවේ දිනට පසුව වේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුවෙයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොවන අතර මම එහිදී සහතික කරනලද නිගමනයන් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය සම්බන්ධයෙන් ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු පවතිනවිට ඒවා කියවමින් මූල්‍ය ප්‍රකාශන සමග එම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මකව නොගැලපේද? හෝ විගණනයේදී මා ලබාගත් තොරතුරු සාවද්‍ය ලෙස ප්‍රකාශව තිබේද යන්න සලකා බැලීම වෙයි.

මම බැංකුවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, ඒවා නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කිරීමට මට අවශ්‍ය වේ. තවදුරටත් ප්‍රමාණාත්මක නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ මාගේ වාර්තාවේ තිබේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව පාර්ලිමේන්තුවට යථා කාලයේ දී සභාගත කරනු ලබන මාගේ වාර්තාවට ඇතුලත්වනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකිවීම පිණිස අවශ්‍ය යයි කලමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයක් හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අනුව සත්‍ය හා සාධාරණ නිරූපණයක් ලැබෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සඳහා කලමනාකරණය වගකිවයුතු වෙයි.

REPORT OF THE AUDITOR GENERAL

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් පසකින් බැංකුව ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ තත්‍ය විකල්පයක් නොමැතිනම් එසේ සිදුකිරීම හැරහොත් ගිණුම්කරණයේ දී ප්‍රවර්ථන ව්‍යාපාර සංකල්පයට සම්බන්ධ කරුණු සුදුසු පරිදි හෙළි කිරීම ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්වාගෙන යෑමේ බැංකුවේ හැකියාව තක්සේරු කිරීම සඳහා කළමනාකරණය වගකිව යුතු වෙයි.

පාලනය සඳහා වගකිවයුතු පිරිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු වෙයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව බැංකුව එහි අන්තර්වාර හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවීම පිණිස බැංකුවේ සියලුම ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වාර්තා කිරීම සඳහා යෝග්‍ය පොත්පත් පවත්වාගෙනයෑම අවශ්‍යවෙයි.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

මගේ පරමාර්ථය වන්නේ සමස්ථයක් ලෙස වංචා හෝ දෝෂ හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශන වැදගත් වැරදි ප්‍රකාශයන්ගෙන් නිදහස්ද යන්න පිළිබඳ සාධාරණ සහතිකය ලබාගැනීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ සහතිකය ඉහළ මට්ටමේ සහතිකයක් වුවද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනයකින් වැදගත් වැරදි ප්‍රකාශයක් එහි පැවතියද සෑම අවස්ථාවකදීම එය සොයා ගන්නා බවට වගවීමක් නොමැත. වැරදි ප්‍රකාශ වංචාව හෝ දෝෂය තුළින් ඇතිවිය හැකි අතර තනි තනිව හෝ එකතුව මෙම මූල්‍ය ප්‍රකාශනවල පදනම් මත ගනු ලබන ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට ඉන් සාධාරණව අපේක්ෂා කරන්නේනම් වැදගත් ලෙස සලකනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර, විගණනය පුරා වෘත්තීය සංශයවාදය පවත්වා ගනිමි. එමෙන්ම මම :

- වංචාව හෝ දෝෂ හෝ සැලැස්ම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශනවල වැදගත් වැරදි ප්‍රකාශන පිළිබඳ අවදානම් හඳුනාගෙන තක්සේරු කරන අතර, එවැනි අවදානම්වලට ප්‍රතිචාරාත්මක විගණන ක්‍රියාපටිපාටි ඉටුකරමින් මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසුවන විගණන සාක්ෂිය ලබා ගතිමු. වංචාවෙන් ඇතිවන වැදගත් වැරදි ප්‍රකාශනයක් සොයා නොගැනීමේ අවදානම වංචාව කුමන්ත්‍රණය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඉවත්කිරීම්, ව්‍යාජ නියෝජන, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම හා සම්බන්ධවන බැවින් දෝෂයකින් ඇතිවන දෙයකට වඩා විශාලය.

REPORT OF THE AUDITOR GENERAL

- බැංකුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා හැර අවස්ථාවන්ට සුදුසුවන විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමු.

- කළමනාකරණය විසින් භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ ඔවුන් විසින් සිදුකරන ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ අනාවරණවල සාධාරණත්වය අගය කරමි.

- ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පදනම සම්බන්ධ කළමනාකරණයේ භාවිතයේ යෝග්‍යතාව සහ ලබාගත් විගණන සාක්ෂිය මත පදනම් වී, ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යාම පිළිබඳ බැංකුවේ හැකියාව සම්බන්ධව වැදගත් සැකයක් ඇතිකළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් සම්බන්ධයෙන් වැදගත් අවිනිශ්චිතතාවක් පවතීද යන්න නිශ්චය කරමි. වැදගත් අවිනිශ්චිතතාවක් පවතින බවට මම නිශ්චය කරන්නේනම් මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ අනාවරණයන්ට මගේ විගණන වාර්තාව පිළිබඳ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, එවැනි අනාවරණ ප්‍රමාණවත් නොවන්නේනම් මගේ මතය වෙනස් කිරීමට අවශ්‍ය වේ. මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂිය මත මාගේ නිගමන පදනම් වේ. කෙසේවෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස බැංකුව ඉදිරියට යාම නතර කිරීමට හේතු විය හැකිය.

- සමස්ත ඉදිරිපත් කිරීම, අනාවරණ ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කිරීම අත්කර ගන්නා ආකාරයකින් පාදක වූ ගනුදෙනු හා සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීමට ලක් කළෙමි.

අනෙකුත් කරුණු අතර මගේ විගණනය තුළ මම හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ යම් වැදගත් අඩුපාඩු ඇතුළුව වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් වගකියන පුද්ගලයින් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 1988 අංක 30 දරණ බැංකු පනතේ 39 වන වගන්තියේ (2024 අංක 24 දරණ බැංකු පනත මගින් සංශෝධිත) පනත සඳහන් අවශ්‍යතා සඳහා අවශ්‍ය විශේෂ ප්‍රතිපාදන අඩංගුවේ.

2.1.1 මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශනයේ සිදුකර ඇති හෙළිදරව් කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති 2024 අංක 5 දරණ චක්‍රලේඛයේ අවශ්‍යතා වලට අනුකූලවේ.

REPORT OF THE AUDITOR GENERAL

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනත තුළ පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය:

2.2.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මම ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂණයෙන් පෙන්නුම්වන තාක් දුරට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතා පරිදි සුදුසු ගිණුම්කරණ වාර්තා බැංකුව විසින් තබා ගෙන ඇත.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශ පූර්වාසන්න වසර සමඟ අනුරූප වේ.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශවල පෙර වසරේ මා විසින් සිදුකළ සියලුම නිර්දේශ ඇතුළත් වේ.

2.3 ඉටුකල ක්‍රියාමාර්ග හා ලබාගත් තොරතුරු මත පදනම්ව ප්‍රමාණාත්මක කරුණු සඳහා පමණක් සීමා වෙමින් මාගේ අවධානය සඳහා කිසිවක් හමුවී නොමැත.

2.3.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඩී) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියෙන් බැහැරව බැංකුව විසින් ගිවිසගත් කිසියම් කොන්ත්‍රාත්තුවක් සඳහා බැංකුවේ පාලන තන්ත්‍රයේ සිටින කිසියම් සාමාජිකයකු කිසියම් සෘජු හෝ වක්‍ර උනන්දුවක් දක්වා තිබීම ප්‍රකාශ කිරීම.

2.3.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(එෆ්) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව බැංකුවේ පාලන තන්ත්‍රය විසින් නියුක්තකර ඇති සාමාන්‍ය හා විශේෂ විධිවිධාන කිසියම් අදාල ලිඛිත නීතියක් සමඟ බැංකුව අනුකූල නොකරගත් බව ප්‍රකාශ කිරීම.

2.3.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ජී) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව කාර්යයන් සහ රාජකාරීන් එහි බලතල අනුව බැංකුව සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.3.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(එච්) පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව අදාල නීති සමඟ අනුකූලව හා කාල සීමාවන් තුල පිරිමැසුම්දායක ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස බැංකුවේ සම්පත් ප්‍රසම්පාදනය හා භාවිතා කිරීම සිදුකර නොමැති බව ප්‍රකාශ කිරීම.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31න් අවසන් දිනට

	සටහන්	2024 රු	2023 රු
වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	13	124,664,750	122,600,853
බැංකු තැම්පතු	14	152,682,844	2,923,132,097
මූල්‍ය වත්කම් - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය	15	2,943,277,961	3,552,533,227
මූල්‍ය වත්කම් - ක්‍රමක්ෂය පිරිවැයට			
- ණය සහ අත්තිකාරම්	16.1	41,730,024,581	38,603,322,207
- ණය සහ අනෙකුත් උපකරණ	17	8,979,104,008	12,162,743,730
-මූල්‍ය වත්කම්- වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	18	5,379,078	5,379,078
දේපළ පිරියත සහ උපකරණ	19	404,644,985	171,651,164
භාවිතයට අයිතිය ඇති වත්කම්	33.1	99,174,660	156,519,188
පමාකළ බදු වත්කම්	20	633,635,649	745,677,897
වෙනත් වත්කම්	21	595,607,504	622,951,236
මුළු වත්කම්		55,668,196,018	59,066,510,678
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	22	-	2,732,792
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්			
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	23	48,160,520,558	52,138,134,453
- ණය සුරැකුම්පත් හිමිකරුවන්ට ගෙවිය යුතු		-	-
- අනෙකුත් ණයකරුවන්ට ගෙවිය යුතු	23	140,800,069	178,986,770
සේවක ප්‍රතිලාභ වගකීම	24	677,787,456	597,674,223
ආදායම් බදු වගකීම	25	-	-
වෙනත් වගකීම්	25	1,268,890,469	694,813,406
මුළු වගකීම්		50,247,998,551	53,612,341,643
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	26	889,812,899	889,812,899
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	27	306,650,839	306,650,839
රඳවාගත් ඉපැයීම්	28	3,145,924,725	3,179,896,294
අනෙකුත් සංචිත	29	1,077,809,004	1,077,809,004
මුළු ස්කන්ධය		5,420,197,467	5,454,169,036
මුළු ස්කන්ධය හා වගකීම්		55,668,196,018	59,066,510,678

සහතික කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙයි.

....

කේ. එල්. එන්. ඒ. පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ සැලසුම්

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

....	....	....
මහීල් කුරගම මහතා	ඩී. ආර්. එල්. වික්‍රමසිංහ මහතා	අයි. ටී. අසුරමාන්න මහතා
සභාපති	අධ්‍යක්ෂ	සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි

2025.02.28

ආදායම් ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31න් අවසන් දිනට

	සටහන්	2024 රු.	2023 රු.
පොලී ආදායම	4	7,590,650,416	9,324,132,408
පොලී වියදම	4	(5,392,222,204)	(8,732,594,619)
ශුද්ධ පොලී ආදායම	4	2,198,428,212	591,537,789
ගාස්තු සහ කොමිස් ආදායම	5	172,631,902	96,293,245
ගාස්තු සහ කොමිස් වියදම		-	-
ශුද්ධ, ගාස්තු සහ කොමිස් ආදායම	5	172,631,902	96,293,245
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය)	6	377,996,544	157,533,227
ශුද්ධ, අනෙකුත් මෙහෙයුම් ආදායම	7	31,145,845	21,943,478
මුළු මෙහෙයුම් ආදායම		2,780,202,503	867,307,739
හානිකරණ ගාස්තු	8	(540,890,034)	(561,392,330)
ශුද්ධ මෙහෙයුම් ආදායම		2,239,312,470	305,915,409
සේවක වියදම්	9	(1,229,142,717)	(1,015,292,893)
ක්ෂයකිරීමේ හා ක්‍රමක්ෂය වියදම්	10, 33.2	(126,686,733)	(99,608,144)
අනෙකුත් වියදම්	10	(447,408,400)	(355,869,747)
එ. අ. බදු, ජා. ගො. බදු හා ණය ආ. ගෙ. බදුවලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		436,074,620	(1,164,855,374)
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු	34	(244,987,282)	(5,125,869)
සමාජ සුරක්ෂිතතා බද්ද		(33,289,319)	5,200,577
බදු පෙර ලාභය / (අලාභය)		157,798,019	(1,164,780,667)
ආදායම් බදු වියදම්	11	(125,756,722)	161,649,247
වසර සඳහා ලාභය / (අලාභය)		32,041,296	(1,003,131,419)

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31න් අවසන් දිනට

	2024 රු	2023 රු
වර්ෂය සඳහා ලාභය / (අලාභය)	32,041,296	(1.003,131,419)
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලබන අයිතම		
මූල්‍ය වත්කම් නැවත තක්සේරු කිරීම මත ලාභය හෝ අලාභය	-	-
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු නොලබන අයිතම		
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම නැවත තක්සේරු කිරීම්	(45,714,913)	(24,548,931)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක ලාභය හෝ අලාභය මත විලම්බිත බදු බලපෑම	13,714,474	7,364,679
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	40,857	(1,020,315,671)

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	පවරන ලද ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිතය	ප්‍රාග්ධන සංචිතය	පොදු සංචිතය	හිමිකම් හානිපූර්ණ අරමුදල	රඳවාගත් ඉපයීම්	එකතුව
2022.12.31 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	4,200,211,965	6,474,484,706
පෙර කාලසීමාවේ ගැලපීම්						-	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						(1,003,131,419)	(1,003,131,419)
වෙනත් විස්තීර්ණ ආදායම්						(17,184,252)	(17,184,252)
වර්ෂය තුළ මාරු කිරීම්						-	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-	-
2023.12.31 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	3,179,896,294	5,454,169,035
පෙර කාලසීමාවේ ගැලපීම්						(34,012,426)	(34,012,426)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						32,041,296	32,041,296
වෙනත් විස්තීර්ණ ආදායම්						(32,000,439)	(32,000,439)
වර්ෂය තුළ මාරු කිරීම්		-				-	-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-	-
2024.12.31 දිනට ශේෂය	889,812,899	306,650,838	393,498,004	683,280,000	1,031,000	3,145,924,725	5,420,197,466

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

	2024/01/01 සිට 2024/12/31 දක්වා රු.	2023/01/01 සිට 2023/12/31 දක්වා රු.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
ලද පොලිය	4,934,027,163	8,921,615,611
ගෙවූ පොලිය	(6,732,425,069)	(9,337,465,140)
ශුද්ධ කොමිස් ලැබීම්	172,631,902	96,293,245
සේවකයින්ට ගෙවීම්	(1,119,439,181)	(846,574,251)
මූල්‍ය සේවා මත එ. අ. බදු, ණ. ආ. ගෙ. බදු හා ජා. ගො බදු	(166,242,018)	(5,125,869)
අනෙකුත් මෙහෙයුම් කටයුතුවලින් ලැබීම්	2,368,345	5,250,254
අනෙකුත් මෙහෙයුම් කටයුතු මත ගෙවීම්	(467,871,894)	(302,958,619)
මෙහෙයුම් වත්කම් හා වගකීම් වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	3,376,950,752	(1,468,964,770)
මෙහෙයුම් වත්කම් (වැඩිවීම)/අඩුවීම		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	(605,999,021)	448,871,346
අනෙකුත් වත්කම්	27,650,831	473,203,052
	(578,348,190)	922,074,398
මෙහෙයුම් වගකීම් (වැඩිවීම)/අඩුවීම		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	(2,655,990,025)	3,607,292,902
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු	(38,186,700)	(96,420,481)
අනෙකුත් වගකීම්	379,834,326	228,785,113
	(2,314,342,400)	3,739,657,534
ආදායම් බද්දට පෙර මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(6,269,641,342)	3,192,767,162
ගෙවූ පාරිතෝෂිත	(73,719,634)	(62,358,388)
ගෙවූ ආදායම් බදු	(15,564,251)	(78,507,801)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(6,358,925,227)	3,051,900,973
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
ලද ලාභාංශ	23,070,500	18,765,120
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්	5,707,000	885,920
දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම	(234,813,235)	(151,172,660)
මූල්‍ය ආයෝජන විකිණීමෙන් සහ කල්පිරීමෙන් ලද මුදල්	6,569,757,649	(2,903,610,343)
ආයෝජන කටයුතුවලින් ලැබූ ශුද්ධ ආදායම (භාවිත කළ)	6,363,721,915	(3,035,131,963)
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය		
යටත් ණය ආපසු ගෙවීම	-	-
ඒකාබද්ධ අරමුදල වෙත ගෙවීම්	-	-
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල්	-	-
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	4,796,688	16,769,010
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	119,868,062	103,099,052
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	124,664,750	119,868,062
මුදල් සහ මුදල් හා සමාන දෑ සැසැඳීම		
මුදල් සහ කෙටිකාලීන අරමුදල්	124,664,750	122,600,853
බැංකුවලින් ණයට ගැනීම් (අයිරා ගිණුම)	-	(2,732,792)
කාලසීමාව අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	124,664,750	119,868,062

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2024 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1. සාමාන්‍ය තොරතුරු

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1931 අංක16 දරන ආඥාපනත මගින් 1931 දෙසැම්බර් 06 වැනි දින ලංකා රාජ්‍ය උකස් බැංකුව ලෙස ආරම්භ කරන ලදී. ලංකා රාජ්‍ය උකස් බැංකුව හා වර්ෂ 1943 දී පිහිට වූ කෘෂිකාර්මික හා කර්මාන්ත ණය සංස්ථාව ඒකාබද්ධ කරමින් වර්ෂ 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මගින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ස්ථාපිත කරන ලදී. බැංකුව 1979 ජනවාරි 1 දින එහි මෙහෙයුම් ආරම්භ කළේය. මෙම බැංකුව බලපත්‍රලාභි විශේෂ බැංකුවක් ලෙස නම්කල අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1998 අප්‍රේල් 27 දින බලපත්‍රය නිකුත් කරන ලදී.

1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රධාන වශයෙන් නිවාස ණය ලබාදීමේ කටයුතුවල නියැලී සිටි අතර, වර්ධනය වන තරඟකාරීත්වයට මුහුණදීම පිණිස මෑතක සිට සිය කටයුතු විවිධාංගීකරණය කරමින් රථවාහන ණය හා පුද්ගල ණය වැනි අනෙකුත් ණය පහසුකම් ලබාදීමේ කටයුතුවල ද නිරත වෙමින් සිටී.

1.3. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය

1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත, 1988 බැංකු පනත සහ එහි සංශෝධනවල විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

1.4. බලය ලබාදීමේ දිනය

2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මෙම විගණනය කළ මූල්‍ය ප්‍රකාශන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් අනුමැතිය අනුව නිකුත් කිරීමට බලය ලබා දී ඇත.

2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 353 ක් විය. (2023 දෙසැම්බර් 31 දිනට එම සංඛ්‍යාව 354 ක් විය)

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් ගිණුම්කරන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී විශේෂයෙන් සඳහන්කර නොමැතිවිට සියලුම කාල පරිච්ඡේද සඳහා අනුගමනය කර ඇත.

2.1 පිළියෙල කිරීමේ පදනම

2.1.1 අනුකූලතා ප්‍රකාශය

1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන වලට අනුව අවශ්‍ය තොරතුරුවලට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව (SLFRS iy LKAS) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙලකර ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන මුදල් ප්‍රවාහයේ ඇති තොරතුරු හැර ගිණුම්කරණයේ උපචිත පදනම යටතේ පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී අනුගමනය කළ ආකෘතිය හා එහි සඳහන් එළිදරව් කිරීම් ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය පල කිරිම හා පිළියෙල කිරිම පිළිබඳ නියම කරන ලද විශේෂිත ආකෘතියට අනුව සිදුකර ඇත.

2.1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුව එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද්‍රවශීලතාවයේ අනුපිළිවෙළට පුළුල්ව ඉදිරිපත් කරයි. හඳුනාගත් වටිනාකම් නිරවුල් කිරීම වෙනුවෙන් නෛතිකව බැඳී ඇති විටක සහ ශුද්ධ අගය පදනමින් නිරවුල් කිරීමට අරමුණක් ඇති විටක දී හෝ වත්කම් උපලබ්ධි කිරීමත් සමග වගකීම් නිරවුල් කිරීමත් එක්වර සිදු කරන අවස්ථාවේ දී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කර ඇත. බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් විශේෂිතව හෙළිදරව් කිරීම යටතේ සහ කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් අර්ථකථනය කිරීමට අනුව අවශ්‍ය හෝ ඉඩ දී ඇති විටක දී හැර මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කිරීමක් සිදු කර නොමැත.

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරයි. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කරන්නේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 01 විසින් අවසර දී ඇත්නම් පමණී.

2.1.3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී, කළමනාකාරිත්වය මගින් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නා ප්‍රමාණ තීරණය කිරීමේදී විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතා කර ඇත. අවිනිශ්චිතතාවය මත පදනම් වූ ප්‍රධාන සැලකියයුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන පහත සාකච්ඡාකර ඇති අතර, එවැනි වත්කම් හා වගකිම්වල ධාරණ අගයන් අදාළ සටහන්වල දක්වා ඇත.

2.1.3.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

SLFRS 9 අනුව බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය වත්කම් විවිධ වර්ගවලට වගීකරණය කිරීමට හා ගණනය කිරීමට අවකාශයක් සපයන අතර පහත සඳහන් නිර්ණායකයන් මත ඒවා ක්‍රමක්ෂය පිරිවැයට, අනෙකුත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට හා ලාභ සහ අලාභ මගින් සාධාරණ අගයට ලෙස දැක්විය හැකි වේ; මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පිහිටුවා ඇති, ආයතනයේ ව්‍යාපාරික ආකෘතිය

2.1.3.2 මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකර ඇති මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳපළ තුළින් ලබාගත නොහැකිවිට ගණිතමය ආකෘතිවල අඩංගු තක්සේරු ශිල්පීය ක්‍රම උපයෝගීකර ගනිමින් ඒවා තීරණය කරනු ලබයි. මෙම ආකෘති සඳහා යෙදවුම් හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත මගින් ලබා ගනී.

2.1.3.3 මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ

SLFR 9 සහ LKAS 39 යටතේ සියලුම වර්ගවල මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ ගණනය කිරීමේදී විශේෂයෙන්ම හානිකරණ අලාභ තීරණය කරන විට අනාගත මුදල් ප්‍රවාහයන් සහ ඇප සුරැකුම්වල වටිනාකම් ඇස්තමේන්තු කිරීමේ හා කාල ගණනය කිරීමේ විනිශ්චයන් අවශ්‍යවේ. ඒ අනුව ආදායම් ප්‍රකාශයේ හානිකරණ අලාභ දැක්විය යුතුද? යන්න තක්සේරු කිරීම සඳහා සෑම වාර්තා කරන දිනකටම බැංකුව වෙන් වෙන් වශයෙන් වැදගත්වන ණය සහ අත්තිකාරම් සමාලෝචනය කරයි. විශේෂයෙන්ම හානිකරන අලාභ තීරණය කරන විට ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ දී හා අනාගත මුදල් ප්‍රවාහයන්ගේ කාල ගණනය කිරීමට කළමනාකරණයේ විනිශ්චයන් අවශ්‍යවේ. මෙම ඇස්තමේන්තු, කරුණු කීපයක් මත පදනම්වූ උපකල්පනයන් වන අතර එමනිසා සැබෑ ප්‍රතිඵල වෙනස්විය හැකි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වෙන්කර ඇති හානිකරණ දීමනාවේ අනාගත වෙනස්කම් ඇතිවිය හැකිය. වෙන් වෙන් වශයෙන් ඇති හානිකරණ ප්‍රතිපාදන හානිකරණය සඳහා වෙන් වෙන් වශයෙන් ඇගයීම් කරන ලද මූල්‍ය වත්කම් සඳහා අදාළවන අතර ලැබීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය කළමනාකරණයේ හොඳම ඇස්තමේන්තු මත පදනම්වේ. මෙම මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමේදී ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය හා ඇප සුරැකුම් ලෙස තබා ඇති වතකමේ ශුද්ධ උපලබ්ධි වටිනාකම පිළිබඳ කළමනාකරණය විනිශ්චයන් සිදු කරයි. සියලුම හානිකරණයට වත්කම් එහි ගුණාත්මකභාවය මත තක්සේරු කරන අතර මුදල් ප්‍රවාහයන්ගේ ගණනය කිරීමේ උපායමාර්ග සහ ඇස්තමේන්තු අයකර ගතහැකි ලෙස සලකනු ලබයි. වෙන් වෙන් වශයෙන් සලකනු නොලබන එකම වර්ගයේ ණය හා අත්තිකාරම් සඳහා වෙන් වෙන් වශයෙන් හානිකරණයවීම් දක්නට නොලැබුණු සහ වෙන් වෙන් වශයෙන් වැදගත්වන වත්කම් කාණ්ඩ සඳහා සාමූහික හානිකරණ ප්‍රතිපාදන සිදුකර ඇත.
SLFRS 9 ට අනුව අපේක්ෂිත ණය හානි ගණනය කිරීම යනු විචල්‍ය යෙදවුම් තෝරාගැනීම සහ ඒවායේ අන්තර් රඳා පැවැත්ම සම්බන්ධයෙන් උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ මාදිලිවල නිමැවුම් (outputs) වේ. ගිණුම්කරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු ලෙස සලකනු ලබන අපේක්ෂිත ණය හානි ආකෘතිවල මූලික අංගවලට

- ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී තිබේද යන්න ගුණාත්මක තක්සේරු කිරීම සඳහා වන නිර්ණායක සහ එසේනම් ජීව කාලය තුළ අපේක්ෂිත ණය හානි පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා දීමනා
- ඒවායේ අපේක්ෂිත ණය හානි සාමූහික පදනමක් මත තක්සේරු කරනවිට මූල්‍ය වත්කම් බෙදා වෙන් කිරීම
- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් තේරීම ඇතුළුව අපේක්ෂිත ණය හානි ආකෘති සංවර්ධනය කිරීම
- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හා උද්ධමනය වැනි සාර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය නිර්ණය කිරීම
- පොලී අනුපාත විනිමය අනුපාත සහ විරැකියාව හා පැහැර හැරීමේ සම්භාවිතාව (PDS)
- පැහැර හැරීමේ නිරාවරණය (EAD) හා පැහැර හැරීමේ අලාභ වීම (LGD)
- අපේක්ෂිත ණය හානි (ECL) ආකෘතිවලට ආර්ථික යෙදවුම් ලබාගැනීම සඳහා ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික අවස්ථා තෝරාගැනීම සහ ඒවායේ විය හැකි බර තැබීම ඇතුළත් වේ.

2.1.4. ආසන්නම රුපියලට දැක්වීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 මගින් ඉඩ ලබා දී ඇති පරිදි වෙනත් අයුරකින් දක්වා ඇති ස්ථාන හැර මූල්‍ය ප්‍රකාශන වල ඇති වටිනාකම් ආසන්නම රුපියලට දක්වා ඇත.

2.1.5. තක්සේරු කිරීමේ පදනම

සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් අයිතමයන් හැර ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

i. වෙනත් විස්තීර්ණ ආදායම් තුලින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්

ii. ලාභ හෝ අලාභ මගින් හඳුනාගන්නා මූල්‍ය වත්කම් හා වගකීම්

iii. ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට නියමකර ඇති මූල්‍ය වත්කම් හා වගකීම්

iv. සේවකයින්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල සැලසුම් කරන ලද වත්කම්වල සාධාරණ අගයට වඩා අඩුවෙන් වර්තමාන වටිනාකම අනුව හඳුනාගෙන ඇත.

2.1.6. ප්‍රවර්ථන ව්‍යාපාරය

ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් කටයුතු කරගෙන යෑමේ හැකියාව පිලිබඳ බැංකුවේ කලමනාකරනය තක්සේරුවක් සිදුකර ඇති අතර ඉදිරි කාලය තෙක් ව්‍යාපාර කටයුතු සිදකරගෙන යෑම සඳහා අවශ්‍ය සම්පත් ඇති බවට සෑහීමකට පත්වෙයි. ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් කටයුතු කරගන යෑමේ බැංකුවේ හැකියාව පිලිබඳ සාධාරණ සැකයක් ඇතිවිය හැකි කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් පිළිබඳව කලමනාකරනය දැනුවත් වී නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන පිලියලකර ඇත්තේ ප්‍රවර්ථන ව්‍යාපාර පදනම මත වෙයි. මෙම තක්සේරු කිරීම් සිදුකිරීමේදී කළමනාකරණය බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්වලට කොවිඩ්-19 වසංගතයෙන් විය හැකි පසු බෑසීම සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ප්‍රවර්ථන ව්‍යාපාර පදනම සුදුසු බවට කළමනාකරණය සෑහීමකට පත් වෙයි.

2.1.7. ප්‍රමාණාත්මක බව හා එක්කිරීම්

සමාන අයිතමයන්ගේ සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වශයෙන් ඉදිපත්කර ඇත. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 මගින් අවසර දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවේ නම් සමාන ස්වභාවයේ නොවන අයිතම හා ක්‍රියාකාරකම් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

2.1.8. සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි කිරීම සඳහා සහ අන්තර් කාලාන්තර සංසන්දනාත්මක බව වැඩි කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල පෙර කාලසීමාව සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කර ඇත. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුගතවීම සඳහා සංසන්දනාත්මක තොරතුරු වඩා ගුණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා නැවත වර්ගීකරණය කරයි.

2.2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් සහ වියදම් හඳුනාගැනීම

2.2.1. පොලී ආදායම සහ වියදම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට ඉඩ ඇති බව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකි බව දක්වා ආදායම් හඳුනාගෙන ඇත. "ආදායම් හා වියදම්" පිළිබඳ විස්තර සටහන් අංක 3 හා 4 හි දක්වා ඇත.

සඵල පොලී අනුපාත ක්‍රමය

ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කර ඇති සියලුම මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට (LVPL) වර්ගකර ඇති මූල්‍ය උපකරණ සඵල පොලී අනුපාතය (EIR) උපයෝගී කරගනිමින් පොලී ආදායම වාර්තා කරනු ලබයි. SLFRS 9 යටතේ වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට තක්සේරු කර ඇති පොලී ලබාගත හැකි මූල්‍ය වත්කම්වල පොලී ආදායම මෙන්ම විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති පොලී ලබාගත හැකි මූල්‍ය වත්කම් හෝ LKAS 39 යටතේ කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් ද EIR ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් වාර්තා කර ඇත. EIR යනු මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හරහා ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හෝ සුදුසුවූ විට කෙටි කාලසීමාවක් මූල්‍ය වත්කම්වල ශුද්ධ ඉදිරියට ගෙන එන මුදලට නියමිත පරිදි වට්ටම් කරන අනුපාතයයි.

EIR (සහ එම නිසා වත්කමේ ක්‍රමක්ෂය පිරිවැය) ගණනය කරනු ලබන්නේ EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත්කර ගැනීම් ගාස්තු සහ පිරිවැය පිළිබඳ කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. ණය මුදලක අපේක්ෂිත ජීව කාලයට වඩා ස්ථාවර ප්‍රතිලාභ අනුපාතයක හොඳම ඇස්තමේන්තුව නියෝජනය කරන ප්‍රතිලාභ අනුපාතිකයන් භාවිතා කරමින් බැංකුව පොලී ආදායම හඳුනාගනී එබැවින් විවිධ කාලසීමාවන්වල අය කළ හැකි පොලී අනුපාත වල බලපෑම සහ ජීවන චක්‍රයේ අනෙකුත් ලක්ෂණ (පෙර ගෙවීම්,දඩ පොලී සහ ගාස්තු ඇතුළුව) එය හඳුනා ගනී.

ණය අවදානම හැර වෙනත් හේතූන් මත මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහයන් පිළිබඳ අපේක්ෂාවන් සංශෝධනය කරන්නේ නම් පොලී ආදායමේ වැඩිවීමක් හෝ අඩුවීමක් සමග මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමේ ඉදිරියට ගෙනයන ශේෂයට ගැලපීම ධන හෝ සෘණ ගැලපීම ලෙස වෙන්කර ඇති ගැලපීම ආදායම් ප්‍රකාශයේ පොලී සහ ඒ හා සමාන ආදායමක් මගින් පසුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.2.2. ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමට බැංකුවේ හිමිකාරිත්වය තහවුරු කරන අවස්ථාවේදී ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි. සටහන් අංක 7.

2.2.3. ශුද්ධ වෙළඳ ආදායම

වෙළඳ ක්‍රියාකාරකම්වලින් හටගන්නා ලද ප්‍රතිඵලවලට ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ හා ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය තුළින් උපලබ්ධි ලාභ හෝ අලාභ ඇතුළත්ය.

2.2.4. වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලබයි සටහන් අංක 7.

2.2.5. අනෙකුත් වියදම්

සියළුම අනෙකුත් වියදම් ඒවා දරනු ලැබූ කාලයට අදාළව සහ ඒවායේ සම්බන්ධතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබයි ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමේ දී හා කාර්යක්ෂම තත්ත්වයකින් ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යෑම සඳහා දරණු ලබන සියලුම වියදම් වර්ෂය සඳහා වන බැංකුවේ ලාභය සේවීමේදී ආදායමට අයකර ඇති වෙනත් වියදම් පිළිබඳ විස්තර සටහන් අංක 10 හි දක්වා ඇත.

2.2.6. SLFR-15 ගනුදෙනුකරුවන් සමඟ ඇති කොන්ත්‍රාත් වලින් ලැබෙන ආදායම

SLFRS 15 ආදායම හඳුනාගන්නේ ද? කොපමණ ප්‍රමාණයක් සහ කුමන අවස්ථාවේදී ද යන්න තීරණය කිරීම සඳහා විස්තීරණ රාමුවක් ස්ථාපිත කරයි. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට අනාගතය, ප්‍රමාණය කාලය සහ ආදායමේ අවිනිශ්චිතභාවය සහ ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් පැන නගින මුදල් ප්‍රවාහයන් අවබෝධ කර ගැනීමට හැකි කිරීම අරමුණු කරයි. ආයතනය විසින් ආදායම හඳුනාගන්නේ කවදාද සහ කුමන මුදල් ප්‍රමාණය ද යන්න තීරණය කිරීමට පියවර පහක ආකෘතියක් යොදාගනු ඇත. ආදර්ශය නිශ්චිතව දක්වා ඇත්තේ, ආයතනයට හිමිකම් ලැබීමට අපේක්ෂා කරන මුදලට භාණ්ඩ හා සේවා ආයතනික පාලනයක් පාරිභෝගිකයකු වෙත පැවරීමේ දී හෝ ආයතයක් ලෙස ආදායම හඳුනාගන්නා බවයි. යම් නිර්නායක සපුරා තිබේ ද යන්න මත පදනම්ව, ආදායම් හඳුනාගනී.

2.3. බදු වියදම්

මූල්‍ය සේවා මත වැට් බද්ද ඇතුළුව බැංකුව ආදායම් බදු හා වෙනත් බදු ගෙවීම සඳහා යටත්වේ. මූල්‍ය ප්‍රකාශනවලට අදාළව (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. SLFRS පිළිගෙන ඒ මත කළ යුතු ගලපීම් පිළිබඳ නිකුත් කර ඇති බදු මාර්ගෝපදේශයට අනුව ඇති අනෙකුත් බදු සහ වර්තමාන බදු හා කල් පසු වූ බදු සඳහා කරනු ලබන මුළු බදු ප්‍රතිපාදන (වෙන් කිරීම්) පිළිබඳ සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. බදු අය කිරීම සඳහා වන බදු අය කළ හැකි ලාභය ගණනය කිරීමේ දී බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන අවස්ථාවේ දී බදු නීතිය යොදා ගැනීම පිළිබඳ අර්ථ නිරූපණය කිරීමට අදාළව අවිනිශ්චිතතාවක් පවතී.

බැංකුව ජංගම වත්කම් හා වගකීම් මත විලම්භිත සහ අනෙකුත් බදු අය කිරීම, බදු ගෙවිය යුතු ද යන්න ඇස්තමේන්තු මත පදනම්ව හඳුනා ගෙන ඇත. මෙහි දී අවශ්‍ය බදු ප්‍රතිඵලය මූලික අවස්ථාවේ දී හඳුනාගත් බදු වටිනාකමට වඩා වෙනස් විය. එකී වෙනස්කම් තීරණ ගනු ලැබූ කාලයට අදාළව ආදායමට හා විලම්භිත බදු වටිනාකමට බලපෑමක් ඇති කරන ලදී.

2.3.1. IFRIC 23-ආදායම් බදු ගැලපීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාවය

LKAS 12 ආදායම් බදු යෙදවීමට බලපාන ආදායම් බදු ගැලපීමට සම්බන්ධව අවිනිශ්චිතතාවයන් ගණනය කිරීමට අර්ථ දැක්වීම පාදකකර ගනී. එය LKAS 12 විෂය පථයට පිටින් ඇති බදු හා ගාස්තු සඳහා අදාල නොවේ. නිශ්චිත බදු ගැලපීම සඳහා අදාල වන දඩ හා පොලිය සම්බන්ධ අවශ්‍යතාවයන් විශේෂයෙන්ම අඩංගු නොවේ. අර්ථදැක්වීම විශේෂයෙන්ම පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරයි.

- ආයතනය අවිනිශ්චිත බදු ගැලපීම් වෙන් වශයෙන් සලකා බලා තිබේද
- බදු අධිකාරීන් විසින් බදු ගැලපීම පරීක්ෂා කිරීම පිළිබඳව ආයතනය විසින් කරන උපකල්පන
- ආයතනයක් බදු අයකළ හැකි ලාභය (බදු පාඩුව) බදු පදනම් භාවිතා නොකළ බදු අලාභ, භාවිතා නොකල බදු බැර ශේෂ සහ බදු අනුපාත තීරණය කරන ආකාරය
- ආයතනයක් කරුණු සහ අවස්ථාවන්හි වෙනස්කම් සලකා බලන ආකාරය. බැංකුව විසින් එක් එක් අවිනිශ්චිත බදු ගැලපීම් වෙන් වෙන් වශයෙන් හෝ වෙනත් අවිනිශ්චිත බදු ගැලපීම් එකක් හෝ කීපයක් සමඟ සලකා බැලිය යුතුද යන්න තීරණය කරන අතර අවිනිශ්චිතතාවයේ විසඳුම යෝග්‍ය ලෙස පුරෝකථනය කරන ප්‍රවේශය භාවිතා කරයි.

බදු ගැලපම්වල අවිනිශ්චිතතාවයන් හඳුනා ගැනීමේදී බැංකුව වැදගත් විනිශ්චයන් යොදාගනියි. බැංකුව සංකීර්ණ වටපිටාවක ක්‍රියාත්මකවන බැවින් මූල්‍ය ප්‍රකාශන වල බැංකුවේ අර්ථ දැක්වීමෙන් වන බලපෑම එමගින් තක්සේරු කරයි. අර්ථකතනය කිරීම් යොදාගැනීමෙන් පසුව එමගින් අවිනිශ්චිත බදු තත්ත්වයක් තිබේදැයි බැංකුව සලකා බලා ඇත. විවිධ තීන්දු මත බැංකුවේ බදු ගොනු කිරීමේ එම බදු ගැලපීම් සඳහා බදු බලධාරීන් විසින් අභියෝග කළ හැකිවේ. බදු බලධාරීන් විසින් පිළිගනු ලබන ප්‍රකාශන බදු ගැලපීම සඳහා විය හැකි එහි බදු අනුකූලතාවය මත පදනම්ව බැංකු තීරණය කරයි. අර්ථදැක්වීම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑමක් ඇති නොකරයි. මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කර ඇති සියලුම කාලසීමාවන් සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති බැංකුව විසින් අනුකූලව යොදාගෙන ඇත.

2.3.2. රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති ආදායම් බදු නීතිය සඳහා සංශෝධන

2017 අංක 24 දරණ ආදායම් බදු නීතියට යෝජිත සංශෝධන ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති 2020 අප්‍රේල් 08 දින දරණ නිවේදනයට අනුව ආයතනික ආදායම් බදු අනුපාතය 28% සිට 24% දක්වා සංශෝධනයකර තිබිණි. එහෙත් සිදුකිරීමට නියමිත නෛතික ප්‍රතිපාදන සහ දේශීය ආදායම් පනතට විධිමත් සංශෝධන සිදුකරන තුරු ආදායම් බදු වගකීම් ගණනය කිරීමේ දී එවැනි සංශෝධන සැලකිල්ලට ගෙන නොමැත.

2022 ඔක්තෝම්බර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආයතනික ආදායම් බදු අනුපාතය 24% සිට 30% දක්වා සංශෝධනය කර ඇත.

ප්‍රවර්ථන ආදායම් බදු පිළිබඳ විස්තර සටහනක් අංක 11 හි එලිදරව් කර ඇත.

2.3.3. විලම්භිත බදු වත්කම්

අනාගතයේ දී බදු අය කළ හැකි ලාභයන්ට හිලව් කිරීම් වශයෙන් යොදා ගත හැකි අලාභයන්ගේ ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකි බදු අලාභයේ ප්‍රමාණයට විලම්භිත බදු වත්කම් හඳුනාගනී. මෙම විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීමේ දී අනාගත බදු සැලසුම්කරන ක්‍රමෝපායන් සමග අනාගත බදු අය කළ හැකි ලාභයේ කාලය සහ මට්ටම මත පදනම්ව විනිශ්චයන්ට එළැඹීම සිදු කිරීම අවශ්‍ය වේ.

විලම්බිත බදු පිළිබඳ විස්තර සටහන් අංක 20 එලිදරව් කර ඇත.

2.3.4 මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු (VAT)

2002 අංක 14 දරණ එකතුකල අගය මත බදු පනතේ 25 අ පරිච්ඡේදය සහ එම පනතට පසුව කරන ලද සංශෝධනයන්ට අනුව එකතුකළ අගය මත බදු (VAT) ගණනය කරනු ලබයි. ආර්ථික පහතවැටීම හා සේවක පාරිශ්‍රමික සඳහා ගැලපීම් සිදුකර ඇති මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු හා එකතුකළ අගය මත බදුවලට පෙර මෙහෙයුම් ලාභයෙන් 15% ක් මූල්‍ය සේවා මත වැට් බද්ද සඳහා ගෙවිය යුතු වේ.

එකතුකළ අගය මත බදු වියදම් පිළිබඳව විස්තර සටහන් අංක 34 හි දක්වා ඇත.

2.3.5. මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂක බදු පනතට අනුව 2022 ඔක්තෝම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සඳහා වැට් බද්ද වෙනුවෙන් ප්‍රයෝජනයට ගන්නා අගය එකතු කිරීමේ ප්‍රමාණයෙන් 2.5% ලෙස බැංකුව විසින් මූල්‍ය සේවා සඳහා සමාජ සත්කාරක බද්ද ගණනය කර ගෙවා ඇත.

2.3.6. මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බද්ද (DRL)

2008 අංක 35 දරණ මුදල් පනතට අනුව 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සෑම මූල්‍ය ආයතනයකින්ම ණය ආපසු ගෙවීමේ බදු (DRL) අයකරනු ලබයි. මූල්‍ය සේවා සඳහා අදාලවන වටිනාකම් එකතු කිරීමෙන් 7% ක ප්‍රමාණයක් DRL ලෙස ගණනය කරයි. 2020 ඔක්තෝම්බර් 12 දින දරණ 2020 අංක 02 දරණ මුදල් (සංශෝධන) පනත අනුව 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමේ බද්ද (DRL) අවලංගු කර තිබිණි.

2.3.7. ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ ප්‍රතිපාදන හා ඉන්පසු සිදුකළ සංශෝධනයන්ට අනුව බැංකුවේ වගකීම් පිරිවැටුමෙන් (liable turnover) 0.5% ක ප්‍රමාණයක් ගෙවියයුතු වන අතර ගෙවියයුතු ආදායම් බද්දෙන් මෙම ප්‍රමාණය අඩු කළ හැකි වේ. 2020 ඔක්තෝම්බර් 12 දින දරණ 2020 අංක 04 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත මගින් 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අවලංගු කර ඇත.

2.3.8. වගා රක්ෂණ බද්ද (CIL)

2013 අංක 12 දරණ මුදල් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව 2013 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ බද්ධ (CIL) හඳුන්වා දී තිබූ අතර බදු පසු ලාභයෙන් 1% ක ප්‍රමාණයක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වෙයි.

2.4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම

2.4.1. සේවක ප්‍රතිලාභ වගකීම් - පාර්තෝෂික

1983 අංක 12 දරණ පාර්තෝෂික ගෙවීමේ පනත යටතේ පාර්තෝෂික ලැබීම සඳහා බැංකුවේ සියලුම සේවකයෝ සුදුසුකම් ලබති. අවුරුදු 5 ට වඩා වැඩි සේවා කාලයක් සපුරා ඇති අයට සේවය සිදුකර ඇති සෑම වර්ෂයක් වෙනුවෙන්ම සේවය අවසන් කළ හෝ ඉල්ලා අස් වූ මූල්‍ය වර්ෂයේ අවසන් මාසයට අදාළ වන පරිදි දළ වැටුපෙන් හරි අඩක් 1983 අංක 12 පාර්තෝෂිත ගෙවීමේ පනත යටතේ පාර්තෝෂිත ලබාගැනීමට, විශ්‍රාම යෑමෙන් හැර ඉල්ලා අස් වූ හෝ සේවය අවසන්කල සේවකයින් සුදුසු වෙයි. නිශ්චිත දායකත්වය සැලැස්ම වන පොරොන්දු වූ පාර්තෝෂිත විශ්‍රාම ප්‍රතිලාභ වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරු ක්‍රමය උපයෝගී කරමින් බැංකුව ගණනය කරයි. සාමාන්‍ය සහ කලින් විශ්‍රාම ගැනීම වසර තුනක සේවා කාලයක් සපුරා ඔහු /ඇය වයස අවුරුදු 55 දී සාමාන්‍යය විශ්‍රාම යෑමට සුදුසුකම් ලබයි. සියලුම අයවලුන් වයස අවුරුදු 60 දක්වා විශ්‍රාම ගැනීමේ වයස දීර්ඝ කිරීමට සුදුසුකම් ලබයි.

පොලී පිරිවැය

ප්‍රතිලාභ පියවීමට වසරකට ආසන්න බැවින් සැලසුම් වගකීම් වල වර්තමාන කාලසීමාව තුළ පොලිය හේතුවෙන් පොලී පිරිවැයෙහි වැඩිවීමක් අපේක්ෂා කරයි.

අරමුදල් සැලසුම්

පාර්තෝෂිත වගකීම් බාහිරින් අරමුදල් නොවේ.

ආයුගණක තක්සේරු

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාර්තෝෂික ආයුගණක තක්සේරුව ප්‍රයෝජනයට ගෙන නිශ්චය කර ඇත. ආයුගණක තක්සේරු සඳහා වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, සේවකයින්ගේ පවත්නා සේවා කාලය සහ සේවක මරණ අනුපාතය යනාදිය පිළිබඳ උපකල්පනයන් පදනම් වේ. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසා එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ. මේ සඳහා යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2024	2023
පොළී අනුපාතය	11%	13%
වාර්ෂික වැටුප් වැඩිවීම් අනුපාතය	6.5% - 10%	10%
විශ්‍රාම ගන්නා වයස	අවුරුදු 55-60	අවුරුදු 55-60

සේවක ප්‍රතිලාභ බැඳීම්වලට අදාළ පාර්තෝෂිත වෙන් කිරීම් පිළිබඳව සටහන් අංක 24 හි දැක්වේ.

2.4.2. සේවක ප්‍රතිලාභ වගකීම් - වෛද්‍ය ප්‍රතිලාභ

වෛද්‍ය ප්‍රතිලාභයන්ගේ ආයුගණක තක්සේරුව පිළිබඳ විස්තර සටහන් අංක 21 හි එළිදරව්කර ඇත. ස්ථිර සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විශ්‍රාමිකයින් වෛද්‍ය ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන අතර ඔවුන් යෝජනා ක්‍රමය සඳහා දායකවී සාමාජික මුදල් ගෙවා තිබිය යුතුවේ. විශ්‍රාම ගිය සාමාජිකයින්ගේ පවුලේ සාමාජිකයින් විශේෂ අවස්ථාවක් යටතේ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. (විශ්‍රාම ගිය සාමාජිකයන්ගෙන් කිසියම් අයෙකු හෝ ඔහුගේ /ඇයගේ පවුලේ සාමාජිකයෙකු සුදුසුකම් ලබයි)

වෛද්‍ය ප්‍රතිලාභ ආවරණය කිරීම සඳහා ඇති නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සඳහා වන පිරිවැය අරමුදල් ආයුගණක තක්සේරු මත පදනම්ව තීරණය කර ඇත. ආයුගනක තක්සේරු කිරීම වට්ටම් අනුපාතය වෛද්‍ය උද්ධමනය සහ මරණ අනුපාතය පිළිබඳව උපකල්පනයන් පදනම් වී ඇත. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසාම එම උපකල්පනයන් සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2024	2023
වට්ටම් අනුපාතය	11%	13%
වෛද්‍ය වියදම් ඉහළයාම	12%	12%
සහභාගීත්ව දත්ත (ක්‍රියාකාරි) දිනට සංගනන තොරතුරු	31.12.2024	31.12.2023

ආයු ගරක ලාභ / පාඩු හඳුනා ගැනීම - වෙනත් විස්තීරණ ආදායම් තුල හඳුනා ගනු ලබන ආයුගරක පාඩු / ලාභ

වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ - සැලසුම කලින් අරමුදල් කරණය වී නොතිබූ නිසා වත්කම් මත අපේක්ෂිත ප්‍රතිඵල ශූන්‍ය අගයක් ගනී.

පොලී පිරිවැය - වර්තමාන සේවා පිරිවැය (CSC) සහ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන අගයේ කාල වටිනාකම් පොලී පිරිවැය වේ.

අරමුදල් සැපයීම - වෛද්‍ය ප්‍රතිකාර යෝජනා ක්‍රමයට බාහිරින් අරමුදල් නොසැපයයි.

2.4.3. නිශ්චිත දායකත්ව සැලසුම

තවද බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක් ක්‍රියාත්මක කරයි. සේවකයින් බැංකුවට සේවය ලබා දෙන ලද සේවා කාලයට අනුපාතිකව නිශ්චිත දායකත්ව සැලසුමකට

අනුව ගෙවිය යුතු දායකත්වය හඳුනා ගනු ලබන අතර එය 'පිරිස් පාලන වියදම' යටතේ වාර්තා ගත කරනු ලබයි. නොගෙවන ලද දායකත්වයන් වගකීමක් ලෙසටම වාර්තා කරනු ලබයි. බැංකුව පහත දැක්වෙන යෝජනා ක්‍රමයන්ට දායක වී ඇත.

2.4.3.1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ කාර්යය මණ්ලඩය පිළිවෙළින් මාසික දළ වැටුපෙන් (අතිකාල ගෙවීම් හැර) 15% සහ 10% බැගින් අර්ථසාධක අරමුදලට දායක වෙයි. බැංකුවේ අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලකි.

2.4.3.2 සේවක භාරකාර අරමුදල

බැංකුව සේවකයින්ගේ දළ මාසික (අතිකාල හැර) වැටුපෙන් 3%ක් අරමුදලට දායක වන අතර එම අරමුදල සේවක භාරකාර අරමුදල් මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලබයි. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයින් පාරිතෝෂිත අරමුදල් ලැබීමට හිමිකම් කියයි.

2.4.4. කල්බදු

පලමුවරට 2019 ජනවාරි 01 දිනෙන් පසුව හෝ එදින සිට බලපැවැත්වෙන පරිදි SLFRS-16 කල්බදු මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි බැංකුව විසින් යොදාගෙන ඇත. 2019 ජනවාරි 01 දින සිට බැංකුව SLFRS-16 අතීතයට බලපාන ලෙස යොදාගෙන තිබුනත් ප්‍රමිතියේ ඇති විශේෂිත සංක්‍රාන්තික ප්‍රතිපාදන යටතේ අවසර දී ඇතත් 2018 වාර්තා කරන කාල පරිච්ඡේදය සඳහා සංසන්දනයන් නැවත ප්‍රකාශකර නොමැත.

2018 මූල්‍ය වර්ෂය දක්වා දේපළ පිරියත උපකරණවල කල්බදු මූල්‍ය කල්බදු හෝ මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කර තිබිනි.

SLFRS-16 කල්බදු අනුව 2019 ජනවාරි 01 දින සිට කල්බදු වත්කම් බැංකුව විසින් භාවිතා කිරීමට ඇති දිනයට කල්බදු භාවිතයට ඇති වත්කම් සහ අනුරූප වගකීමක් ලෙස හඳුනාගනී.

කල්බද්දකින් පැනනගින වත්කම් සහ වගකීම් වර්තන වටිනාකම් පදනමක් මත මූලිකවම අගය කෙරේ. කල්බදු වගකීම්වල පහත සඳහන් කල්බදු ගෙවීම්වලට අදාල ශුද්ධ වර්තන අගය ඇතුලත්වේ.

- කල්බදු දිරිදීමනා ලැබීම් අඩුකළ ස්ථිර ගෙවීම් (අවශ්‍යම ස්ථිර ගෙවීම් ඇතුළුව)
- දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විචිධ කල්බදු ගෙවීම මූලිකව ආරම්භක දිනයට දර්ශකය හෝ අනුපාතය භාවිතා කරමින් මනිනු ලබයි
- අවසාන වටිනාකමේ ඇප යටතේ සමූහය විසින් ගෙවීමට ඇති අපේක්ෂිත ප්‍රමාණ
- සමූහය එම මතය ක්‍රියාත්මක කිරීමට සාධාරණව නිශ්චිතනම්, මිලදී ගැනීමේ මතයක් පිළිබඳ ප්‍රායෝගික මිල, සහ
- කල්බදු නියමයන්ගෙන් සමූහය එම විකල්පය ක්‍රියාවට නංවන බව පිළිබිඹු කරයිනම් කල්බදු අවසන් කිරීම සඳහා දඩමුදල් ගෙවීම

කල්බදු ගෙවීම් කල්බද්ද තුළ පොළී අනුපාත භාවිතා කරමින් වට්ටම් කෙරේ. එම අනුපාතය සමූහය තුළ කල්බදු සඳහා පොදුවේ අවස්ථාව වන පහසුවෙන් තීරණය කළ නොහැකිනම්. කල්බදුකරුගේ වර්ධිත ණය ගැනීමේ අනුපාතය භාවිතා කෙරේ.

කල්බදු ගෙවීම් මුල් මුදල සහ මූල්‍ය පිරිවැය අතර වෙන් කෙරේ. එක් එක් කාලසීමාව සඳහා වගකීමේ ඉතිරි ශේෂය මත අඛණ්ඩ ආවර්ථික අනුපාතයක් නිෂ්පාදන කරමින් පොළී මූල්‍ය පිරිවැය කල්බදු කාලය තුළ ලාභය හෝ අලාභයට අයකෙරේ.

2.4.4.1 කල්බදු හඳුනාගැනීම

කාලසීමාවක් සඳහා හඳුනාගත් වත්කමක් පාලනය කිරීමේ අයිතිය ගිවිසුමකින් පැවරෙන්නේ නම් එම ගිවිසුම කල්බද්දකි. එම නිසා ගිවිසුමක මූලාරම්භයේදීම බැංකුව ගිවිසුම හෝ Contains පහත කරුණු ගැන සලකා බලා තක්සේරු කිරීම සිදු කරයි. හඳුනාගත් වත්කමක් පැවතීම, හඳුනාගත් වත්කමේ පාලනය කිරීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කමේ භාවිතයෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ සැලකියයුතු ලෙස ලබාගැනීමට ඇති අයිතිය, හඳුනාගත් වත්කම භාවිතාව අධීක්ෂණය කිරීමට ඇති අයිතිය (කෙටි කාලීන ගිවිසුම්, මාස 12 ට අඩු සහ අඩු වටිනාකම් ඇති ගිවිසුම් හැර) SLFRS 16 කල්බදු යටතේ යන්ත්‍රෝපකරණ Contain a lease සඳහා සහ ශාඛා මෙහෙයවීම සඳහා බැංකුව ඇතුළත්වී ඇති සියලුම කුලී ගිවිසුම් ඒ අනුව බැංකුව හඳුනාගනී.

භාවිතයට අයිතිය ඇති වත්කම් පහත සඳහන් දෑ ඇතුළත්ව පිරිවැයට මනිනු ලැබේ.

- කල්බදු වගකීමේ මූලික මැනීමේ ප්‍රමාණය
- ලද යම් කල්බදු දිරිදීමනා අඩුකළ ආරම්භක දිනයට හෝ පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම්
- යම් මූලික සෘජු පිරිවැය, සහ
- ප්‍රතිසංස්කරණ පිරිවැය.

භාවිතයට අයිතිය ඇති වත්කම් වත්කමේ ඵලදායි ජීවකාලයේ කෙටි කාලය සහ සරල මාර්ගික ක්‍රමයක් මත කල්බදු කාලය පුරා පොදුවේ ක්ෂය කෙරේ.

කෙටි කාලීන කල්බදු ආශ්‍රිත ගෙවීම් සහ අඩු වටිනාකම් වත්කම්වල සියලුම කල්බදු ලාභය හෝ අලාභය තුළ වියදමක් ලෙස සරල මාර්ගික පදනමක් මත හඳුනා ගනී.

කෙටි කාලීන කල්බදු යනු මාස 12 හෝ ඊට අඩු කාලයක් සහිත කල්බදුය. මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 33 යටතේ මුදල් හා කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තරයක් ලබා දී ඇත.

2.4.5. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ කෙටිකාලීන අරමුදල්වලට අතැති මුදල් බැංකුවල ඇති ශේෂයන්, බැංකු සමඟ ස්ථාපනයන්, ඉල්ලුම් කළ හැකි මුදල් සහ කෙටිකාලීන දැනුම්දීමක් මත ලබා ගත හැකි මුදල් ද ඇතුළත් වෙයි. මුදල් සහ කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් අංක 13 හි දක්වා ඇත.

2.4.6. දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත උපකරණ පිළිබඳ විස්තරයක් සටන් අංක 16 හි ලබා දී ඇත. දේපළ පිරියත හා උපකරණ පිරිවැය හෝ වටිනාකමින් සමුච්චිත ක්ෂයකිරීම සහ සමුච්චිත හානිකරණය අඩු කළ එදිනෙදා නඩත්තු වියදම ඉවත්කළ පසු වටිනාකමට දක්වා ඇත. අපේක්ෂිත ඵලදායී ජීව කාලයෙහි වෙනස්වීම් සුදුසු පරිදි ක්ෂය කිරීම් කාලය හෝ ක්ෂය ක්‍රමය වෙනස් කිරීම මගින් ගණනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ද හඳුනා ගනු ලබයි.

2.4.6.1. දේපල පිරියත උපකරණ සහ අස්පෘශ වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය

සෑම වාර්තාකරන දිනටම දේපළ පිරියත උපකරණවල ඉතිරි වටිනාකම ප්‍රයෝජනවත් ජීව කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය බැංකුව සමාලෝචනය කරයි. කලමනාකරණයේ විනිශ්චයන් මෙම වටිනාකම්, අනුපාත හා ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී ප්‍රයෝජනයට ගන්නා අතර එහෙයින් ඒවා අවිනිශ්චිතතාවයන්ට යටත්වෙයි. සෑම වත්කම් කාණ්ඩයක් සඳහාම භාවිත කළ ක්ෂය කිරීමේ ක්‍රම හා අනුපාත පිළිබඳ විස්තර සටහන් අංක 2.4.6.4. හි දැක්වේ.

2.4.6.2. හඳුනාගැනීමේ පදනම

වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ලැබෙන සහ වත්කමක පිරිවැය පහසුවෙන් අගය කළ හැකි අවස්ථාවේදී දේපළ පිරියත හා උපකරණ හඳුනා ගනී. එදිනෙදා සේවා කිරීමේ පිරිවැය රහිතව දේපළ පිරියත හා උපකරණ පිරිවැයට සඳහන් කරයි.

2.4.6.3. අගය කිරීමේ පදනම

දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, පහත සඳහන් විශේෂිත පදනම සඳහා එය ලබා දේ.

2.4.6.4. ක්ෂයකිරීම

දේපළ පිරියත හා උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ඒවායේ සුන්බුන් වටිනාකමට ලියා හැරීමට සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්ෂයකිරීම ගණනය කරන අතර, වත්කමක් ක්ෂය කිරීම එය භාවිතයට ගන්නා අවස්ථාවේදී ආරම්භ කරයි. ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.

වත්කම් වර්ගය	ක්ෂයකිරීමේ අනුපාතය
මෝටර් රථ	25.00% වාර්ෂිකව
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	12.50% වාර්ෂිකව
කාර්යාල උපකරණ	12.50% වාර්ෂිකව
පරිගණක	25.00% වාර්ෂිකව
වෙනත්	12.50% වාර්ෂිකව

කාර්යාල ගොඩනැගිලි පුළුල් කිරීම සඳහා වෙනස් කිරීම හෝ නවීකරණය වෙනුවෙන් දරන පිරිවැය වසර 4 ක් හෝ මුල් කල්බදු කාලය යන දෙකෙන් අඩුකාලයට ක්‍රමක්ෂය කර ඇත.

2.4.6.5. පසුව දරනු ලබන පිරිවැය

දේපළ පිරියත හා උපකරණ යන අයිතමයක කොටසක් අළුත් කිරීම සඳහා දරනු ලබන පිරිවැය, එම කොටස එකතු කිරීමත් සමඟ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බැංකුවට ගලා එන්නේනම් සහ එහි පිරිවැය පහසුවෙන් අගය කිරීමට ද හැකිනම්. එම අයිතමයේ ධාරණ වටිනාකමකට හඳුනා ගනු ලබයි.

2.4.6.6. යළි ස්ථාපනය කිරීමේ පිරිවැය

දේපළ පිරියත සහ උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් පවත්වාගෙන යෑම සඳහා වන අළුත්වැඩියාවන් සහ නඩත්තුව සහ දරන වියදම එම අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලබයි.

2.4.6.7. කාරක ප්‍රාග්ධනය

ගොඩනැගිලි ඉදි කිරීම්, විශාල යන්ත්‍ර හා පිරියත සහ පද්ධති සංවර්ධනය, ප්‍රාග්ධනීකරණය අපේක්ෂාව සඳහා සෘජුව දරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ඇත. මෙවැනි වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.4.6.8. ඉවත් කිරීම

දේපළ පිරියත හා උපකරණ විකිණීම හෝ එම වත්කම් භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බලාපොරොත්තු නොවන විට දී ඉවත්කරයි. එවැනි වත්කම් ඉවත්කිරීමක් මත හට ගන්නා ලාභය

හෝ අලාභය (වත්කමෙහි ධාරණ වටිනාකම සහ ශුද්ධ විකුණුම් ආදායම අතර වෙනස ගණනය කළ) වත්කම ඉවත්කරන වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් මෙහෙයුම් ආදායම් ලෙසට හඳුනාගනු ලැබේ. සටහන් අංක 19 හි විස්තර එළිදරව් කර ඇත.

2.4.7. අස්පෘෂ්‍ය වත්කම්

බැංකුවේ අනිකුත් අස්පෘෂ්‍ය වත්කම්වල පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුලත් වෙයි. පිරිවැය විශ්වාසදායි ලෙස තක්සේරු කලහැකි විටදී සහ එයට සම්බන්ධිත ඇතිවිය හැකි අනාගත ආර්ථික ප්‍රථිලාභ බැංකුව වෙත ගලා එන අවස්ථාවේදී අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගනී.

වෙන් වෙන් වශයෙන් අත්පත් කර ගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම් මූලික හඳුනා ගැනීම මත පිරිවැයට අගය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, අස්පෘෂ්‍ය වත්කම්වල සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණය අලාභයන් අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලබයි.

අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායි ජීව කාලය නිශ්චිත හෝ අවිනිශ්චිතව අගය කිරීමක් සිදු කරනු ලබයි. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් ඵලදායී ජීව කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි. නිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය අඩු වශයෙන් සෑම වර්ෂයක් අවසානයේ දීම සමාලෝචනයට ලක් කරනු ලබයි. අපේක්ෂිත ඵලදායී ජීව කාලය තුළ හෝ වත්කම් සමග ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන් භාවිතයේ අපේක්ෂිත රාටාවන් හී වෙනස්වීම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කරමින් ගණනය කරනු ලැබේ. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම එම අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රියාකාරීත්වය සමඟ යන වියදම වර්ගීකරණය යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

පහත පරිදි ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය පුරා ඉතිරි වටිනාකමට අස්පෘෂ්‍ය වත්කම්වල පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල පන්තිය	ඵලදායී ජීව කාලය	ක්‍රමක්ෂය ක්‍රමය
පරිගණක මෘදුකාංගය	අවුරුදු 4	සරල මාර්ග ක්‍රමය

2.4.8. මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

බැංකුව සෑම වාර්තාකරන දිනයකදීම වත්කමෙහි හානිකරණය පිළිබඳව කිසියම් සලකුණක් තිබේද යන්න පිළිබඳව ඇගයීමට ලක් කරනු ලබයි. කිසියම් සලකුණක් පවතී නම් හෝ වත්කමක වාර්ෂික හානිකරණය පිළිබඳ පරීක්ෂා කිරීමක් අවශ්‍ය වේනම්, බැංකුව වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලබයි. කිසියම් වත්කමක ලැබිය හැකි වටිනාකම වනුයේ වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකය හි සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පාවිච්චි වන වටිනාකම අඩු කළ පසු අගය වේ. එහි දී වත්කමෙහි ධාරණ අගය හෝ එහි ලැබිය හැකි වටිනාකම ඉක්මවන්නේ නම්, එම වත්කම හානිකරණය වී ඇති බවට සලකනු ලබන අතර එය අය කර ගත හැකි වටිනාකමට ලියා හරිනු ලබයි.

භාවිතය තුළ වටිනාකම් තක්සේරු කිරීමේ දී, මුදලෙහි කාලීන වටිනාකම පිළිබඳ පවත්නා වෙළෙඳපොළ තක්සේරුව සහ වත්කමට නිශ්චිත අවදානම් පිළිබිඹු කරන පෙර බදු වට්ටමක් භාවිතා කරමින්, අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකම වට්ටම් කෙරේ. විකිණීම සඳහා දරනු ලබන වියදම් අඩු කළ සාධාරණ අගය තීරණය කිරීමේ දී, සුදුසු තක්සේරු ක්‍රමයක් යොදා ගනු ලබයි. එම ගණනය කිරීම, තක්සේරු කිරීම් පරිපාලිත සමාගම්වල ලැයිස්තුගත කොටස් මිල හෝ වෙනත් පවත්නා සාධාරණ අගය දර්ශකයන් මඟින් මනාව පැහැදිලි වේ.

2.4.9. මූල්‍ය සුරැකුම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී, බැංකුව මූල්‍ය ඇපවීම් ලබා දේ. මූල්‍ය ඇපවීම් අදාළ වාරිකයන් ලැබෙන විට, සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල (වෙනත් වගකීම් යටතේ) මූලිකවම හඳුනා ගනී. එම මූලික අවස්ථාවේ හඳුනා ගැනීමෙන් අනතුරුව, එක් එක් ඇපය යටතේ බැංකුවේ වගකීම, ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ මුලින් හඳුනාගත් ප්‍රමාණය සහ ඇපයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් මූල්‍ය බැඳීම නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වඩා නිවැරදි ඇස්තමේන්තු වටිනාකම යන දෙකෙන් ඉහළ අගයට මනිනු ලබයි.

මූල්‍ය ඇපවීම් සම්බන්ධයෙන් ඇති වගකීම්වල කිසියම් වැඩිවීමක් 'ණය අලාභ වියදම' යටතේ ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලබයි. වාරික ලැබීම් 'ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම' ලෙසට සරල මාර්ග ක්‍රමයට එම ඇපවීම අදාළ වන කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබයි.

2.4.10. වෙන්කිරීම්

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ ගිවිසුම්ගත) ඇති විටක සහ බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභයක් ඇතුළත් සම්පත් පිටවයාමක් අවශ්‍ය වන විට සහ වගකීමෙහි ප්‍රමාණය විශ්වාසදායී ලෙසට ඇස්තමේන්තු කිරීමක් ද කළ හැකි විට වෙන්කිරීම් හඳුනා ගනියි. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදම ආදායම් ප්‍රකාශනයෙහි කිසියම් ප්‍රතිපූරණයකින් ශුද්ධව ඉදිරිපත් කර ඇත.

2.4.11. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම

2.4.11.1. හඳුනා ගැනීමේ දිනය

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ අත්හරිමින් මූල්‍ය වත්කම් සහ වගකීම් වෙළෙඳ දිනයට හඳුනා ගන්නා අතර, මෙම දිනය වන්නේ බැංකුව උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල කොටස්කරුවෙක් බවට පත්වන දිනයයි. මෙයට ඇතුළත් වන්නේ වෙළෙඳාමේ විධිමත් මාර්ග වන, වෙළෙඳ ස්ථානය තුළ රෙගුලාසියක් හෝ ගිවිසුමක් මගින් පොදුවේ ස්ථාපිත කාලරාමුවක් තුළ වත්කම බෙදා හැරීම අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම සහ විකිණීමයි. අරමුදල් ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් හඳුනා ගනී. අරමුදල් බැංකුව වෙත මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ බැංකුව හඳුනා ගනී.

2.4.11.2. මූල්‍ය උපකරණයන්ගේ මූලික තක්සේරු කිරීම

මූලික හඳුනා ගැනීමේ දී මූල්‍ය උපකරණයන් වර්ගීකරණය එහි ගිවිසුම්ගත කාලය සහ එම උපකරණය කළමනාකරණය සඳහා ව්‍යාපාර රටාව මත පදනම් වේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වාර්තා කරන, එයට ගනුදෙනු පිරිවැය එකතු කරන හෝ අඩුකරන අවස්ථාව හැර ඒවායේ සාධාරණ අගයට මූලික වශයෙන් අගය කරනු ලබයි. වෙළෙඳ ලැබීම් ගනුදෙනු මිලට අගය කරනු ලබයි. මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය උපකරණ මත සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස්වන අවස්ථාවක පහත විස්තර කරන පරිදි බැංකුව දින 1 ලාභය හෝ අලාභය ගණනය කරයි.

2.4.11.3. දින 1 ලාභය හෝ අලාභය

උපකරණයේ ගනුදෙනු මිල ආරම්භයේදී සාධාරණ අගයට වෙනස්වන්නේනම්. සහ සාධාරණ අගය වෙළෙඳපොල ගනුදෙනුවල නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් භාවිතා කරන තක්සේරු කරණ ශිල්පයක් මත පදනම් වන අවස්ථාවක, බැංකුව ශුද්ධ වෙළෙඳ ආදායම තුළ ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස හඳුනා ගනී. සාධාරණ අගය සමහර යෙදවුම් නිරීක්ෂනය කළ නොහැකි ආදර්ශ මත පදනම් වන අවස්ථාවන්හිදී, ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස සොයා ගන්නා අතර යෙදවුම් නිරීක්ෂනය කළ හැකි බවට පත්වන හෝ උපකරණය ඉවත්කරන අවස්ථාවේදී ලාභය හෝ අලාභය තුළ පමණක් හඳුනා ගනී.

2.4.11.4. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් තක්සේරු කිරීමේ ප්‍රභේදයන්

2018 ජනවාරි 01 දින සිට වත්කමේ ආයුගණක කෝන්දේසි හා වත්කම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාරික ආකෘතිය මත පදනම්ව සමස්ථ මූල්‍ය වත්කම් බැංකුව වර්ගීකරනය කරයි. තක්සේරු කිරීම්.

- ක්‍රමක්ෂය පිරිවැයට
- වෙනත් විස්තීර්න ආදායම් මගින් සාධාරන අගය - FVOCI
- ලාභ සහ අලාභ මගින් සාධාරන අගය - FVPL

2018 ජනවාරි 01 දිනට පෙර බැංකුව එහි මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරයි. (ක්‍රමක්ෂය පිරිවැයට) FVPL, විකිණීම සඳහා ඇති හෝ කල්පිරීම දක්වා, රඳවාගෙන ඇති (ක්‍රමක්ෂය පිරිවැයට) ණය බැඳීම් හා මූල්‍ය ඇප හැර මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරයි.

2.4.12. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

2.4.12.1. බැංකුවලින් ලැබියයුතු, ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන

2018 ජනවාරි 01 දින සිට බැංකුවලින් ලැබිය යුතු, ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම් අනෙකුත් මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් පමණක් බැංකුව අගය කරයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට මූල්‍ය වත්කම් දරා ගැනීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගනී.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි හිඟව පවත්නා ප්‍රධාන මුදල මත මුල් මුදල සහ පොළියේ පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා විශේෂ දිනවල ඇති වේ.

මෙම කොන්දේසි පිළිබඳ විස්තර පහත දැක්වේ.

2.4.12.2. ව්‍යාපාර ආදර්ශ තක්සේරුව

බැංකුව එහි ව්‍යාපාර අරමුණු අත්කර ගැනීමට මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය වඩා හොඳින් පිළිබිඹු කරන මට්ටමකදී එහි ව්‍යාපාර ආදර්ශය තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාර ආදර්ශය උපකරණයකින් උපකරණය යන පදනම මත තක්සේරු නොකරයි. එකතුකළ කළඹ තුළ ඉහළ මට්ටමකදී කරනු නොලැබුවත්, පහත නිරීක්ෂණය කළ හැකි සාධක මත එය පදනම වේ.

- ව්‍යාපාර ආදර්ශයේ සහ එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්වල කාර්යසාධනය අගය කරන සහ ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට වාර්තා කරන ආකාරය
- ව්‍යාපාර ආදර්ශයේ සහ කාර්යසාධනයට බලපාන අවදානම් එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්) විශේෂයෙන් එවැනි අවදානම් කළමනාකරණය කරන ආකාරය
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට ගෙවනු ලබන ආකාරය (නිදසුනක් ලෙස, ගෙවීම කළමනාකරණය කළ වත්කම්වල සාධාරණ අගය හෝ එකතුකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත පදනම් වේ)
- විකුණුම්වල අපේක්ෂිත වාර ගණන, වටිනාකම සහ කාලය බැංකුවේ තක්සේරුවේ වැදගත් අංගයකි.

ව්‍යාපාර ආදර්ශ තක්සේරුව නරක සිදුවීම් හෝ පීඩන සිදුවීම් සැලකිල්ලට ගන්නේ නැතිව සාධාරණව අපේක්ෂිත ක්‍රියාදාම මත පදනම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ බැංකුවේ මුල් අපේක්ෂාවන්ගෙන් වෙනස් වන ආකාරයකින් මුදා හරින්නේනම්, එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන ඉතිරි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය බැංකුව වෙනස් නොකරයි. නමුත්. ඉදිරියට ගෙනියන අලුතින් උත්පාදිත හෝ අලුතින් මිලදීගත් මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී එවැනි තොරතුරු අතුළත් කරයි.

2.4.12.3. SPPI පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවැනි පියවරක් ලෙස, SPPI පරීක්ෂණය සපුරා ඇතිද යන්න හඳුනා ගැනීම සඳහා මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ බැංකුව තක්සේරු කරයි. මෙම පරීක්ෂණයේ අරමුණ සඳහා ප්‍රධාන මුදල යන්න මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම්වල සාධාරණ අගය ලෙස නිර්වචනය කරන අතර මුල් මුදල මූල්‍ය වත්කමේ (නිදසුනක් ලෙස, ආපසු ගෙවීම හෝ වාරිකය/ වට්ටම ක්‍රමක්ෂය කිරීම ඇත්නම්) වෙනස් විය හැකිය.

ණයදීමේ වැඩපිළිවෙලක් තුළ පොළියේ වඩාත් වැදගත් අංග වන්නේ මුදල සහ ණය අවදානමේ කාල වටිනාකම සඳහා නියමානුකූල ප්‍රතිෂ්ඨාවයි SPPI තක්සේරු කිරීම සිදු කිරීම සඳහා, බැංකුව විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම නම් කරනු ලබන ව්‍යවහාර මුදල සහ පොළී අනුපාතය නියම කරන කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලයි.

මෙයට වෙනස්ව, මුල් ණය දීමේ වැඩපිළිවෙලකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තුළ අවදානම් හෝ වෙනස්වීම් සඳහා නිරාවරණය අඩුකර ගැනීමකට වඩා හඳුන්වාදෙන ගිවිසුම්ගත නියමයන් හිගව පවත්නා ප්‍රමාණය මත මුල් මුදල හා පොළිය ගෙවීම සඳහා පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඇති නොකරයි. එවැනි අවස්ථාවලදී, මූල්‍ය වත්කම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වේ.

2.4.12.4. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ණය උපකරණ

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන අවස්ථාවේදී අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ SLFRS 9 යටතේ නව වර්ගීකරණය බැංකුව යොදා ගනී.

- උපකරණය ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගැනීම, හා එහි පමාර්ථය සාමූහික ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ සහ අලෙවිකරන මූල්‍ය වත්කම් යන දෙවර්ගය විසින් අත්කර ගැනීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් හි SPPI පරීක්ෂණය සපුරාලීම.

මෙම උපකරණ විශාල වශයෙන් LKAS 39 යටතේ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන ලෙස පෙර වර්ගීකරණය කර ඇති වත්කම්වලින් සමන්විත වේ.

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සාධාරණ අගය තුළ වෙනස්වීම් නිසා ඇතිවන ලාභ හෝ අලාභ සහිත සාධාරණ අගයට පසුව මිනිනු ලැබේ. සමාන සුරැකුම්වල බැංකුව එක් ආයෝජනයකට වැඩිපුර දරන අවස්ථාවේදී, ඒවා පෙර පිවිසි පෙර පිටවුම් මත LKAS බැහැර කළ යුතුයයි සලකනු ලැබේ. ඉවත් කිරීම මත, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභ අනෙකුත් විස්තරාත්මක ආදායමෙන් ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ. 2022 වසරෙන් අවසන් වූ වසර සඳහා වෙනත් විස්තරාත්මක ආදායම් තුළින් සාධාරණ අගයට තක්සේරු කල ණය උපකරණ බැංකුව රඳවාගෙන නොමැත.

2.4.12.5. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ (FVOCI)

මූලික හඳුනා ගැනීම මත, බැංකුව අවස්ථානුකූලව LKAS 32 යටතේ ස්කන්ධය පිළිබඳ නිර්වචනය සපුරාලන අවස්ථාවේදී එහි ස්කන්ධ ආයෝජන කිහිපයක් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ ලෙස වෙනස්කළ නොහැකි ලෙස වර්ගිකරණය කිරීම තෝරා ගෙන ඇත. මූල්‍ය උපකරණ අලෙවිය සඳහා තබා නොමැති අවස්ථාවකදී, එවැනි වර්ගීකරණය උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

මෙම ස්කන්ධ උපකරණ මත ලාභ හෝ අලාභ ලාභයට නැවත ප්‍රතිචක්‍රිය නොකරයි. උපකරණයේ පිරිවැයේ කොටසක් අයකර ගැනීමක් ලෙස එවැනි ළඳ මුදල්වලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවේදී, එවැනි ලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරන අවස්ථාව හැර ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභය හෝ අලාභය තුළ ලාභාංශ හඳුනා ගනී. අනෙකුත්

විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ හානිකරණ තක්සේරුවකට යටත් නොවේ. 2002 වසරෙන් අවසන් වූ වසර සඳහා පිවි රේටින් සමාගමේ සහ ණය තොරතුරු කාර්යාංශයේ ලයිස්තුගත ස්කන්ධ උපකරණ බැංකුව රඳවාගෙන ඇත. සටහන් අංක 18.

2.4.12.6. නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල්

මූලික අගය කිරීමෙන් පසු, නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල් පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ. ක්‍රමක්ෂය පිරිවැය නිකුත්කළ අරමුදල් පිළිබඳ යම් මට්ටම් හෝ වාරික සහ ඵලදායි පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ගණනය කෙරේ. වගකීමක් සහ ස්කන්ධ සංරචකයක් අඩංගු සංකීර්ණ මූල්‍ය උපකරණයක් නිකුත් කරන දිනයට වෙන් කෙරේ.

2.4.12.7. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් හා වගකීම්

මෙම වර්ගය තුළ මූල්‍ය වත්කම සහ මූල්‍ය වගකීම යනු අලෙවිය සඳහා තබා ඇති සහ මූලික හඳුනා ගැනීම මත කළමනාකරණය විසින් නම්කරන ඇති හෝ SLFRS යටතේ සාධාරණ අගයේදී මැනීමට අනිවාර්යෙන්ම අවශ්‍ය වන ඒවා වේ. කළමනාකරණය පහත සඳහන් නිර්ණායකයක් සපුරාලන අවස්ථාවේ මූලික හඳුනා ගැනීම මත ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට උපකරණයක් නම් කරයි. එම නම් කිරීම උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

- මෙම නම් කිරීම වත්කම් හෝ වගකීම් අගය කිරීමෙන් වෙනත් ආකාරයකින් ඇතිවියහැකි හෝ විවිධ පදනමක් මත ඒ මත ලාභ හෝ අලාභ හඳුනා ගැනීමේ අනුරූප නොවන දෙය තුරන් කරයි නැතිනම් සැලකියයුතු ලෙස අඩු කරයි. හෝ
- වගකීම් (සහ LKAS 39 යටතේ 2018 ජනවාරි1 දක්වා වත්කම්) මූල්‍ය වගකීම් සමූහයක (හෝ LKAS 39 යටතේ මූල්‍ය වත්කම් හෝ දෙකම) කොටසක් වන අතර, ලේඛණගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන ක්‍රමෝපායට අනුකූලව කළමනාකරණය කරන අතර ඒවායේ කාර්යසාධනය අගයනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කරයි. සාධාරණ අගයේ වෙනස්වීම් බැංකුවට අයත් ණය අවදානම් තුළ වෙනස්වීම් නිසා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ වගකීම්වල සාධාරණ අගය තුළ වෙනස්වීම් හැරදැමීම සමඟ ලාභය සහ අලාභය තුළ වාර්තා කෙරේ. සාධාරණ අගය තුළ එවැනි වෙනස්වීම් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ණය සංචිතය තුළ වාර්තා කරන අතර, ලාභය සහ අලාභයට ප්‍රතිචක්‍රීය නොකරයි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ උපකරණ මත උපයන හෝ දරන පොළීය ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් යම් මට්ටම/වාරිකය සහ උපකරණයේ අත්‍යවශ්‍ය කොටසක් වන සුදුසුකම් ලබන ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් පිළිවෙලින් පොළී ආදායම හෝ පොළී වියදම තුළ උපචිත කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මැනිම නීතියෙන් අනිවාර්ය වත්කම් මත උපයන පොළීය ගිවිසුම්ගත පොළී අනුපාතය භාවිතා කරමින් වාර්තා කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මනිනලද ස්කන්ධ උපකරණවලින් ලාභාංශ ආදායම ගෙවීමේ අයිතිය ස්ථාවර කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභ සහ අලාභ තුළ වාර්තා කෙරේ. 2024 දෙසැම්බර් 31 දිනට බැංකුව ඒකක භාර රඳවාගෙන ඇති අතර ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට (FVPL) තක්සේරු කරයි.

2.4.12.8. මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ව්‍යාපාර මාර්ගයක් අත්කරගන්නා, බැහැර කරන හෝ අවසන් කරන විශේෂ වාතාවරණයකදී හැර බැංකුව ඒවායේ මූලික හඳුනා ගැනීමෙන් පසු එහි මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකරයි. බැංකුව 2023 සහ 2024 දී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

2.4.12.9. මූල්‍ය වත්කම් හා වගකීම් ඉවත් කිරීම

2.4.12.9.1. නියමයන් හා කොන්දේසිවල සැලකියයුතු වෙනස්වීම් අනුව ඉවත් කිරීම

බැංකුව ගනුදෙනුකරුවන්ට ණය වැනි මූල්‍ය වත්කමක් ඉවත් කරන්නේ, හානිකරණ අලාභය දැනට වාර්තා කර නොමැති ප්‍රමාණය දක්වා ඉවත් කිරීමක් ලෙස හඳුනාගන්නා වෙනස සමඟ එය අලුත් ණයක් බවට පත්වන පරිදි සැලකියයුතු ප්‍රමාණයට එහි නියමයන් හා කොන්දේසි නැවත සාකච්ඡා කර ඇති අවස්ථාවේදීය. අලුතින් හඳුනාගත් ණයමුදල් අපේක්ෂිත ණය අලාභ මැනීමේ අරමුණ සඳහා 1 අදියර ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එම ණය POCI වන බවට සලකන්නේනම් පමණී.

අනෙකුත් කරුණු අතර, ගනුදෙනුකරුවන්ට ණයක් හඳුනා ගන්නේද යන්න තක්සේරු කිරීමේදී, බැංකුව පහත සඳහන් සාධක සලකා බලයි.

- ණය මුදලේ ව්‍යවහාර මුදලේ වෙනස
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වාදීම
- ඈපයක වෙනස්වීම
- වෙනස්වීම මගින් SPPI නිර්ණායක තවදුරටත් සපුරනු නොලබන උපකරණයක් වීම.

වෙනස්වීම පසුකාලීනව වෙනස් වන මුදල් ප්‍රවාහවලට හේතු නොවේනම්, වෙනස්වීම ඉවත් කිරීමට හේතු නොවේ. මුල් ඵලදායී පොළී අනුපාතයට වට්ටම් කළ මුදල් ප්‍රවාහ තුළ වෙනස මත පදනම් වී, හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට වෙනස් වීමේ ලාභයක් හෝ අලාභයක් වාර්තා කරයි.

2.4.12.9.2. සැලකියයුතු නවීකරණයකිරීම හැර ඉවත්කිරීම

මූල්‍ය වත්කම්

කල් ඉකුත් වූ වත්කම්වලින් මුදල් ගලා ඒම ලබාගැනීමට හිමිකමක් ඇතිවිට මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක් හෝ අදාලවන පරිදි) ඉවත් කිරීමක් සිදුකරයි. ඉවත්කිරීම සඳහා මාරු කිරීම් ලක්ෂණ හා මූල්‍ය වත්කම මාරුකර තිබේනම් යන අවස්ථා දෙකෙහිදීමදීත් බැංකුව මූල්‍ය වත්කම ඉවත් කරයි. බැංකුව මූල්‍ය වත්කම මාරුකර ඇත්නම් පමණක්, නැතහොත්

- මූල්‍ය වත්කමකින් මුදල් ගලාඒම ලබාගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව මාරුකර ඇතිවිටක දී හෝ
- මුදල් ගලාඒම අයිතිය අත්හිටුවා ඇතිවිට එහෙත් pass-through ගිවිසුමක් යටතේ නොවන පක්ෂයකට ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ලබාගත් මුදල් ප්‍රවාහය සම්පූර්ණයෙන් ගෙවීමේ අයිතිය පිලිගෙන ඇත. Pass-through ක්‍රියාමාර්ග යනු ගනුදෙනු වෙයි. එමගින් වත්කමකින් (ආරම්භක වත්කම) මුදල් ගලා ඒම ලබාගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව අත්හිටුවයි. එහෙත් මෙම මුදල් ප්‍රවාහයන් එකක් හෝ ආයතන වැඩි ගනනකට ගෙවීමට හැකි ගිවිසුම්ගත අයිතිය පහත සඳහන් තත්ත්වයන්ට යෝග්‍යවේ නම් පිලිගනු ලබයි.
- ණයටදුන්මුදලටවෙළෙඳපලඅනුපාතයටඇතිඋපචිත පොලිය එකතුකර සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට අයිතියක් ඇත. කෙටිකාලීන අත්තිකාරම් හැර මූලික වත්කමින් සමාන වටිනාකමක් ලබාගෙන නොමැති ආනුෂාංගික ලැබීම්කරුවන්හට වටිනාකම් ගෙවීමට බැංකුව බැඳීමක් නොමැත.
- ආනුෂාංගික ලැබීම්කරුවන්හට ඇති සුරැකුම් හැර මූලික වත්කම ඇපයට තැබීමට හෝ විකිණීමට බැංකුවට නොහැක.
- බැංකුව විසින් එකතුකරනු ලබන මුදල් ප්‍රවාහයන් ප්‍රමාණාත්මක ප්‍රමාදයකින් තොරව ආනුෂාංගික ලැබීම්කරුවන් වෙත බැංකුව ප්‍රේෂණය කරයි.
- මීට අමතරව රැස්කිරීමේ දිනය හා අනුෂාංගික ලැබීම්කරුවන්ට ප්‍රේෂණය කිරීමට අවශ්‍ය දිනය අතර කාලය තුල දී ඉපයු පොලිය ඇතුලුව මුදල් හෝ මුදල් සමාන දෑ වල ආයෝජනය කිරීම හැර එවැනි මුදල් ප්‍රවාහයන් ආයෝජනය කිරීමට බැංකුවට අයිතියක් නොමැත.
- ඉවත්කිරීම සඳහා පැවරීම සුදුසු වත්කම් එක පසෙකින්
- බැංකුව වත්කමේ සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස මාරුකර ඇතිවිට හෝ
- බැංකුව සැලකියයුතු ලෙස වත්කමේ සියලු අවදානම් හා ලැබීම් මාරුකිරීමක් හෝ රඳවාගැනීමක් සිදුකර නොමැති නමුත් වත්කමේ පාලනය මරුකර ඇත.

පැවරුම් ලාභියාට අසම්බන්ධිත පාර්ශවයකට වත්කම මුළුමනින්ම විකුණා දැමීමට ප්‍රායෝගික හැකියාවක් තිබියයුතු අතර එම හැකියාව පැවරීම අමතර සීමාවලට යටත්කිරීමකින් තොරව බහුපාර්ශිකව ප්‍රයෝජනයට ගැනීමට හැකිනම් හෝ හැකිවේනම් පමණක් බැංකුව පාලනය පැවරීම සලකා බලයි.

සියලුම අවදානම් හා ලැබීම් සැලකියයුතු ලෙස රඳවා තබා ගැනීමක් හෝ පැවරීමක් බැංකුව සිදු නොකරනවිට හා වත්කමේ පාලනයේ නවතා දැමීම සිදුකර බැංකුවේ සිදුකරගෙන යන මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම හඳුනාගන්නා අතර එවැනි අවස්ථාවක බැංකුව ආශ්‍රිත වත්කම් ද හඳුනාගනී. බැංකුව රඳවාගෙන ඇති බැඳීම් හා අයිතීන් නිරූපනයවන පදනම මත පවරන ලද වත්කම හා ආශ්‍රිත වගකීම් තක්සේරු කරනු ලබයි.

පවරනලද වටිනාකමේ ඇපයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කමේ මූලික ඉදිරියට ගෙන ආ වටිනාකමේ අඩු අගයට තක්සේරු කරන අතර බැංකුව ගෙවියයුතු උපරිම වටිනාකම සලකා බැලීම සිදුකරයි.

ප්‍රතිමිලදී ගැනීම් සඳහා බැංකුවට ගෙවීමට අවශ්‍යවන අගයට අඛණ්ඩ මැදිහත්වීම තක්සේරු කරන අතර පවරන ලද වත්කම මත අඛණ්ඩ මැදිහත්වීම ලිඛිත හෝ මිලදී ගැනීම් විකල්පයක ස්වරූපය ගනී. සාධාරණ අගයට තක්සේරු කර ඇති වත්කමක අයිතිය විකිණීමේ දී අස්ථිත්වයේ අඛන්ඩ මැදිහත්වීම පවරන ලද වත්කමේ සාධාරණ අගයේ අඩුවටිනාකමට සීමාවෙයි.

මූල්‍ය වගකීම්

වත්කමක් යටතේ ඇති බැඳීම් නිදහස් කරනු ලැබීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත්වීම සිදුවූ අවස්ථාවක මූල්‍ය වගකීමක් ඉවත්කිරීම සිදුකරයි. එකම ණය ගනුදෙනුකරුවෙකු සැලකියයුතු වෙනසක් සහිත කොන්දේසිවලට යටත්ව පවත්නා මූල්‍ය වගකීමක් අලුත් කිරීම හෝ දැනට පවත්නා වගකීම්වල කොන්දේසි සැලකිය යුතු ලෙසින් අලුත් කිරීමේ දී එවැනි හුවමාරුවක් හෝ අලුත් කිරීමක් ප්‍රාරම්භක වගකීම් ඉවත්කිරීමක් ලෙසට හා නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසද ගැලපීම් කර ඇත. එසේම ප්‍රාරම්භක මූල්‍ය වගකීම්වල ඉදිරියට ගෙන එන ලද වටිනාකම සහ මුලාරම්භක මූල්‍ය වගකීම් යන ගෙවන ලද වටිනාකම අතර වෙනස ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනේ.

2.4.12.10. මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව, ගනුදෙනුකරුවන්ට සියලුම ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වියහැකි හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කෙරේ. පහත සඳහන් තක්සේරු ශිල්ප ණයවල සාධාරණ අගය ගණනය කිරීමට භාවිතා කළ අතර ඒවා පහත පරිදි වේ. මූල්‍ය වත්කම් හානිකරණයේ විස්තර සටහන් අංක 16 හා 17 හි දක්වා ඇත.

2.4.12.10.1. වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණ ක්‍රමය

I වෙන් වෙන් වශයෙන් හානිකරණ ක්‍රමය ණය සඳහා සිදුකරන අතර, එහිදී මුදල් ආපසු ණය ඉවත්කරන අතර රු.මි.5ට වැඩි සියලුම ණය ඇතුළත් කරයි. නැතිනම් ප්‍රාග්ධන පදනමෙන් 0.1% ක් තනි තනිව සැලකියයුතු ලෙස සලකනු ලබයි. තනි තනි හානිකරණ පරීක්ෂණය සඳහා පහසුකම් හානිකරණයේ අරමුණුගත සාක්ෂි ලබාගැනීම මත පදනම් වී තෝරා ගනු ලැබේ.

II වෙන් වෙන් වශයෙන් වැදගත් සහ වෙන් වෙන් වශයෙන් හානිකරණය වූ තක්සේරු කිරීම් මූලාරම්භයේ සිට සැලකිය යුතු පිරිහීමකට ලක්වී ඇති නිර්ණායක මත පදනම් වූ වෙන් වෙන් වශයෙන් සැලකිය යුතු නමුත් හානිකරණය නොවූ ණය සාමූහිකව අධියර I යටතේ හෝ අධියර II යටතේ හානිකරණය සඳහා තක්සේරු කරනු ලබයි. එයින් වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණය යටතේ වර්ගකර ඇති ණය පහසුකම් සඳහා සැලකිය යුතු ණය පිරිහීම් සැලකීමේ දී පහත සඳහන් නිර්ණායක සලකා බලනු ලබයි.

ණය ලබාගන්නා හෝ ණය ලබාදෙන්නාගේ සැලකිය යුතු මූල්‍ය අපහසුතා ඇතිවූ විට ණය ගැනුම්කරු බංකොලොත් වී හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට යොමු වී ඇති බවක් දක්නට ලැබෙයි. මූල්‍ය වත්කම් සඳහා ක්‍රියාකාරී වෙළඳපළක් නොමැතිවූ විට මූල්‍ය දුෂ්කරතාවයන් ඇති කරයි. ගැනුම්කරු වංචා සහගත ලෙස ලියකියවිලි ඉදිරිපත් කර ඇති අතර ඉතිරි ශේෂය අයකර ගැනීම සැක සහිත බව ප්‍රකට වෙයි. එහෙයින් එම ණය ගැනුම්කරුගේ වෙනත් මූල්‍ය උපකරණ සඳහා ද ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇතිකරයි.

2.4.12.10.2 සාමූහික හානිකරණ ක්‍රමය

වියහැකි ණය අලාභ සඳහා සාමූහික හානිකරණ වෙන් කිරීම් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව සිදු කෙරේ. බැංකුව අපේක්ෂිත ණය අලාභ මූලධර්මයට අනුව සාමූහික හානිකරණ වෙන්කිරීම බැංකුව සිදුකර ඇත. එහිදී වෙන් වෙන් වශයෙන් සිදුකරන හානිකරණය වැදගත් නොවේ.

2.4.12.10.2.1අපේක්ෂිත ණය අලාභ මූලධර්මය පිළිබඳ දළ විශ්ලේෂණය

ඉදිරිය දකින අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් සහිතව LKAS 39 හි දරන ලද අලාභ ප්‍රවේශය වෙනුවට SLFRS 9 යොදා ගැනීම මූලිකවම බැංකුවේ ණය අලාභ හානිකරණ ක්‍රමය මූලිකවම වෙනස් කර ඇත. 2018 ජනවාරි 1 සිට, "මූල්‍ය උපකරණ, ලෙස මෙම සෑම කොටසකම සඳහන් කරන ණය බැඳීම් සහ මූල්‍යමය ඇප ගිවිසුම් සමඟ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොදරන සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් අත්තිකාරම බැංකුව වාර්තා කරමින් සිටී. ස්කන්ධ උපකරණ SLFRS 9 යටතේ හානිකරණයට යටත් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු ජීවකාල අපේක්ෂිත ණය අලාභයේ කොටස වන අතර එය වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුළත වියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් ඇතිවන අපේක්ෂිත ණය අලාභය නියෝජනය කරයි. ජීවකාල අපේක්ෂිත ණය අලාභ සහ මාස 12 අපේක්ෂිත ණය අලාභ යන දෙකම මූල්‍ය උපකරණවල පාදක කළඹේ ස්වභාවය මත රැඳෙමින් තනි තනි පදනමක් හෝ සාමූහික පදනමක් මත ගණනය කෙරේ. මූල්‍ය වත්කම් කාණ්ඩකරණය සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය සාමූහික පදනමක් මත අගය කර ඇත.

මූල්‍ය උපකරණයක ඉතිරි ජීව කාලය තුළ සිදුවන පැහැර හැරීමේ අවදානම තුළ වෙනස සැලකිල්ලට ගනිමින් මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය උපකරණයේ ණය අවදානම සැලකියයුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ එක් එක් වාර්තාකරන කාලසීමාව අවසානයේදී තක්සේරුවක් සිදු කිරීමට බැංකුව ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුව එහි ණය පහත විස්තර කරන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 සහ POCI තුළට කාණ්ඩ කරයි.

අදියර 01 ණය පළමුව හඳුනාගන්නා අවස්ථාවේදී බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ මත පදනම් වී අත්තිකාරමත් හඳුනා ගනී. අදියර 01 ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර දෙක සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

අදියර 02 ණය මුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කර ඇති අවස්ථාවක බැංකුව ජීව කාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තාකරයි. ණය අවදානම වැඩි වී ඇති අදියර 02 ණය මුදල්වලද පහසුකම් ඇතුළත් වන අතර ණය මුදල අදියර 03 සිට නැවත වර්ගීකරණය කරයි.

අදියර 03 ණය හානිකරණය වී ඇති බවට සලකන ණය (අංක 13 හි සඳහන් පරිදි) බැංකුව ජීව කාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් අපේක්ෂාකරයි.

POC1 මිලදී ගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය (POC1) වත්කම් යන මූලික හඳුනා ගැනීම ණය මත හානිකරණය වන මූල්‍ය වත්කම් තිබේ. මිලදී ගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය වත්කම් මුල් හඳුනා ගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරන අතර ණය ගැලපුම් කරන ලද සඵල පොලී අනුපාතය පදනම්කරගනිමින් පොලී ආදායම පසුව හඳුනා ගැනේ අපේක්ෂිත ණය අලාභ හඳුනාගැනීම පෙර නිකුත් කිරීම සිදුකරනු ලබන්නේ අපේක්ෂිත ණය අලාභ වල පසුකාලීන වෙනසක් ඇති ප්‍රමාණයට පමණි.

හිඟව ඇති මුළු ප්‍රමාණය හෝ එයින් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් බැංකුවට නොමැති මූල්‍ය වත්කම් සඳහා, මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය අඩු කරනු ලබයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනා නොගැනීමක් ලෙස සලකනු ලබයි.

2.4.12.10.2.3 අපේක්ෂිත ණය අලාභ (ECLs) ගණනය කිරීම

ඵලදායී පොළී අනුපාතයට ආසන්නවීමට වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟය මැනීම සඳහා සම්භාවිතාව බරතබනලද ක්‍රියාදාම හතරක් මත පදනම් වී බැංකුව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟයක් යනු ගිවිසුමකට අනුකූලව ආයතනයකට ගෙවියයුතු මුදල් ප්‍රවාහ සහ ආයතනය ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසයි. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ශිල්ප පහත කෙටියෙන් දක්වන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ.

PD පැහැර හැරීමේ සම්භාවිතාවය යනු දෙන ලද කාලසීමාවන් තුළ පැහැර හැරීම් සිදුවිය හැකි බව පිළිබඳ ඇස්තමේන්තුවයි. මූල්‍ය පහසුකම් මෙයට පෙර හඳුනාගත නොහැකි නම් සහ තවමත් කලබල නම් පැහැර හැරීමක් තක්සේරු කළ කාලසීමාව තුළ එක්තරා අවස්ථාවකදී පමණක් සිදුවිය හැක.

EAD පැහැර හැරීමේදී නිරාවරණය යනු බැඳුණු පහසුකම් සහ මගහැරුණු ගෙවීම් උපචිත පොළිය මත පහළ වැටීම් අපේක්ෂිත ගිවිසුම මගින් හෝ වෙනත් ආකාරයකින් උපලේඛණ ගත මුල් මුදල සහ පොළිය නැවත ගෙවීම ඇතුළුව වාර්තා කරන දිනෙන් පසු නිරාවරණය තුළ අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අනාගත පැහැර හැරීමේ දිනයක නිරාකරණය පිළිබඳ තක්සේරුවයි.

LGD අලාභ ලබන පැහැර හැරීම් යනු දෙන ලද යම් කාලයකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවක සිදුවන අලාභ පිළිබඳව තක්සේරුව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හිඟ සහ යම් අය මුදා හැරීම ඇතුළුව ණයකරු ලබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. ඒ සාමාන්‍යයෙන් පැහැරහැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, බැංකුව විසින් මූලික සිදුවීම, හොඳම සිදුවීම සහ නරකම සිදුවීම ලෙස ක්‍රියාදාම තුනක් සලකා බලයි. මේවා එකින් එක එකිනෙකට වෙනස් PDs, EADs සහ LGDs හා බැඳේ. අදාළ වන අවස්ථාවේදී, ණය අයකර ගැනීමේ හැකියාව සහ ඇපවල වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලබාගතහැකි ප්‍රමාණය ඇතුළුව පැහැර හැරි ණය අයකර ගැනීමට අපේක්ෂා කරන ආකාරය සම්බන්ධයෙන් විවිධ ක්‍රියාදාම පිළිබඳ තක්සේරුවක් ද ඇතුළත් කරයි.

හානිකරණ අලාභ සහ මුදාහැරීම් මූල්‍ය වත්කමේ දළ ධාරණ අගයේ ගැලපීමක් ලෙස ගණනය කරන වෙනස්කිරීමේ අලාභ හෝ ලාභ සඳහා ගණනය කර වෙන වෙනම අනාවරණය කෙරේ.

2.4.12.10.2.4අපේක්ෂිත ණය හානි (ECL) ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සංක්ෂිප්තව පහත දැක්වේ.

අදියර 1

මාස 12 අපේක්ෂිත ණය හානි (12m ECL) ජීව කාලයක පුරා ඇති අපේක්ෂිත ණය හානි (LTECLs) වල කොටසක් ලෙස ගණනය කරන අතර එමගින් අපේක්ෂිත ණය හානි (ECLs) නියෝජනය වෙයි. මෙම ගණනය කිරීම වාර්තා කරන දිනයෙන් පසු මාස 12 ක් ඇතුලත මූල්‍ය උපකරණයක් මත වියහැකි පැහැර හැරීම් අවස්ථාවක් නිසා ඇතිවන ප්‍රතිඵලයකි. වාර්තාකරන දිනයෙන් පසු මාස 12 ක කාලයක දී සිදුවන පැහැර හැරීමක් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (LKAS) යටතේ මාස 12 ණය හානි දීමනාව බැංකුව ගණනය කරයි. ප්‍රාරම්භක සඵල පොලී අනුපාතයට (EIR) ආසන්නව වට්ටම්වන අපේක්ෂිත පාඩු සිදුවන පැහැර හැරීමක් (LGD) ගුණකර අපේක්ෂිත මාස 12 හෝ වියහැකි පැහැරහැරීම් පුරෝකථනය කරන ලද නිරාවරණයක දී (EAD) සඳහා යොදා ගනී. ඉහත විස්තර කළ පරිදි මෙම ගණනය කිරීම් සෑම අවස්ථා හතරක් සඳහාම සිදුකරයි.

අදියර 2

ආරම්භයේ පටන් ණය මුදලක ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් පෙන්වා තිබේනම් ජීව කාලය පුරා ඇති අපේක්ෂිත ණය හානි (LTECLs) සඳහා බැංකුව දීමනාවක් වාර්තා කරයි. විවිධ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම ඇතුලත්ව ක්‍රියාකාරිත්වය ඉහත විස්තර කරන ලද දේ හා සමාන වෙයි. නමුත් PD හා LGDs උපකරණයක ජීව කාලය පුරා ඇස්තමේන්තු කරනු ලබයි. සඵල පොලී අනුපාතයට ආසන්න අගයක් මත අපේක්ෂිත, මුදල් හිඟ වීම් වට්ටම් කරයි.

අදියර 3

ණය හානිකරණයවී ඇතැයි සලකන ණය සඳහා බැංකු ජීව කාලය පුරා අපේක්ෂිත ණය හානි අලාභ බැංකුව හඳුනා ගනී. 100% ලෙස PD තබා ඇති අදියර 2 වත්කම් සඳහා ද ක්‍රමවේදය සමාන වෙයි.

POCI මූලික හඳුනාගැනීමේ දී ණය හානිකරණයවී ඇති මූල්‍ය වත්කම් POCI වත්කම්වේ. ණය ගලපන ලද සඵල පොලී අනුපාතය මගින් වට්ටම් කරන ලද වියහැකි බව මත බර තැබූ අවස්ථා හතර පදනම්ව ආරම්භක හඳුනාග ැනීමේ සිට ජීව කාලය පුරා ඇති ECLs සඳහා අවසාන වෙනස්වීම් පමණක් බැංකුව හඳුනාගනී.

2.4.12.11. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ සාධාරණ අගයේ පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මෙම මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු නොකරයි. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේනම් ඇතිවිය හැකි දිමනාවට සමාන මුදලක් ආදායම් ප්‍රකාශනයට අනුරූප අයකිරීමක් සමඟ සමුච්චිත හානිකරණ ප්‍රමාණයක් ලෙස අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සමුච්චිත අලාභ වත්කම හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභයට ප්‍රතිචක්‍රිය කෙරේ.

2.4.12.12. මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් (POCI)

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් සඳහා, අලාභ දිමනාව තුළ මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනා ගනී.

2.4.12.13. ඉදිරිය දකින තොරතුරු

අපේක්ෂිත ණය අලාභ ආදර්ශය තුළ, පහත කරුණු වැනි ආර්ථික යෙදවුම් ලෙස ඉදිරිය දකින තොරතුරු පිළිබඳ පුළුල් පරාසයක් මත බැංකුව විශ්වාසය තබයි.

- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොළී අනුපාත
- විනිමය අනුපාතය
- විරැකියා අනුපාත

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සහ ආදර්ශ මූල්‍ය ප්‍රකාශනවල දිනයට වෙළෙඳපොලේ සියලුම ගතිලක්ෂණ සෑමවිටම ග්‍රහනය කර නොගනී. මෙය පිළිබිඹු කිරීම සඳහා, එවැනි වෙනස්වීම් සැලකියයුතු ලෙස වැදගත් වන අවස්ථාවේ ගුණාත්මක ගැලපීම් හෝ ආවරණ තාවකාලික ගැලපීම් ලෙස අවස්ථානුකූලව සිදු කෙරේ. එමනිසා, බැංකුව පහත සඳහන් ගුණාත්මක සාධක සැකිලල්ට ගනී.

- සාමාන්‍ය LTV
- රජයේ ප්‍රතිපත්ති
- ක්ෂේත්‍රයේ ව්‍යාපාරයේ තත්ත්වය
- නියාමන බලපෑම

2.4.12.14.ඇප තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් මත ණය අවදානම් අවම කිරීම සඳහා, හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප භාවිතා කිරීමට උත්සාහ දරයි. ඇප මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇප, නිශ්චල දේපල, ලැබීම්, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය වර්ධනයන් වැනි විවිධ ආකාරයේ ස්වරූපයක් ගනී. SLFRS 9 යටතේ බැංකුව එහි ණයදීමේ වැඩපිළිවෙල තුළින් පවරාගන්නා ඇප සඳහා බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියයි.

2.4.12.15. නැවත අත්කරගත් ඇප

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ නැවත අත්කරගත් වත්කමක් එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වඩා හොඳින් භාවිතා කළ හැකිය යන්න හෝ විකිණිය යුතුය යන්න තීරණය කිරීමයි. එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත්යයි තීරණය කළ වත්කම් ඒවා නැවත අත්කරගත් වටිනාකම හෝ මුල් සුරැකුම් වත්කමේ ධාරණ අගය යන දෙකින් අඩු අගයට ඒවාට අදාළ වත්කම් වර්ගීකරණයට මාරු කෙරේ. විකිණීම වඩාත් හොඳ විකල්පයක් වන බවට තීරණය කරනු ලබන වත්කම් ඒවායේ සාධාරණ අගයට (මූල්‍ය වත්කම්නම්) සහ බැංකුවේ ප්‍රතිපත්තියට සමගාමීව නැවත අත්කර ගත් දිනයට මූල්‍ය නොවන වත්කම් සඳහා විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගයට අලෙවිය සඳහා තබා ඇති වත්කම්වලට මාරු කරනු ලබයි.

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර රටාවට අනුව, බැංකුව එහි පාරිභෝගික කළඹ තුළ දේපළ හෝ අනෙකුත් වත්කම් භෞතිකව නැවත අත්කර නොගන්නා නමුත් පොදුවේ වෙන්දේසියකදී හිඟ ණය නිරවුල් කිරීමට අරමුදල් අයකර ගැනීමට බාහිර නියෝජිතයින් සේවයේ යොදවනු ලබයි. යම් අතිරික්ත අරමුදල් ගනුදෙනුකරුවන්ට/ වගකිවයුත්තන්ට ආපසු ගෙවනු ලැබේ. මෙම ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් ලෙස, නෛතිකව නැවත අත්කරගැනීමේ ක්‍රියාවලින් යටතේ නේවාසික දේපළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා නොකෙරේ.

2.4.12.16. ලියාහැරීම්

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුළ පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුව අයකරගැනීමේ කාර්යය නවතා

ඇති අවස්ථාවේදී පමණක් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම මූල්‍ය වත්කම් ලියා හරිනු ලබයි. ලියාහරිනු ලබන මුදල සමුච්චිත අලාභ දීමනාවට වඩා ඉහළ නම්, දළ ධාරණ අගයට අනුව යොදා ගනු ලබන දීමනාවට එකතු කිරීමක් ලෙස වෙනස පළමුව සලකනු ලැබේ. යම් පසුකාලීන අයකර ගැනීම් ණය අලාභ වියදමට බැර කෙරේ.

2.4.13. වාර්තාකරන කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරන කාලසීමාවෙන් පසු සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර, සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සිදු කෙරේ. කොවිඩ් -19 වසංගතයේ තුන්වන රැල්ල හේතුවෙන් පුද්ගලයින් සහ ව්‍යාපාර මුහුණදුන් අභියෝගයන්ට මුහුණ දීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 අංක 5 දරණ චක්‍රලේඛය 2021 මැයි මාසයේ දී නිකුත් කරන ලදී. 2021 අංක 08 දරණ චක්‍රලේඛය මගින් 2021 සැප්තැම්බර් මාසයේ දී එය තවදුරටත් දීර්ග කරන ලදී. ඒ අනුව දැනටමත් බැංකුව 2021 මැයි මාසයේ දී සහන ලබා දී ඇති අතර දැනට බැංකුව විසින් දීර්ග සහන ක්‍රියාමාර්ග සඳහා සුදුසු ණය ගැනුම්කරුවන් විසින් යොමු කරන ලද ඉල්ලීම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටියි.

මූල්‍ය සේවා මත වැට් බදු වෙනස්වීම

2022 ජනවාරි 7 වෙනි දින නිකුත් කරන ලද රජයේ පනත් කෙටුම් පතේ ප්‍රතිපාදන අනුව මූල්‍ය සේවා මත වැට් බදු වැඩි කිරීමට යෝජනා කර ඇත.

නව අක්‍රිය ණය අනුපාත නියෝගය

2022 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය පහසුකම් සඳහා වර්ගීකරණය හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව නියෝග මාලාවක් නිකුත් කර ඇත. අක්‍රිය ණය වර්ගීකරණය සඳහා අවිනිශ්චිත පොලී ඉවත් කිරීම SLFRS 9 අදියරේ වර්ගීකරණ යොදා ගැනීම, හරස් පැහැර හැරීමේ නීති, අදියර 01 ණය සඳහා ලබා දිය යුතු ණය ප්‍රතිපාදන අනුපාතය සහ විවිධ අදියර යටතේ මූල්‍ය වත්කම් සංචලනය කිරීමේ නව නීති ආදිය වේ. කෙසේ වෙතත් 2022 ජනවාරි මස 01 දිනෙන් පසුව අක්‍රිය ණය ලෙස සලකන ණය සඳහා නව නියෝගය බලපැවැත්වෙන අතර පෙර නිකුත්කර තිබූ නියෝගය යටතේ වර්ගීකරණය කර ඇති පැරණි ණය ගෙවා නිමකරන තුරු එලෙසම පවතී.

2.4.14. රජය හා රජයට අදාළ ආයතන සමග සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

LKAS 24 හි 32 පරිච්ඡේදය යටතේ අනාවරණයෙන් නිදහස්වීම බැංකුව තෝරාගෙන නැත.

2.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම්

2.5.1. පොලී ආදායම

පොලී ආදායම් විස්තර සටහනක් අංක 3 හි දක්වා ඇත.

2.5.2. පොලිය සහ සමාන ආදායම

බැංකුව ණය හානිකරණ වත්කම් හැර මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයට එලදායි පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම ගණනය කරනු ලබයි. මූල්‍ය වත්කමක් ණය හානිකරණ බවට පත්වන සහ එමනිසාම අදියර 3 ලෙස සලකන අවස්ථාවක, මූල්‍ය වත්කමේ ශුද්ධ ක්‍රමක්ෂය පිරිවැයට එලදායි පොලී අනුපාත (EIR) ක්‍රමය යොදා ගනිමින් බැංකුව පොලී ආදායම ගණනය කරනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී අනිවාර්යයෙන් මැනීමට අවශ්‍ය සියලුම වෙළෙඳ වත්කම් සහ මූල්‍ය වත්කම් මත පොලී ආදායම පිළිවෙලින් ශුද්ධ වෙළෙඳ ආදායම සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ / (අලාභ) තුළ ගිවිසුම්ගත පොලිය භාවිතයෙන් හඳුනා ගනී.

2.5.3. ගාස්තු සහ කොමිස් ආදායම

කොමිස් ආදායම හා වියදම පිළිබඳ විස්තර සටහන් අංක 5 හි දක්වා ඇත.

2.6. 2020 දෙසැම්බර් 31. දින සිට තවමත් බලාත්මක නොවූ නිකුත්කල ප්‍රමිති

2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකව තිබූ පවතින පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතී සඳහාවූ සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මත සැලකිය යුතු බලපෑමක් ඇතිකර නොතිබිණි.

2.6.1. 2020.01.01. දින සිට බලපැවැත්වෙන පරිදි LKAS 1 සහ LKAS 8 සඳහා සංශෝධන

2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන දැනට ක්‍රියාත්මක වන පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතීන්ට සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර නොතිබිණි. නිර්වචනයේ කිසියම් පැතිකඩක් තහවුරු කිරීමට හා ප්‍රමිතිය හරහා ප්‍රමාණාත්මකභාවයේ නිර්වචනය පෙලගැස්වීමට LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ LKAS 8 ගිණුම්කරණ ප්‍රමිති ගිණුම්කරණ ඇස්තමේන්තු හා දෝෂ වෙනස්වීම් වල ප්‍රමාණාත්මක සංශෝධනයක් සිදුකරයි. තොරතුරු ප්‍රමාණාත්මකවන අතර මග හැරීම් හෝ සැගවීම් විශේෂිත වාර්තාකරණ ආයතනයක්

පිළිබඳ මූල්‍ය තොරතුරු සපයන එම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සාමාන්‍ය අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් විසින් ගනු ලබන තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් එල්ල කිරීම නව අර්ථකථනය මගින් ප්‍රකාශවෙයි. ප්‍රමාණාත්මක වන අර්ථකථනයට සිදුකරන සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු බලපෑමක් එල්ල කරන බව අපේක්ෂා නොකරයි.

2.6.2. SLFRS 16 කල්බදු සංශෝධන - කොවිඩ්-19 හා සම්බන්ධ බදු සහන

කොවිඩ්-19 වසංගතයේ සෘජු බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස පැනනගින කුලී සහන ගණනය කිරීම සඳහා SLFRS 19 කල්බදු නවීකරණය කිරීම පිළිබඳ මගපෙන්වීම් අදාල කර ගැනීමට සංශෝධන කල්බදු ලබා ගන්නන් සඳහා සහන සපයයි. ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් ලෙස කොවිඩ්-19 ට අදාල කුලී සහන කල්බදු නවීකරණය කරන කල්බදු ලබා දෙන්නන්ගේ තක්සේරුකර ගැනීමට කල්බදුකරුට නොහැකි වේ. කොවිඩ්-19 ට සම්බන්ධ කුලී සහනවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන කල්බදු ගෙවීමේ කිසියම් වෙනසක් සඳහා කල්බදුකරු මෙම Election Accounts නිර්මාණය කරන අතර එලෙසම වෙනස කල්බදු නවීකරණය කිරීමක් නොවන්නේ නම් එය SLFRS 16 යටතේ වෙනස සඳහා ගණනය කරයි. සංශෝධන ප්‍රකාශනය බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකරන බව අපේක්ෂා නොකරයි.

2.7. කොවිඩ්-19 නිසා සිදුවන බලපෑම

කොවිඩ්-19 වසංගත තත්ත්වය ව්‍යාපාරික හා ආර්ථික කටයුතු අඩාල කිරීමට මෙන්ම ගෝලීය හා දේශීය ආර්ථිකයේ අවිනිශ්චිතතාවයක් ඇති කිරීමට හේතු වී තිබිණි. ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය ආරම්භවීමෙන් පසුව ව්‍යාපාරික මෙහෙයුම් සිදු කිරීමේදී බැංකුව රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර තිබූ මාර්ගෝපදේශ සහ උපදෙස් දැඩි ලෙස අනුග මනය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර තිබූ උපදෙස්වලට සමගාමීව බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා බැංකුව තවදුරටත් සහන සපයා තිබිණි.

ලබාගත් ණය සඳහා ආපසු ගෙවීමේ කොන්දේසි ලිහිල් කිරීම, සුදුසු ණය නිෂ්පාදන සඳහා සහනදායී පොලී අනුපාත ලබාදීම (ණය සහන කාල සීමාවන්) එක් එක් ගාස්තු හා අයකිරීම් කපාහැරීම මෙම සහන කටයුතු වලට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය නිකුත් කර තිබූ මාර්ගෝපදේශ හා සමගාමීව වාර්තාකරන දිනට උපකල්පනයන් සිදුකිරීම හා පවතින තොරතුරු මත පදනම්ව බැංකුවේ ණය හා අත්තිකාරම් කළඹට කොවිඩ්-19 වසංගතයෙන් සිදුවූ බලපෑම මෙම මූල්‍ය ප්‍රකාශනවල තක්සේරු කර ගැලපීම් සිදුකර ඇත. කෙසේ නමුත් ණය ගැණුම්කරුවන් මෙම ණය සහනයන්ගෙන් ප්‍රයෝජන ගන්නා ආකාරය අනුව සත්‍ය පාඩුව වෙනස් වීමකට භාජනය විය හැකි වේ.

පළමු දිනයේ වෙනස සහ පොළී ආදායම පිළිබඳ විස්තර සටහන් අංක 16.3.2 යටතේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

03. දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආදායම විශ්වාසදායි ලෙස තක්සේරු කිරීමට හැකිවීම සහ ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒම සිදුවිය හැකි ප්‍රමාණයට දළ ආදායම හඳුනාගනී. ආදායම හඳුනාගැනීමට ප්‍රථම විශේෂිත හඳුනාගැනීම් නිර්ණායකයන් ද සැලකිල්ලට ගතයුතු වෙයි.

	2024 රු.	2023 රු.
පොලී ආදායම	7,590,650,416	9,324,132,408
ගාස්තු සහ කොමිස් ආදායම	172,631,902	96,293,245
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්වලින් ශුද්ධ සාධාරණ අගයේ ලාභ/ (අලාභ)	377,996,544	157,533,227
වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම්	31,145,845	21,943,478
දළ ආදායම	8,172,424,707	9,599,902,358

04. ශුද්ධ පොලී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 2.2.1 හි දක්වා ඇත.

	2024 රු.	2023 රු.
පොලී ආදායම		
බැංකු තැන්පතු (ස්ථාවර + ඉතුරුම් ගිණුම්)	207,957,256	1,975,533,930
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්		
- ණය සහ අත්තිකාරම්	6,073,826,180	5,600,330,194
ණය සහන කාල ලබාදුන් ණයවල පළමු දින බලපෑම	2,507,045	3,031,481
5වැනි කොවිඩ් රැල්ල සඳහා ණය සහන පොලී මත 7%ක විලම්බිත පොලී ආදායම	-	-
අඩුකළා - 1,3,4,5 වැනි කොවිඩ් රැල්ලෙන් 7%ක බැංකුව අයකළ ණය සහන	(897,949)	(532,942)
- ණය සහ වෙනත් උපකරණ	1,307,257,884	1,745,769,745
මුළු පොලී ආදායම	7,590,650,416	9,324,132,408
පොලී වියදම		
බැංකුවලට ගෙවිය යුතු	-	51,052
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්		
- තැන්පතුකරුවන්ට ගෙවිය යුතු	5,374,590,961	8,706,701,092
- අනෙකුත් ණය ගැනුම්කරුවන්ට ගෙවිය යුතු	17,631,243	25,842,475
මුළු පොලී වියදම	5,392,222,204	8,732,594,619
ශුද්ධ පොලී ආදායම	2,198,428,212	591,537,789
අ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම් වලින් ලද ශුද්ධ ආදායම		
පොලී ආදායම	973,039,690	1,286,407,489
(අඩු කළා): පොලී වියදම	-	-
ශුද්ධ පොලී ආදායම	973,039,690	1,286,407,489

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

05. ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

බැංකුව, කාල සීමාව තුළ සිදුකළ සේවාවන් සමූහයකින් ගාස්තු සහ කොමිස් ආදායම උපයා ගනී.

	2024 රු.	2023 රු.
ගාස්තු හා කොමිස් ආදායම	172,631,902	96,293,245
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	172,631,902	96,293,245
ඇතුළත් වේ		
බැංකු සේවා ගාස්තු - ණය හා අත්තිකාරම්	160,872,603	84,074,511
නෛතික හා තාක්ෂණ ගාස්තු - ණය හා අත්තිකාරම්	5,315,042	1,841,929
වෙනත් අයකිරීම්	6,444,257	10,376,804
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	172,631,902	96,293,245

06. ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණයන්ගේ ශුද්ධ සාධාරණ ලාභය / (අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පොලී ආදායම හැර, "ලාභ හෝ අලාභ තුළින් හඳුනාගත් මූල්‍ය උපකරණ" වෙත සියලුම ලාභ හා අලාභ සහ අදාළ ලාභාංශ ශුද්ධ වෙළඳ ආදායම සඳහා ඇතුළත් වේ.

	2024 රු.	2023 රු.
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා ලාභ	377,996,544	157,533,227
ලාභ හා අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් සඳහා අලාභ	-	-
මුළු ගණන	377,996,544	157,533,227

07. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයේ ගෙවීම් ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු වූ විට, වෙනත් විස්තීර්ණ ආදායමක් තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වලින් උපයන ලාභාංශ හඳුනා ගැනේ.

	2024 රු.	2023 රු.
ලාභාංශ ආදායම	23,070,500	15,950,352
විවිධ ආදායම්	8,075,345	5,993,126
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	31,145,845	21,943,478

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

08. ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු (ප්‍රතිවර්තන)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

"මූල්‍ය උපකරණ" සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS -9 අනුව තක්සේරු කරනු ලබන, සියලු මූල්‍ය උපකරණ සඳහා වන හානිකරණ ප්‍රතිපාදනවල වෙනස්වීම් බැංකුව හඳුනාගෙන ඇත. SLFRS 9 යටතේ සියලු කාණ්ඩවල මූල්‍ය වත්කම් හානිකරණ මැනීම සඳහා විනිශ්චයක් අවශ්‍ය වේ; විශේෂයෙන් හානිකරණ අලාභ හඳුනාගැනීමේදී සහ ණය අවදානම්වල සැලකිය යුතු වර්ධනය තක්සේරු කිරීමේදී ප්‍රමාණය තීරණය කිරීම සහ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සහ ඇපසුරැකුම්වල කාල නිර්ණය කිරීම සඳහා අවශ්‍ය වේ. අදාළ කරගත් විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 16හි විස්තර කොට ඇත.

	2024 රු.	2023 රු.
ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්		
අදියර 1	(25,466,851)	(34,814,940)
අදියර 2	24,889,011	167,142,810
අදියර 3	547,881,282	423,926,677
ක්‍රමක්ෂය පිරිවැයට ඇති අනෙකුත් මූල්‍ය වත්කම්		
අදියර 1	(6,413,408)	5,137,783
අදියර 2	-	-
අදියර 3	-	-
එකතුව	540,890,034	561,392,330

09. පුද්ගල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

01. නිශ්චිත දායකත්ව සැලසුම්

2023 මූල්‍ය වර්ෂය තුළ බැංකුව මගින් පහත සඳහන් නිශ්චිත දායකත්ව සැලසුම ක්‍රියාත්මක කරයි. ලබාදුන් දායකත්වය "පුද්ගල වියදම්" යටතේ වියදමක් ලෙස වාර්තා කර ඇත. නොගෙවූ දායකත්වයන් වගකීමක් ලෙස වාර්තා කරයි.

(අ) සේවක අර්ථසාධක අරමුදල

2.4.1 හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය එළිදරව් කර ඇත.

(ආ) සේවක භාරකාර අරමුදල

2.4.1 හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය එළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

කාර්ය මණ්ඩල වියදම්	2024 රු.	2023 රු.
වැටුප් හා ප්‍රසාද දීමනා	863,549,970	717,390,410
නිශ්චිත දායකත්ව සැලසුම EPF සහ ETF	145,930,461	126,556,908
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂිත ප්‍රතිපාදන	61,445,114	59,542,589
ලබා නොගත් අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම්	38,815,577	29,964,922
අතිකාල සහ සේවකයා දැරූ වියදම් ප්‍රතිපූර්ණය	14,931,001	5,850,366
කාර්ය මණ්ඩල අධ්‍යයන සහ පුහුණු ගෙවීම්	2,248,850	1,944,205
වෛද්‍ය යෝජනා - ගෙවීම්	60,086,208	62,874,231
වෛද්‍යාධාර - ප්‍රතිපාදන (IFRS)	46,672,840	54,114,387
සුභසාධනය	5,787,930	7,171,626
රක්ෂණ	486,579	469,387
කාර්ය මණ්ඩල ණයවල පළමු දින වෙනස (IFRS)	(33,386,997)	(51,453,677)
හානිපූරණය	872,710	867,538
කාර්ය සාධන දීමනා	21,702,473	-
එකතුව	1,229,142,717	1,015,292,893

අඩු කළා- IFRS ප්‍රතිපාදන

කාර්ය මණ්ඩල ණයවල පළමු දින වෙනස (IFRS)	33,386,997	51,453,677
වෛද්‍ය යෝජනා ක්‍රමය - ප්‍රතිපාදන (IFRS)	(46,672,840)	(54,114,387)
සැබෑ එකතුව	1,215,856,873	1,012,632,183

09.1 දායකත්වය- විශ්‍රාමික කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය

	2024 රු.	2023 රු.
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	46,672,840	54,114,387

09.2 විශ්‍රාමික කාර්ය මණ්ඩල වෛද්‍ය යෝජනා ක්‍රමය බැංකුවේ සියලුම සේවකයින් සඳහා ස්ථාපිත කොට ඇත. 2023 දෙසැම්බර් 31 දින, වෘත්තීය ආයුගණක සමාගමක් වන Actuarial & Management Consultants (Pvt) Ltd හි, සාමාජිකයෙකු වන එම්. පූපාලනාතන් මහතා විසින් ආයුගණක තක්සේරුව සිදුකර ඇත. (සටහන් බලන්න)

දායකත්වය-පාරිතෝෂිත	2024 රු.	2023 රු.
වියදම් ලෙස හඳුනාගත් ප්‍රමාණය	61,445,114	59,542,589

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

10. වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම සහ දැරූ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හඳුනාගනී. ව්‍යාපාරය පවත්වා ගැනීමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම්, වර්ෂයේ ලාභය ගණනය කිරීම සඳහා ලාභ හා අලාභ ප්‍රකාශය වෙත අයකරනු ලැබේ. පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුව වර්තමාන බැඳීමක් (නෛතික හෝ ව්‍යුහාත්මක) ඇතිවිට වෙනත් වියදම්වලට අදාළ ප්‍රතිපාදන හඳුනාග නී. වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාම අවශ්‍ය වන අතර, වගකීමේ වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තු පිළියෙල කළ හැකි වේ. දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ක්ෂයවීමේ හා ක්‍රමක්ෂය වියදම්, අනෙකුත් වියදම් වෙන් කොට ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

	2024 රු.	2023 රු.
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	4,017,257	1,998,974
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	11,660,898	5,564,435
වෘත්තිය හා නෛතික වියදම්	8,523,264	7,399,866
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්	185,346,169	156,567,575
ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වියදම්	40,986,467	9,359,051
රථ වාහන නඩත්තු හා ගමන් වියදම්	9,139,958	7,984,571
සාමාන්‍ය වියදම්	23,046,704	11,690,094
වෙනත් අලාභ, බොල් ණය හා ලියා හැරීම්	-	-
ශ්‍රී ලංකා මහ බැංකු තැන්පතු රක්ෂණය	50,198,203	51,678,387
වෙනත් වියදම්	114,489,481	103,626,794
එකතුව	447,408,400	355,869,747

දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම/ක්‍රමක්ෂය කිරීම

ක්ෂය කිරීම - දේපළ, පිරියත සහ උපකරණ	49,185,811	21,007,983
ක්ෂය කිරීම - කල්බදු වත්කම්	77,500,923	78,600,161
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	126,686,733	99,608,144

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

11. බදු වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ප්‍රවර්තන බදු වියදම් - බදු අනුපාතය 24% සහ 30%

වර්තන බදු වත්කම් හා වගකීම් සඳහා පසුගිය වසර මෙන්ම මෙම වසර වෙනුවෙන් දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් වෙත ගෙවූ හෝ අයකර ගැනීමට අපේක්ෂිත වටිනාකම් අඩංගු වේ. වටිනාකම් ගණනය කිරීම සඳහා භාවිත කළ බදු අනුපාත හා බදු නීති යනු වාර්තාකරණ දිනයට බලාත්මක කර තිබූ හෝ බලාත්මක කළ ඒවා වේ. ඒ අනුව 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන හා එහි සංශෝධන අනුව, සටහන 2.3 හි නිශ්චිතව දක්වා ඇති අනුපාතවලට බදු අරමුණු සඳහා වෙනස්කළ පරිදි, වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

විලම්බිත බදුකරණය - බදු අනුපාතය 30%

වාර්තාකරණ දිනයට මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් බදු පදනම් සහ ඒවායේ රැගෙනයාමේ වටිනාකම අතර තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමවේද භාවිතයෙන් විලම්බිත බදු සපයනු ලැබේ. ප්‍රයෝජනයට ගතහැකි ප්‍රමාණයට එදිරිව බදු අයකළ හැකි ලාභ ප්‍රමාණයට, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්, භාවිත නොකළ ඉදිරියට ගෙන ආ බදු බැර ශේෂ සහ භාවිත නොකළ බදු අලාභ සියල්ල සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගනු ලබයි.

විලම්බිත බදු වත්කමේ කොටසක් හෝ සම්පූර්ණයෙන්ම භාවිතයට ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් තවදුරටත් නොපැවතීමේ ප්‍රමාණයට අඩුකර, විලම්බිත බදු වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම සෑම වර්තාකරණ දිනකදීම සමාලෝචනයට ලක් කරයි. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් සෑම වර්තාකරණ දිනකදීම නැවත තක්සේරු කරන අතර, ඉදිරියේදී තිබිය හැකි බදු අය කළ හැකි ලාභයක් මගින් විලම්බිත බදු වත්කම අයකර ගැනීමට ඉඩ ලබා දීමේ ප්‍රමාණයට හඳුනාගනු ලබයි.

වාර්තාකරණ දිනට පසුව පැනවූ හෝ දැනට පනවා ඇති බදු අනුපාත හා බදු නීති මත පදනම්ව, වත්කම් උපලබ්ධිවනවිට හෝ වගකීම් නිරාකරණය කරනවිට වර්ෂය තුළ දී උපයෝගී කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාත උපයෝගී කරගනිමින් විලම්බිත බදු වත්කම් හා වගකීම් ගණනය කරයි.

2022 වර්ෂයේදී බැංකුවේ සම්මත බදු අනුපාතය 24.0% සිට 30.0% දක්වා වැඩි වූ අතර, අලුතින් ක්‍රියාත්මක කරන ලද 2.5%ක සමාජ ආරක්ෂණ දායක බද්දක් බලාත්මක විය. 2022 ජනවාරි 1 වැනි දින සිට බලාත්මකවන පරිදි මූල්‍ය සේවා මත වැට් බද්ද 15.0% සිට 18.0% දක්වා වර්ධනය විය. භාවිතයට නොගත් බදු අලාභ සහ සැලකිය යුතු හානිකරණ ගාස්තු හේතුවෙන් විලම්බිත බදු වත්කම්වල වැඩි වීම සහ පසුගිය වසරවල බදු ප්‍රතිපාදන ආපසු හැරවීමෙන් පසුගිය බදු වර්පනම් පියවීම සමඟ බැංකුව වත්මන් වර්ෂය සඳහා රුපියල් මිලියන 442 ක බදු බැරකමක් හඳුනාගනු ලබයි.

	2024 රු.	2023 රු.
ප්‍රවර්තන බදු වියදම්		
ප්‍රවර්තන වර්ෂය	-	(55,492,480)
විලම්බිත බදු වියදම් (බැර)	125,756,722	(106,156,767)
එකතුව	125,756,722	(161,649,247)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

11.1 බදු වියදම් සැසඳීම

බදු පෙර ලාභය/ (අලාභ)	157,798,019	(1,164,780,667)
ඉකුත් කාලයේ ප්‍රවර්තන ආදායම් බදු ගැළපීම්		
එකතු කළා: බදු අරමුණු සඳහා අඩු කළ නොහැකි වියදම්/ආදායම් අඩුකිරීම්වල බදු බලපෑම	952,658,272	615,883,520
අඩු කළා: බදු අරමුණුවලට අඩු කළ හැකි වියදම්වල බදු බලපෑම	(804,527,551)	(606,532,475)
වත්කම් බැහැර කිරීම	5,707,700	885,920
ලාභාංශ	23,070,500	15,950,352
බදු ගණනය සඳහා ඉඩ දිය හැකි වියදම් - බදු පාඩු	-	-
වර්ෂය සඳහා ගළපන ලද ලාභය	334,706,940	(1,138,593,349)
වර්ෂය සඳහා ලාභය මත පදනම් වූ බදු	-	-
14% ක ලාභාංශ ආදායම මත පදනම් වූ බදු	-	-
විලම්බිත බදුකරණයට/ බදුකරණයෙන් මාරු කිරීම්	125,756,722	(106,156,767)
පසුගිය වර්ෂයේ (අධි)/ ඌන වෙන්කිරීම්	-	(55,492,480)
කාලපරිච්ඡේදය සඳහා බදු වියදම්	125,756,722	(161,649,247)

11.2 ආදායම් ප්‍රකාශයේ හා වෙනත් විස්තීර්ණ ආදායම්වල ඇති විලම්බිත බදු (බැර)/ අයකිරීම්වල පහත සඳහන් වෙනස්කම් ඇතුළත්ය

විලම්බිත බදු		
දේපළ, පිරියත හා උපකරණ	(21,377,623)	(35,613,577)
සේවක ප්‍රතිලාභ බැඳීම්	203,336,237	179,302,267
හානිකරණ වෙන් කිරීම්	257,636,159	257,809,511
භාවිතය සඳහා අයිතිය ඇති වත්කම්	(1,813,934)	(1,552,645)
ණය සහන පළමු දින බලපෑම	3,402,223	4,154,337
භාවිතයට නොගත් බදු අලාභ	192,452,587	341,578,005
විලම්බිත බදු	633,635,650	745,677,898

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

12. අගය කිරීමේ පදනම් මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය - බැංකුව- ප්‍රවර්තන වර්ෂය (2024)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය යන මාතෘකා යටතේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය, SLFRS 9 හි "මූල්‍ය උපකරණ"වල අර්ථ දක්වා ඇති පරිදි කාණ්ඩ අනුව මූල්‍ය උපකරණවල ධාරණ වටිනාකම පහත සාරාංශගත කර ඇත.

රු. වලින්	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුළින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	124,664,750	-	-	124,664,750
බැංකු තැන්පතු	152,682,844	-	-	152,682,844
ණය සහ අත්තිකාරම්	44,666,805,952	-	-	44,666,805,952
ණය උපකරණ	694,208,564	-	-	694,208,564
ප්‍රතිමිලදී ගැනීම්	2,256,431,869	-	-	2,256,431,869
භාණ්ඩාගාර බිල්පත්	5,607,545,953	-	-	5,607,545,953
භාණ්ඩාගාර බැඳුම්කර	422,577,047	-	-	422,577,047
ඒකක භාර	-	2,943,277,961	-	2,943,277,961
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	**53,924,916,979**	**2,943,277,961**	**5,379,078**	**56,873,574,017**
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	-	-	-	-
මූල්‍ය වගකීම්				
- තැම්පතුකරුවන්ට ගෙවිය යුතු	48,160,520,558	-	-	48,160,520,558
- වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු	140,800,069	-	-	140,800,069
මුළු මූල්‍ය වගකීම්	**48,301,320,627**	-	-	**48,301,320,627**

AC - ක්‍රමක්ෂය පිරිවැය - ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්
FVPL - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්/වගකීම්
FVOCI - වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

බැංකුව - ඉකුත් වර්ෂය (2023)*

රු. වලින්	ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ/ අලාභ තුළින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	122,600,853	-	-	122,600,853
බැංකු තැන්පතු	2,923,132,097	-	-	2,923,132,097
ණය සහ අත්තිකාරම්	40,992,800,137	-	-	40,992,800,137
ණය උපකරණ	781,224,416	-	-	781,224,416
ප්‍රතිමිලදී ගැනීම්	970,572,268	-	-	970,572,268
භාණ්ඩාගාර බිල්පත්	9,840,233,022	-	-	9,840,233,022
භාණ්ඩාගාර බැඳුම්කර	415,464,023	-	-	415,464,023
වාණිජ පත්‍ර	155,250,000	-	-	155,250,000
ඒකක භාර	-	3,552,533,227		3,552,533,227
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	56,201,276,816	3,552,533,227	5,379,078	59,759,189,122
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	2,732,792	-	-	2,732,792
මූල්‍ය වගකීම්				
- තැම්පතුකරුවන්ට ගෙවිය යුතු	52,138,134,453	-	-	52,138,134,453
- වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු	178,986,770	-	-	178,986,770
මුළු මූල්‍ය වගකීම්	52,319,854,014	-	-	52,319,854,014

13. මුදල් සහ මුදල් සමාන දෑ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මුදල් හා මුදල් සමාන දෑ සඳහා වටිනාකමෙහි නොසැලකිය යුතු වෙනස්වීමේ අවදානමට යටත්වන අතැති මුදල්, බැංකුවල ඇති ශේෂ, ඒක්ෂණ මුදල් සහ කෙටිකාල දැන්වීම් අඩංගු වේ. මුදල් හා මුදල් සමාන දෑ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණ අඩු කර ලබා ගනී. "මූල්‍ය උපකරණ" සඳහා වන SLFRS 9 අනුව බැංකුවල ඇති ශේෂ, ඒක්ෂණ මුදල් සහ කෙටිකාල දැන්වීම් හානිකරණයට යටත් වේ.

මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2024 රු.	2023 රු.
අතැති මුදල්	94,473,374	62,943,092
බැංකුවල ඇති ශේෂ	30,191,375	59,657,762
එකතුව	124,664,750	122,600,853

14. බැංකුවල ඇති තැම්පතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සාධාරණ අගයේ වැදගත් නොවන මට්ටමේ වෙනස්වීමේ අවදානමකට යටත්වන බැංකුවල ඇති තැම්පතු සඳහා, තැම්පත්කර ඇති කෙටිකාලීන තැම්පතු අඩංගුවන අතර, කෙටිකාලීන බැඳීම් කළමනාකරණය කිරීම සඳහා බැංකුව සහ සමූහය ඒවා යොදා ගනු ලබයි. සුදුසු පරිදි හානිකරණය අඩුකර ඒවා මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රකාශිත අගයට හෝ දළ වටිනාකමට වාර්තා කරනු ලබයි. විශේෂ බැංකුවක බාහිර ශ්‍රේණිගත කිරීම මත පදනම්ව SLFRS 9 හි මූල්‍ය උපකරණවලට අනුව සමූහය විසින් හානිකරණ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි.

14.1

	2024 රු.	2023 රු.
ස්ථාවර තැන්පතු		
ජාතික කිරීමේ බැංකුව	-	-
මහජන බැංකුව	-	2,929,999,099
එක්ෂණ තැම්පතු		
ලංකා බැංකුව	-	-
ඉතුරුම් ගිණුම් - ආයෝජන		
සණස සංවර්ධන බැංකුව	1,252,059	1,213,045
ජාතික සංවර්ධන බැංකුව	1,360,802	4,770
සම්පත් බැංකු	25,358	-
මුස්ලිම් වාණිජ බැංකුව	150,056,610	-
දළ එකතුව	152,694,828	2,931,216,914

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

14.2

	2024 රු.	2023 රු.
අදියර 1		
2024.01.01 දිනට ආරම්භක ශේෂය	8,084,817	2,947,034
ආදායම් ප්‍රකාශනයට අයකිරීම්/ (ආපසු ලිවීම්)	(8,072,834)	5,137,783
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2024.12.31 දිනට අවසාන ශේෂය	11,983	8,084,817
අදියර 2		
2024.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම්/ (ආපසු ලිවීම්)	-	-
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2024.12.31 දිනට අවසාන ශේෂය	-	-
අදියර 3		
2024.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම්/ (ආපසු ලිවීම්)	-	-
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2024.12.31 දිනට අවසාන ශේෂය	-	-
ඇ. බැංකුවල ඇති ශුද්ධ තැම්පතු	152,682,844	2,923,132,097

15. ලාභ හෝ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්

	2024 රු.	2023 රු.
ඒකක භාර (NDB)	2,943,277,961	3,552,533,227
එකතුව	2,943,277,961	3,552,533,227

අ. විශ්ලේෂණය

	2024 රු.	2023 රු.
ඇප අනුව වර්ග කිරීම		
සුරැකුම් ලෙස තබා ඇති ඇප	-	-
බැඳීම් රහිත දේපළ	2,943,277,961	3,552,533,227
දළ එකතුව	2,943,277,961	3,552,533,227

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

16. ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ණය සහ අත්තිකාරම් සඳහා සක්‍රිය වෙළඳ පොළක සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇතුළත් වන අතර, වහාම හෝ නුදුරු කාලීනව විකිණීම සඳහා අදහස් කරන දෑ ඇතුළත් නොවේ. ඇතැම් වත්කම් මූලික හඳුනාගැනීමේදී ලාභ අලාභ තුළින් සාධාරණ අගයට නම් කරන අතර අනෙකුත් වත්කම් මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වලට නම් කරයි. ණය පිරිහීම හේතුවෙන් හැර, එම අයිතමය එහි මූලික ආයෝජන සියල්ලම සැලකිය යුතු ලෙස ආපසු අයකරගත නොහැක.

ණය සහ අත්තිකාරම් සඳහා සක්‍රිය වෙළඳ පොළක සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇතුළත් වන අතර, වහාම හෝ නුදුරු කාලීනව විකිණීම සඳහා අදහස් කරන දෑ ඇතුළත් නොවේ. ඇතැම් වත්කම් මූලික හඳුනාගැනීමේදී ලාභ අලාභ තුළින් සාධාරණ අගයට නම් කරන අතර අනෙකුත් වත්කම් මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වලට නම් කරයි. ණය පිරිහීම හේතුවෙන් හැර, එම අයිතමය එහි මූලික ආයෝජන සියල්ලම සැලකිය යුතු ලෙස ආපසු අයකරගත නොහැක.

16.1

	2024 රු.	2023 රු.
දළ ණය හා අත්තිකාරම්	44,678,146,696	41,006,647,925
අදියර 1	24,538,845,298	25,022,039,747
අදියර 2	5,401,181,793	5,325,583,522
අදියර 3	14,738,119,605	10,659,024,656
(අඩු කළ): සමුච්චිත හානිකරණය	2,936,781,371	2,389,477,929
අදියර 1	402,669,086	428,135,938
අදියර 2	456,118,112	431,229,101
අදියර 3	2,077,994,173	1,530,112,891
ශුද්ධ ණය හා අත්තිකාරම්	41,741,365,325	38,617,169,996
අඩු කළා - ණය සහන කාල ලබාදුන් ණයවල පළමු දින බලපෑම	11,340,744	13,847,789
ධාරණ අගයට ණය හා අත්තිකාරම්	41,730,024,581	38,603,322,207

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

16.2 විශ්ලේෂණය

	2024 රු.	2023 රු.
නිෂ්පාදන අනුව		
උකස්	9,969,290,283	10,179,549,598
සේ.අ.අ	13,938,716,138	8,857,459,543
රථවාහන	-	-
කාර්ය මණ්ඩල ණය	1,061,427,985	1,208,081,194
පුද්ගල ණය	17,669,137,783	19,295,356,966
වෙනත්	2,404,174,993	1,864,188,107
අඩුකළා		
පළමු දින වෙනස සඳහා දීමනාව - කාර්ය මණ්ඩල ණය	(364,600,486)	(397,987,482)
දළ එකතුව	44,678,146,696	41,006,647,925
ඇප සුරැකුම් අනුව		
සුරැකුම් ලෙස රඳවාගත් ඇප	24,819,823,839	19,037,009,141
අනෙකුත් ණය වැඩි වීම	19,858,322,857	21,969,638,784
දළ එකතුව	44,678,146,696	41,006,647,925

16.3 වර්ෂය තුළ හානිකරණයේ සංචලනය

අරමුණුගත සාක්ෂි පවතින විට හානිකරණ අලාභයක් දැරීමට වන අවස්ථාවේදී, වත්කමේ ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් අතර වෙනස මත පදනම්ව අලාභයේ ප්‍රමාණය ගණනය කරන අතර, වත්කමේ ධාරණ අගය අඩුකර වෙන්කිරීම් ගිණුමකට අයකරමින්, අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගනී.

ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම, මූල්‍ය වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරනු ලබයි. ඇපකර මූල්‍ය වත්කම්වල තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහවල වර්තමාන අගය ගණනය කිරීමේදී විකිණීමට ඇති වටිනාකම්වල මූල්‍ය ප්‍රවාහයෙන් පෙර වර්ණවල පිරිවැයෙන් අඩු කළ ප්‍රමාණය සැලකිල්ලට ගනු ලබයි.

අ. සාමූහික හානිකරණ තක්සේරුව

වෙන් වෙන් වශයෙන් තක්සේරුකළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණයවීමට අරමුණුගත සාක්ෂි නොපවතින බව බැංකුව තීරණය කරන්නේ නම්, වත්කමේ නිෂ්පාදන ලක්ෂණවල සමජාතීය බව මත පදනම්ව තක්සේරු කිරීම් සිදු කරනු ලබයි. ඊට අමතරව සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සාමූහිකව හානිකරණ සඳහා ඇගයීමට ලක් කෙරේ.

ආ. හානිකරණවල තනි තක්සේරුකරණය

ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ගෙන යන මූල්‍ය වත්කම් (බැංකුවලින් ලැබිය යුතු මුදල්, ණය සහ ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් මෙන්ම මූල්‍ය වත්කම්වලට ක්‍රමක්ෂය පිරිවැය - ණය සහ වෙනත් උපකරණ වැනි) සඳහා බැංකුව පළමුවෙන් හානිකරණවල විෂයබද්ධ සාක්ෂි පවතින්නේද යන්න තනි වැදගත්කමක් ඇති මූල්‍ය වත්කම් සඳහා තනිව තක්සේරු කරන අතර, තනි වැදගත්කමක් නොමැති මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පිළිබඳ විෂයබද්ධ සාක්ෂි නොමැති බව බැංකුව තීරණය කරන්නේ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

නම්, වත්කම් ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක දක්වනු ලබන අතර හානිකරණ සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. හානිකරණ අලාභ හඳුනාගෙන ඇති හෝ නිරන්තරයෙන් හඳුනාගැනෙන හානිකරණ සඳහා තනි තනිව තක්සේරු කරන ලද වත්කම්, සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ. හානිකරණ අලාභ සිදු වී ඇති බවට විෂයමූලික සාක්ෂි පවතී නම්, අලාභ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම්වල ධාරණ වටිනාකම් සහ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහ අතර වෙනස්කම අනුවය (තවමත් නොදැරූ ඉදිරියේදී අපේක්ෂිත ණය අලාභ හැර). හානිකරණ ප්‍රතිපාදන ගිණුමෙන් වත්කම්වල ධාරණ වටිනාකම අඩු වන අතර, අලාභ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. හානිකරණ මැනීමේ අරමුණු සඳහා ඉදිරි මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට භාවිත කරන පොලී අනුපාත අනුව රැගෙන යන මුදල මත පොලී ආදායම අඛණ්ඩව උපචිත වේ. පොලී ආදායම "පොලී සහ සමාන ආදායම"හි කොටසක් ලෙස වාර්තා කරනු ලබයි. තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ.

ණයක් සඳහා විචල්‍ය පොලී අනුපාතයක් ඇත්නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ වත්මන් සඵල පොලී අනුපාතය වේ. බැංකුව විසින් ණය සහ ලැබිය යුතු දේ වෙත වෙළඳ වත්කම් නැවත වර්ගීකරණය කර ඇත්නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම සඳහා වන වට්ටම් අනුපාතය වනුයේ නැවත වර්ගීකරණ දිනයේ දී තීරණය කරනු ලබන නව සඵල පොලී අනුපාතය වේ. ඇපකරගත මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය ගණනය කිරීම මගින්, පෙරවරණ සම්භාවිතාවක් තිබුණත් නැතත්, ඇපකරය ලබා ගැනීම සහ විකිණීම සඳහා පිරිවැය අඩුකළ පෙර වර්ෂවලින් මූල්‍ය ප්‍රවාහයන් පිළිබිඹු කරයි. අනාගත ප්‍රතිසාධනය පිළිබඳ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සහ සියලු ඇපකර සාක්ෂාත් කර ඇති විට හෝ බැංකුව වෙත මාරු කර ඇති විට, අදාළ දීමනාව සමඟ ණය කපා හරිනු ලැබේ. පසු වසරක දී, හානිකරණ හඳුනා ගැනීමෙන් පසු සිදු වූ සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තුගත හානිකරණ අලාභයේ ප්‍රමාණය වැඩි වී හෝ අඩු වී ඇත්නම්, දීමනා ගිණුම ගැළපීමෙන් කලින් හඳුනාගත් හානිකරණ අලාභ වැඩි හෝ අඩු කරනු ලැබේ. ලියා හැරීමක් පසුව අයකරගනු ලැබුවහොත්, ආපසු අයකර ගැනීම "ණය අලාභ වියදම" වෙත බැර කෙරේ.

ණය සහ අත්තිකාරම් ලියාහැරීම

SLFRS 9 යටතේ කපා හැරීම සඳහා වන බැංකු ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ පැවති ආකාරයටම පවතී. යථා තත්ත්වයට පත් වීමේ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සාමාන්‍යයෙන් ණය (සහ අදාළ හානිකරණ දීමනා ගිණුම්) අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ලියා හරිනු ලබන අතර ගෙවිය යුතු මුදල් අයකර ගැනීමේ දී ගත හැකි සියලු පියවර අවසන් වී ඇත. ණය සුරක්ෂිත කර ඇති විට, මෙය සාමාන්‍යයෙන් සිදුවන්නේ සුරැකුම සාක්ෂාත් කර ගැනීමෙන් ලැබෙන යම් ආදායමක් ලැබීමෙන් පසුවය. ලියා හැරිය යුතු මුදල, සමුච්චිත අලාභ දීමනාවට වඩා වැඩි නම්, වෙනස මුලින්ම සලකනු ලබන්නේ දීමනාවට එකතු කිරීමක් ලෙසය, පසුව එය දළ ධාරණ අගයට යොදනු ලැබේ. ලියා හැරීමක් පසුව අයකර ගනු ලැබුවහොත්, ප්‍රතිසාධනය "වෙනත් මෙහෙයුම් ආදායමට" බැර කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2024 රු.	2023 රු.
අදියර 1		
2024.01.01 දිනට ආරම්භක ශේෂය	428,135,938	462,950,878
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	(25,466,851)	(34,814,940)
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
2024.12.31 දිනට අවසාන ශේෂය	402,669,086	428,135,938
අදියර 2		
2024.01.01 දිනට ආරම්භක ශේෂය	431,229,101	264,086,290
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	24,889,011	167,142,810
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
2024.12.31 දිනට අවසාන ශේෂය	456,118,112	431,229,101
අදියර 3		
2024.01.01 දිනට ආරම්භක ශේෂය	1,530,112,891	1,106,186,214
ආදායම් ප්‍රකාශනයට අයකිරීම් / (ආපසු ලිවීම්)	547,881,282	423,926,677
වර්ෂය තුළ ලියාහැරීම්	-	-
2024.12.31 දිනට අවසාන ශේෂය	2,077,994,173	1,530,112,891
එකතුව	2,936,781,371	2,389,477,929

17. මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය සහ අනෙකුත් උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ක්‍රමක්ෂ වියදම් සහිත මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් උපකරණ යනු, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීමක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර, ඒවා කල්පිරීම දක්වා රඳවා ගැනීමට බැංකුවට අභිප්‍රාය සහ හැකියාව ඇත. මූලික ඇගයීමෙන් පසු ක්‍රමක්ෂය පිරිවැය - ණය සහ වෙනත් උපකරණවල මූල්‍ය වත්කම, පසුව හානිකරණවලින් අඩු කළ, සඵල පොලී අනුපාත භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. සඵල පොලී අනුපාතයේ වැදගත් කොටසක්වන ගාස්තු හා අත්පත් කර ගැනීමේ දී කිසියම් වට්ටමක් වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයේ "පොලී සහ සමාන ආදායම්" තුළ හානිකරණ ගාස්තු ඇතුළත් වේ. හානිකරණ ගාස්තු යටතේ එවැනි ආයෝජන හෝ හානිකරණයෙන් පැන නගින අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2024 රු.	2023 රු.
භාණ්ඩාගාර බිල්පත්	5,607,545,953	9,840,233,022
භාණ්ඩාගාර බැඳුම්කර	422,577,047	415,464,023
ණයකර	694,208,564	781,224,416
ප්‍රති විකුණුම්	2,256,431,869	970,572,268
වාණිජ පත්‍රිකා	-	155,250,000.00
දළ එකතුව	8,980,763,433	12,162,743,730

17.1 විශ්ලේෂණය

ඇප අනුව වර්ගීකරණය		
ඇප ලෙස හිලව්කළ	-	-
බැඳීම් නොමැති	8,980,763,433	12,162,743,730
දළ එකතුව	8,980,763,433	12,162,743,730

17.2 අදියර 3

2024.01.01 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශය වෙත අයකිරීම/(ආපසු ලිවීම)	1,659,425.00	-
වර්ෂය තුළ කපා හැරීම	-	-
වෙනත් වෙනස්වීම්	-	-
2024.12.31 දිනට අවසන් ශේෂය	1,659,425	-
ඇ. ශුද්ධ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට	8,979,104,008	12,162,743,730

18. අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් විස්තීර්ණ අදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් යටතේ ස්කන්ධ හා ණය සුරැකුම් වර්ගීකරණය කරනු ලබයි. අනෙකුත් විස්තීර්ණ අදායම තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කරනු ලබන ස්කන්ධ ආයෝජන යනු උපායමාර්ගික ආයෝජන ලෙස රඳවාගත් දෑය. මෙම කාණ්ඩයේ ණය සුරැකුම්පත් අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා ගැනීමට අදහස් කරන දෑ වන අතර ද්‍රවශීලතාවේ අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳ පොළ තත්ත්වයන්වල වෙනස්කම් සඳහා ප්‍රතිචාර වශයෙන් අලෙවි කළ හැකිය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

වෙනත් විස්තීරණ ආදායම තුළින් ස්කන්ධ සාධන පත්‍ර සාධාරණ වටිනාකම

බැංකුව විසින් "මූල්‍ය උපකරණ: ඉදිරිපත් කිරීම" මත LKAS 32 යටතේ කොටස් අර්ථ දැක්වීම සපුරාලන විට සහ වෙළඳාම සඳහා රඳවා නොගන්නා විට වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම යටතේ ඇතැම් ස්කන්ධ ආයෝජන වර්ගීකරණය කළ යුතුය. එවැනි වර්ගීකරණ උපකරණ - උපකරණ පදනම යටතේ සිදු කරනු ලබයි.

වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම්

	2024 රු.	2023 රු.
ලැයිස්තුගත නොකළ කොටස්		
ණය තොරතුරු කාර්යාංශය	4,754,078	4,754,078
ෆිච් ශ්‍රේණිගත කිරීම්	625,000	625,000
දළ එකතුව	5,379,078	5,379,078

18.1 විශ්ලේෂණය

ඇප අනුව වර්ගකිරිම		
ඇප ලෙස හිලව්කළ	-	-
බැඳීම් නොමැති	5,379,078	5,379,078
දළ එකතුව	5,379,078	5,379,078

19. දේපළ, පිරියත සහ උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

හඳුනා ගැනීමේ පදනම

වත්කම සමඟ තිබියහැකි අනාගත ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් සහ වත්කම් පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ලබයි. වත්කම් අත්පත්කර ගැනීම සඳහා සෘජුවම අදාළ කර ගත හැකි පිරිවැය ඇතුළත්ව දේපළ, පිරියත සහ උපකරණ මූලිකව පිරිවැයට ගණනය කරනු ලබයි.

තක්සේරුකරණ පදනම

වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසුවන දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මූලිකවම පිරිවැයට තක්සේරු කරනු ලබයි. වත්කම් අත්පත් කර ගැනීම සහ පසුකාලීන වියදම් සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයංසාදන ලද වත්කම් සඳහා ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය, වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක් සහ අයිතම විසුරුවා හැරීමට සහ ඉවත් කිරීමට සහ ඒවා පිහිටා ඇති සහ ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කර ඇති වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට යන පිරිවැය ඇතුළත් වේ.

පිරිවැය මාදිලිය

බැංකුව සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, කම්හල් සහ උපකරණ සඳහා පිරිවැය ආකෘතිය අදාළ කරන අතර ඒ මත සිදුවන වියදම්වලින් අඩු කළ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ සමඟ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයේ වාර්තා කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

19.1

අ. දේපළ, පිරියත සහ උපකරණ

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	වෙබ් අඩවි සංවර්ධනය	එකතුව
2024 (ප්‍රවර්ථන වසර පිරිවැය / සාධාරණ අගය 2024.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	173,707,095	177,334,076	4,395,518	460,000	426,694,943
එකතු කිරීම්	-	21,730,043	85,702,354	267,591,988	-	375,024,385
බැහැරකිරීම්	(6,605,500)	(2,193,231)	(7,014,041)	-	-	(15,812,773)
ගැළපීම්	-	-	-	460,000	(460,000)	-
2024.12.31 දිනට අවසාන ශේෂය	64,192,754	193,243,906	256,022,389	272,447,506	-	785,906,556
(අඩු කළා): සමුච්චිත ක්ෂය කිරීම 2024.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	128,581,991	144,037,784	4,395,518	74,986	347,888,533
වර්ෂය සඳහා අයකිරීම	-	11,845,426	24,872,265	12,468,119	-	49,185,810
බැහැරකිරීම්	(6,605,500)	(2,193,231)	(7,014,041)	-	-	(15,812,773)
ගැළපීම්	-	-	-	74,986	(74,986)	-
2024.12.31 දිනට අවසාන ශේෂය	64,192,754	138,234,185	161,896,008	16,938,623		381,261,571
2024.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	55,009,721	94,126,381	255,508,883		404,644,985

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

රුපියල් වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	වෙබ් අඩවි සංවර්ධනය	එකතුව
2023 (පෙර වසර) පිරිවැය / සාධාරණ අගය 2023.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	168,969,165	167,010,505	4,395,518	460,000	411,633,442
එකතු කිරීම්	-	9,022,113	12,722,520	-	92,844,755	114,589,387
බැහැරකිරීම් / ගැළපීම්	-	(4,284,184)	(2,398,948)	-	-	(6,683,132)
ගැළපීම්	-	-	-	-	-	-
2023.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	173,707,095	177,334,076	4,395,518	93,304,755	519,539,697
(අඩු කළා) සමුච්චිත ක්ෂය කිරීම 2026.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	121,468,661	136,740,714	4,395,518	17,486	333,420,634
වර්ෂය සඳහා අයකිරීම	-	-	-			-
බැහැරකිරීම්	-	11,254,465	9,696,018	-	57,500	21,007,983
ගැළපීම්	-	(4,141,136)	(2,398,948)	-	-	(6,540,084)
	-	-	-	-	-	
2023.12.31 දිනට අවසාන ශේෂය	70,798,254	128,581,991	144,037,784	4,395,518	74,986	347,888,533
2023.12.31. දිනට ශුද්ධ පොත් අගය	-	45,125,104	33,296,292	-	93,229,768	171,651,164

19.2 තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ

තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණ පහත පරිදි වේ.

දෙසැම්බර් 31 දිනට	2024	2023
වාහන	64,192,754	70,798,254
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් සහ කාර්යාල උපකරණ	99,079,756	93,852,701
පරිගණක උපකරණ	126,114,757	120,030,133
පරිගණක මෘදුකාංග	4,395,518	4,395,518
එකතුව	293,782,786	289,076,606

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

19.3 තාවකාලික අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ

වාර්තාකරණ දිනය වන විට තාවකාලික අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ නොමැත.

19.4 සක්‍රිය භාවිතයෙන් ඉවත් කළ දේපළ, පිරියත සහ උපකරණ

SLFRS 5 ප්‍රකාරව විකිණීමට තබා ඇති - විකුණුම් සහ අත්හිටවූ මෙහෙයුම් සඳහා තබා ඇති ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය නොකළ ක්‍රියාකාරී භාවිතයෙන් ඉවත් කළ දේපළ, පිරියත සහ උපකරණ නොතිබුණි.

20. විලම්බිත බදු වත්කම් / (වගකීම්)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

විලම්බිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 11හි එළිදරව් කර ඇත.

	2024 රු.	2023 රු.
2024.01.01 ආරම්භක ශේෂය	745,677,897	632,156,451
අදාළ වසර සඳහා අය කිරීම		
- ලාභ/ (අලාභ)	(125,756,722)	106,156,767
- ලාභ/ (අලාභ) - බදු අනුපාතවල වෙනස්කම් මත බලපෑම	-	-
- වෙනත් විස්තීර්ණ ආදායම් (30% භාවිත කළ)	13,714,474	7,364,679
2024.12.31 දිනට අවසාන ශේෂය	633,635,649	745,677,897

21. වෙනත් වත්කම්

	2024 රු.	2023 රු.
ලිපි ද්‍රව්‍ය තොගය	16,920,483	15,038,906
තැම්පතු හා කලින් ගෙවීම්	3,758,799	35,210,838
කලින් ගෙවූ සේවක ණය	364,600,486	397,987,482
VAT අයවිය යුතු	35,812,671	27,952,433
NBT අයවිය යුතු	-	3,603,588
DRL අයවිය යුතු	-	15,591,023
WHT අයවිය යුතු	164,429,777	113,160,349
SSCL අයවිය යුතු	-	3,321,741
ණය සහන පොලිය මත 7% ක ලැබිය යුතු පොලිය	5,311,931	6,209,879
අයවිය යුතු පොලිය - ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථිර තැම්පතු	-	-
වෙනත්	4,773,358	4,874,997
එකතුව	595,607,504	622,951,236

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

22. බැංකු වලට ගෙවිය යුතු

	2024 රු.	2023 රු.
ණය ගැනීම් (අයිරා)	-	2,732,792
නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	-	-
එකතුව	-	2,732,792

23. ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

තැම්පත්කරුවන්ට ගෙවිය යුතු මුදල් සඳහා තැන්පතු හා කාල තැන්පතු අඩංගු වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව සඵල පොලී අනුපාත ක්‍රමය උපයෝගී කර ගනුදෙනු තැන්පතු ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට තක්සේරු කරයි. තැන්පතු සඳහා ගෙවූ / ගෙවිය යුතු පොලිය පොලී වියදම් යටතේ ආදායම් ප්‍රකාශයේදී හඳුනා ගනු ලබයි.

	2024 රු.	2023 රු.
තැම්පත්කරුවන්ට ගෙවිය යුතු	48,160,520,558	52,138,134,453
නැවත මිලදී ගැනීමේ ගිවිසුම්	-	-
වෙනත් ණයට ගැනීම්	140,800,069	178,986,770
එකතුව	48,301,320,627	52,317,121,222

23.1 තැම්පතුකරුවන්ට ගෙවියයුතු වටිනාකම් විශ්ලේෂණය

	2024 රු.	2023 රු.
නිෂ්පාදන අනුව		
ඉතුරුම් තැම්පතු	3,574,326,835	2,202,016,436
ස්ථාවර තැම්පතු	44,319,050,968	49,323,667,095
වෙනත් තැම්පතු (යෝජනා ක්‍රම)	267,142,754	612,450,922
එකතුව	48,160,520,558	52,138,134,453

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

23.2 වෙනත් ණයට ගැනීම් විශ්ලේෂණය

	2024 රු.	2023 රු.
බැංකු ණය	-	-
AHF	-	-
මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය	36,788,951	22,029,668
කල්බදු වගකීම්	104,011,119	156,957,101
එකතුව	140,800,069	178,986,770

24. සේවක ප්‍රතිලාභ

ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කරමින් ආයුගණක උපදේශන සමගින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක්වන නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි (PVDBO) වර්තමාන අගය බැංකුව තක්සේරු කරයි.

වට්ටම් කිරීමේ අනුපාතය, අපේක්ෂිත වත්කම් මත ඉපැයීම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතය ආදිය පිළිබඳ උපකල්පනයන් මත මෙම අරමුදලේ ආයුගණක තක්සේරු කිරීම් පදනම්ව ඇත.

මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වරූපය හේතුවෙන් එම ඇස්තමේන්තු කිරීම් සැලකියයුතු අවිනිශ්චිතතාවයන්ට ලක් වේ. Actuarial & Management Consultants (Pvt) Ltd විසින් සිදු කරන ලද 2024 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී තක්සේරු වාර්තාව මත පදනම්ව 2024 දෙසැම්බර් 31 දිනට සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබයි.

ආයුගණක විසින් භාවිත කරන ප්‍රධාන උපකල්පනවලට පහත දෑ ඇතුළත් වේ.

	2024 රු.	2023 රු.
පොලී අනුපාතය	11.00%	13.00%
වැටුප් වැඩිවීමේ අනුපාතය	6.5% - 8%	10.00%
විශ්‍රාම ගැනීමේ වයස	55-60 අවුරුදු	55-60 අවුරුදු

පාරිතෝෂික

	2024 රු.	2023 රු.
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම		
වර්ෂයේ ආරම්භක ශේෂය	291,878,533	245,562,689
ප්‍රවර්තන සේවා වියදම	37,944,209	15,341,305
පොලී වියදම	23,500,905	44,201,284
ප්‍රතිලාභ ගෙවීම්	(57,161,366)	(45,509,997)
ආයුගණක (ලාභ)/අලාභ	60,781,879	32,283,252
එකතුව	356,944,160	291,878,533

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන අගයේ සංවේදීතාවය විශ්ලේෂණය කිරීම

	2024 රු.	2023 රු.
වෙනස් වූ උපකල්පන (අනෙකුත් සියලුම උපකල්පන නොවෙනස්ව පවතින විට)	PV-DBO (Rs.)	PV-DBO (Rs.)
වට්ටම් අනුපාතයේ සියයට එකක් (+1%) ප්‍රතිශත ලක්ෂයක වැඩිවීම	336,260,853	275,457,498
වට්ටම් අනුපාතයේ සියයට එකක් (+1%) ප්‍රතිශත ලක්ෂයක අඩුවීම	380,286,557	310,420,576
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියයට එකක (+1%) ප්‍රතිශත ලක්ෂයක වැඩිවීම	382,503,514	312,316,801
වේතන වැටුප් වැඩිවීමේ අනුපාතයේ සියයට එකක (+1%) ප්‍රතිශත ලක්ෂයක අඩුවීම	333,977,441	273,530,916

2024.12.31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදනයේ කල්පිරීමේ සාරාංශය

වයස් කාණ්ඩය	සේවකයින් ගණන	මුළු මූලික වැටුප (රු.)	මුළු ජීවන වියදම් දීමනාව	ඉදිරි වැඩ කාලයේ සාමාන්‍යය	මුළු ප්‍රතිපාදන (PV-DBO)
XV: 20 to 24	25	863,575	62,776	14.6	172,749
XV: 25 to 29	32	1,660,730	1,004,415	14.0	3,644,593
XV: 30 to 34	78	5,845,330	4,897,876	13.4	33,875,887
XV: 35 to 39	43	4,793,780	2,699,365	12.3	31,059,573
XV: 40 to 44	58	5,987,570	3,641,005	11.3	53,282,453
XV: 45 to 49	47	5,826,960	2,950,469	9.7	63,432,867
XV: 50 to 54	37	5,194,800	2,322,710	6.7	64,837,559
XV: 55 to 59	34	4,902,840	2,134,382	1.9	106,638,479
එකතුව	354	35,075,585	19,712,998	10.8	356,944,161

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

වෛද්‍යාධාර

	2024 රු.	2023 රු.
වෛද්‍යාධාර සඳහා වෙන්කිරීම		
වර්ෂය ආරම්භයේදී ශේෂය	305,795,690	276,264,014
ප්‍රවර්තන සේවා පිරිවැය	39,753,440	4,386,865
පොලී පිරිවැය	6,919,400	49,727,522
ආයුගණක (ලාභ) / (අලාභ)	(15,066,966)	(7,734,321)
ගෙවූ ප්‍රතිලාභ	(16,558,269)	(16,848,390)
එකතුව	320,843,296	305,795,690
සේවක ප්‍රතිලාභ වගකීම් එකතුව	677,787,456	597,674,223

ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය

කාණ්ඩය	+1% වට්ටම් අනුපාතය PV-DBO (රු.)	-1% වට්ටම් අනුපාතය PV-DBO (රු.)
ක්‍රියාකාරී සේවකයින් - විශ්‍රාමික වෛද්‍ය ප්‍රතිලාභ (වෛද්‍ය අරමුදල)	99,937,988	143,656,110
විශ්‍රාමිකයන් - වෛද්‍ය ප්‍රතිලාභ (වෛද්‍ය අරමුදල)	172,695,706	202,845,191
එකතුව	272,633,694	346,501,301

25. වෙනත් වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් වගකීම් සඳහා ගාස්තු හා වියදම්, බදු ගෙවිය යුතු නොපැවැරූ ගනුදෙනුකරුවන්ගේ ලැබීම්, නිවාඩු සඳහා මුදල් ගෙවීම් සහ වෙනත් වියදම් ගිණුම්වල සිදුකර ඇති වෙන්කිරීම් ඇතුළත් වේ. වාර්තාකරණ දිනට ගෙවියයුතු ලෙස අපේක්ෂා කරන වටිනාකම් තුළ මෙම වගකීම් වාර්තා කර ඇත.

	2024 රු.	2023 රු.
ගෙවියයුතු බදු	149,578,309	35,637,120
උපචිත වියදම්	160,275,343	93,706,978
වෙනත් වගකීම්	30,667,357	72,562,152
මුදල නැවත ගෙවීමේ ණයහිමි	8,452,291	12,006,515
ආන්තික ගිණුම- ETF මණ්ඩලය සඳහා විශේෂිත ණය	910,984,285	467,485,793
ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීම්- වැසූ ණය මුදල	8,932,884	13,414,849
එකතුව	1,268,890,469	694,813,406

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

25.1 ගෙවියයුතු බදු

උපයනවිට ගෙවීම් බදු	10,151,925	7,161,290
WHT ගෙවියයුතු	15,863,435	21,485,961
VAT ගෙවියයුතු	113,691,536	6,989,869
SSCL ගෙවියයුතු	9,871,413	-
ගෙවියයුතු බදු	149,578,309	35,637,120
ගෙවියයුතු ආදායම් බදු		
ආරම්භක ශේෂය	-	134,000,281
වර්ෂය සඳහා ප්‍රතිපාදන	-	-
අධි/(ඌන) ප්‍රතිපාදන	-	(55,492,480)
ගෙවූ ආදායම් බදු	-	(78,507,801)
අවසන් ශේෂය	-	-

26. ප්‍රකාශිත ප්‍රාග්ධනය / වෙන් කළ ප්‍රාග්ධනය

	2024 රු.	2023 රු.
බලයලත් ප්‍රාග්ධනය	2,000,000,000	2,000,000,000
දායක ප්‍රාග්ධනය	889,812,899	889,812,899

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ ප්‍රතිපාදන සහ එහි සංශෝධනයන්ට අනුව බලය ලත් ප්‍රාග්ධනය රු. බිලියන 2කි. කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අඥා පනතේ වගන්ති අංක 22 අනුව කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව වෙත 1976 ජනවාරි 1වැනි දිනට ලබා දුන් අත්තිකාරම්වල හිග මුදල් වලින් සහභාගීත්ව ප්‍රාග්ධනය සමන්විත වේ. එමෙන්ම කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව යටතේ වන සංචිත සහ 1979 ජනවාරි 01 දිනට ලංකා රාජ්‍ය උකස් බැකංුවට අයත් ණය සංචිතය ද බැංකුවේ ප්‍රාග්ධනයෙන් කොටසක් වෙයි. එය බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය කරන අතර, එවැනි සියලුම මුදල් රජය විසින් බැංකුවේ ප්‍රාග්ධනයට ලැබෙන දායකත්වය ලෙස සලකනු ලැබේ.

1979 ජනවාරි 1 දිනට පසුව රජය විසින් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායකත්වයක් ලබා දී ඇති අතර, එම දායකත්වය සහ ඉහත ඡේදයෙන් සඳහන් කරන ලද ප්‍රාග්ධන යෙදවීම් ද ඇතුළු සමස්ථ ප්‍රාග්ධන යෙදවීම 2024 දෙසැම්බර් 31 දිනට රු. 889,812,899ක් විය.
තවද පනතෙහි අදාළ ප්‍රතිපාදනයන්ට අනුව, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, එහි ප්‍රාග්ධන වෙත අමතර දායකත්වයක් ලෙස එවැනි අරමුදලක් කලින් කලට යෙදවීම සිදු කරන අතර රජයෙන් හෝ වෙනත් ප්‍රභවයකින්, ශ්‍රී ලංකා ජනරජයෙන් හෝ ඉන් පිටතින් බැංකුව සුදුසුයි තීරණය කරන පරිදි සිදුකරනු ලබයි. රජය වෙතින් යෙදවූ එවැනි අරමුදල්, ඒකාබද්ධ අරමුදල මත අයකරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

27. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

	2024 රු.	2023 රු.
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	306,650,839	306,650,839
වර්ෂය තුළ මාරු කිරීම්	-	-
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	306,650,839	306,650,839

28. රඳවාගත් ඉපයීම්

	2024 රු.	2023 රු.
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	3,179,896,294	4,200,211,965
පෙර කාලසීමාවේ ගැළපීම්	(34,012,426)	-
හානිකරණය පළමු දින ගැළපීම	-	-
අනෙකුත් විස්තරාත්මක ආදායමේ සංචිත මාරු කිරීම	-	-
වර්ෂය සඳහා ලාභය	32,041,296	(1,003,131,419)
වෙනත් සංචිත වලට මාරු කිරීම්	-	-
අනෙකුත් විස්තීරණ ආදායම්	(32,000,439)	(17,184,252)
ගෙවිය යුතු ලාභාංශ බදු	-	-
දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය	3,145,924,725	3,179,896,294

පෙර කාල සීමාවේ ගැළපීම්		
ආදායම් බදු වියදම් ඌන වෙන් කිරීම	15,564,251	-
2019 වර්ෂයේ ජා.ගො.බ. වියදම්	3,603,588	-
2019 වර්ෂයේ ණය ආපසු ගෙවීමේ බදු වියදම්	15,591,023	-
වගාරක්ෂණ බදු	(746,436)	-
එකතුව	34,012,426	-

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

29. වෙනත් සංචිත

අ. බැංකුව - ප්‍රවර්තන වසර (2024)

සංචිතය	2024/01/01 දිනට ආරම්භක ශේෂය	සංචලන/ පැවරීම්	2024/12/31 දිනට අවසාන ශේෂය
පොදු සංචිතය	683,280,000	-	683,280,000
ප්‍රාග්ධන සංචිතය	393,498,004	-	393,498,004
හිමිකම් සුරක්ෂිත අරමුදල	1,031,000	-	1,031,000
එකතුව	1,077,809,004	-	1,077,809,004

29.1

ආ. බැංකුව - පෙර වසර (2023)

සංචිතය	2023/01/01 දිනට ආරම්භක ශේෂය	සංචලන/ පැවරීම්	2023/12/31 දිනට අවසාන ශේෂය
පොදු සංචිතය	683,280,000	-	683,280,000
ප්‍රාග්ධන සංචිතය	393,498,004	-	393,498,004
හිමිකම් සුරක්ෂිත අරමුදල	1,031,000	-	1,031,000
එකතුව	1,077,809,004	-	1,077,809,004

30. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

